ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ
ශ්‍රී ලංකා
ISSN : 1012 - 3954




# වාර්ෂික වාර්තාව
# 2011




ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ

# වාර්ෂික වාර්තාව
# 2011

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ

# වාර්ෂික වාර්තාව 2011

ISSN 1012-954

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

| | |
|---|---|
| ප්‍රකාශණය | ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය |
| පිටු සැලසුම් | වී එස් සිද්‍රාකරන් |
| පිට කවර සැකසුම | පී ඒ එන් පුන්‍යසිරි සහ බ්‍රසාදි ජෙගනාදන් |
| ඡායාරූප | කේ පී ආර් නිරෝෂන් සහ ජේ ටී තේවදාසන් |
| මුද්‍රණය | යුනිවර්සල් ප්‍රින්ටර්ස් |





තේ ජාන කම්ටුවෙහි පරිවෘත්තීමය රසායනික සංඝටකයන් ආකෘතිගත කිරීම.

තේ ජාන කම්ටුවෙහි පරිවෘත්තීමය රසායනික සංඝටකයන්ගේ විවිධත්වය සොයා බැලීම සඳහා පරීක්ෂණ ආරම්භ කර ඇත.

# පටුන


ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
- දැක්ම සහ මෙහෙවර
- ආයතනික ව්‍යුහය

කළමණාකරන මණ්ඩලය
උපදේශක කමිටු
තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපතිතුමාගේ වාර්ථාව
අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය
තේ ප ආයතන කාර්ය මණ්ඩලය
පර්යේෂණ
- බෝග වැඩි දියුණු කිරීම
- බෝග ආරක්ෂාව
- ඵලදායිතාව වැඩි දියුණු කිරීම
- දේශගුණික වෙනස්වීම් හි බලපෑම තක්සේරුව
- ක්ෂෙත්‍ර ක්‍රියාකාරකම් යාන්ත්‍රීකරණය
- බෝග කලමණාකරණය
- තේ සැකසුම් තාක්ෂණය
- නිමි තේ ගුණාත්මය
- අගය එකතුකල තේ නිෂ්පාදන
- සමාජ ආර්ථික

තේ කර්මාන්තයේ නියැලෙන්නන් සඳහා සේවාවන්
ප්‍රාදේශීය මධ්‍යස්ථාන
ත්‍යාගයන්, ඇගයීම්, ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම්
තේ ප ආ වතු
- ශාන්ත කූම්බ්ස්
- ශාන්ත ජෝකිම්

පරිපාලන සහ මුල්‍ය
- මානව සම්පත් සංවර්ධනය සහ කාර්ය මණ්ඩලය සවි බල ගැන්වීම
- යටිතල පහසුකම් සංවර්ධනය සහ පවත්වාගෙන යාම

මුල්‍ය කාර්යසාධනය
විගණකාධිපති වාර්ථාව

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

තේ කර්මාන්තයේ උන්නතිය උදෙසා පර්යේෂණ ප්‍රතිඵල නිසි ලෙස භාවිතා කිරීමේ අරමුණින් 1925 දී ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය පිහිටුවන ලදී. වැවිලිකරුවන්ගේ සංගමයේ ශාඛාවක් ලෙස ඇරඹුණු ද ක්‍රමික වෙනස්කම් වලට භාජනය වුණු තේ පර්යේෂණ ආයතනය මේ වන විට ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය යටතේ රාජ්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.

### ආයතනික දැක්ම

තේ පර්යේෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ටතමයා වෙමින්, ශ්‍රී ලංකා තේ නාමය තරඟකාරී මිලක් ද ලබමින් ලොව ප්‍රමුඛතම තේ නිෂ්පාදන බවට පත් කිරීම උදෙසා වන තාක්ෂණ උපදෙස් ලබා දීමයි

### මෙහෙවර ප්‍රකාශය

තේ නිෂ්පාදනයන්ගේ ඵලදායීතාව සහ ගුණාත්මකභාවය වඩාත් ලාභදායී ආකාරයෙන් ඉහල නැංවීම සඳහා යෝග්‍ය විද්‍යාත්මක දැනුම සහ තාක්ෂණය වැඩි දියුණු කිරීම, හඳුන්වාදීම සහ ව්‍යාප්ත කිරීම අපගේ ප්‍රධාන මෙහෙවර ලෙස සලකමු

# ආයතනික ව්‍යුහය



සභාපති තේ පර්යේෂණ මණ්ඩලය
අභ්‍යන්තර විගණන අංශය
පර්යේෂණ පිළිබද උපදේශක කමිටුව
උපදෙස්, ව්‍යාප්ති සහ තේ ප ආ වතු පිළිබද උපදේශක කමිටුව
විගණන හා කළමණාකරන කමිටුව
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි
අතිරේක අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (නිෂ්පාදන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ(තේ සැකසුම් තාක්ෂණ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)
ශෂ්‍ය විද්‍යා සහ ශාක කායික විද්‍යා අංශය
ශාක අභිජනන අංශය
පාංශු සහ ශාක පෝෂක අංශය
කීට විද්‍යා/වටපණු විද්‍යා අංශය
ශාක ව්‍යාධිවේද අංශය
තේ සැකසුම් තාක්ෂණ අංශය
ජෛව රසායන විද්‍යා අංශය
උපදෙස් හා ව්‍යාප්ති අංශය
ප්‍රාදේශිය මධ්‍යස්ථාන
පරිපාලන අංශය
මූල්‍ය අංශය
තේ ප ආ වතු
කෘෂි ආර්ථික විද්‍යා අංශය
ජෛවමිතික ඒකකය
ප්‍රකාශන ඒකකය
පුස්තකාලය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය

1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනත ප්‍රකාරව 1993 නොවැම්බර් මස 12 දින ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය පිහිටුවන ලදී. කැබිනට් මණ්ඩල අනුමැතිය සහිත 2006 අංක 43 දරන පනත මගින් 2007 වසරේදී තේ පර්යේෂණ මණ්ඩල පනත සංශෝධනය කරන ලදී.

තේ වගාව සහ නිෂ්පාදනය ආශ්‍රිත පර්යේෂණ වල නියැලීම සහ දිරිමත් කිරීම, පහසුකම් සැපයීම සහ සහයෝගය ලබා දීම ආදී කටයුතු වල නියැලීම තේ පර්යේෂණ මණ්ඩලයේ මූලික කාර්යභාරයන් වේ.

**තේ පර්යේෂණ මණ්ඩලයේ කාර්යභාරය**

- තේ වගාවේ රෝග සහ පළිබෝධ වැලැක්වීම සහ මර්දනය, නිමි තේ වල ගුණාත්මකභාවය ඉහල නැංවීම, නිෂ්පාදන විවිධාංගීකරණය ආදී තේ වගාව සහ නිෂ්පාදනය සඳහා බලපෑ හැකි සියළු ගැටළු සහ අවස්ථා පිළිබඳ පර්යේෂණ මෙහෙයවීම, සහයෝගය ලබාදීම සහ දිරිමත් කිරීම මෙන්ම එම පර්යේෂණ ප්‍රතිඵල නිසි ලෙස බෙදාහැරීම සහ ප්‍රකාශයට පත් කිරීම
- තේ කර්මාන්තයේ ආර්ථික ශක්‍යතාවන් සහ ගැටළු සම්බන්ධයෙන් මෙන්ම අනාගත ප්‍රවණතා පිළිබඳ පර්යේෂණ මෙහෙයවීම, සහයෝගය ලබා දීම සහ දිරිමත් කිරීම
- ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හි පර්යේෂණ ආයතන සමග සබඳතා ගොඩනගා ගැනීම සහ පවත්වාගෙන යාම
- ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පර්යේෂණ ආයතන සමග සහයෝගී පර්යේෂණ, අධ්‍යයන, සම්මන්ත්‍රණ සහ සමුළු ආදිය පැවැත්වීම

ඉදිරි පෙළ: එන් පද්මසිරි කාරියවසම් මහතා, අයි එස් බී අබේසිංහ මහතා (අධ්‍යක්ෂ.තේ.ප.ආ) ආචාර්ය එස් එස් බී පී ජයවර්ධන මහතා(සභාපති.තේ.ප.ම) පී එල් යූ දිසානායක මහතා. ජේ එම් බී ජේ බන්ඩාර මහතා
පසු පෙළ: ආචාර්ය එම් ටී කේ ගුණසේකර මිය(කැඳවුම්කරු ලේකම්).ආචාර්ය ඩී එස් ඒ සමරවීර මහතා, ප්‍රසන්න ප්‍රනාන්දු මහතා ආචාර්ය ඩී වී සිවරත්නම් මහතා,ලෙනාඩ් ජයසිංහ මහතා.

## තේ පර්යේෂණ මණ්ඩල සාමාජිකයන්

**ආචාර්ය එස් එස් බී ඩී ජී ජයවර්ධන**
සභාපති
තේ පර්යේෂණ මණ්ඩලය

**ආචාර්ය අයි එස් බී අබේසිංහ**
අධ්‍යක්ෂ, තේ පර්යේෂණ ආයතනය

**ප්‍රසන්න ප්‍රනාන්දු මහතා**
53, පී බී අල්විස් පෙරේරා මාවත
කටුබැද්ද, මොරටුව

**පී එල් යු දිසානායක මහතා**
අතිරේක ලේකම්
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
55/75, වොක්ස්හෝල් පටුමග, කොළඹ 02

**ආචාර්ය ඩී වී සීවරත්නම් මහතා**
ප්‍රධාන විධායක නිලධාරි
වටවල වැවිලි සමාගම
60, ධර්මපාල මාවත, කොළඹ 03

**එල් පී ජයසිංහ මහතා**
පෞද්ගලික තේ කම්හල් හිමියන්ගේ සංගමයේ නියෝජිත

**අජිත් අබේසේකර මහතා**
අධ්‍යක්ෂ
ජාතික අයවැය දෙපාර්තමේන්තුව, කොළඹ 01

**නොයෙල් පද්මසිරි කාරියවසම් මහතා**
සභාපති, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල

**ආචාර්ය ඩී එස් ඒ සමරවීර**
අංශ ප්‍රධානී - (මෙහෙයුම්), කුඩා තේ වතු කර්මාන්තශාලා සමාගම
පළමු මහල, මැකිනන්ස් ගොඩනැගිල්ල
අංක 4, ලේඩීන් බැස්ටියන් පාර, කොළඹ 01

**ජේ එම් බී ජේ බණ්ඩාර මහතා**
සභාපති
ශ්‍රී ලංකා කුඩා තේ වතු හිමියන්ගේ සමිති සම්මේලනය
01 කොටස, කැටන්දොල වත්ත, රත්නපුර

කැඳවුම්කරු /ලේකම්
ආචාර්ය එම් ටි කේ ගුණසේකර මිය, තේ පර්යේෂණ ආයතනය

# උපදේශක කමිටු

## පර්යේෂණ උපදේශක කමිටු සාමාජිකයන්

- ආචාර්ය ඩී එස් ඒ සමරවීර (කමිටු සභාපති)
  අංශ ප්‍රධානී - (මෙහෙයුම්), කුඩා තේ වතු කර්මාන්තශාලා සමාගම
  පළමු මහල, මැකිනන්ස් ගොඩනැගිල්ල
  අංක 4, ලේඩීන් බැස්ටියන් පාර, කොළඹ 01

- ආචාර්ය එස් එස් බී ඩී ජී ජයවර්ධන මහතා
  සභාපති, තේ පර්යේෂණ මණ්ඩලය

- ආචාර්ය අයි එස් බී අබේසිංහ මහතා
  අධ්‍යක්ෂ, තේ පර්යේෂණ ආයතනය, තලවකැලේ

- ආචාර්ය ඩී වී  සීවරත්නම් මහතා
  ප්‍රධාන විධායක නිලධාරි, වටවල වැවිලි සමාගම

- ආචාර්ය පී සිවපාලන් මහතා
  හිටපු අධ්‍යක්ෂ , ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

- මහාචාර්ය ඩබ් ඒ ජේ එම් ද කොස්තා මහතා
  භෝග විද්‍යා අංශය, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලයය

- මහාචාර්ය එච් පී එම් ගුණසේන මහතා
  සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය

- එන් බී එච් පිලපිටිය මහතා
  හිමිකරු, නව විතානකන්ද තේ කර්මාන්තශාලාව, කලවාන

- එම් බී සිරිල් මහතා
  නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සංවර්ධන), කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

- එස් කේ එල් ඔබේසේකර මහතා
  අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි, බලන්ගොඩ වැවිලි සමාගම සහ මැඩොල්සීමා වැවිලි සමාගම

- එල් පී ජයසිංහ මහතා
  පෞද්ගලික තේ කර්මාන්තශාලා හිමිකරුවන්ගේ සංගමයේ නියෝජිත

- පී එම් සමරසිංහ මහතා
  සාමාන්‍යාධිකාරි (නිෂ්පාදන), ඇග්‍රෝ ටෙක්නිකා සමාගම

- එෆ් ආර් අමරසිංහ මහතා
  ෆෝබ්ස් ඇන්ඩ් වෝකර් තේ බ්‍රෝකර්ස් පෞද්ගලික සමාගම

- ජී ඩී වී පෙරේරා මහතා
  අධ්‍යක්ෂ, සීමාසහිත ලංකෙම් තේ සහ රබර් වැවිලි පෞද්ගලික  සමාගම

- එල් ජේ පීරිස් මහතා
  කළමණාකරණ අධ්‍යක්ෂ, හේලික්ස් ඉංජිනියරින් පෞද්ගලික සමාගම

**කැඳවුම්කරු/ ලේකම්**

ආචාර්ය එල් එස් කේ හෙට්ටිආරච්චි මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (නිෂ්පාදන)

## වතු සහ උපදෙස් සේවා උපදේශක කමිටු සාමාජිකයන්

- ආචාර්ය ඩී වී සීවරත්නම් මහතා
  කමිටු සභාපති
  ප්‍රධාන විධායක නිලධාරි, වටවල වැවිලි සමාගම

- ආචාර්ය එස් එස් බී ඩී ජී ජයවර්ධන මහතා
  සභාපති, තේ පර්යේෂණ මණ්ඩලය

- ආචාර්ය අයි එස් බී අබේසිංහ මහතා
  අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

- ආචාර්ය එල් එස් කේ හෙට්ටිආරච්චි මහතා
  නියෝජ්‍ය අධ්‍යක්‍ෂ පර්යේෂණ (නිෂ්පාදන), ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

- ආචාර්ය ඩී එස් ඒ සමරවීර මහතා
  අංශ ප්‍රධානී - මෙහෙයුම්, කුඩා තේ වතු කර්මාන්තශාලා

- මහාචාර්ය ඩබ් ඒ ඩී පී වනිගසුන්දර මහතා
  අංශ ප්‍රධානි, කෘෂිකර්ම ව්‍යාප්ති අංශය
  පේරාදෙණිය විශ්වවිද්‍යාලයය, පේරාදෙණිය

- කේ ජී බී ඔබේසේකර මහතා
  සාමාන්‍යාධිකාරි
  කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

- ආර් කේ නතෑනියෙල් මහතා
  හිටපු අංශ ප්‍රධානි, උපදෙස් සහ ව්‍යාප්ති අංශය, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

- දයාන් මඩවල මහතා
  ප්‍රධාන විධායක නිලධාරි, හපුගස්තැන්න වැවිලි සමාගම

- එස් වීරසිංහ මහතා
  හිටපු අධ්‍යක්‍ෂ,(ව්‍යාප්ති) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

- ටී ඒ ජී ද මෙල් මහතා
  සාමාන්‍යාධිකාරී, බලංගොඩ වැවිලි සමාගම

  කැඳවුම්කරු/ලේකම්
  ආචාර්ය වී එස් සිධාකරන් මහතා
  ජ්‍යෙෂ්ඨ උපදෙස් නිලධාරි, උපදෙස් හා ව්‍යාප්ති අංශය, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

**විගණන සහ කළමනාකරණ කමිටු සාමාජිකයන්**

- අජිත් අබේසේකර මහතා
  කමිටු සභාපති,
  නියෝජ්‍ය අධ්‍යක්‍ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව

- ජේ එම් බී ජේ බණ්ඩාර මහතා
  සභාපති, ශ්‍රී ලංකා කුඩා තේ වතු හිමියන්ගේ සමිති සම්මේලනය

- පී එල් යු දිසානායක මහතා
  අතිරේක ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

- කැඳවුම්කරු / ලේකම්
  ආර් කාරියවසම් මහතා, අභ්‍යන්තර විගණක,ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය (2011 අගෝස්තු මස දක්වා)
  කේ ජේ සී ජේ රොද්‍රිගෝ මහතා නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (පරිපාලන), තේ පර්යේෂණ ආයතනය (2011 අගෝස්තු මස සිට)

## තේ පර්යේෂණ මණ්ඩල සභාපතිවරයාගේ වාර්තාව

2011 වසර සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව සහ විගණනය කල මූල්‍ය වාර්තාව තේ පර්යේෂණ මණ්ඩලය වෙනුවෙන් මම ඉතා සතුටින් ඉදිරිපත් කරමි.

2011 වසර තුලදී ජාතික තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 328.37 ක් ලෙස වාර්තා වූ අතර මෙය ඉහළම තේ නිෂ්පාදනය අගය ලෙස වාර්තා වූ 2010 වසරේ කිලෝග්‍රෑම් මිලියන 329 ට වඩා සුළු අඩුවීමක් පෙන්නුම් කරයි. මුළු නිෂ්පාදන ප්‍රමාණයෙන් කිලෝග්‍රෑම් මිලියන 230 ක් එනම් මුළු නිෂ්පාදනයෙන් 70% ක් කුඩා තේ වතු ක්ෂේත්‍රයෙන් වාර්තා වූ අතර ඉතිරි කිලෝග්‍රෑම් මිලියන 98.47 ප්‍රාදේශීය වැවිලි සමාගම් (RPC) විස්ස යටතේ ඇති වතු 307, ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB), ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (SLSPC) සහ ඇල්කඩුව වැවිලි සමාගම යටතේ ඇති වතු මගින් නිපද වූ බව වාර්තා වේ. 2011 වසරේ සමාගම් වැවිලි ක්ෂේත්‍රයේ සහ කුඩා තේ වතු අංශයේ ඇස්තමේන්තු කල සාමාන්‍ය අස්වැන්න (නිෂ්පාදකතාවය) පිළිවෙලින් වසරකට හෙක්ටයාරයකට නිමි තේ කිලෝග්‍රෑම් 1,280 ක් සහ වසරකට හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1,970 ක් විය. මෙයින් පැහැදිලි වන්නේ අපගේ නිෂ්පාදකතාවය අපගේ ප්‍රධාන තරගකාරී රටවල් වන කෙන්යාව සහ ඉන්දියාවට වඩා සාපේක්ෂව අඩු බවයි. කම්කරු ශ්‍රමය, බලශක්තිය සහ පොහොර වැනි පිරිවැය සාධක තේ කර්මාන්තයේ කළමණාකරුවන්ගේ පාලනයෙන් පරිබාහිර දේශීය සහ අන්තර්ජාතික සමාජ ආර්ථික මානයන් හා බැඳී පවතින නිසා තේ වගාවන්හි අඩු නිෂ්පාදකතාවය තේ කර්මාන්තයට මෙන් ම තේ පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින්ටද විශාල අභියෝගයක් ව පවතී. 2011 වසර තේ කර්මාන්තයේ නියැලෙන්නන්ට විශාල අභියෝගකාරී වසරක් වූයේ කම්කරු කුලිය විශාල වශයෙන් ඉහළ යාම සහ අනෙකුත් යෙදවුම් පිරිවැය ඉහළ යාම නිසා නිෂ්පාදන පිරිවැය අධික ලෙස ඉහළ යාම නිසා ය.

තේ කර්මාන්තය තුල පැන නැගුණු නිෂ්පාදන වියදම අඩු කිරීම, පොහොර කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා තේ නිෂ්පාදන ක්‍රියාවලියේදී බලශක්ති පරිභෝජනය අඩු කිරීම වැනි අර්බුදකාරී අවස්ථාවනට මුහුණ දීම සඳහා තේ කර්මාන්තයේ නියැලෙන කුඩා තේ වතු හිමියන්, වැවිලිකරුවන්ගේ සංගමය මගින් සියළු සමාගම් වතු අංශයන්, පුද්ගලික තේ කර්මාන්තශාලා හිමිකරුවන් හා එක්ව සම්මන්ත්‍රණ, රැස්වීම්, සාකච්ඡා හරහා ක්ෂණිකව පිළිතුරු සෙවීමට තේ පර්යේෂණ ආයතනයේ අන්‍යෝන්‍ය සහයෝගි යාන්ත්‍රණයට හැකියාව ලැබුණි.

ආචාර්ය එස් එස් බී ඩී ජී
B Sc Agric.(Ceylon)
M Sc(Kyoto,Japan)
PhD (Kyoto,Japan)

පුද්ගලික අංශය හා විශ්වවිද්‍යාල සහභාගි කර ගනිමන් දළු නෙළීම යාන්ත්‍රිකරණය කිරීම සඳහා යෝග්‍ය යන්ත්‍ර සංවර්ධනය කිරීම කේන්ද්‍ර කරගත් යාන්ත්‍රිකරණ වැඩසටහනක් දෙසට තේ පර්යේෂණ ආයතනය යොමු කිරීමට තේ පර්යේෂණ මණ්ඩලයට හැකි විය.

ජාතික තේ නිෂ්පාදනයට කුඩා තේ වතු ක්ෂේත්‍රයේ දායකත්වය හා රජයේ පොහොර සහනාධාර වැඩපිළිවෙලේ වටිනාකම වටහා ගනිමින් වඩා සුදුසු පොහොර මිශ්‍රණයක් භාවිතය සහ නිර්දේශිත තේ ප්‍රභේදයන්ගේ නිරෝගී රෝපණ ද්‍රව්‍ය භාවිතා කිරීම ඇගයීම සඳහා අනුවර්තී පර්යේෂණ වැඩසටහන් කෙරෙහි මූලිකත්වය දීම තේ පර්යේෂණ ආයතනය විසින් තවදුරටත් කරගෙන යනු ලැබීය.

බාහිර විද්‍යාඥයින්ගේ සහභාගිත්වය ඇතුව පර්යේෂණ වැඩසටහන් බාහිර පාර්ශවයන්ගේ සමාලෝචනයට ලක් කිරීමේ වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳ තේ පර්යේෂණ මණ්ඩලය විසින් වඩාත් සමීප ලෙස අධීක්ෂණය කරනු ලැබීය. අවශ්‍යතාවයන්ට අනුකූල පර්යේෂණ සිදු කිරීම සහ පර්යේෂණයන්ගේ ප්‍රතිඵල තේ කර්මාන්තයේ අවශ්‍යතාවයන්ට අදාල වේ දැ යි සහතික වීම පිණිස තේ පර්යේෂණ මණ්ඩලය විසින් ආයතනයේ පර්යේෂණ අංශයන්හි වැඩසටහන් නිරන්තර ඇගයීම්වලට භාජනය කරනු ලැබීය. තේ පර්යේෂණ ආයතනය මඟින් නිපදවා වගාකරුවන්ගේ භාවිතය සඳහා නිර්දේශිත තාක්ෂණයන් වගාකරුවන්ගේ පිළිගැනීමට භාජනය වේ දැ යි වටහා ගැනීම සඳහා තුන් මසකට වරක් පවත්වනු ලබන පර්යේෂණ උපදේශන කමිටුව වඩා කාර්යක්ෂම යාන්ත්‍රණයක් බවට පත් වී ඇත.

එමෙන්ම තුන් මසකට වරක් පවත්වනු ලබන උපදේශන සේවා සහ වතු උපදේශක කමිටුව තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් හා ව්‍යාප්ති වැඩසටහන් කොපමණ දුරට වගාකරුවන්ගේ අවශ්‍යතාවයන් ඉටු කිරීම වෙනුවෙන් කැප වී ඇත් දැ යි සොයා බැලීම සිදු කරයි. තේ පර්යේෂණ ආයතනය සතු ශාන්ත කුම්බස් හා ශාන්ත ජෝකිම් වතුයායන් වඩාත් කාර්යක්ෂම හා ලාභදායි ලෙස පවත්වාගෙන යෑම සහ ඒවායේ කාර්යසාධනය පිළිබඳ මෙම කමිටුව විසින් නිරන්තරව අධීක්ෂණය කරනු ලබයි.

කුඩා තේ වතු ක්ෂේත්‍රය සඳහා වඩා හොඳ සේවාවක් ඉටු කරනු වස් පුහුණු සහ නිපුනතා සංවර්ධන අවශ්‍යතා හඳුනාගැනීමට සහ තාක්ෂණ වුවමාරු

වැඩසටහන් පිළිබඳ සාකච්ඡා කිරීම සහ සමාලෝචනය කිරීම පිණිස තේ පර්යේෂණ ආයතනය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමඟ සම්බන්ධීකරණ රැස්වීම් රැසක් පවත්වනු ලැබීය. විවිධ ප්‍රදේශයන් හි නිරතුරුව පවත්වනු ලැබූ ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු තුලින් ඒ ඒ ප්‍රදේශයන්ට සුවිශේෂී වූ තේ කර්මාන්තයට අදාල ගැටළු හදුනාගැනීමට හැකි වූ අතර මෙම අවස්ථාවන් වැවිලි කළමණාකරුවන්ට තේ පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින් සමඟ සමීප හා සක්‍රීය සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට ද මහෝපකාරී විය.
ප්‍රදේශයේ 38,184 ක් වූ කුඩා තේ වතු හිමියන් සහ 69 ක් වූ මධ්‍යම ප්‍රමාණයේ පුද්ගලික තේ ඉඩම් හිමියන් සඳහා තේ තවාන් පාලනය හා ශාක ප්‍රචාරණය මූලික කරගත් තේ වගා සායන වැඩසටහනක් සාර්ථක ලෙස පැවැත්වීමට අභිනවයෙන් පිහිට වූ මතුගම උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ කාර්ය මංඩලයට හැකි විය. මෙම ප්‍රදේශයේ ග්‍රාමීය ආර්ථිකයට සහ ගැමි ජනතාවගේ ජීවන තත්ත්වයට කුඩා තේ වතු ක්ෂේත්‍රයෙන් සිදුවන ඉහළ දායකත්වය නිසා මෙම වැඩසටහන් සංවිධානය සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම්තුමා සහ ප්‍රාදේශීය ලේකම්වරුන් දැක්වූ උනන්දුව සහ ක්‍රියාකාරී දායකත්වය අපව ඉතාමත් දිරිමත් කරවන්නක් විය.

2011 වසර තුලදී තලවකැලේ තේ පර්යේෂණ ආයතනය තුල පැවැත්වූ පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදයන් (E & E) හි තේමාවන් වූයේ වර්තමාන ලෝක තේ වෙළෙඳපොලෙහි අවශ්‍යතාවයන් තෘප්තිමත් කිරීම ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය මුහුණ දෙන අභියෝග” සහ මනා ලෙස භූමිය කළමණාකරනය තුලින් නිෂ්පාදකතාවය පහළ වැටීමට පිළියම් සෙවීම යනාදියයි. තේ කර්මාන්තය හා සම්බන්ධ ප්‍රධාන විධායක නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ වතු කළමණාකරුවන්, ශ්‍රී ලංකා පුද්ගලික තේ කර්මාන්තශාලා හිමිකරුවන්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනයේ නිලධාරීන් අතර පර්යේෂණ හා ව්‍යාප්ති සංසදයන් ඉතාමත් ජනප්‍රිය අංගයක් ලෙස පවත්වාගෙන යාමට තේ පර්යේෂණ ආයතනය සමත් වී ඇත. 2011 වසර තුලදී සිංහල මාධ්‍යයෙන් රත්නපුර මධ්‍යස්ථානයේදී දෙවතාවක් පැවැත් වූ පර්යේෂණ හා ව්‍යාප්ති සංසද තුලින් කුඩා තේ වතු හිමියන් සඳහා කාලීන වැදගත්කමින් යුත් මාතෘකා වන කුඩා තේ ඉඩම්වල ලාභදායි බව ඉහළ නංවාගැනීම, පාංශු ස්වාරක්ෂක ධාරිතාව පිළිබඳ අවබෝධ කර ගැනීම සහ කුඩා තේ වතු හිමියන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා භෝග විවිධාංගීකරණයේ වැදගත්කම වැනි මාතෘකා සාකච්ඡාවට භාජනය කෙරිණි.

කුඩා තේ වතු හිමියන්ගේ තාක්ෂණික තොරතුරු අවශ්‍යතාවය ඉටු කරනු වස් නිරන්තරයෙන් ප්‍රාදේශීය මට්ටමින් පැවැත් වූ පර්යේෂණ හා ව්‍යාප්ති සංසද, ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසද හා වගාසායන වැනි වැඩසටහන් තුලදී තේ වගාකරුවන්ට සහ ව්‍යාප්ති නිලධාරීන්ට ආයතනයේ විද්‍යාඥයින් හා වඩාත් සමීප හා මිත්‍රශීලි වාතාවරණයක් තුල හමුවීමට ඉඩකඩ සැලසුනි.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමඟ විවිධ අන්‍යෝන්‍ය සහයෝගී යාන්ත්‍රණයන් තුලින් කුඩා තේ වතු හිමියන්ගේ තාක්ෂණික තොරතුරු අවශ්‍යතාවය ඉටුකිරීම සඳහා සමාගම් වතු ක්ෂේත්‍රයේ උපදේශක සේවා සැපයීම සඳහා රත්නපුර පිහිටි පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය මඟින් විශාල කාර්යභාරයක් ඉටු කරනු ලැබීය. දෙනියාය, ගාල්ල සහ ඌව ප්‍රදේශයන්හි කුඩා තේ වතු හිමියන්ගේ ව්‍යාප්ති අවශ්‍යතා දෙනියාය, කොට්ටව සහ ඌව උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය විසින් පවත්වනු ලැබූ ඉතාමත් කාර්යක්ෂම ක්ෂේත්‍ර වැඩසටහන් මඟින් ඉටු කරනු ලැබීය. හන්තාන පිහිටි මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින්

ශාක අභිජනන, ශාක ආරක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන වැඩකටයුතු වලට සහ ප්‍රදේශයේ වැවිලි සමාගම් ක්ෂේත්‍රයට, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි ක්ෂේත්‍රයට, ජනතා වතු සංවර්ධන මණ්ඩල ක්ෂේත්‍රයට හා කුඩා තේ වතු ක්ෂේත්‍රයන්ට තාක්ෂණ දැනුම බෙදාහැරීම සඳහා මුල්තැන දෙමින් ඉටු කල භූමිකාව තවදුරටත් ශක්තිමත් ලෙස කරගෙන යනු ලබයි. ශාක අභිජනන අංශය මගින් සංවර්ධනය කල නව තේ ප්‍රභේද වඩාත් පුළුල් ලෙස වගාකරුවන් අතර ප්‍රචලිත කිරීම සඳහා තේ පර්යේෂණ ආයතනය මව් වගා ව්‍යාප්තිය සහ තවාන් සහතික කිරීමේ වැඩසටහනක් සමායෝජනය කිරීමේ වැඩකටයුතු මැදරට මධ්‍යස්ථානය මගින් ඉදිරියටත් කරගනු යනු ලැබීය.
උපදෙස් හා ව්‍යාප්ති අංශය මගින් සංවිධානය කරනු ලැබූ සම්මන්ත්‍රණ තුලදී වැවිලි ක්ෂේත්‍රයේ කළමණාකරුවන්ට ඔවුන් සතු අත්දැකීම් තේ පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින් සමග බෙදාහදා ගැනීමට අවස්ථාවක් සලස්වා දීමේ නව වැඩසටහනක ඇරඹුමක් 2011 වසරේදී සනිටුහන් විය. තේ පර්යේෂණ ආයතනය විද්‍යාඥයින් වෙත වැදගත් ප්‍රතිපෝෂණයන් සැපයීමට අමතරව තේ පර්යේෂණ ආයතනය හඳුන්වා දුන් තාක්ෂණයන් වඩාත් පිළිගැනීමට ලක් කිරීම සඳහා වගාකරුවන්ගේ සාර්ථකත්ව අත්දැකීම් මනා පිටිවහලක් වන බව මෙම උපායමාර්ගයේදී දක්නට හැකි විය.

මෙම වසරෙහි ද උපදෙස් හා ව්‍යාප්ති අංශය විසින් ප්‍රධාන වශයෙන් සමාගම් ක්ෂේත්‍රයේ තේ වතුයායන් සහ කුඩා තේ ඉඩම් හි සුවිශේෂ වූ ගැටළු නිරාකරණය සඳහා ක්ෂේත්‍ර චාරිකා රැසක් සිදු කරනු ලැබීය. තේ වගාකරුවන්ගේ පුහුණු හා තාක්ෂණික දැනුම් සපයනු වස් ආයතනයේ අනෙකුත් පර්යේෂණ අංශ හා එක්ව සම්මන්ත්‍රණ, දේශන, ක්ෂේත්‍ර වැඩමුළු හා පුහුණු වැඩමුළු ආදි වැඩසටහන් 516 ක් පැවැත් වූ අතර මෙහිදි මෙම වැඩසටහන් විවිධ විෂය ක්ෂේත්‍රයන් අතර මනා සම්බන්ධිකරණයෙන් පැවැත්වීම කැපී පෙනෙන ලක්ෂණයකි. නිවැරදි තවාන් කළමණාකරනයේ සහ නිරෝගී රෝපණ ද්‍රව්‍ය නිපදවීම සහ ප්‍රවරධනය කිරීමේ කාර්යයේදී රාජ්‍ය හා පුද්ගලික අංශයන්ගේ සහභාගිත්වය ශක්තිමත් කිරීම සඳහා උපදෙස් හා ව්‍යාප්ති අංශය ප්‍රධාන කාර්යභාරයක් ඉටුකල බව මෙහි ලා විශේෂයෙන් සඳහන් කලයුතුය.

2005 සිට 2008 දක්වා කාලයක් තුල විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සඳහන් කරුණු විභාග කිරීම සඳහා 2011 අප්‍රේල් මාසයේ දි තේ පර්යේෂණ මණ්ඩලය පෙනීසිටි අතර මෙහිදි ආයතනය විසින් නිවැරදි පරිපාලන කටයුතු සහ නිවැරදි මූල්‍ය කළමණාකරණ උපායමාර්ගයන් අනුගමනය කරන බැව් හොඳින් සනාථ කිරීමට තේ පර්යේෂණ මණ්ඩලයට හැකි විය. මූල්‍ය කළමණාකරණයට සහ පරිපාලන කටයුතු හා අදාල රජයේ චක්‍රලේඛ සහ අනෙකුත් උපදෙස් නිවැරදි ආකාරයට සහ ඉහළ වගකීමකින් යුතුව අනුගමනය කිරීම සහතික කරනු වස් තේ පර්යේෂණ මණ්ඩලය විසින් ආයතනයේ කටයුතු නිරන්තරව නිරීක්ෂණය කරනු ලැබීය.

ආයතනය සම්බන්ධ විගණන කමිටු වාර්තා සහ විගණකාධිපති වාර්තා පිළිබඳ තේ පර්යේෂණ මණ්ඩලය විසින් නිරන්තරව සමීප නිරීක්ෂණයක යෙදුනු අතර එම කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආයතනයට උපදෙස් දෙනු ලැබීය. නිරන්තර සාකච්ඡා, සමාලෝචන රැස්වීම් හා අමාත්‍යාංශ නියෝග මගින් රජයේ ආර්ථික සංවර්ධන ඉලක්ක සහ ආයතනික සැලසුමෙහි අරමුණු සහ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් තේ පර්යේෂණ මණ්ඩලයට සහ තේ පර්යේෂණ ආයතනයට නිසි මග පෙන්වීමක් සිදු කරනු ලැබීය.

ආයතනයේ අරමුණු කරා ළඟා වීම සඳහා ආයතනයේ පර්යේෂණ, උපකාරක සේවා සහ පරිපාලන කාර්යය මණ්ඩලය දැක්වූ ඉහළ කැපවීම අගය කිරීමටත් ඒ සඳහා කෘතඥතාවය පලකිරීමටත් මම මෙය අවස්ථාවක් කරගනිමි.

ගරු ඇමතිතුමා, අමාත්‍යාංශ ලේකම්තුමිය සහ කාර්යය මණ්ඩලය මඟින් ලැබුණු උපදෙස්, මගපෙන්වීම සහ පහසුකම් ඉතාමත් ප්‍රශංසනීය යි.

තේ පර්යේෂණ ආයතනය වෙනුවෙන් තේ පර්යේෂණ මණඩලයේ සභාපති ලෙස මා වෙත මණ්ඩලයේ සාමාජිකයින්ගෙන් ලැබුණු ඉහළ කැපවීම, සහයෝගය සහ මගපෙන්වීම ද මා ඉතාමත් ඉහළින් අගය කරමි.

**ආචාර්ය එස් එස් බී ඩී ජී ජයවර්ධන**
**සභාපති**
**තේ පර්යේෂණ මණ්ඩලය**

# තේ පර්යේෂණ ආයතන අධ්‍යක්ෂවරයාගේ වාර්තාව

**පොදු කරුණු:**

යාවත්කාලීන කල තේ පර්යේෂණ ආයතන වෙබ් අඩවිය 2011 ජූලි මස ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා අතින් එළි දැක්විය.

අතිගරු ජනාධිපතිතුමාගේ 65 වන උපන් දිනය සහ දෙවන පදවි ප්‍රාප්තිය සමරණු වස්, දිවයින පුරා පැල මිලියන 1.1 ක් සිටුවීම අරමුණු කර ගනිමින් පරිසර අමාත්‍යාංශය මඟින් දියත් කල දැයට සෙවණ ජාතික රුක් රෝපන වැඩ සටහන යටතේ නොවැම්බර් 15 වන දින ආයතනය තුල පැල සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක විය.

සම්බුද්ධ ජයන්තිය සැමරීම සඳහා ආයතනය විසින් මැයි 11 සහ 12 යන දෙදින තුල පරිත්‍රාණ ධර්මදේශනයක් සහ දානමය පුණ්‍යකර්මයන් සංවිධානය කරනු ලැබීය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තේ පර්යේෂණ ආයතනය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව තේ මණ්ඩලයේ විද්‍යාගාරයේ තාක්ෂණික කටයුතු නොවැම්බර් මාසයේදී තේ පර්යේෂණ ආයතනය වෙත භාරදෙනු ලැබීය.

SLSI SLTB නිෂ්පාදන සහ ක්‍රියාවලි ප්‍රමිතිකරණ වැඩපිළිවෙලක් සහ හැකියා ප්‍රවර්ධන/පුහුණු වැඩසටහන් හඳුන්වාදීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයට මූල්‍යමය සහයෝගී වැඩපිළිවෙලක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් පත්කල තේ පිළිබඳ ජාතික කමිටුව මඟින් නිර්දේශ කරණු ලැබීය.

**පර්යේෂණ උපදෙස් හා ව්‍යාප්ති කටයුතු**

2013 - 2017 ආයතනික සැලැස්ම පිළියෙල කිරීම පහසු කරවනුවස් දැනට ක්‍රියාත්මක වන (2008-2012) ආයතනික සැලැස්මේ ප්‍රගතිය පූර්ණ ලෙස සමාලෝචනය කරනු ලැබීය.

**විශේෂ පර්යේෂණ කඩඉම්:**

TRI 5000 ශ්‍රේණියේ ඉදිරියේදී නිකුත් කිරීමට නියමිත නව තේ ප්‍රභේද ශ්‍රේණිය: වගාකරුවන්ගේ සහයෝගීතාවය ඇතිව TRI 5000 ශ්‍රේණියේ සාර්ථක තේ

ප්‍රභේද යොදාගනිමින් ක්ෂේත්‍ර 19 ක අනුවර්තී පර්යේෂණ සිදු කරගෙන යනු ලැබේ. විවිධ කෘෂි පාරිසරික කලාප නියෝජනය කරමින් තෝරාගත් සමාගම් වතු 4ක නව අත්හදා බැලීම් 4 ක් ස්ථාපණය කරණු ලැබ ඇත. WU2a කෘෂි දේශගුණික කලාපය තුල පර්යේෂණයට භාජනය කල නව ප්‍රභේද පහක් ඒවා සමඟ  පාලකය ලෙස භාවිතා කල ජනප්‍රිය ප්‍රභේද 2 ක් වන TRI 2025 හා DTI ප්‍රභේදයන්ට වඩා වැඩි අස්වැන්නක් ලබාදෙන බව පර්යේෂණ දත්ත අනාවරණය කර ඇත. එම උසස් අස්වනු ප්‍රභේද අතරින් එක් ප්‍රභේදයක් DTI හා සමානවම උසස් ගුණාත්මයේ තේ නිපදවීමට හැකි බව ද පෙන්වා ඇත.

ආචාර්ය අයි සරත් බී අබේසි
B.Sc(peradeniya.Sri Lar
PhD (Sheffied.UK)

**TRI 3000 හා TRI 4000 ශ්‍රේණිවල තේ ප්‍රභේද පිළිබඳ වගාකරුවන්ගේ සංජානනය:**

මෑතකදි නිකුත්කල නව තේ ප්‍රභේදයන්ගේ ප්‍රගතිය පිළිබඳ වගාකරුවන්ගේ සංජානනය ඇගයීම සඳහා උපදෙස් හා ව්‍යාප්ති අංශයේ සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහභාගිත්වය ඇතිව මුළු දිවයිනම ආවරණය වන සමීක්ෂණයක් ආරම්භ කරණු ලැබීය. දෙණියාය සහ ඌව (බණ්ඩාරවෙල, බදුල්ල හා පස්සර) ප්‍රදේශයන් තුල සමීක්ෂණයේ ප්‍රතිඵල පෙන්වා දී ඇත්තේ එම ප්‍රදේශවල ගොවීන් තුල TRI 3000 හා TRI 4000 ශ්‍රේණිවල තේ ප්‍රභේදයන්ගේ ගතිගුණ පිළිබඳ යහපත් සංජානනයන් (දෙණියාය 77% සහ ඌව 100%) ඇති බව සහ ඉදිරියටත් එම තේ ප්‍රභේද වගා කිරීම සඳහා ඔවුන් කැමැත්තක් දක්වන බවයි. මෙම සමීක්ෂණය දැනට මහනුවර ප්‍රදේශයේ සිදුකරමින් පවති.

**තේ ජානප්ලාස්මයන්ගේ ජෛව රසායනික අනුලක්ෂණකරණය සහ පරිවෘත්තීය පැතිකඩ**

තේ ප්‍රභේද වර්ග 35 කින් නිපදවූ හරිත තේ සහ කළු තේ වල ජෛව රසායන පරාමිතීන් භාවිතයෙන් එම තේ ප්‍රභේද වර්ග ඒවායේ ජෛව රසායනික විවිධත්වය අනුව වෙන් වෙන් කාණ්ඩවලට වෙන් කල හැකි බව හෙලි වී ඇත. විවිධ තේ ප්‍රභේදයන්ගේ දක්නට ලැබුණු කැපේන් සංයුතියේ පුළුල් විචලත්වය ඒවා ඉදිරි අභිජනන කටයුතු සඳහා යොදාගැනීමට ඇති හැකියාව පිළිබඳ ඉඟියක් පෙන්වයි. තේ ජානප්ලාස්මයන් ඉදිරි තේ අභිජනන සහ භෝග වැඩි දියුණු කිරීමේ වැඩසටහන් හිදී භාවිතා කරගැනීම අරමුණු කරගනිමින් ජාතික පර්යේෂණ සභාවේ මූල්‍ය අනුග්‍රහය මත ශ්‍රී ලංකාවේ තේ ජානප්ලාස්මයන්ගේ

පරිවෘත්තීය පැතිකඩ හඳුනාගැනීමේ නව ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබීය.

**ආන්තික තේ වගා ප්‍රදේශ සඳහා විකල්ප රෝපණ ද්‍රව්‍යය ලෙස වැඩි දියුණු කල බීජ භාවිතා කිරීම**

ආන්තික තේ ඉඩම් සඳහා යෝග්‍ය විකල්ප රෝපණ ද්‍රව්‍ය පිළිබඳ තේ වගාකරුවන් අතර උනන්දුවක් ඇතිවීම සමගම වැඩි දියුණු කල තේ බීජ සඳහා ඇති ඉල්ලුම ඉහළ යමින් පවතී. බීජ ඵල දරණ වකවානුවලදී බීජ ලබාගැනීම පහසු කරවනු පිණිස බාහිර තේ බීජ උද්‍යාන සමඟ තේ වගාකරුවන් සම්බන්ධීකරණය කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කරනු ලැබීය.

**යාන්ත්‍රික දළු නෙළීම සඳහා යෝග්‍ය තේ දල්ලේ ලක්ෂණ හඳුනාගැනීම**

විවිධ තේ ප්‍රභේදයන්ගේ දළුවල ඇති යාන්ත්‍රික දළු නෙළීම සඳහා යෝග්‍ය ලක්ෂණ හඳුනාගැනීමේ අධ්‍යයනයන් සිදු කරනු ලැබීය. නටුව කෙටිවීම සහ පත්‍ර වඩා පැතිරෙන ආකාරයකින් නටුවට සවි වී තිබීම අස්වැන්න අඩු වීම සඳහා ධනාත්මක සම්බන්ධයක් පෙන්වන අතර පඳුරේ දළු ඝණත්වය ඍණාත්මක සම්බන්ධතාවයක් පෙන්වීය. යාන්ත්‍රිකව දළු නෙළූ විට කැපුනු පත්‍ර ප්‍රමාණය සහ නටු ප්‍රමාණය වැඩිවීම සඳහා පත්‍රයේ දිග ධනාත්මක සම්බන්ධතාවයක් පෙන් වූ අතර පත්‍ර තලය වක්‍ර වී තිබීම සමඟ ඍණාත්මක සම්බන්ධතාවයක් පෙන්වීය.

**විවිධ තේ දර්ශ, තේ ප්‍රභේද සහ බීජ තේ වගාවන් ප්‍රධාන තේ පළිබෝධයන්ට දක්වන ප්‍රතිචාර හඳුනාගැනීම:**

පහතරට, මැදරට සහ උඩරට ප්‍රදේශයන් සඳහා විවිධ තේ දර්ශ, තේ ප්‍රභේද සහ බීජ තේ වගාවන් කෙරෙහි ප්‍රධාන පළිබෝධයන් දක්වන බලපෑම ශාක අභිජනකයන් විසින් හඳුනාගනු ලැබ ඇත. මෙම අධ්‍යයනයේදී විවිධ ප්‍රදේශයන්හි ඇති තෝරාගත් තේ දර්ශ 82 ක්, තේ ප්‍රභේද සහ බීජ වගාවන් ප්‍රැටිලෙන්චස් ලූසායි, රැඩොෆොලස් සිමිලිස්, කඳගුල්ලාගේ හානිය සහ පහතරට සජීවී දැව වේයාගේ හානියට දක්වන ප්‍රතිරෝධීතාවය සහ/හෝ දරාගැනීමේ හැකියාව පිළිබඳ සම්මත ක්‍රමවේදයන්ට අනුව අධ්‍යයනය කරනු ලැබීය.

**ජල කළමණාකරණ තාක්ෂණයන් වැඩි දියුණු කිරීම**

බිඳිති සහ විසිරි ජල සම්පාදන ක්‍රම සම්බන්ධ ක්ෂේත්‍ර පර්යේෂණයන් 2011 වසරේදී අවසන් කල අතර ඒවා මඟින් සොයාගත් වැදගත් තොරතුරු පහත දැක්වේ,

**බිඳිති ජල සම්පාදනය**

වෙනස් ලක්ෂණයන් සහිත තේ ප්‍රභේද 02 ක් වන TRI 2023 හා TRI 3025 ප්‍රභේද බිඳිති ජල සම්පාදනයට දක්වන ප්‍රතිචාර පිළිබඳ ඇගයීමක් කරනු ලැබීය. සාමාන්‍ය වර්ෂා ජලයෙන් වගාකිරීම හා සංසන්දනය කිරීමේදී බිඳිති ජල සම්පාදනය මඟින් වියළි කාලගුණයන් ඇති කාලවලදී අස්වැන්න 2.6 - 2.8 ගුණයකින් ඉහළ නංවන අතර වාර්ෂික අස්වැන්න 20%කින් වැඩි කරන බව පෙන්වීය. විවිධ තේ ප්‍රභේද බිඳිති ජල සම්පාදනයට දක්වන ප්‍රතිචාරයේ විවිධත්වය පෙන්නුම් කරමින් TRI 2023 TRI 3025 ට

වඩා වැඩි අස්වනු ප්‍රතිචාරයක් පෙන්වූ අතර, කඳ පිළිකා තත්ත්වයන් ඇතිවීම 80%කින් පහළ දැමීය. මෙම ප්‍රතිඵල විදහා දක්වන්නේ බිඳිති ජල සම්පාදනය වැඩි අස්වනු තේ ප්‍රභේද සඳහා වඩා හොඳ ශක්‍යතාවයක් පෙන්වන බවයි.

**බිඳිති සහ විසිරි ජල සම්පාදනය**

TRI 2023 තේ ප්‍රභේදය විසිරි ජල සම්පාදනය යටතේදී බිඳිති ජල සම්පාදනයට වඩා 6% ක වැඩි අස්වැන්නක් වාර්තා කල අතර වියළි මාසවලදී පත්‍රතුල කායික ක්‍රියාවලීන් ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාමට පහසු කරවීම සඳහා විසිරි ජල සම්පාදනයේදී පත්‍රයන්හි උෂ්ණත්වය බිඳිති ජල සම්පාදන ක්‍රියාවලිය තුල දී සිදුවනවාට වඩා අඩු මට්ටමක පවත්වාගෙන යන බව පෙනේ.

**කප්පාදු චක්‍රය තුලදී තේ වල ගුණාත්මය සහ රසායනික ගුණාංග ඇගයීම**

කප්පාදු චක්‍රයේ විවිධ අවස්ථාවලදී ජෛව රසායන පරාමිතීන්ගේ වෙනස්වීම් පිළිබඳව DTI හා TRI 2023 තේ ප්‍රභේද යොදාගනිමින් සිදුකල අධ්‍යයනයකදී එලිවූයේ අමු දළු වල හා නිමි තේ වල ගුණාත්මක තත්ත්වයන් ඉහළම අගයක පවතින්නේ කප්පාදු චක්‍රයේ තෙවන වසරේදී වන අතර අක්‍රමත්ව කප්පාදු චක්‍රය ප්‍රමාද කිරීම තුලින් නිමි තේ වල ගුණාත්මයට බලපෑමක් ඇති වන බවය.

**නිෂ්පාදකතාවය හා ගුණාත්මය ඉහළ නැංවීම හා ජීවී සහ අජීවී ආතතීන් සමනය කිරීම සඳහා රිකිලි බද්ධ තාක්ෂණය යොදාගැනීම**

බද්ධ කිරීම තුලින් ඉහළ අස්වැන්නක්, ඉහළ ගුණාත්මයක්, නියගයට ඔරොත්තුදීමක්, රෝග හා පළිබෝධයනට ඔරොත්තුදීමක් ලඟා කර ගැනීම සඳහා යෝග්‍ය අනුජ සහ ග්‍රාහක සහයෝගයන් හඳුනාගනු ලැබීය. TRI 777 සහ TRI 4079 අනුජය ලෙස යොදාගත් අවස්ථාවලදී ඉහළ අස්වැන්නක් වාර්තා විය. ගුණාත්මය පරීක්ෂා කිරීම සඳහා යොදාගත් ප්‍රභේද සහයෝගයන්ගේ ප්‍රතිඵල පාලකය ලෙස යොදාගත් TRI 4049 හි තත්ත්වයන්ට සමාන විය. TRI 4006 මත TRI 4046, TRI 4006 මත TRI 3072, TRI 4053 මත TRI 3072, මත TRI 3072 මත TRI 4046 සහ TRI 3072 මත TRI 4006 යොදාගත් අවස්ථාවන්වලදී එම සමග යොදාගත් පාලකයන්ට වඩා ඉහළ අස්වැන්නක් වාර්තාවිය.

**ස්ථාන විශේෂිත පොහොර නිර්දේශ වැඩි දියුණු කිරීම**

ශ්‍රී ලංකාවේ සියළුම තේ වගා කලාප නියෝජනය කරන පාංශු ශ්‍රේණි 20 ක් ඒවායේ පෝෂක ස්වාරක්ෂක ධාරිතාව සඳහා විශ්ලේෂණය කරනු ලැබීය. එහි ප්‍රතිඵල මගින් මෙම පාංශු ශ්‍රේණියෙහි මැග්නීසියම් ගතිකයන්ගේ වෙනස්වීම් හඳුනාගත හැකි විය. දැනට පවතින මැග්නීසියම් පෝෂණ නිර්දේශයන් වඩාත් නිවැරදි කරගැනීම සඳහා මෙම තොරතුරු ඉවහල් වේ යැ යි බලාපොරොත්තු වේ.

විවිධ තේ වගා කලාපයන්හි පාංශු ශ්‍රේණින් පී එච් ස්වාරක්ෂක ධාරිතාවක් සඳහා විශ්ලේෂණය කල අතර ඒ තොරතුරු අනුව පී එච් ස්වාරක්ෂක කාණ්ඩ 03 ක් හඳුනාගත් අතර එම තොරතුරු එක් එක් තේ වගා කලාපයන්හි පසට හුණු යෙදීමේ අවශ්‍යතාවය වඩාත් නිවැරදි කිරීම සඳහා භාවිතා කිරීමට හැකි වේ.

**තේ වගාව සඳහා ජෛව කාබනික පොහොර වර්ග වැඩි දියුණු කිරීම**

ශාක වර්ධනය දිරිමත් කරන පාංශු බැක්ටීරියාවන් ප්‍රචලිත කිරීමේ අරමුණ ඇතිව පස් නියැදීන්ගෙන් තේ මුල් නියැදීන්ගෙන් නයිට්‍රජන් තිරකරන බැක්ටීරියාවන් සහ ශාක ආශ්‍රිත පාංශු කලාපය තුල සිටින පාංශු පොස්පේට දියකිරීමේ හැකියාව ඇති බැක්ටීරියා වෙන්කර ගනු ලැබීය. වෙන් කරගත් බැක්ටීරියාවන්ගේ වඩාත් යහපත් විශේෂයන් තවාන් තත්ත්වය යටතේදි ප්‍රායෝගිකව යොදාගැනීමේ හැකියාව සොයා බැලීම සහ ස්ථිර කිරීම සඳහා පර්යේෂණ ආරම්භ කරනු ලැබීය.

**තේ වගාවේ පිළිකා රෝගයට හේතුකාරක දිලීරයන්ගේ අණුක විද්‍යාත්මක අධ්‍යනය**

මාක්‍රෝපමා තීකෝලා දිලීරය මගින් ඇති කරන කඳ සහ අතු පිළිකා රෝගය තේ වගාවේ ප්‍රභල ගැටළුවකි. අණුක විධ්‍යාත්මක අධ්‍යයනයන්ට අනුව මෙම රෝග තත්ත්වයට ෆියුසේරියම් විශේෂයක්ද සම්බන්ධ බවත් අධ්‍යයනයේ තොරතුරු අනුව වෙන්කර ගත් විශේෂය බොහෝ දුරට ෆියුසේරියම් සොලනයි විශේෂයට සමාන බවත් පෙනී ගොස් ඇත.

**තේ බුබුළු අංගමාරයේ තීව්‍රතාවය ඇගයීම සඳහා යතුරක්**

තේ බුබුළු අංගමාර රෝගයේ තීව්‍රතාවය වඩාත්ම නිවැරදිවත් වඩාත්ම කාර්යක්ෂමවත් නැවත නැවත පරීක්ෂා කල හැකි ප්‍රමාණාත්මක ප්‍රතිශත දර්ශකයක් දියුණු කර එය තහවුරු කරනු ලැබීය. මෙම දර්ශකය බුබුළු අංගමාර රෝගයේ පැතිරීම සහ එහි ආර්ථිකව ඇති කරන බලපෑම යොදාගන්නා කළමණාකරන ක්‍රමයේ ඇති වාසි සහගත තත්ත්වයක් නිර්ණය කිරීමටත් අභිජනන වැඩ පිළිවෙල තුලදී රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේද හඳුනාගැනීමටත් උපකාරි වේ.

**තේ කර්මාන්තයේ නිෂ්පාදකතාවය සහ ලාභදායි බව කෙරෙහි ගෝලීය දේශගුණික විපර්යාසයන් මගින් ඇති කරන බලපෑම් ඇගයීම**

ශ්‍රී ලංකාවේ විවිධ කලාපයන් නියෝජනය කරන තේ වගා ප්‍රදේශයන්ගේ නිෂ්පාදනතාවයන්ට ගෝලීය දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම පිළිබඳ අනාවැකි පලකිරීම සඳහා Shefield Dynamic Global Vegetation Model) යෝග්‍ය වෙනස් කිරීම් සිදුකිරීම මගින් නව ආකෘතියක්(Model) වැඩි දියුණු කරන ලදි.

**තේ නිෂ්පාදකතාවය සහ වර්ධනය කෙරෙහි ගෝලීය දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම ඇගයීම**

වසර 30ක් පුරා රැස්කල මාසික කාලගුණ දත්ත විශ්ලේෂණය මගින් කාලගුණික විචලතාවයන්ගේ රටාවන් දිගුකාලීන හඳුනාගැනීමේ කටයුතු අවසන් කරනු ලැබීය. තේ පර්යේෂණ ආයතනය මගින් විවිධ කෘෂි කාලගුණ මධ්‍යස්ථානයන්ගෙන් රැස්කරගත් දෛනික වර්ෂාපතන දත්ත විශ්ලේෂණය මගින් පසුගිය වසර 40 පුරා නියගයන් ඇති වූ

රටාව අධ්‍යයනය සඳහා මෙම අධ්‍යයනය ආරම්භ කරනු ලැබීය.

**පහතරට තේ නිෂ්පාදනයේදී කැබලි වෙන්කරනයේ දැල් වෙනස් කිරීම තුලින් උසස් නිම් තේ වර්ග ප්‍රතිශතය සහ ලැබෙන මිල ඉහළ නැංවීම**

ඇඹරීමේ අවධියේදී නො 3 හා නො 4 දැල් භාවිතා කිරීමේ විවිධ සංයෝජනයන් හඳුනාගැනීම තුලින් උසස් තේ වර්ග ප්‍රතිශතය හා ශුද්ධ සාමාන්‍ය මිල ඉහළ නැංවීම සඳහා සිදුකල අධ්‍යයනය මගින් හෙලිවූයේ පළමු ඇඹරීමෙන් පසු නො 4 දැල භාවිතා කර ඉන් පසු ඇඹරීම සඳහා නො 3 නො 4 දැල් සංයෝජනය භාවිතා කිරීමෙන් උසස් නිම් තේ වර්ග ප්‍රතිශතය හා ඒවායේ මිල ගණන් ඉහළ නැංවිය හැකි බව හෙලිදරව් විය.

**පත රට තෙත් කලාපයේ (රත්නපුර දිස්ත්‍රික්කයේ ) කුඩා තේ ඉඩම්හි නිෂ්පාදන වියදම (COP) නිර්ණය කරන සාධකත**

කුඩා තේ වතු හිමියන්ගේ නිෂ්පාදන වියදම (COP) ඇස්තමේන්තු කිරීමටත් නිෂ්පාදන වියදමට බලපාන සාධක හඳුනාගැනීමටත්, ඔවුන් මුහුණ දෙන ගැටළු හඳුනාගැනීමටත් සමීක්ෂණයක් සිදු කරනු ලැබීය. එම අධ්‍යයනයේ ප්‍රතිඵල පෙන්වා දුන්නේ විවිධ කුඩා තේ වතු කාණ්ඩයන්ගේ තේ කිලෝග්‍රෑමයක් නිෂ්පාදනයට වැය වන මුදල වෙනස් බවයි. අවම නිෂ්පාදන වියදමක් වාර්තා වූයේ අක්කර 0.75 - 1.5 අතර ඉඩම් කාණ්ඩයේ වන අතර මෙම අගය අනෙකුති ඉඩම් කාණ්ඩ අතර අගයන්ගෙන් සැලකිය යුතු වෙනස්කමක් පෙන්වීය. නිෂ්පාදන වියදමේ වැඩිම ප්‍රතිශතයක් එනම් 72%ක් කම්කරු ශ්‍රමය සඳහා වැය වන බව පෙනේ. කුඩා තේ වතු හිමියන් මුහුණ දෙන ගැටළු අතර නව තාක්ෂණය පිළිබඳව අඩු දැනුම, මූල්‍ය සහ පුහුණු කිරීමේ ආයතන පිළිබඳ දැනුවත්භාවය, අඩු දළු සඳහා අඩු මිලක් ලැබීම සහ මිල අධික ලෙස උච්ඡාවචනය වීම ප්‍රධාන බව වාර්තා විය.

**තේ වතු සඳහා බාහිර වගාකරු වැඩ පිළිවෙලක් සඳහා යෝග්‍ය ආකෘතියක් වැඩි දියුණු කිරීම**

නව **ආකෘතියක්** හඳුනාගැනීම සඳහා ඇල්කඩුව වතු සමාගමේ සෙලගම වතුයාය තුලට **බාහිර** වගාකරුවන්" සංකල්පය හඳුන්වා දෙනු ලැබීය. මූලික විශ්ලේෂනයන්ට අනුව පෙනී ගියේ **බාහිර** වගාකරුවන්ගේ ඉඩම්වල සාමාන්‍ය නිෂ්පාදනතාවය 2010 ට සාපේක්ෂව 2011 වසරේදී වැඩි වී ඇති බවයි.

**නිම් තේ වල පළිබෝධනාශක අවශේෂ උපරිම සීමාවන් පිළිබඳ ගැටළු**

යුරෝප සංගමය සහ ජපානය මගින් පැනවූ පළිබෝධනාශක අවශේෂ සීමාවන් වෙනස් කිරීමට අදාල විශ්ලේෂණ කටයුතු සඳහා කර්මාන්ත සහ වානිජ අමාත්‍යාංශය මගින් රුපියල් මිලියන 7.3 ක මුදලක අනුමත කරනු ලැබීය.
තෝරාගත් පළිබෝධනාශක විශ්ලේෂණය කිරීම සඳහා බහු අවශේෂ විශ්ලේෂණ ක්‍රමවේදයක් වැඩි දියුණු කරනු ලැබු අතර කොන්සෝල් දිලීරනාශක වර්ග (බිටර්ටනෝල්, හෙක්සකොනසෝල්, ප්‍රොපිකොනසෝල් සහ ටෙබියකොනසෝල් විශ්ලේෂණය සඳහා දියුණු

කල ක්‍රමවේදය තුලට ඩයිසිනොක් විශ්ලේෂණයද ඇතුළු කරනු ලැබීය. කොනසෝල් වර්ග 04 සහ ඩයිසිනෝන් විශ්ලේෂණය සඳහා යොදාගන්නා බහු අවශේෂ ක්‍රමවේදය මඟින් විශ්ලේෂණය කරගත හැකි සංඝටක සංඛ්‍යාව වැඩිකර ගැනීම සඳහා නව පළිබෝධනාශක රැසක් යොදාගනිමින් සිටින අතර මේ තුලට ඔක්සිග්ලුවෆෙන් හා ෆෙන්නියෝ (MRL 0.005 mg/kg) සහ පයිරොක්ලොස්ට්‍රොබින් ( 0.5 mg/kg) ද ඇතුලත් කර ඇත.

ජෙල් පර්මියේෂන් ක්‍රොමටොග්‍රැපි (GPC) සහ ගෑස් ක්‍රොමටොග්‍රැපි ඉලෙක්ට්‍රෝන් අයනීකරණ මාස් සිපෙට්‍රො මෙට්‍රි (GC- EIMS) ක්‍රම භාවිතා කරමින් පටර්ටනෝල්, ප්‍රොපිකොනසෝල්,ගෙන්සකොනසෝල් සහ ටෙබියකොනසෝල් යන දිලීරනාශක ඇතුලත් වන බහුවිධ අවශේෂයන් ප්‍රමාණිකරන විශ්ලේෂණ ක්‍රමවේධයන් වැඩි දියුණු කරනු ලැබීය. නව පරම්පරාවේ දිලීරනාශකයක් වන පයික්ලොස්ට්‍රොබින් භාවිතා කරමින් වර්ෂා කාලය තුලදී සිදු කල පළිබෝධනාශක අවශේෂ අත්හදාබැලීම් වලදී දින 07 කට පසු ලැබුන අවශේෂ අගයන් යුරෝපා සංගමය මඟින් නියම කල අගයන්ට වඩා ඉහළ අගයක් පවතින බව පෙනීගිය අතර ඒ අනුව මෙම අගයන් නැවත සලකා බැලීම සඳහා ඉල්ලීම් කිරීමේ අවශ්‍යතාවය පෙනී ගොස් ඇත.

**අන්තර් පර්යේෂණාගාර පරීක්ෂණ වැඩසටහන**

විශ්ලේෂණ පරාමිතීන්ගේ නිපුණත්වය පවත්වාගෙන යාම සඳහා අන්තර් පර්යේෂණාගාර පරීක්ෂණ වැඩසටහන් සඳහා ඇතුළුවීම අවශ්‍ය වේ. අන්තර්ජාතික මෙන්ම ජාතික ආයතන මඟින් පවත්වනු ලබන මෙවන් වැඩසටහන් සඳහා තේ පර්යේෂණ ආයතනය දිගින් දිගටම සහභාගි වූ අතර පහත සඳහන් නිපුණතා පරීක්ෂණ වැඩසටහන් සඳහා සහභාගි විය.

අන්තර්ජාතික ප්‍රමිති සංවිධානය (ISO): ISO නිර්දේශ අනුගමනය කරමින් HPLC N භාවිතයෙන් L- තයනීන් ප්‍රමාණිකරනයේ දෙවන වටය සිදුකල අතර එම දත්ත ISO වෙත ඉදිරිපත් කරනු ලැබීය.

පර්යේෂණාගාර පරීක්ෂා කිරීමේ ශ්‍රී ලංකා සංගමය (SLATL) ISO 3720 පරාමිතීන් සඳහා අන්තර් පර්යේෂණාගාර පරීක්ෂණ වැඩසටහන SLATL ආයතනය මඟින් පවත්වනු ලැබීය.

**පුහුණු සහ තාක්ෂණ ප්‍රචාරණ තේ කර්මාන්තයේ නියැලෙන්නන්ගේ සංසඳය**

තේ පර්යේෂණ ආයතන විද්‍යාඥයින්ගේ සහ තේ කර්මාන්තයේ නියැලෙන්නන් අතර ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් නව සහභාගිත්ව ප්‍රවේශයක් ලෙස සියළුම වැවිලි සමාගම් හි ප්‍රධාන විධායක නිලධාරීන් සහ ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් ද තේ කර්මාන්තයේ නියැලෙන අනෙකුත් සියළුම ආයතනයන්හි නියෝජිතයන් සහභාගි වූ සම්මන්ත්‍රණ 02 ක් අප්‍රේල් සහ ඔක්තෝම්බර් මාසයන් තුලදී පැවැත්විය. තේ කර්මාන්තයේ ගැටළු නිර්ණයනාත්මක අධ්‍යයනයේ ප්‍රතිඵල ප්‍රකාශනයට පත් කල Agronomic Profile of the Corporate Section Tea Plantations” පොත අප්‍රේල් මස පැවැත් වූ සම්මන්ත්‍රණයේදී එළි දැක්විය.

**තේ වගා සායන**

තිරසාර තේ ඉඩමක් සඳහා නිරෝගී තේ පැලයක් " යන තේමාව යටතේ තේ වගා සායනයන් 2011 දෙසැම්බර් මස තේ පර්යේෂණ ආයතන මතුගම ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී පැවැත්වින. මෙම වැඩසටහනේ මූලික පරමාර්තය වූයේ නිරෝගී හොඳ ගුණාත්මයෙන් යුතු තේ පැලයක් සාදාගැනීමේ තාක්ෂණයක් තේ වගාකරුවන් වෙත ගෙනයාමය.

**පොහොර අනුවර්තී පර්යේෂණ**

තේ පර්යේෂණ ආයතනය මගින් නිර්දේශිත පොහොර සහ වගාකරුවන් ප්‍රියබවක් දක්වන පොහොර මිශ්‍රණ යොදාගත් අනුවර්තී පර්යේෂණ රැසක් කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම්වල ස්ථාපනය කල අතර තේ පර්යේෂණ ආයතන උපදෙස් හා ව්‍යාප්ති අංශයේ නිලධාරින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරී මහතුන් සමඟ එක්ව දත්ත එක්රැස් කිරීම සහ නිරතුරුව පර්යේෂණ ක්ෂේත්‍ර නිරීක්ෂණය සිදුකරනු ලබයි.

**වැවිලි සමාගම් ක්ෂේත්‍රය සඳහා පරිපූරක ව්‍යාප්ති ප්‍රවේශය**

සමාගම් වතු ක්ෂේත්‍රයේ වතුයායන්හි ක්ෂේත්‍ර පරික්ෂණ සහ කම්කරු මට්ටමේ සේවකයන්ගේ කෘෂිකාර්මික දැනුම සහ එම දැනුම භාවිතයට ගැනීම  අතර පරතරය ඇගයීම සඳහා වටවල වතු සමාගම් සමඟ සහයෝගයෙන් ආරම්භ කල පරිපූරක ව්‍යාප්ති ප්‍රවේශ වැඩසටහන 2011 වසර තුලදී ද පවත්වාගෙන යනු ලැබීය. එම පුහුණු වැඩසටහන තුල තේ තාක්ෂණික දැනුම සටහන් කොට සන්නිවේද නිපුණතාවය, සෞඛ්‍යය හා පෝෂණ සම්බන්ධ දැනුම වැඩි දියුණු කිරීම සම්බන්ධ මැදිහත් වීමක් සිදුකරනු ලැබීය. මෙම වසර තුලදී වැඩසටහන් 06ක් පැවැත් වූ අතර පරිපූරක පුහුණුකරුවන් 30ක් පුහුණු කරනු ලැබීය.

**සයිබර් ව්‍යාප්ති ක්‍රියාකාරකම්**

සමාගම් වතු ක්ෂේත්‍රයේ සහ කුඩා තේ වතු හිමියන් වෙත අදාල තේ තාක්ෂණ තොරතුරු අඩු කාලයක් සන්නිවේදනය කිරීම සඳහා වගාකරුවන් හට වඩාත් උචිත තොරතුරු සන්නිවේදන යාන්ත්‍රණයක් ලෙස සයිබර් ව්‍යාප්ති තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරකම් අරඹනු ලැබීය. තාක්ෂණ ජනන පද්ධති සහ තාක්ෂණ භාවිත පද්ධති අතර තාක්ෂණ හුවමාරුවේ කාල පරතරය අඩු කිරීම තුලින් තාක්ෂණ භාවිතය කාර්යක්ෂම කිරීම මෙම ව්‍යාපෘතියේ මූල්‍ය පරමාර්ථය වේ.

**වානිජ තේ තවාන් පරීක්ෂාව**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ඉල්ලීම පරිදි මෙම වසර තුලදී වානිජ තේ තවාන් 137ක් පරීක්ෂාවට භාජනය කරනු ලැබු අතර පරීක්ෂා කර නිර්ණායකයන් වන තවාන් මළුවල උස,වට ප්‍රමාණය හා පැලවල උස යන කරුණු මත වගාකිරීමට යෝග්‍ය පැල ප්‍රමාණය 55 - 60% පමණ වූ බව වාර්තා වේ.

**වගා නොකල ඉඩම් පිළිබඳ සමීක්ෂණය**

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් සංවිධානය කල සියළුම තේ වගා කරන ප්‍රදේශයන් ආවරණය වන පරිදි සිදුකල තේ වතුයායන් තුල වගා නොකල ඉඩම් හඳුනාගැනීමේ සමීක්ෂණය සඳහා උපදෙස් හා ව්‍යාප්ති අංශයේ නිලධාරීන් සහ පර්යේෂණ අංශ කිහිපයක නිලධාරීන් දත්ත එක්රැස් කිරීම සඳහා ක්‍රියාකාරී ලෙස සහභාගි විය.

**ආසියානු සංවර්ධන බැංකු මව් වගා ව්‍යාපෘතිය**

මෙම වසර තුලදී කුඩා තේ වතු හිමියන් සහ මහවතු වෙත TRI 3000 සහ TRI 4000 ශ්‍රේණීන්ගෙන් තේ රිකිලි මිලියන 7.8ක් පමණ ප්‍රමාණයක් නිකුත් කරනු ලැබීය. ඌව ප්‍රදේශයේ වගාකරුවන් අතර TRI 4053 , TRI 4052, TRI 4042 සහ TRI 3019 සඳහා වැඩි ඉල්ලුමක් පැවති අතර පහතරට ප්‍රදේශයේදී TRI 4049 සඳහා වැඩි ඉල්ලුමක් පැවතින. මේ අතර මැදරට ප්‍රදේශයේ වගාකරුවන් TRI 4006 සහ TRI 4046 සඳහා වැඩි කැමැත්තක් දැක්වූ අතර උඩරට ප්‍රදේශයේ වගාකරුවන් TRI 4071, TRI 4052 හා TRI 4019 පිළිබඳ වැඩි කැමැත්තක් දැක්විය.

**ප්‍රකාශන, පේටන්ට් බලපත්‍ර, සම්මාන සහ පිළිගැනීම**

2011 වසර තුලදී පර්යේෂණ පත්‍රිකා නිර්දේශිත විද්‍යාත්මක සඟරා තුල ප්‍රකාශනයට පත්විය. ශ්‍රී ලංකා තේ විද්‍යා සඟරාව (SLJTS), TRI Updates සහ තේ තතු යන වාරික ප්‍රකාශනයන් හැරුනු විට උපදෙස් චක්‍රලේඛ 03ක් ($PA_2$ , $PM_4$ හා $PM_5$) සහ නියගයට පසු තේ ඉඩම්වල අනුගමනය කලයුතු ක්‍රියාමාර්ග සහ තේ ඉඩම්වල පසේ සරුබව සහ නිෂ්පාදිතාව ඉහළ නැංවීම පිණිස කප්පාදු අතු වැළලීම පිළිබඳ නව ක්‍රියාපටිපාටි පත්‍රිකා 02ක් ප්‍රකාශනයට පත්විය.

කෘෂිකර්ම පර්යේෂණ විශිෂ්ටත්වය උදෙසා වන ජාතික සම්මානයේ පළමුවන ස්ථානය 2011 අගෝස්තු මස 25 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත් වූ උත්සවයේදී ආචාර්ය අයි එස් බී අබේසිංහ සහ ආචාර්ය නිමල් පුණ්‍යසිරි දිනාගන්නා ලදී.

2007 සිට 2009 දක්වා කාලය තුල ස්වභාවික විද්‍යා ක්ෂේත්‍රයේ හොඳම පශ්චාත් උපාධි පර්යේෂණයට හිමිවන "හිරාන් තිලකරත්න පර්යේෂණ සම්මානය" විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේදී ආචාර්ය කේ එම් මෙවන් විසින් දිනාගන්නා ලදී.

ජේ ඩී කොට්ටව ආරච්චි විසින් කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ 23 වන වාර්ෂික පර්යේෂණ සමුළුවට ඉදිරිපත් කල ශ්‍රී ලංකා තේ ජාන ප්ලාස්මාවේ ගුණාත්මක තේ නිර්ණය කිරීම සඳහා නිම් තේ වල තෝරාගත් ජෛව රසායන සංඝටක විශ්ලේෂණය පිළිබඳ" ඉදිරිපත් කල පර්යේෂණ වාර්තා සඳහා ජෛව රසායන සහ ආහාර විද්‍යා අංශයේ අංශයේ හොඳම ඉදිරිපත් කිරීම සඳහා වන සම්මානය සහ හොඳම පශ්චාත් උපාධි ශිෂ්‍යයාට හිමි වන සම්මානය දිනාගැනීමට සමත්විය.

ජෛව රසායන අංශය, ශාක අභිජනන අංශය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය එක්ව සිදුකරන ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන ශ්‍රී ලංකාවේ තේ ජාන ප්ලාස්මාවේ පරිවෘත්තීය

පැතිකඩ හඳුනාගැනීමේ පර්යේෂණ සඳහා ජාතික පර්යේෂණ සභාව මඟින් රුපියල් මිලියන 9.3ක් වටිනා පර්යේෂණ පරිත්‍යාගයක් ආචාර්ය පී ඒ එන් පුණ්‍යසිරි වෙත පිරිනමන ලදී.
ශ්‍රී ලංකා කෘෂිකාර්මික ප්‍රතිපත්ති සභාව විසින් ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්මට ඇතුලත් කිරීම සඳහා පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති යෝජනා තෝරාගනු ලැබේ.

තේ වතුවල කාලගුණික වෙනස්වීම් තත්ත්වයන් විශේෂ සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ තේ වටපණු ගහණයන්ගේ රූපමිතික සහ අනුක ලක්ෂණීකරනය.

ජෛව රසායනික සහ අනුක සලකුණු සම්මිශ්‍රණය භාවිතා කරමින් ඉහළ කළු තේ ගුණාත්මය සඳහා තේ ජාන ප්ලාස්මාවක් තෝරාගැනීම සඳහා පූර්ව හඳුනාගැනීමේ නිර්ණායකයන් වැඩිදියුණු කිරීම විශේෂ අතර අභිජනනය සහ කළලය සුරකීම තුලින් රෝගයනට ප්‍රතිරෝධී තේ ප්‍රභේද වැඩි දියුණු කිරීම.

**නව ප්‍රකාශන සහ පේමන්ට්**

- ශ්‍රී ලංකා තේ විද්‍යා සඟරාව :- 74 කලාපය දෙවැනි කොටස
- උපදෙස් චක්‍රලේක නො: PA 2 - තේ වතුවල නියඟ හානි සමණය කිරීම.
- උපදෙස් චක්‍රලේක නො: PM 2 - ලපටි තේ ඉඩම් වටපණුවන්ගෙන් රැක ගැනීම.
- උපදෙස් චක්‍රලේක නො: PM 2 - වටපණු විශ්ලේෂණය සඳහා නියැදි ලබාගැනීම.
- මාර්ගෝපදේශ මාලාව නො: 01/11 :- නියඟයට පසු තේ ඉඩම්හි අනුගමනය කලයුතු ක්‍රියාමාර්ග. (සිංහල/ඉංග්‍රීසි)
- මාර්ගෝපදේශ මාලාව නො: 02/11 :- තේ ඉඩම්වල නිෂ්පාදකතාව සහ පසේ සරුබව ඉහළ නැංවීම සඳහා කප්පාදු අතු වැළලීම පිළිබඳ මාර්ගෝපදේශ මාලාව.
- TRI Updates: 13 වන කලාපය නො: 02
- තේ තතු - 7 වන කලාපය 1 වන කොටස
- තේ තතු - 8 වන කලාපය 1 වන කොටස
- වාර්ෂික වාර්තාව 2010 (ඉංග්‍රීසි)
- වාර්ෂික වාර්තාව 2010 (සිංහල)
- වාර්ෂික වාර්තාව 2010 (දෙමළ)

**බාහිර ආයතන හා සම්බන්ධව සිදුකල සහයෝගී වැඩ කටයුතු**

ආයතන දෙක අතර සහයෝගී පර්යේෂණ ව්‍යාපෘති සිදුකිරීමට ඇති හැකියාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා නෙස්ලේ ආයතනයේ දකුණු ආසියානු කලාපයේ පර්යේෂණ හා සංවර්ධන අංශ ප්‍රධානී 2011 මාර්තු මාසයේදී තේ පර්යේෂණ ආයතනයට පැමිණියේය.

ශ්‍රී ලංකාවේ නැනෝ තාක්ෂණය පිළිබඳ ආයතනය සමඟ ආරම්භ කල පසේ සරුබව ඉහළ නැංවීම සඳහා සෙමින් නිදහස් වන පොහොර භාවිතා කිරීම" පිළිබඳ සහයෝගී ව්‍යාපෘතියේ කටයුතු මෙම වසර තුලදී ද සිදුකෙරිණි.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ "තේ තාක්ෂණ සහ අගය එක් කිරීම" උපාධි පාඨමාලාවේ සම්පත් දායකයින් ලෙස තේ පර්යේෂණ ආයතන විද්‍යාඥයින් රැසක් මෙම වසරේදී ද සම්බන්ධ විය.

මූලික අධ්‍යයනය සමඟ ජෛව පටල ජෛව පොහොර භාවිතය පිළිබඳ සහයෝගී ව්‍යාපෘති කටයුතු මෙම වසරේදී ද සිදුකල අතර තේ තවාන් සහ ලපටි තේ ඉඩම්හි ජෛව පටල ජෛව පොහොර අනුවර්තී පර්යේෂණ ආරම්භ කරනු ලැබීය.

දේශගුණය වෙනස්වීම සහ කාලගුණ අනාවැකි එලකිරීම පිළිබඳ සහයෝගී පර්යේෂණ යෝජනාවලියක් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ස්වභාවික සම්පත් කළමණාකරන මධ්‍යස්ථානයේ (NRMC) නිලධාරීන් සමඟ සාකච්ඡාවක් 2011 ජූලි මස 08 වන දින පැවැත්විය. මෙහි දී ව්‍යාපෘතීන් 03 ක් හඳුනාගනු ලැබීය.

1. පසුගිය දශක කිහිපය තුල සියළුම තේ වගාකරන කෘෂි පාරිසරික කලාපයන්හි දේශගුණික වෙනස්වීම් රටාව හඳුනාගැනීම සහ 2025 - 2050 අතර කාලය සඳහා ප්‍රක්ෂේපනයන් සිදුකිරීම.
2. දේශගුණ විපර්යාසයන්ට පාත්‍ර වීමේ අවධානම ඇති ප්‍රදේශයන් හඳුනාගෙන සිතියම්ගත කිරීම.
3. සෘතුවෙන් සෘතුවට කාලගුණ අනාවැකි පලකිරීම. මෙහි දී ව්‍යාපෘතියේ පළමු අදියර වශයෙන් 1 සහ 3 යන ව්‍යාපෘති දෙක පිළිබඳ අවධානය යොමු කිරීමට තීරණය විය.

සහයෝගීතා පර්යේෂණ පිළිබඳ ඇති හැකියාව සොයා බැලීම සඳහා හැන්ග්ෂු නාගරික පාලන ඒකකයේ උප නගරාධිපති He Guanin මහතාගේ නායකත්වයෙන් යුත් චීන ධූතපිරිසක් 2011 අප්‍රේල් මස 20 වන දින ආයතනයට පැමිණියේය.
04 වන වැවිලි භෝග සමුළුව සංවිධානය කිරීම මූලික කරගනිමින් සියළුම වැවිලි භෝග පර්යේෂණ ආයතනයන්හි අධ්‍යක්ෂවරුන් සහ සභාපතිවරුන්ගෙන් සමන්විත අධ්‍යක්ෂවරුන්ගේ සංසදය පැවැත්විය.

**සහභාගි වූ ප්‍රධාන රැස්වීම්/ සම්මන්ත්‍රණ**

- ශ්‍රී ලංකාවේ කටුපොල් ක්ෂේත්‍රය සංවර්ධන කිරීම සඳහා ඉන්දියාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා ජනවාරි 02 සිට 04 දක්වා ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ මූලිකත්වයෙන් ඉන්දුනීසියාවට සංචාරය කල රාජ්‍ය දූතපිරිසට තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති ආචාර්ය එස් එස් බී ඩී ජී ජයවර්ධන සහභාගී විය.
- ජපන් රජය සහ ජපානයේ වෙනත් වෙළෙඳ සංවිධාන සමඟ තේ ප්‍රවර්ධනය ශක්තිමත් කිරීමේ කටයුතු සහ සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම සහ සාකච්ඡා කිරීම සඳහා ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමාගේ මූලිකත්වයෙන් ජපානය බලා ගිය දූතපිරිසට තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති ආචාර්ය එස් එස් බී ඩී ජී ජයවර්ධන සහභාගී විය.
- මාර්තු මස 09 - 15 අතර ඉන්දියාවේ සිල්ගුරි හි පැවැත් වූ ජාතික සම්මේලනයේ ආරාධිත දේශකයෙකු ලෙස තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය අයි එස් බී අබේසිංහ සහභාගී විය.

- නිම් තේ වල පළිබෝධනාශක අවශේෂ සහ සීමාවන් සම්බන්ධව සහ තේ ප්‍රවර්ධනය ශක්තිමත් කිරීම හා සංවර්ධනය සඳහා යෝග්‍ය ව්‍යාපෘතීන් පිළිබඳව ජර්මන් තේ සංගමය සමග සාකච්ඡා කිරීම සඳහා ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ නායකත්වයෙන් ජූනි මස 21 - 27 දිනවලදී ජර්මනියේ සංචාරය කල ශ්‍රී ලාංකීය දූත මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති ආචාර්ය එස් එස් බී ඩී පී ජයවර්ධන සහභාගී විය.

- ජූලි මස 18 - 22 දිනවලදී කෙන්යාවේ පැවැත් වූ පළමුවන අප්‍රිකානු තේ සම්මේලනයට සහ 19 වන FAO/IGG රැස්වීමට කීට විද්‍යා අංශයේ අංශ ප්‍රධානි ආචාර්ය කීර්ති මොහොට්ටි හා තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති ආචාර්ය එස් එස් බී ඩී පී ජයවර්ධන සහභාගී විය.

- නොවැම්බර් මස 21 - 25 දිනයන් තුලදී ඉන්දියාවේ ඇසෑමයේ ටොක්ලායි පර්යේෂණ මධ්‍යස්ථානයේ පැවැත් වූ ලෝක තේ සම්මේලනයට තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය අයි එස් බී අබේසිංහ සහභාගී විය.

- ඔක්තෝම්බර් මස 25 - 29 දින තුලදී තායිපෙ හි පැවැත් වූ ජෛව සංරක්ෂණය පිළිබඳ විශේෂඥඋපදේශන රැස්වීමෙහි ආරාධිත විද්‍යාඥයෙකු වශයෙන් ශාක අභිජනන අංශ ප්‍රධානී ආචාර්ය එම් ටී කේ ගුණසේකර මහත්මිය සහභාගි විය.

- නොවැම්බර් මස 16 - 25 දක්වා දකුණු ඉන්දියානු එක්සත් වැවිලිකරුවන්ගේ සංගමය(UPASI) සහ තේ වතු කිහිපයක් නිරීක්ෂණය කිරීමටත් ඇසෑමයේ ජොහාට් හි ටොක්ලායි පර්යේෂණ මධ්‍යස්ථානය මගින් සංවිධානය කල ලෝක තේ සම්මේලනයට සහභාගිවීම සඳහාත් ශාක අභිජනන අංශ ප්‍රධානී ආචාර්ය එම් ටී කේ ගුණසේකර, පාංශු හා ශාක පෝෂන අංශයේ ප්‍රධානී ආචාර්ය ජී පී ගුණරත්න, උපදෙස් හා ව්‍යාප්ති අංශයේ ප්‍රධානී බී ඒ ඩී සමන්සිරි මහතා සහ ශෂ්‍ය විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආචාර්ය එම් ඒ විජේරත්න මහතා ඉන්දියාව බලා පිටත් විය.

- නොවැම්බර් 21 - 25 දක්වා ඉන්දුනීසියාවි බාලි හි තේ උළෙලට සමගාමිව පැවැත් වූ මොන්ට්‍රියල් ගිවිසුමේ හවුල්කරුවන්ගේ සම්මේලනයට කීට විද්‍යා අංශයේ අංශ ප්‍රධානි ආචාර්ය කීර්ති මොහොට්ටි සහභාගී විය

- දෙසැම්බර් 14 - චීනයේ ගුවන්ග්ෂාන් හි පැවැත් වූ ඇලිලොපති සම්බන්ධ 6 වන ලෝක සම්මේලනයට ශෂ්‍ය විද්‍යා අංශයේ ප්‍රධානි ආචාර්ය කේ පී ප්‍රේමතිලක සහභාගී විය.

- ඔක්තෝම්බර් මස 10 - 13 දින තුල කොළඹ සිනමන් ලේක් හෝටලයේ පැවැත් වූ පාංශු විද්‍යා සංගම් පෙරදිග හා ගිණිකොනදිග ආසියානු ඒකාබද්ධ සංගමයේ 10 වන අන්තර්ජාතික සම්මේලනයේදී ආචාර්ය ජී පී ගුණරත්න, එල් ආර් එම් සී ලියනගේ, මහාචාර්ය ඒ එන් ජයකොඩි, ඩබ් එම් එස් විජේතුංග සහ එස් එම් දිසානායක යන මහත්වරුන් "ශ්‍රී ලංකාවේ තේ ඉඩම්හි පොටෑසියම් සුලභතාවය සඳහා ස්ථානීය තත්ත්වයන්ගේ බලපෑම" නමින් පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබීය.

**පරිපාලන සහ මූල්‍ය කරුණු**

මහා භාණ්ඩාගාරයේ කළමණාකරන සේවා අංශ චක්‍රලේඛ අංශ 30 සහ 31 (1) හි මාර්ගෝපදේශකත්වය යටතේ පිළියෙල කල ආයතනයේ බඳවාගැනීම් ක්‍රියාපටිපාටිය 2011 සැප්තැම්බර් මස 16 වන දින අනුමත විය.

2005 - 2008 දක්වා කාලය තුල තේ පර්යේෂණ ආයතනයේ කාර්ය සාධනය හා විගණන විමසීම් සම්බන්ධව 2011 අප්‍රේල් 08 වන දින රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේදී සාකච්ඡාවට ගැනිණි.

**මානව සම්පත්**

වසර 30 කට වැඩි කාලයක් පුරා තේ පර්යේෂණ අයතනයට අගනා මෙහෙවරක් ඉටුකර ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිලධාරිනි ජයන්ති ජයසුන්දර මහත්මිය, ස්ථානභාර නිලධාරී/ජ්‍යේෂ්ඨ උපදේශක නිලධාරී කේ ඩී දහනායක සහ මහජන සම්බන්ධතා නිලධාරී කේ ජී ජයසේන යන මහත්වරුන් 2011 දී තේ පර්යේෂණ සේවයෙන් විශ්‍රාම ලැබූ අතර පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු සහ අත්හදාබැලීමේ නිලධාරීන් 04 දෙනෙකු තේ පර්යේෂණ ආයතන සේවයෙන් ඉල්ලා අස්විය.

කේ ජේ සී රුදිගු මහතා පරිපාලන නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ලෙස 2011 පෙබරවාරි 01 වන දින වැඩ භාරගත් අතර 2011 අගෝස්තු 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පාංශු හා ශාක රෝපන අංශයේ ප්‍රධානී ලෙස ආචාර්ය ජී පී ගුණරත්න මහතා තේ තාක්ෂණ අංශයේ ප්‍රධානී ලෙස ආචාර්ය ඩබ් එස් බොතේජු මහතා පත් කරනු ලැබීය.

ආර් එම් ආර් ආර් එල් රණරාජා මහතා 2011 මැයි 02 දින නේවාසික ඉංජිනේරුවරයා ලෙස වැඩ භාරගත් අතර 2011 මැයි 05 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශාන්ත කූම්බස් වතුයායේ වතු අධිකාරිවරයා ලෙස ටී එම් එස් කේ තෙන්නකෝන් මහතා පත්කරනු ලැබීය. 2011 අගෝස්තු 01 වන දින බලපැවැත්වෙන පරිදි ඩී එල් ඒ දසනායක මහතා සහ එච් ආර් එම් පී අබේරත්න මෙනවිය පර්යේෂණ නිලධාරීන් ලෙස පත්කල අතර 2011 වසර තුලදී තාක්ෂණ නිලධාරීන් 17 දෙනෙකු, ලිපිකරුවන් 04 දෙනෙකු, රියදුරන් 06 දෙනෙකු සහ සාමාන්‍ය කම්කරුවන් 26 දෙනෙකු බඳවාගනු ලැබීය.

ශාක අභිජනන අංශයේ අත්හදාබැලීම් නිලධාරී කේ කේ රණවීර මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයෙන් භෝග විද්‍යා පිළිබඳ දර්ශනසූරි පශ්චාත් උපාධිය සාර්ථකව අවසන් කළේය.

ජෛව්‍ය රසායන අංශයේ පර්යේෂණ නිලධාරී කේ එම් මෙවන් මහතා පශ්චාත් උපාධි කටයුතු ඔක්තෝම්බර් මාසයේදී සාර්ථකව අවසන් කල අතර ඔහුට කොළඹ විශ්වවිද්‍යාලයෙන් අනුක ජෛව විද්‍යා සහ ජාන තාක්ෂණය පිළිබඳ දර්ශනවේදී උපාධිය පිරිනැමීය.

උපදේශන නිලධාරී කේ ජී ජේ පී මහින්දපාල මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව අවසන් කරනු ලැබීය.
තරඟකාරි නොවන වැටුප් ව්‍යුහයන්, ගුණාත්මක පශ්චාත් උපාධි පුහුණු අවස්ථා සීමාවීම හා උසස්වීම් අවස්ථා ප්‍රමාණවත් නොවීම වැනි කරුණු මත ආයතනය තුල සුදුසුකම් සහිත නිලධාරීන් රඳවාගැනීම අසීරු කරුණක් විය. තේ කර්මාන්තය සඳහා වඩාත් කාර්යක්ෂම සේවයක් ඉටුකිරීමේ අරමුණින් පිළියෙල කල ආයතනික සැලැස්මේ පරමාර්ථයන් සාක්ෂාත් කරගැනීම සඳහා මෙවැනි බාධාකාරි තත්ත්වයන් ප්‍රමුඛත්වයේ ලා සාකච්ඡාවට භාජනය කල යුතුය.

2011 වසර සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් මිලියන 233.91 මුදලක් සහ පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 82.20 මුදලක් භාණ්ඩාගාරය විසින් ආයතනයට ලබා දී ඇත. මෙම මුදල පසුගිය වසර හා සැසඳීමේදී තරමක වැඩිවීමක් පෙන්නුම් කරයි. ප්‍රාග්ධන සහ පුනරාවර්තන මුදල් වියදම් රටාව පහත දැක්වේ.






**තත් පර්යේෂණ වතුයායන්හි කාර්යසාධන තත්ත්වයන්**

**ශාන්ත කුම්බිස් වත්ත**

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය මහින්ද සමරසිංහ මහතා 2011 අප්‍රේල් මස 22 වන දින ශාන්ත කුම්බස් තේ කර්මාන්ත ශාලාව නිරීක්ෂණය කළේය. මෙම වසරේදී ශාන්ත කුම්බිස් වත්ත රුපියල් මිලියන 2.2 ක පමණ ලාභයක් ඉපැයීය.

**නැවත වගා කිරීම**

පස පුනරුත්තාපනය කර තිබූ හෙක්ටයාර් දෙකක ක්ෂේත්‍රයේ නව තේ ප්‍රභේද වගාකල අතර තවත් හෙක්ටයාර් දෙකක පැරණි බීජ වගා බිමක් තේ ගලවා ඉවත්කර පුනරුත්තාපන තෘණ වගා කරනු ලැබීය.

**ADB මව් වගා ව්‍යාපෘතිය**

මෙම වසර තුලදී TRI 3000 සහ TRI 4000 ශ්‍රේණීන්ගෙන් රිකිලි 798,278 ක් කුඩා තේ වතු හිමියන් හා සමාගම් වතු වෙත නිකුත් කරනු ලැබූ අතර එමගින් රුපියල් 901,852.63 ක ලාභයක් ඉපැයීය.

**ශාන්ත ජෝකිම් වත්ත**

2011 - 2014 වසර සඳහා SLSI SLTB නිෂ්පාදන සහතිකය ලබාගැනීමට ශාන්ත ජෝකිම් කර්මාන්තශාලාව සුදුසුකම් ලැබීය.

**ADB මව් වගා ව්‍යාපෘතිය**

මෙම වසරේදී TRI 3000 සහ TRI 4000 ශ්‍රේණීන්ගෙන් රිකිලි 287,445 ක් කුඩා තේ වතු හිමියන් හා සමාගම් වතු වෙත නිකුත්කිරීමට හැකිවිය.

මෙම වසර තුලදී මාගේ රාජකාරි කටයුතු සාර්ථකව ඉටුකිරීමට සභාපතිතුමා, කළමණාකරන මණ්ඩලය, පර්යේෂණ පිළිබඳ උපදෙස් හා වතු පිළිබඳ සහ විගණන සහ කළමණාකරන උපදේශක කමිටු මගින් නිරතුරුව ලැබුණු උපදෙස් හා මගපෙන්වීම පිළිබඳ මාගේ ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි. ආයතනික සැලැස්මේ අරමුණු කරා ලඟාවීම සඳහා සෑම විටදීම මට ලබාදෙන පූර්ණ සහයෝගය පිළිබඳ තේ පර්යේෂණ ආයතනයේ සියළුම නිලධාරීන්ටද මාගේ කෘතඥතාවය පුද කරමි.

**ආචාර්ය අයි එස් බී අබේසිංහ**
**අධ්‍යක්ෂ**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය**

## තේ පර්යේෂණ ආයතනය - කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය

- ආචාර්ය අයි එස් බී අබේසිංහ
  BSc (Peradeniya, Sri Lanka) Ph D(Sheffield,UK)
  අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී

- ආචාර්ය එල් එස් කේ හෙට්ටිආරච්චි
  BS c (Peradeniya, Sri Lanka) PhD(Aberdeen,UK)
  නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (නිෂ්පාදන)

- කේ ජේ සී ජේ රොද්‍රිගෝ   නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)

**අධ්‍යක්ෂ කාර්යාලය**

- එස්ජයසිංහම්  අධ්‍යක්ෂවරයාගේ ලේකම්

- දේවිකා රත්නායක ලඝු ලේඛිකා (ඉංග්‍රීසි)

ආර් රායප්පන් ලිපිකරු

පී සෙල්වරාජ්  පොදු සේවක(from 1.10.2011)

**කෘෂි ආර්ථික විද්‍යා අංශය**

- ආචාර්ය එච් ඩබ් ශ්‍යාමලී
  BSc Agric. (Peradeniya, Sri Lanka) ,
  MSc (Peradeniya, Sri Lanka) ,
  Ph D (CSKHPKV, India)
  වැඩබලන අංශ ප්‍රධානී/පර්යේෂණ නිලධාරී

- එච් ආර් එම් පී අබේරත්න
  BSc Agric. (Peradeniya, Sri Lanka)
  පර්යේෂණ නිලධාරී

- කේ ඩබ් එන් නදීෂානි
  BSc Science (Peradeniya, Sri Lanka)

- ඒ වී කේ එස් පෙරේරා
  තාක්ෂණ සහකාර

තාක්ෂණ සහකාර
ඒ වී කේ එස් පෙරේරා

**ශෂ්‍ය විද්‍යා අංශය**

අංශ ප්‍රධානී

- ආචාර්ය කේ පී ප්‍රේමතිලක
  BSc Agric. (Ruhuna, Sri Lanka) ,
  M Phil (Peradeniya, Sri Lanka) ,
  Ph D (Reading, UK)

පර්යේෂණ සහකාර

- එස් ආර් ඩබ් පතිරණගේ
  BSc Agric. (Ruhuna, Sri Lanka) ,
  පර්යේෂණ සහකාර
  (පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය)

- ටී එල් විජේරත්න
  BSc Agric. (Peradeniya, Sri Lanka) ,
  MSc Crop Sc. (Peradeniya, Sri Lanka)
  පර්යේෂණ සහකාර

- ඩී එම් එස් නවරත්න
  BSc Crop Sc. (Peradeniya, Sri Lanka) ,
  M Phil (Peradeniya, Sri Lanka)

- එච් එස් එන් පීරිස්
  BSc Agric. (Peradeniya, Sri Lanka) ,
  M Phil (Peradeniya, Sri Lanka)
  අත්හදා බැලීමේ නිලධාරී
  (පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය)

- ඒ ජේ ගමගේ
  BSc Agric. (Peradeniya, Sri Lanka)
  අත්හදා බැලීමේ නිලධාරී
  (පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය)

- එම් ජී එස් ලියනගේ
  BSc Agric. (Peradeniya, Sri Lanka)
  අත්හදා බැලීමේ නිලධාරී
  (පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය)

- එල් ඒ එස් පී ජයසිංහ
  BSc Agric. (Wayamba, Sri Lanka)
  Msc Crop Sc. (Peradeniya, Sri Lanka)
  අත්හදා බැලීමේ නිලධාරී

- එම් එම් එන් දමයන්ති
  BSc Agric. (Peradeniya, Sri Lanka)
  M Phil Crop Sc. (Peradeniya, Sri Lanka)
  අත්හදා බැලීමේ නිලධාරී

- ඩී ඩබ් විතාන
  Diploma in Agriculture
  අත්හදා බැලීමේ නිලධාරී
  (පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය)

- යූ පී අබේසේකර
  Diploma in Agriculture
  අත්හදා බැලීමේ නිලධාරී

- ඒ පී ඩී ඒ ජයසේකර

- ආචාර්ය පී ඒ එන් පුණ්‍යසිරි
  Grad. Chem. (Inst. of Chemistry) Ph D
(Peradeniya, Sri Lanka)
  ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි (කොන්ත්‍රාත් පදනම)

- ජී ඒ ඒ ආර් පෙරේරා
  B Sc Agric. (Peradeniya, Sri Lanka)
  Msc (USJ Sri Lanka)
  පර්යේෂණ නිලධාරි

අත්හදා බැලීමේ නිලධාරි

- ජී එච් තොටවත්තගේ B Sc Agric. (Peradeniya, Sri Lanka)
  M Sc (Peradeniya, Sri Lanka)

- පී කේ පී මුතුකුමාරණ
  B Sc Agric. (Ruhuna, Sri Lanka)
  අත්හදා බැලීමේ නිලධාරි

- පි ජී සී ප්‍රියන්ත
  අත්හද බැලීමේ නිලධාරි(Up to 01.07.2011)

තාක්ෂණ සහකාර
එච් එම් එස් බී හීන්කෙන්ද

- ආර් එම් ඊ එම් කේ රන්දෙනිය
  Diploma in Agriculture
  තාක්ෂණ නිලධාරි(From 1.8.2007)

- ඊ එන් යූ එදිරිසිංහ
  Diploma in Agriculture
  තාක්ෂණ නිලධාරි(From 1.8.2007)

- එම් ඩබ් සිල්වා
  පුහුණු කාර්මික

පොදු සේවක
ජී පෙරියසාමි

-

- ඊ පී විජේවර්ධන
තාක්ෂණ නිලධාරි

- බී එම් එන් පී බස්නායක
තාක්ෂණ නිලධාරි

ශාක අභිජනන අංශය

- ආචාර්ය එම් ටී කේ ගුණසේකර
  B Sc Agric. (Ruhuna, Sri Lanka)
  **PhD (Southampton, UK)**
  අංශ ප්‍රධානි / ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි

- එම් ඒ බී රණතුංග
  BSc (Peradeniya, Sri Lanka)
  MSc (TNAU,India)
  ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි

- එච් ඒ සී කේ ආරියරත්න
  BSc (Peradeniya, Sri Lanka)
  MSc (Peradeniya, Sri Lanka)
  M Phil (Colombo, Sri Lanka)
  පර්යේෂණ සහකාර

කීට විද්‍යා හා වටපණු විද්‍යාවේදී අංශය

- ආචාර්ය කේ එම් මොහොට්ටි**BSc. (Peradeniya, Sri Lanka),**
**PhD (Reading, UK), C.Biol (Sri Lanka)**
අංශ ප්‍රධානි / ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
**BSc. (Peradeniya, Sri Lanka),**

- පී ජී ඩී එස් අමරසේන

  BSc (Peradeniya, Sri Lanka)

  MSc (PGIA, Sri Lanka)

  අත්හදාබැලීම් නිලධාරී

- ආර් පාස්කරදේවන්

  BSc (Madras,India)

  MSc (Colombo, Sri Lanka)

  පර්යේෂණ සහකාර

- පී ඩී උපාලි

  අත්හදාබැලීම් නිලධාරී

  (පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය)

- වී සභාරත්නම්

  පොදු සේවක

- එස් හෙට්ටිආරච්චි

  පොදු සේවක

- ටී එම් සරත්චන්ද්‍ර

  BSc (Biosience)

  අත්හදාබැලීම් නිලධාරී

  (මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය)

- ජේ ඩී කොට්ටවආරච්චි

  BSc (OUSL, Sri Lanka)

  අත්හදාබැලීම් නිලධාරී

- කේ කේ රණවීර

  B Sc Agric. (Ruhuna, Sri Lanka)
  M Phil (Peradeniya, Sri Lanka)

  අත්හදාබැලීම් නිලධාරී

- ජේ එච් එන් පියසුන්දර

  BSc (OUSL, Sri Lanka)
  M Phil (Peradeniya, Sri Lanka)

  පර්යේෂණ සහකාර
  (පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය)

- ඩී වී ආර් දෙනියපහල
  Diploma in Agriculture

  තාක්ෂණ නිලධාරී

**ශාක ව්‍යාධිවේදී අංශය**

- මහාචාර්ය කේ එල් වසන්ත කුමාර

  B Sc Agric. (Ruhuna, Sri Lanka)

  MSc (Peradeniya, Sri Lanka)

  PhD(Bangalore,India)

  fcHIaG m¾fhaIK ks,OdÍ

- එන් එම් එල් ප්‍රදීපා

  B Sc Agric. (Ruhuna)

  MSc (GBPUAT,India)

  fcHIaG m¾fhaIK ks,OdÍ

- ජී ඩී සින්නයියා
  B Sc (EUSL), Phd (Peradeniya)
  ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
  (කොන්ත්‍රාත් පදනම)

**පාංශු සහ ශාක පෝෂණවේදී අංශය**

- ආචාර්ය Ô mS .=Kr;ak

  **B Sc Agric. (Peradeniya, Sri Lanka)**

  **M phil (Peradeniya, Sri Lanka)**

  **Ph D(Peradeniya, Sri Lanka)**

  wxY m%OdkS $ fcHIaG m¾fhaIK ks,Odß

- ඒ කේ මුදලිගේ
  Diploma in Agriculture
  අත්හදාබැලීම් නිලධාරි
  (පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය)

- එම් පී එම් කුමාර
  HNDT (Agric)
  තාක්ෂණ නිලධාරි

- B Sc Agric. (Leipzig, Germany)

M Sc (Leipzig, Germany),

Ph D (West Berlin, Germany)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි(කොන්ත්‍රාත් පදනම)

- එල් ආර් එම් සී ලියනගේ
  B Sc Agric. (Peradeniya, Sri Lanka)
  පර්යේෂණ සහකාර

- ජේ ඩබ් කේ කේ ජයසුන්දර
  BSc Agric. (Peradeniya, Sri Lanka)
  MSc (Punjab,India)
  PGD in International Relations
  (BCIS, Colombo)
  පර්යේෂණ නිලධාරි

- ඩී එල් ඒ එල් ඒ දසනායක
  BSc Agric. (Peradeniya, Sri Lanka)
  පර්යේෂණ නිලධාරි

- ඩී පී එන් පී කරුණාජීව
  Diploma in Agriculture
  තාක්ෂණ නිලධාරි

- සී ඩී ජයසිංහ
  HNDT (Agric)
  තාක්ෂණ නිලධාරි

- පී එල් කේ තෙන්නකෝන්
  B Sc Agric. (Peradeniya, Sri Lanka)
  M Sc (Dharwat, India)
  අත්හදාබැලීමේ නිලධාරි

- ඩබ් ටී බී ඩී ප්‍රියන්ත
  B Sc (J' Pura, Sri Lanka)
  අත්හදාබැලීමේ නිලධාරි

- එස් එම් දිසානායක
  B Sc (Wayamba)
  අත්හදාබැලීම් නිලධාරි

- ජේ ආර් වයි අබේවර්ධන
  අත්හදාබැලීමේ නිලධාරි

- ඕ පී කේ ඒ ගුණරත්න
  Dip in Agiculture,
  ACLT (OUSL, Sri Lanka)
  අත්හදාබැලීමේ නිලධාරි

- ඩබ් එම් ජේ සී බණ්ඩාර
  B Sc (OUSL, Sri Lanka)
  අත්හදාබැලීමේ නිලධාරි

- ආර් ඒ අයි ඩබ් කේ රණතුංග
  Dip in Agiculture
  තාක්ෂණ නිලධාරි

- ඩබ් එම් එස් විජයතුංග
  B Sc Agric. (Peradeniya, Sri Lanka)
  M Sc (Peradeniya, Sri Lanka)
  පර්යේෂණ නිලධාරි

- පී එල් කේ තෙන්නකෝන්
  B Sc Agric. (Peradeniya, Sri Lanka)

- එස් කෝනේෂ්වරමූර්ති
  B Sc Engeenring (Peradeniya,Sri Lanka)
  කාර්මික ඉංජිනේරු/ ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිලධාරි

- එම් එස් වීරවර්ධන
  B Sc Engneering (Peradeniya,Sri Lanka)
  අත්හදා බැලීම් නිලධාරි

- කේ ඒ එස් ඒ රූපසිංහ
  Dip in Agiculture
  තාක්ෂණ නිලධාරී

- කේ එස් තිලකසිරි
  Dip in Agiculture
  තාක්ෂණ නිලධාරී

- ඩී සිල්වෙස්ටර්
  පොදු සේවක

- වී රත්නක්‍රිෂ්නන්
  පොදු සේවක

- එස් එච් ප්‍රියන්ති
  N D T (Moratuwa,Sri Lnaka)
  අත්හදා බැලීම් නිලධාරි

**පිරිසැකසුම් තාක්ෂණ අංශය**

- ආචාර්ය ඩබ් එස් බොතේජු
  B Sc (Sri Lanka)
  M Phil (Peradeniya,Sri Lanka)
  Ph D (Peradeniya,Sri Lanka)
  අංශ ප්‍රධානී/ ජ්‍යෂ්ඨ පර්යේෂණ නිලධාරි

- කේ රවීන්ද්‍රන්
  B Sc Engneering (Moratuwa,Sri Lanka)
  M Eng (AIT, Thailand)
  රසායන ඉංජිනේරු/ ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිලධාරි

- පී එල් සී ගලහිටියාව
  B Sc (Kalaniya,Sri Lanka)
  ජ්‍යෂ්ඨ පර්යේෂණ නිලධාරි

- කේ බී එම් ශ්‍රිපාලිකා
  B Sc Engneering (Peradeniya,Sri Lanka)
  අත්හදා බැලීම් නිලධාරි

**යාන්ත්‍රික වැඩපොල**

- ඒ නන්දසිරි
  ප්‍රධාන කාර්මික ශිල්පී

- එල් වීරසූරිය  කාර්මික ශිල්පී

**ජෛවමිතික ඒකකය**

- ටී යූ එස් පීරිස්
  B Sc Agric. (Peradeniya, Sri Lanka)
  M Phil (Peradeniya,Sri Lanka)
  ජ්‍යෂ්ඨ පර්යේෂණ නිලධාරි

- ඩබ් එම් යූ ඒ බී මාරපන
  B Sc (J'pura, Sri Lanka)
  අත්හදා බැලීම් නිලධාරි

- එම් ඒ චමීන්ද
  අත්හදා බැලීම් නිලධාරි

- සේනක ප්‍රභාත් දයානන්ද
  B Sc Engineering(Peradeniya,Sri Lanka)
  අත්හදා බැලීම් නිලධාරි

- ජේ සී කේ රාජසිංහ
  B Sc Agric. (Peradeniya, Sri Lanka)
  M Sc (PGIA, Sri Lanka)
  ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරි/ස්ථානභාර නිලධාරි
  (මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය)

- එල් ජයසිංහ
  අත්හදා බැලීම් නිලධාරි

- එස් සෙල්වදුරෙයි
  පොදු සේවක

- එම් ගේබ්‍රියල්
  කාර්මික ශිල්පී

- ආර් ඉලංගෝවන්
  පොදු සේවක

- එච් කේ කේ දේශප්‍රිය
  තාක්ෂණ නිලධාරි

උපදෙස් සහා ව්‍යාප්ති අංශය

- බී ඒ ඩී සමන්සිරි
  B Sc Agric. (Peradeniya, Sri Lanka)
  M Phil (Los Banos,Philippines)
  අංශ ප්‍රධානී (2011.03.15 සිට)/
  ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරි

- ආචාර්ය වී එස් සිධාකරන්
  B Sc Agric. (Peradeniya, Sri Lanka)
  M Sc (Peradeniya, Sri Lanka)
  Ph D (TNAU,India)
  වැඩබලන අංශ ප්‍රධානී(2011.03.14 දක්වා)/ ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරි

- ටී ජී එන් මහින්ද
  B Sc Agric. (Peradeniya, Sri Lanka)
  M Sc (Peradeniya, Sri Lanka)
  උපදේශක නිලධාරි/ වැඩබලන ස්ථානභාර නිලධාරි
  (මතුගම ව්‍යාප්ති මධ්‍යස්ථානය)

- එච් ජේ එම් ද සිල්වා
  B Sc Agric. (Ruhunu, Sri lanka)
  ව්‍යාප්ති නිළධාරි
  (මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය)

- එච් ජයවීර
  වැඩබලන ස්ථානභාර නිලධාරි/ ව්‍යාප්ති නිළධාරි
  (මතුගම ව්‍යාප්ති මධ්‍යස්ථානය)

- කේ ජී ජේ පී. මහින්දපාල
  B Sc Agric. (Peradeniya, Sri lanka)
  M Sc (Peradeniya Sri lanka)
  උපදේශක නිලධාරී/ස්ථානභාර නිලධාරී
  (ගාල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානය)

- එස් පී රත්නායක
  B Sc Agric. (Ruhuna, Sri Lanka)
  MBA (WHUT, China)
  උපදේශක නිලධාරී /ස්ථානභාර නිලධාරී
  (දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානය)

- ඒ එල් ආර් යු කුමාර
  B Sc Agric. (Peradeniya, Sri Lanka)
  ව්‍යාප්ති නිළධාරී

- සී ජේ ලියනාරච්චි
  B Sc Agric. (Wayamba, Sri Lanka)
  M Sc (Peradeniya, Sri Lanka)
  ව්‍යාප්ති නිළධාරී(පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය)

- පී කේ ආර් සී ඊ මුණසිංහ
  B Sc Agric. (Wayamba, Sri Lanka)
  ව්‍යාප්ති නිළධාරී(දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානය)

- ඩී කේ ඩී දිසානායක
  තාක්ෂණ නිලධාරී
  (ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානය)

- සී එස් කේ කිරිබත්ගොඩ
  ලඝු ලේඛිකා (ඉංග්‍රීසි)

- එන් එස් ඒකනායක
  තාක්ෂණ නිලධාරී

- කේ ආර් ඩබ් බී කහඳව
  B Sc Agric. (Peradeniya, Sri Lanka)
  M Sc (Peradeniya, Sri Lanka)
  ව්‍යාප්ති නිළධාරී/ ස්ථානභාර නිලධාරී
  (ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානය)

- එම් ඒ එච් නිශාන්ති
  B Sc Agric. (Peradeniya, Sri Lanka)
  ව්‍යාප්ති නිළධාරී

**ප්‍රකාශන සහ ප්‍රචාරක ඒකකය**

- කේ ජී එච් ලියනගේ
  B Sc (OUSL, Sri Lanka)
  ප්‍රකාශන/ප්‍රචාරක නිලධාරී

- ඒ පී වී කල්‍යානි
  ලඝු ලේඛිකා (ඉංග්‍රීසි)

- පී ඩබ් එම් එස් එන් ගුණසේකර
  Diploma in Agriculture
  තාක්ෂණ නිලධාරී

- අයි පී එස් ඩී වික්‍රමසූරිය
  තාක්ෂණ නිලධාරී

- අයි ඩබ් එම් නිහාල් කුමාර
  ලිපිකරු/යතුරු ලේඛක

- කේ ජී ආර් නිරෝෂන
  ඡායාරූප ශිල්පී

- ජේ ටී දේවදාසන්
  ඡායාරූප ශිල්පී

- ඒ ක්‍රිෂ්ණමෙනන්
  පොදු සේවක

**දුරකථන හුවමාරුපොල**

- කේ එම් සෙනෙවිරත්න බණ්ඩා
  දුරකථන ක්‍රියාකරු

- පී කේ එන් දමයන්ති
  දුරකථන ක්‍රියාකරු/ පිළිගැනීමේ නිලධාරිනී

- පී වෛතිලිංගම්පිල්ලේ
  පොදු සේවක

- ඒ ඒ චින්තක
  ලිපිකරු/යතුරු ලේඛක

- අයි ඩබ් එම් එන් කුමාර
  ලිපිකරු/යතුරු ලේඛක

- එස් ධර්මලිංගම්
  ලිපිකරු/යතුරු ලේඛක

**පුස්තකාලය**

- ආර් ඩබ් එම් එස් කේ අමුණුගම
  Diploma in Library Science
  පුස්තකාල සහකාර

- එස් පරමේශ්වරී
  පොදු සේවක

**තොරතුරු තාක්ෂණ ඒකකය**

- යූ ඩී අලගියවඩු
  අත්හදා බැලීමේ නිලධාරී

**පරිපාලන අංශය**

- ඩබ් පී ඒ එන් ජයසිංහ
  ප්‍රධාන ලිපිකරු

- කේ ආර් එම් ප්‍රියන්ත
  ලිපිකරු/යතුරු ලේඛක

- ඒ ඩබ් එම් පී ආර් ජයසිංහ
  ලිපිකරු/යතුරු ලේඛක

- ඩබ් එම් එස් ආර් වනසිංහ
  ලිපිකරු/යතුරු ලේඛක

- සී ජෙයරාම්
  ලිපිකරු/යතුරු ලේඛක

- ආර් එම් ඩී රත්නායක
  ලිපිකරු/යතුරු ලේඛක

- ආර් එම් බී ඩී රත්නායක
  සංචාරක බංගලා භාරකරු (කොළඹ)

- ආර් මහේන්ද්‍රන්
  සංචාරක බංගලා භාරකරු (තලවකැලේ)

- වී චන්ද්‍රසේකරන්
  පොදු සේවක

- එන් පුෂ්පරාජ්
  පොදු සේවක

- යූ ඩී ඩී රත්නසිරි
  ජල පෙරහන්ගාර සහකාර

- කේ ඒ එෆ් ධර්මදාස
  සහකාර ජලනල කාර්මික

- ජේ එම් ජෝතිපාල
  පෙදරේරු

- ආර් ජෙයරාජ්
  වඩු කාර්මික

- ඒ ලෝගනාදන්
  පොදු සේවක

- එම් එම් විජේසේකර
  පොදු සේවක

- එස් බාලක්‍රිෂ්ණන්
  පොදු සේවක

- සී පෝල්
  පොදු සේවක

**මිලදීගැනුම් ඒකකය**

- බී තිලකරත්න
  මිලදී ගැනුම් නිලධාරී

- පී ඩී එස් එල් ද සිල්වා
  ලිපිකරු/යතුරු ලේඛක

**ඉංජිනේරු ඒකකය**

- ආර් එම් ආර් ආර් ලලිත් රණරාජා
  නේවාසික ඉංජිනේරු

- සී ජේ බී අබේකෝන්
  වැඩ ලිපිකරු

- ජේ ජී ගමගේ
  ජල පෙරහන්ගාර සහකාර

- ඩබ් සී කේ ප්‍රනාන්දු
  ප්‍රධාන ජලනල කාර්මික

- ඩබ් ආර් පී ද සිල්වා
  ලිපිකරු/යතුරු ලේඛක

- පී ටී පෙරේරා
  ලිපිකරු/යතුරු ලේඛක

- ආර් ඒ සී ලසන්ත
  ලිපිකරු/යතුරු ලේඛක

**යාන්ත්‍රික වැඩපොල**

- ජී ජී ඊ එච් ගමගේ
  ප්‍රධාන මෝටර් කාර්මික
- ඩබ් ජී විජේරත්න
  පොදු කාර්මික

- කේ රාජරත්නම්

පොදු සේවක

- ජේ ඒ ආර් කේ බණ්ඩාර

විදුලි කාර්මික

- කේ ජයරත්නම්
  පොදු සේවක

- ජේ ඇන්තනි
  පොදු සේවක

- ආර් එම් එන් ප්‍රේමතිලක
  රියදුරු I

- ආර් ගුණසේකර
  රියදුරු I

- යූ කේ ඒ බී උඩුවැල්ල
  රියදුරු I

- කේ එම් ජී ද සිල්වා
  රියදුරු I

- ඩබ් එස් ජී ඩබ් පෙරේරා
  රියදුරු I

- එම් මරදමුත්තු
  රියදුරු I

- කේ බී වී යූ එන් ගුණසේන
  රියදුරු I

**විදුලි ඒකකය**

- යූ ඒ වික්‍රමසිංහ
  විදුලි සුපරීක්ෂක

- ආර් ඩබ් රෙංගසාමි
  විදුලි කාර්මික

- එල් ආර් රාජලිංගම්
  පොදු සේවක

**ප්‍රවාහන ඒකකය**

- එම් එල් එච් පෙරේරා
  ප්‍රවාහන නිලධාරී

- එස් එච් චන්ද්‍රසේන
  ලිපිකරු/යතුරු ලේඛක

- එස් බැස්ටියන්
  රියදුරු I

- කේ බී වී පියසේන
  රියදුරු I

- පී ඒ එස් එල් ලක්ෂ්මන්
  රියදුරු I

- පී සෙංගමලෙයි
  රියදුරු I

- එල් මුරුගේසු
  රියදුරු I

- එම් කලියපෙරුමාල්
  රියදුරු I

- ඩබ් ජී සෙනෙවිරත්න
  රියදුරු I

- ජී ජී එම් රණසිංහ
  රියදුරු II

- එම් බී එස් ප්‍රියශාන්ත
  රියදුරු II

- ඩබ් එම් එස් ජේ වීරසිංහ
  පොදු සේවක

- සමන් හේවාසීලියන්
  ගිණුම් ලිපිකරු

- ඩබ්.ඒ නිශාන්ත
  AAT-Parts 1&2
  පරිගණක දත්ත ක්‍රියාකරු සහ ගිණුම් ලිපිකරු

- අයි ජයවික්‍රම
  ලිපිකරු / යතුරු ලේඛිකා

- එච්. එන් ධර්මපාල
  ලිපිකරු / යතුරු ලේඛක

- කේ.ඒ.ඩී සුදත් ප්‍රදීප්
  ගිණුම් ලිපිකරු

- වී ඊ කුමාර
  ගිණුම් ලිපිකරු

- ටී එස් එස් කුමාර
  ගිණුම් ලිපිකරු

- පී එස් රාජු
  පොදු සේවක

- එන් සී ජයවීර
  අභ්‍යන්තර විගණන ලිපිකරු (තාවකාලිකව මූල්‍ය අංශය වෙත ස්ථානමාරු කරන ලදී)

- ඩබ් එන් කේ අයි ආරියරත්න
  අභ්‍යන්තර විගණන ලිපිකරු

**මූල්‍ය අංශය**

- ඩී එම් ආර් දිසානායක
  AAT Sri Lanka Associate
  වැඩබලන ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී

- එම්.වී මෝහන්
  CIMA (Londen) Interim,
  AAT Sri Lanka Associate
  ගණකාධිකාරී

- එස් පී පුංචිබණ්ඩා
  ජ්‍යෙෂ්ඨ ගිණුම් නිළධාරී

- වී. පහලගේ
  ගිණුම් ලිපිකරු

- බී.කේ එස් හේරත්
  ගිණුම් ලිපිකරු

- එම්. පී වීරතිලක
  මුදල් අයකැමි

- ඒ.ඒ.ඒ. පී අමරතුංග
  ගිණුම් ලිපිකරු

- එච්.බී තල්ගහගොඩ
  ගිණුම් ලිපිකරු සහ මුදල් අයකැමි

**අභ්‍යන්තර විගණන ඒකකය**

- ආර් කාරියවසම්
  අභ්‍යන්තර විගණක

- පී එස් වික්‍රමසිංහ
  අභ්‍යන්තර විගණක නිලධාරී

**ගබඩාව**

- කේ ටී යූ කුලතුංග
  සහකාර ගබඩා පාලක

- එච් පී ඩබ් ගුණසේකර
  ගබඩා සහකාර

- කේ එම් එස් කේ කොඩිතුවක්කු
  පොදු සේවක

# පර්යේෂණ කඩඉම්

## භෝග වැඩි දියුණු කිරීම

**තේ ක්ෂුද්‍ර ප්‍රචාරණය සඳහා අඩු වියදම් පටක රෝපණ තාක්ෂණය වැඩි දියුණු කිරීම.**

පටක රෝපණ තාක්ෂණය සඳහා භාවිතා කරන අධික පිරිවැයක් සහිත ඒගාර් මාධ්‍ය වෙනුවට භාවිතා කල හැකි අඩු වියදම් ආදේශක මාධ්‍යයක් හඳුනාගැනීමට පර්යේෂණ සිදුකරන ලදී. එහි ප්‍රතිඵලවලට අනුව පර්යේෂණයට භාවිතා කල විකල්ප මාධ්‍ය 10 අතරින් සව් මාධ්‍යය භාවිතා කල විට ක්ෂුද්‍ර අතු කැබලිවල ගුණන වේගය ඒගාර් මාධ්‍යයට (ලීටරයට ග්‍රෑම් 08ක් ) සාපේක්ෂව ඉහළ අගයක් පෙන්නුම් කරන ලදී. එම නිසා මෙම අඩු වියදම් පටක රෝපන තාක්ෂණය මේ වන විටත් සම්ප්‍රදායික අභිජනන ක්‍රියාවලිය කඩිනම් කිරීමට භාවිතා කරන ක්ෂුද්‍ර ප්‍රචාරණ ක්‍රමයේ ප්‍රායෝගික ශක්‍යයතාවය තහවුරු කරන ලදී.

**තේ අණුක විද්‍යාත්මක චරිතායනය සඳහා ඩී එන් ඒ සළකුණු ක්‍රමය භාවිතය**

තේ ශාකය බාහිර අභිජනනයට වැඩි ප්‍රමුඛතාවක් පෙන්වන බහුවාර්ෂික ශාකයක් නිසා එහි ජාන සම්පත් සංරක්ෂණය, භාවිතය හා ප්‍රවේණික වැඩිදියුණු කිරීම සඳහා සාම්ප්‍රදායික අභිජනන ක්‍රමවේද භාවිතයේ සීමාකාරිකම් පවතී. දැනට පවතින සාම්ප්‍රදායික අභිජනන වැඩසටහන්වල කාර්යක්ෂමතාවය හා නිරවද්‍යතාවය වැඩි කිරීම සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය මඟින් අනුක සලකුණු ක්‍රමවේදය එම වැඩසටහනේ ප්‍රධාන අංග දෙකක් තුලට අන්තර්ගහණය කරන ලදි. ඒවා නම්, ජාන විවිධත්වය හා සංරක්ෂණය පිළිබඳ අධ්‍යයනයන් (වැඩිදියුණු ප්‍රභේද නිපදවීම සඳහා ජාන සම්පත් සංරක්ෂණය හා භාවිතා කිරීම සඳහා තේ ජාන සම්පත් වල විවිධත්වය අධ්‍යයනය කිරිම) හා ජාන සිතියම්ගත කිරීම හා අනුක සලකුණු
පාදක අභිජනනය (ආර්ථිකව වැදගත් ලක්ෂණ ඉක්මණින් තෝරාගැනීම සඳහා එම ලක්ෂණ වලට බන්ධුතාවක් දක්වන DNA අනුක සලකුණු හඳුනාගැනීම හා භාවිතය-අනුක සලකුණු පාදක තේරීම MAS) වේ. ඉහත අරමුණු ලඟාකර ගැනීම සඳහා සරල ප්‍රතිවලිත සලකුණු (SSR) ක්‍රමවේදය භාවිතයෙන් වැඩිදියුණු කරන ලද තේ ප්‍රභේද චරිතායනය කිරීම සිදුකෙරේ. තේ වල ජාන එකතුව පුළුල් කිරීමේ අරමුණින්, පැරණි බීජ තේ ගහන වලින් තෝරාගත් පැල ඇගයීමට ලක් කොට නව ප්‍රභේද නිපදවීම සඳහා භාවිතා කළහැකි ඉහළ ජාන විවිධත්වයකින් යුත් බීජ තේ පැල කිහිපයක් හඳුනාගන්නා ලදී.



**TRI 5000 කාණ්ඩය - නව කාණ්ඩයේ තේ ප්‍රභේද**

TRI 5000 කාණ්ඩයේ නව ප්‍රභේදවල වාණිජ මට්ටමේ ඇගයීම් සඳහා වගාකරුවන්ගේ සහභාගිත්වය ඇතිව අනුවර්තී පර්යේෂණ 19ක් මේ වන විට සිදුකරමින් පවතී. පසුගිය වසර තුල විවිධ කෘෂි දේශගුණික කලාප නියෝජනය වන පරිදි මහාවතු 04ක් ආශ්‍රිතව නව අනුවර්තී පර්යේෂණ ස්ථාපනය කරන ලදී. එමෙන්ම WU2a හා IU3c යන කෘෂි දේශගුණික කලාපවල සිදුකරන ලද අත්හදාබැලීම්වල පළමු කප්පාදු චක්‍රයේ ඇගයීම් නිමකරන ලද අතර ප්‍රතිඵල වලට අනුව WU2a කෘෂි දේශගුණික කලාපයේ අත්හදාබලන ලද නව තේ ප්‍රභේද 05 ක පළමු කප්පාදු චක්‍රයේ අස්වැන්න TRI 2025 හා DTI යන පාලක ප්‍රභේදවල අස්වැන්නට වඩා වැඩි විය. එම වැඩි අස්වැන්නක් සහිත ප්‍රභේද අතරින් එක් ප්‍රභේදයක නිම් තේ වල ගුණාත්මකභාවය DTI ප්‍රභේදයේ නිම් තේ වල ගුණාත්මකභාවය හා සංසන්දනාත්මක වූ අතර නව කාණ්ඩයේ ප්‍රභේදවල ඉහළ අස්වැන්නට අමතරව ඉහළ නිම් තේ ගුණාත්මකභාවයද අන්තර්ගත වී ඇති බව එයින් තහවුරු කෙරිණි. IU3c කෘෂි දේශගුණික කලාපය තුල අත්හදාබැලීම් සිදුකරන ලද නව ප්‍රභේද 09 ක පළමු කප්පාදු චක්‍රයේ අස්වැන්න, නිම් තේ වල ගුණාත්මකභාවය සහ කඳගුල්ලාගේ හානියට ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ ඇගයීම් සිදු කරමින් පවතී.

**නව තේ ප්‍රභේද නිපදවීම**

නව තේ ප්‍රභේද නිපදවීමේදී ජානමය විවිධත්වය ලබාගැනීමේ ප්‍රධානතම ක්‍රමය වන්නේ දෙමුහුම්කරණ ක්‍රියාවලියයි. වසර 2003 - 2005 කාලය තුල සිදුකරන ලද පාලිත දෙමුහුම්කරණ ක්‍රියාවලිය මඟින් නිපදවන ලද, තෝරාගන්නා ලද දර්ශ 50ක් ඇගයීම් සඳහා අත්හදාබැලීම් දෙකක් තලවකැලේ හා රත්නපුර තේ පර්යේෂණ ආයතන මධ්‍යස්ථානවල එකවර ස්ථාපනය කරන ලදී. මෙම මුහුම් නිපදවීම සඳහා මව්පිය ශාක වශයෙන් ඉහළ විවිධත්වයක් ඇති, මීට පෙර අභිජනන ක්‍රියාවලිය සඳහා නිතර භාවිතා නොකළ ප්‍රභේද යොදා ගන්නා ලදී. එමෙන්ම මෙම තෝරාගත් දර්ශ භාවිතා කර වසර 2012 දී නව අත්හදාබැලීම් 02ක් හන්තාන සහ පස්සර තේ පර්යේෂණ ආයතන මධ්‍යස්ථානවල ස්ථාපනය කිරීමට අවශ්‍ය පැල සෑදීම ආරම්භ කර ඇත.

නව ප්‍රභේද නිපදවීම සඳහා සුදුසු දර්ශ තෝරාගැනීමට වතු ප්‍රභේද වරණය කිරීමේ වැඩසටහන වසර 2001 - 2004 කාලය තුලදී පීඩෘ, ලබුකැලේ, ලිඩස්ඩේල් හා ෆෙයාර්ලෝන් යන වතු ආශ්‍රිතව සිදුකරන ලදී. මේ යටතේ තෝරාගන්නා ලද දර්ශ 20ක් පළමු අදියරේ ඇගයීම සඳහා නව අත්හදාබැලීමක් තලවාකැලේ තේ පර්යේෂණ ආයතනයේ ස්ථාපනය කරන ලදී.

**සම්ප්‍රදායික අභිජනන ක්‍රියාවලියට අණුක ජීව විද්‍යාත්මක ක්‍රමවේද ඇතුලත් කිරීම**

සම්ප්‍රදායික අභිජනන ක්‍රියාවලියට පරිපූරකයක් ලෙස අණුක ජීව විද්‍යාත්මක ක්‍රම ඇතුලත් කරගැනීම ඉලක්ක කර ගනිමින් විද්‍යාගාර පහසුකම් ස්ථාපනය කරන ලදී. එම පහසුකම් උපයෝගි කර ගනිමින් 2004, 2005 හා 2006 වසර තුල සිදුකරන ලද පාලිත දෙමුහුම්කරණ ක්‍රියාවලිය මඟින් නිපදවන ලද ප්‍රජනිතයන් අණුක ජීව විද්‍යාත්මක දර්ශක භාවිතා කර ඇගයීම් සිදුකරන ලදී. මෙය ශ්‍රී ලංකාව තුල අණුක ජීව විද්‍යාත්මක දර්ශක භාවිතා කරමින් ප්‍රජනිතයන් ඇගයීමට ගන්නා ලද ප්‍රථම උත්සාහය වන අතර, මූලික ප්‍රතිඵල වලට අනුව

අනුමාන කරන ප්‍රජනිතයන්ගේ ජානමය විචලනය පිළිබඳ සොයා බැලීමට සහ දෙමව්පිය ලක්ෂණ සම්මිශ්‍රණය වූ ප්‍රජනිතයන් හඳුනාගැනීමට RAPD දර්ශක උපයෝගි කරගත හැකි බව තහවුරු විය.

**තේ ජාන සංචිතය ජෛව රසායනික ලක්ෂණ භාවිතයෙන් අනු ලක්ෂණය කිරීම**

ජෛව රසායනික ලක්ෂණයන් භාවිතා කර තේ ජාන සංචිතය අනු ලක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය සිදුකරමින් පවතී. මේ යටතේ ජාන ප්ලාස්ම 35ක තේ දළුවල හා නිමි තේ වල ඇති ජෛව රසායනික පරාමිතීන් විශ්ලේෂණය කල අතර ජෛව රසායනික විවිධත්වය පාදක කරගෙන එම ජාන ප්ලාස්ම 35 කාණ්ඩගත කරන ලදී. එම ජාන ප්ලාස්ම අතර කැෆේන් රසායනික සංඝටකය විශාල වශයෙන් විචලනය වනු දක්නට ලැබෙන අතර එම හඳුනාගත් ජාන ප්ලාස්ම ඉදිරි තේ අභිජනන ක්‍රියාවලිය සඳහා ප්‍රයෝජනවත් වනු ඇත.

**ආන්තික තේ වගා කරන ප්‍රදේශ සඳහා විකල්ප රෝපණ ද්‍රව්‍යයක් ලෙස වැඩි දියුණු කල තේ බීජ**

පසුගිය කාලය තුල තේ වගාකරුවන් අතර ආන්තික තේ වගා කරන ප්‍රදේශ සඳහා සුදුසු විකල්ප රෝපන ද්‍රව්‍යයන් කෙරෙහි දැක් වූ උනන්දුව නිසා වැඩි දියුණු කල බීජ සඳහා ඇති ඉල්ලුම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතී. එම නිසා තේ වගාකරුවන්ට බීජ එලදාව වැඩි කාලයට බීජ ලබාගැනීම පහසුකිරීම සඳහා වගාකරුවන් බීජ උද්‍යාන හා සම්බන්ධ කිරීමට කටයුතු ආරම්භ කර ඇත. එමෙන්ම වැඩි දියුණු කල බීජවල යෝග්‍යතාවය ඇගයීම සඳහා ස්ථාපනය කරන ලද අනුවර්තී පර්යේෂණ 06ක් අඛණ්ඩවම නිරීක්ෂණය කරමින් පවතී.

**TRI 3000 හා 4000 කාණ්ඩවල ප්‍රභේද කෙරෙහි වගාකරුවන් තුල ඇති ආකල්ප**

මෑතකදී නිකුත් කරන ලද නව තේ ප්‍රභේද කෙරෙහි වගාකරුවන් තුල ඇති ආකල්ප පිළිබඳ ඇගයීම සඳහා දීපව්‍යාප්ත සමීක්ෂණයක් උපදෙස් හා ව්‍යාප්ති අංශයේ හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහභාගිත්වයෙන් ආරම්භ කරන ලදී. මේ යටතේ දෙනියාය හා ඌව (බණ්ඩාරවෙල ,බදුල්ල හා පස්සර) ප්‍රදේශවල තේ වගාකරුවන් අතර කරන ලද සමීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුව ඔවුන් තුල TRI 3000 හා 4000 කාණ්ඩවල ප්‍රභේදවල ප්‍රගතිය පිළිබඳ යහපත් ආකල්පයක් (පිළිවෙලින් 77% හා 100%) පැවති අතර ඔවුන් නව ප්‍රභේද ඉදිරියටත් වගාකිරීමට බලාපොරොත්තුවෙන් සිටියි. මෙම සමීක්ෂණය මහනුවර ප්‍රදේශය ආශ්‍රිතවද සිදු කෙරෙමින් පවතී.

**නැවුම් තේ දළු වල පරාමිතීන් මඟින් කළු තේ වල තත්ත්වය/ගුණාත්මක බව පිළිබඳව අනාවැකි පල කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම**

නැවුම් තේ දළු වල රසායනික පරාමිතීන් භාවිතා කරමින් තේ නිෂ්පාදනයේ අවසානයේදී සාදන කළු තේ වල ගුණාත්මක බව පිළිබඳව කල්තියා අනාවැකි පල කිරීමේ හැකියාවන් ඇති නම් එය, නව තේ ප්‍රභේද අභිජනන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය ඉහළ නංවාලීමට උපකාරි වේ. මේ දක්වා භාවිතා කරන ක්‍රමය වනුයේ, අභිජනන පර්යේෂණ සඳහා යොදා ගන්නා තේ පාත්තිවලින් නෙලාගත් දළු සාමාන්‍ය පරිදි තේ නිෂ්පාදන ක්‍රියාවලියට යටත්

කොට සාදාගන්නා කළු තේ මගින් එහි ගුණාත්මකභාවය තීරණය කරගැනීමයි. B 16 යටතේ එන මෙම පර්යේෂණ සිදුකරනු ලැබුවේ තේ නිෂ්පාදන ක්‍රියාවලියේ අවසාන ඵලය වන නිමි තේ සහ එම තේ නිෂ්පාදනයට යොදාගනු ලබන නැවුම් තේ දළු වල රූපීය හා රසායනික ලක්ෂණ අතර පවතින සහසම්බන්ධය අධ්‍යයනය කිරීමයි. මේ සඳහා තේ ප්‍රභේද 12 ක් යොදාගනු ලැබූ අතර, නැවුම් තේ දළු හා නිෂ්පාදිත කළු තේ සඳහා රසායනික හා අනෙකුත් විශ්ලේෂණයන් වර්ෂා/තෙත් කාලය සඳහා සම්පූර්ණ කර ඇත. එම අධ්‍යයනයම වියළි කාලසීමාවකදි නැවත කිරීමට කටයුතු යොදා ඇත්.

**සුදු තේ/සිල්වර් ටිප් නිපදවීම සඳහා ප්‍රභේද හඳුනාගැනීම.**
**ඇන්තොසයනින් ප්‍රමාණය අධික TRI 2043 ප්‍රභේදය පමණක් දැනට සිල්වර් ටිප් නිපදවීම සඳහා යොදා ගැනේ.මේ සඳහා යොදා ගත හැකි වෙනත් ප්‍රභේද පිළිබඳ අධ්‍යනය වැදගත් ත්වී තවද සුදු තේ සඳහා ප්‍රමිතින් සකස් කිරීමට ISO ආයතනය සැලසුම්කර ඇති අතර ශ්‍රී ලාංකීය සුදු තේ නිපදවීමට ශ්‍රීලංකා තේ පර්යේ. ආ මුල් වරට පියවර ගෙන ඇත.**

**යාන්ත්‍රික තේ දළු නෙලීම සඳහා සුදුසු (අනුකූල) තේ දල්ලේ ගුණාංග තේරීම**
යාන්ත්‍රික දළු නෙලීම සඳහා සුදුසු වන තේ දල්ලේ ගුණාංග සෙවීම පිණිස තේ දල්ලේ ගුණාංග අටක්, තේ ප්‍රභේද අටක් අතරින් තෝරාගන්නා ලදී. එම ගුණාංග නම්, අස්වැන්න (වැඩි සහ අඩු), පර්ව අතර පරතරය (දිගු සහ කෙටි), පත්‍ර අග්‍රයේ ස්වභාවය (කෙලින් සහ පහතට නැමුණු), පත්‍ර විශාලත්වය (ඉතා විශාල සහ මධ්‍යම), පත්‍ර ආනතිය (පහතට නැමුණු සහ අර්ධ - සෘජු), ඒකීය වර්ගඵලයක දළු සංඛ්‍යාව (වැඩි සහ අඩු), වංගි ප්‍රමාණය (වැඩි සහ අඩු) සහ කටුක පාරිසරික සහ ශෂ්‍ය විද්‍යාත්මක තත්ත්ව වලට ඔරොත්තු දීම (ඔරොත්තු දෙන සහ නොදෙන) ලෙස විය. තෝරාගත් තේ ප්‍රභේද TRI 2023, TRI 2027, TRI 3025, TRI 3055, TRI 4014, TRI 4042, TRI 4049 සහ TRI 4061 ලෙස විය.

තෝරාගන්නා ලද තේ ප්‍රභේදයන්, CRD පර්යේෂණ සැකසුම් ක්‍රමයට පිහිටුවන ලද අතර මාස 10 ක කාලයක් පුරාවට අතින් සහ යන්ත්‍රානුසාරයෙන් දළු නෙලමින් ඉහත සඳහන් කරන ලද සියළු ගුණාංග වෙන වෙනම වාර්තාගත කරන ලදී. කාලයත් සමග අස්වැන්නේ සිදුවන වෙනස්කම් සහ එම වෙනස්කම් වලට අදාල තේ දල්ලේ ගුණාංග අතර අන්තර් සබඳතාවය අධ්‍යයනය කරන ලදී.

අස්වැන්න අඩුවීමේ ප්‍රතිශතය සංඛ්‍යා විද්‍යාත්මකව ගණනය කර බැලූ විට, TRI 2023 සහ TRI 2027 ප්‍රභේද වලට සාපේක්ෂව, TRI 4061 සහ TRI 3025 යන ප්‍රභේදවල අඩු අගයක් ගත් බව සොයාගන්නා ලදී. පර්ව වල දිග සහ පත්‍ර ආනතිය අඩු වීමේදී යාන්ත්‍රික දළු නෙලීම නිසා ඇති වන අස්වනු හානියද අඩු බව සොයාගන්නා ලද අතර, පඳුරක ඒකීය වර්ගඵලයක ඇති තේ දළු සංඛ්‍යාව වැඩිවන විට අස්වනු හානිය අඩුවන බවක්ද ගණනය කරන ලදී. එමෙන්ම පත්‍රයේ දිග වැඩි වීමේදී හානි වූ දළු ප්‍රතිශතය සහ අස්වැන්නේ ඇති නටු කොටස් ද වැඩි වන බව සොයාගන්නා ලදී. පත්‍රයේ වක්‍ර ස්වභාවය වැඩි වීමේදී අස්වැන්නට එන මේරූ දළු ප්‍රමාණයේ අඩුවීමක්ද දක්නා ලදී.

මෙසේ කෙටි පර්ව, ඒකීය වර්ගඵලයක් තුල වැඩි දළු සංඛ්‍යාවක් තිබීම, සෘජු සහ කුඩා පත්‍ර මෙන්ම වැඩි වක්‍රතාවක් දරන පත්‍ර යාන්ත්‍රික දළු නෙලීම සඳහා සුදුසු (අනුකූල) වන තේ ප්‍රභේදයක දළුවල තිබිය යුතු ගුණාංග වෙයි. එසේම නියගය ආදි දැඩි පරිසර තත්ත්ව වලට ඔරොත්තු දෙන සහ මධ්‍යම ප්‍රමාණයේ අස්වැන්නක් සහිත තේ ප්‍රභේදවල යාන්ත්‍රික

දළු නෙලීමේදී සිදුවන අස්වනු හානියේ ප්‍රතිශතය අඩුබව නිරීක්ෂණය කරන ලදී.

**නියඟයට ඔරොත්තු දෙන තේ ප්‍රභේද හඳුනාගැනීමේ ක්‍රමවේදයට උචිත පරාමිතික හඳුනාගැනීම**

හරිතාගාර තත්ත්ව යටතේ කරන ලද පර්යේෂණ තවදුරටත් තහවුරු කිරීම සඳහා ක්ෂේත්‍ර පර්යේෂණ දෙකක් ආරම්භ කරන ලදී. රත්නපුර ශාන්ත ජෝකිම් වත්තේ ස්ථාපනය කරන ලදී.

නියඟයට ඔරොත්තු දීමේ හැකියාව පදනම් කරගෙන රත්නපුර ප්‍රදේශය සඳහා TRI 2025, DG 39, TRI 4049, TRI 2023 හා TRI 4046 යන ප්‍රභේදත්, හන්තාන ප්‍රදේශය සඳහා TRI 2023, TRI 2027, DG 7, CY 9 හා TRI 2025 යන තේ ප්‍රභේදත් තෝරාගන්නා ලදී. මෙම ක්ෂේත්‍ර පර්යේෂණ මඟින් ද හරිතාගාර තත්ත්ව යටතේ මීට පෙර කරන ලද පර්යේෂණයේ ප්‍රතිඵල තවදුරටත් තහවුරු කරන ලදී. මේ අනුව එම නියඟයට ඔරොත්තු දෙන තේ ප්‍රභේද හඳුනාගැනීම සඳහා නිර්මාණය කරන ලද ක්‍රමවේධය අනාගතයේදී ද සාර්ථකව වන තේ ප්‍රභේද හඳුනාගැනීමට භාවිතා කලහැකි බව මෙයින් සනාථ කල හැකි විය.

**ප්‍රධාන තේ පළිබෝධකයන්ට ප්‍රතිරෝධී ප්‍රජනිතයන්, ප්‍රභේද හා බීජ තේ හඳුනා ගැනීම**

ආර්ථිකමය වශයෙන් වැදගත් වන තේ පළිබෝධකයන් සඳහා ඔරොත්තු දෙන / ප්‍රතිරෝධී තේ ප්‍රභේද හඳුනා ගැනීම පළිබෝධනාශක යෙදීම ඇතුළු අනෙකුත් පළිබෝධ මර්දන ක්‍රම භාවිතය අවම කිරීම තුළින් ආර්ථිකමය හා පරිසරයට හිතකර ලෙස ඒකාබද්ධ පළිබෝධ කළමණාකරණයේ මූලික අංගයකි. නව තේ ප්‍රජනිතයන්, ප්‍රභේද හා බීජ තේ 82 ක් සම්මත ක්‍රමවේදයන්ට අනුකූලව ප්‍රැටිලෙන්චස් ලූසයි, රැඩොෆොලස් සිමිලිස් වටපණු විශේෂයන්, කඳ විදින ගුල්ලා සහ පහතරට සජීවී දැව වේයා යන පළිබෝධකයන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව / ප්‍රතිරෝධී බව අධ්‍යයනය සඳහා ස්ථාන කිහිපයකදී පර්යේෂණ සිදු කෙරිණි.

## භූමි ඵලදායිතාවය වැඩි දියුණු කිරීම

**නැවත තේ වගාවට පෙර තෘණ වගාකොට සිදුකරන පාංශු පුනරුත්ථාපනයේ කාලසීමාව අවම කරගැනීම සඳහා ආර්ථිකමය වශයෙන් ඵලදායි වගාක්‍රම සංවර්ධනය කිරීම.**

නැවත තේ වගාවට පෙර තෘණ වගාකොට පාංශු පුනරුත්ථාපනය කිරීම අනිවාර්ය කාර්යයක් වුවද මාස 18-24 ක කාලසීමාවක් තුලදී එයින් සෘජු ආර්ථිකමය වාසියක් ලබාගත නොහැකි හෙයින් මහා වතු අංශයේ තේ වතු හා කුඩා තේ වතු අංශයේ ගොවීහු බොහෝ විට එසේ පුනරුත්ථාපනය නොකොට නැවත තේ වගාවට පෙළඹෙති.

එබැවින් මෙම පුනරුත්ථාපන කාලසීමාව අවම කරගැනීම සඳහා සුදුසු විකල්ප ක්‍රම අත්හදා බැලීම ඉතා කාලෝචිත වේ. මේ අනුව පහත දැක්වෙන පර්යේෂණ කටයුතු 2011 වසරේ මැද භාගයේ විවිධ ස්ථානවල ආරම්භ කරන ලදී.

**අ) නැවත තේ වගාව සඳහා පැරණි තේ ගැලවීමට වසර දෙකකට පෙර සිට තෘණ හා රනිලමය භෝග එම බිමෙහිම වගාකිරීම - නිව් පීකොක් වතුයාය ගම්පොල.**

2013 වසරේදී තේ නැවත සිටුවීමේ අරමුණින් පැරණි තේ ඉඩමෙහි තේ තිබියදීම ප්‍රතිකාරක 1 ලෙස වැටමාරා හා මානා හා ප්‍රතිකාරක 2 ලෙස ෆ්ලෙමින්ජියා හා මානා 2011 මැද භාගයේ වගාකරන ලදී. ප්‍රතිකාරක 3 ලෙස 2013 දී පුනරුත්ථාපනය නොකොට කෙලින්ම තේ සිටුවීමට නියමිතය. ප්‍රතිකාරක 4 ලෙස 2011 දී තේ ගලවා මානා සිටුවා 2013 දී නාවත තේ සිටුවීමට නියමිතය. ප්‍රතිකාරක 5 එනම් පාලකය ලෙස 2011 දී තේ ගලවා කෙලින්ම නැවත තේ සිටවීම කරන ලදී.

ප්‍රතිකාරක 1, 2, 3 සඳහා වූ පාත්ති වල පැරණි තේ වගාවෙන් 2013 මැද භාගය දක්වා තේ දළු නෙලීම කරගෙන යනු ලැබේ. පාංශු ගුණාත්මක දර්ශකය (SQI) ගණනය සඳහා පරීක්ෂණය ආරම්භයට පෙර පාංශු නියැදි ලබාගන්නා ලදී. ඒ අනුව පා ගු ද 5.72 ක් විය. පසෙහි කාබන් ප්‍රතිශතය 1.68 ක් විය. පාංශු ඝනත්වය සෙ මී 0-15 හා සෙ මී 15-30 ගැඹුරේදී පිළිවෙලින් 1.4 ක් හා 1.32 ක් විය. මානා දෙවරක් කප්පාදු කර එම බිමෙහිම අතුරන ලදී. පරීක්ෂණය තවදුරටත් කෙරෙමින් පවතී.

**ආ) පාංශු පුනරුත්ථාපනයේ කාලසීමාව අවම කරගැනීම සඳහා ජෛව පටල ජෛව පොහොර භාවිතය- නිව් පීකොක් වතුයාය, ගම්පොල හා හව්පේ වතුයාය, කහවත්ත**

පහත ප්‍රතිකාරක 2011 ජූනි මස ආරම්භ කරන ලදී. ප්‍රතිකාරක 1 ලෙස පාංශු පුනරුත්ථාපනය නොකොට 2011 දී තේ වගාකර ජෛව පොහොර සමග T200 පොහොර මිශ්‍රණයෙන් අඩක් යෙදීම. ප්‍රතිකාරක 2 ලෙස 2011 පුනරුත්ථාපනය ආරම්භ කර 2013 දී තේ නැවත සිටුවීමට නියමිතය. ප්‍රතිකාරක 3 ලෙස 2012 දී පුනරුත්ථාපනය ආරම්භ කර 2013 දී තේ නැවත සිටුවීමට නියමිත අතර මේ වසරක කාලය තුල ජෛව පොහොර සමග යූ 625 තෘණ පොහොර මිශ්‍රණයෙන් අඩක් මානා සඳහා යෙදීමට නියමිතය. ප්‍රතිකාරක 4 ලෙස 2012 දී පුනරුත්ථාපනය ආරම්භ කර 2013 දී තේ නැවත සිටුවීමට නියමිත අතර මේ වසරක කාලය තුල ජෛව පොහොර සමග යූ 625 තෘණ පොහොර මිශ්‍රණයෙන් මුළු නිර්දේශයම මානා සඳහා යෙදීමට නියමිතය. ප්‍රතිකාරක 5 ලෙස 2013 දී පුනරුත්ථාපනය නොකර තේ සිටුවා ජෛව පොහොර පමණක් යෙදීමට නියමිතය. ප්‍රතිකාරක 6 ලෙස 2013 දී පුනරුත්ථාපනය නොකර තේ සිටුවා T200 පොහොර පමණක් යෙදීමට නියමිතය. පරීක්ෂණයට පෙර පාංශු නියැදි ලබා ගන්නා ලදී. නිව් පීකොක් වතුයායේ පාංශු පී එච් අගය 3.39 කි. කාබන් ප්‍රතිශතය 1.04 කි. නයිට්‍රජන් ප්‍රතිශතය 0.17 ක . පොටෑසියම් ප්‍රමාණය කි ග්‍රෑ 1 ට මි ග්‍රෑ 194 කි. පාංශු ගුණාත්මක දර්ශකය (SQI) 5.5 කි.

හව්පේ වතුයායේ පාංශු පී එච් අගය 5.04 කි. කාබන් ප්‍රතිශතය 2.5 කි. නයිට්‍රජන් ප්‍රතිශතය 0.22 කි. පොටෑසියම් ප්‍රමාණය කි ග්‍රෑ 1 ට මි ග්‍රෑ 181 කි. මානා වරක් කප්පාදු කරන ලදී. පරීක්ෂණ දිගටම පවත්වාගෙන යනු ලැබේ.

**ඇ) වසර 1 ½ - 2 පුනරුත්ථාපන කාලසීමාව කෙටි කරගැනීමේ අරමුණින් ඉහළ කොළ අස්වැන්නක් සහිත නව තෘණ විශේෂයක් අත්හදා බැලීම.**

ශාන්ත ජෝකිම් වතුයාය, රත්නපුර, හව්පේ වතුයාය, කහවත්ත හා ප්‍රාදේශීය මධ්‍යස්ථානය, තේ පර්යේෂණ ආයතනය, කොට්ටව හා ගාල්ල

හයිබ්‍රිඩ් නේපියර් (ප්‍රභේද CO3) හා නැගෙනහිර ඉන්දියන් ලෙමන්ග්‍රාස් නැමති නව තෘණ විශේෂ දෙකෙහි තෘණ නිෂ්පාදන හැකියාව හා තෘණ කපා තේ ඉඩමේ ඇතිරීමෙන් වන පාංශු කාබනික හා රසායනික ගුණාංග වැඩි දියුණුවීම යනාදිය, මානා හා ගෞතමාලා තෘණ සමග සංසන්දනාත්මකව අධ්‍යයනය කරන ලදී. පරීක්ෂණයට ප්‍රථම පසෙහි කාබනික රසායනික ගුණාංග පරීක්ෂා කරන ලදී. රත්නපුර කල පරීක්ෂණයේදී තෘණ කප්පාදු තුනකදී ඉහළම තෘණ අස්වැන්නක් ලබාදුන්නේ ප්‍රභේද CO-3 මඟිනි. එය හෙක්ටයාර 1 ට වියළි බර මෙ. ටො. 30.6 කි. ලෙමන් ග්‍රාස්, මානා හා ගෞතමාලා පිළිවෙලින් හෙක්ටයාර 1 ට මෙ. ටො. 12.1 ක්, මෙ. ටො. 5.5 ක් හා මෙ. ටො. 16.6 ක් ලබාදුනි. පළමු කප්පාදුවෙන් පසු CO-3 හා ලෙමන්ග්‍රාස් මඟින් පසේ නයිට්‍රජන් පිළිවෙලින් 0.17% ක් හා 0.02% ක් හා පොටෑසියම් පිළිවෙලින් 57 මි.ග්‍රෑ./කි. ග්‍රෑ. හා 70.9 මි.ග්‍රෑ./කි. ග්‍රෑ. ලෙස පසේ මුලින් පැවති ප්‍රමාණයන්ට වඩා ඉහළ ගියේය.

මේ අතර හව්පේ වතුයායේ පරීක්ෂණයේදී කප්පාදු වට දෙකකින් වියළි බර ලෙස CO3, ලෙමන්ග්‍රාස්, මානා හා ගෞතමාලා මඟින් හෙක්ටයාර 1 ට මෙ. ටො. 24.6, 6.91, 4.76 හා 8.63 ක් පිළිවෙලින් ලබාදුනි. සියළු පරීක්ෂණ තවදුරටත් කෙරෙමින් පවතී.

**පාංශු ගුණාත්ම දර්ශකයේ (SQI) වලංගුභාවය නිර්ණය කිරීම**

තේ ඉඩම්වල ජෛව, රසායනික හා භෞතික ගුණාංග පරීක්ෂා කිරීම සඳහා අළුතින් නිර්මාණය කරන ලද පාංශු ගුණාත්මක දර්ශකය අනාගතයේදී පාංශු වැඩිදියුණු කිරීම සඳහා යම් නිර්දේශයන් ලබාදීම සඳහා ඉතා වැදගත් වේ. දැනට ගණනය කර ඇති පාංශු ගුණාත්මක දර්ශක අගයන්හි වලංගුභාවය නිර්ණය කිරීම සඳහා තේ නැවත සිටුවීමට නියමිත ඉඩම් ඇති පහත සඳහන් වතුවලින් පස් නියැදි ලබාගැනීම මැයි මාසයේ සිට ආරම්භ කරන ලදී. එම වතු නම් ගම්පොල නිව් පිකොක් වතුයාය, ස්ටෙලන්බර්ග් වතුයාය, රත්නපුර කහවත්තේ දොලොස්වල හා වටාපොත වතුයායන් වේ.

**ජල කළමනාකරණ තාක්ෂණයන් සංවර්ධනය කිරීම**

තේ වගාවේ පාංශු ජල කළමනාකරණයේදී වැසි ජලය එක්කොට සුරැකීම හා ක්ෂුද්‍ර ජල සම්පාදන උපායමාර්ග තාක්ෂණයන්ට වැදගත් ස්ථානයක් හිමිවේ. බිඳිති හා විසිරි ජල සම්පාදනය මූලික කරගත් පරීක්ෂණයක් කප්පාදු චක්‍ර 03 කාලයන් තුල රත්නපුර ශාන්ත ජෝකිම් වතුයායේ සිදුකොට 2011 වසරේදී නිම කරන ලදී. ඒවාය් ප්‍රතිඵල පහත දැක්වේ.

**බිඳිති ජල සම්පාදනය කෙරෙහි තේ ප්‍රභේදවල බලපෑම**

බිඳිති ජල සම්පාදනය කෙරෙහි එකිනෙකට වෙනස් තේ ප්‍රභේද 2 ක් වන TRI 2023 හා TRI 3025 හි බලපෑම පරීක්ෂා කරන ලදී. පෙබරවාරි - මාර්තු නියං සමය තුලදී ජල සම්පාදනය මඟින් ප්‍රභේද 02 හිම තේ අස්වැන්න 2.6 - 2.8 ගුණයකින් ඉහළ ගියේය. තවද වැසි ජලයෙන්

පෝෂණය වූ තේ හා සසඳන විට වාර්ෂිකව 20% ක ප්‍රමාණයකින් අස්වනු ඉහළ ගියේය. ජල සම්පාදනය මගින් අස්වනු ඉහළ යාම කෙරෙහි TRI 2023 , TRI 3025 ට වඩා ඉහළ ප්‍රතිචාරයක් දැක්වීය. තවද බිඳිති ජල සම්පාදනය නිසා කඳ පිළිකා රෝගය 80% ක් පමණ අඩුවීමේ ප්‍රවණතාවයක් දැක්විය. ඒ අනුව ප්‍රභේදවල ප්‍රතිචාරය විවිධ බව පැහැදිලි වූ අතර බිඳිති ජල සම්පාදනය සඳහා TRI 2023 වැනි නියගයන්ට ග්‍රාහී ප්‍රභේද වඩා යෝග්‍ය බව පැහැදිලි විය.

**බිඳිති හා විසිරි ජල සම්පාදනය සැසඳීම**

විසිරි ජල සම්පාදනය යටතේ වගාකරන ලද TRI 2023 ප්‍රභේදය බිඳිති ජල සම්පාදනයට වඩා 6% ක ඉහළ අස්වැන්නක් ලබාදුනි. විසිරි ජල සම්පාදනය මගින් නියං සමයේ පරිසර උෂ්ණත්වය පහළ දැමීම හා කායික ක්‍රියාකාරකම් රැසක් සඳහා යහපත් පරිසරයක් ඇති කිරීම යනාදි කරුණු මීට හේතුවන්නට ඇත.

**සෙවණ පාලන උපායමාර්ග දියුණු කිරීම**

**සෙවණ සඳහා සුදුසු විවිධ ශාක විශේෂවල වර්ධන හැකියාවන් පරීක්ෂා කිරීම**
විවිධ ශාකවල සෙවණ ලබාදීම සඳහා ඇති සුදුසුභාවය පරීක්ෂා කිරීමේදී ශාක විශේෂ 08 ක් ඒ සඳහා හඳුනාගන්නා ලදී. ඒවායින් ඩෙරිස් මයික්‍රොෆයිලා හා කැෂියා නොඩෝසා වල බීජ ලබාගෙන රත්නපුර ශාන්ත ජෝකිම් වතුයායේදී තවාන්ගත කරන ලදී. ඩෙරිස් මයික්‍රොෆයිලා බීජ පමණක් හොඳින් ප්‍රරෝහණය විය.

**පාංශු සහ ශාක පෝෂණ අංශය**

පාංශු සශ්‍රීකතාවය උදෙසා ඒකාබද්ධ භාවිතය
ක්ෂේත්‍ර විශේෂිත පොහොර නිර්දේශ සංවර්ධනය කිරීම (**SSFR**)
ක්ෂේත්‍ර විශේෂිත පොහොර නිර්දේශයේ අරමුණ වනුයේ අස්වනු විභවයට අවධානය යොමුකොට ඊට සරිලන නයිට්‍රජන් පොහොර අවශ්‍යතාවය පදනම් කරගෙන සහ පාංශු පරීක්ෂාවක් මගින් අවශ්‍ය පොහොර ප්‍රමාණයන් වඩා නිවැරදිව පසට ලබාදීමයි. මෙමගින් සමතුලිත පෝෂණයක් ලබාදෙන අතරම පොහොර සඳහා වැය වන මුදල ද ඉතිරිකර දෙයි. මෙම SSFR ක්‍රමවේදය භාවිතා කිරීමේදී තේ වගා බිම්වල නියමාකාර පෝෂණ කළමනාකාරය සඳහා පාංශු පරීක්ෂාව පූර්ව අවශ්‍යතාවයක් වේ. SSFR ක්‍රමවේදය පළමු වරට තේ පර්යේෂණ ආයතනය විසින් වර්ෂ 2006 දී හඳුන්වා දෙනු ලැබූ අතර SSFR භාවිතා කිරීමට අදාල උපදේශ පත්‍රිකාවක් ද නිකුත් කරනු ලැබිණි.

මෙම අධ්‍යයනයේදී ශ්‍රී ලංකාවේ තේ වගා කරන සෑම ප්‍රදේශයක්ම නියෝජනය වන පරිදි පාංශු වර්ගීකරණ ශ්‍රේණි විස්සකින් පස් නියැදි එකරැස් කොට පෝෂක ස්වාරක්ෂක හැකියාව (පෝෂක සාන්ද්‍රණය වෙනස්වීමට දක්වන ප්‍රතිරෝධය) විශ්ලේෂණය කරන ලදී. එම දත්තයන් මැග්නීසියම් පෝෂකය පදනම් කොටගෙන පාංශු වර්ගීකරණය සඳහා මෙවලමක් ලෙස යොදාගන්නා ලදී. විශ්ලේෂණයට භාජනය කළ පාංශු ශ්‍රේණි තුල මැග්නීසියම් පෝෂකයෙහි විචල්‍යතාවයක් ප්‍රතිඵල ලෙස දක්නට ලැබිණි. ශ්‍රී ලංකාවේ තේ වගාව සඳහා දැනට භාවිතා කරන මැග්නීසියම් පොහොර නිර්දේශය වඩා සියුම්ව සකස් කිරීමට මෙම වර්ගීකරණය භාවිතා කිරීම වාසිදායක විය හැක.

**නයිට්‍රජන් සහ පොටෑසියම් පොහොර සඳහා තේ ශාකයේ ප්‍රතිචාරය**

විවිධ පෝෂක ප්‍රමාණයන් නයිට්‍රජන් (120,360 සහ 600 කි.ග්‍රෑ/හෙක්/අවු. N) සහ පොටෑසියම් (0.80 සහ 120 කි.ග්‍රෑ/හෙක්/අවු. $K_2O$ ලෙස ) යෙදීමෙන් තේ වගාවේ අස්වැන්න හා පාංශු/ශාක පෝෂක තත්ත්වයන්ට වන බලපෑම සොයාබැලීම සඳහා මෙම අධ්‍යයනය සිදුකරන ලදී. නයිට්‍රජන් ප්‍රමාණය වැඩි කරන විට තේ අස්වැන්න ද සැලකිය යුතු ලෙස වැඩි විය. එමෙන්ම නයිට්‍රජන් ප්‍රමාණය වැඩි කරන විට අදාල ප්‍රභේදයන්හි මව් පත්‍රයේ ඇති නයිට්‍රජන් සාන්ද්‍රණය ද සැලකිය යුතු ලෙස වැඩි විය.

පොදුවේ සැලකූ විට N ප්‍රමාණය වැඩිකර යෙදීම පසේ $P^H$ අගය (පසේ ආම්ලිකතාවය, උදාසීනබව හෝ භාෂ්මිකතාවය) මතුපිට පසේ මෙන්ම යටි පසේද සැලකිය යුතු ලෙස අඩු කරන ලදී. වැඩි කරන ලද පොටෑසියම් ප්‍රමාණයන්ට සමගාමීව මව් පත්‍රයේ පොටෑසියම් සාන්ද්‍රණය සැලකිය යුතු ලෙස වැඩි වූ නමුත් ඒ හා සමගාමීව අසුවනු වැඩි වීමක් දක්නට නොලැබුණි. කෙසේ වූවද පොටෑසියම් ප්‍රමාණය වැඩි කර යෙදූ විට පසේ පොටෑසියම් මට්ටම කැපී පෙනෙන ලෙස වර්ධනය විය.

**කොම්පෝස්ට් පොහොර සමඟ අකාබනික නයිට්‍රජන් යෙදීම**

විවිධ නයිට්‍රජන් පෝෂක මට්ටම් (200,400 සහ 600 කි.ග්‍රෑ/හෙක්/අවු. N ලෙස) සමග විවිධ කොම්පෝස්ට් පොහොර මට්ටම් (0,10,20 සහ 30 ටොන්/හෙක්/අවු. වශයෙන්) යෙදීමෙන් ශාක වර්ධනය පාංශු සහ ශාක පෝෂක තත්ත්ව හා අස්වැන්න කෙරෙහි වන බලපෑම සොයාබැලීම සඳහා මෙම අධ්‍යයනය සිදුකරන ලදී. යූරියා නයිට්‍රජන් පොහොර ලෙස ක්‍රමයෙන් වැඩි කරමින් යෙදීමට සාපේක්ෂව අස්වැන්න සැලකිය යුතු ලෙස වැඩි විය. කොම්පෝස්ට් පොහොර වැඩිකර යෙදීමෙන් සැලකිය යුතු ලෙස අස්වනු වැඩිවීමක් නිරීක්ෂණය නොවී නමුදු කොම්පෝස්ට් නොමැති ප්‍රතිකාරක වලට වඩා කොම්පෝස්ට් සහිත නයිට්‍රජන් ප්‍රතිකාරක වල මධ්‍යන අස්වැන්න වැඩිවීමක් දක්නට ලැබුණි. කොම්පෝස්ට් ප්‍රමාණයන් වැඩි කිරීමට සාපේක්ෂව පාංශු කාබන් ප්‍රමාණය, පසේ පෝෂක රඳාගැනීමේ හැකියාව, ශාක උපයෝජ්‍ය මැග්නීසියම් හා කැල්සියම් ප්‍රමාණයන් සැලකිය යුතු ලෙස වැඩි වීමක් දක්නට ලැබුණි.

**යූරියා සහ ඇමෝනියම් සල්ෆේට් විවිධ ප්‍රමාණවලින් හා විවිධ අනුපාතවලින් යෙදීම**

යූරියා සහ ඇමෝනියම් සල්ෆේට් ලෙස විවිධ නයිට්‍රජන් ප්‍රමාණයන් (වසරකට හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 240 ක් සහ 360 ක් වශයෙන්) යෙදීම සහ එම පොහොරවල විවිධ අනුපාත (යූරියා: ඇමෝනියම් =100-0,75-25,50-50,25-75 සහ 0-100 වශයෙන්) යෙදීමෙන් පැලවල වර්ධනය, පැංශු සහ ශාක පෝෂක තත්ත්වය සහ අස්වැන්න කෙරෙහි බලපෑම සොයාබැලීම උදෙසා මෙම පර්යේෂණය කරන ලදී. පර්යේෂණ ස්ථානවලින් බහුතරයක් නයිට්‍රජන් ප්‍රමාණය වැඩි වීම නිසා හෝ නයිට්‍රජන් ප්‍රභවවල එනම් අනුපාතවල වෙනස්වීම නිසා හෝ අස්වැන්නෙහි සැලකිය යුතු වෙනසක් නොපෙන්වන ලදී. යූරියා සහ ඇමෝනියම් සල්ෆේට් සංයෝජන තුල ඇමෝනියම් සල්ෆේට් අනුපාතය වැඩිකර යෙදීමේදී සහ නයිට්‍රජන් ප්‍රමාණය වැඩිකර යෙදීමේදි උපයෝජ්‍ය පාංශු සල්ෆර් සාන්ද්‍රණය කැපී පෙනෙන ලෙස මතුපිට පස සහ යටි පස යන පාංශු ස්ථර දෙකෙහිම වැඩිවීමක් දක්නට

ලැබිණි. නයිට්‍රජන් ප්‍රමාණය 100% ක් යූරියා ලැබූ කොටුවලට සාපේක්ෂව කැපී පෙනෙන ලෙස අඩු විය.

**ශ්‍රී ලංකාවේ තේ වගා කරන පසේ ක්ෂුද්‍ර පෝෂක තත්ත්වය තක්සේරු කිරීම**

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ තේ වගා පසෙහි ක්ෂුද්‍ර පෝෂක තත්ත්වය පදනම් කරගත් ඵලදායී මෙන්ම ලාභදායී ක්ෂුද්‍ර පෝෂක සංයෝජනයක් හඳුන්වා දීමයි. මේ සඳහා මූලික වශයෙන් පාංශු ශ්‍රේණි හඳුනාගැනීමෙන් පසුව පහතරට (ගාල්ල, මාතර, හම්බන්තොට සහ රත්නපුර යන දිස්ත්‍රික්ක), මැදරට (මහනුවර, මාතලේ, කුරුණෑගල සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක), උඩරට (නුවරඑළිය දිස්ත්‍රික්කය සහ ඌව (බදුල්ල සහ බණ්ඩාරවෙල යන දිස්ත්‍රික්ක) ප්‍රදේශයන්ගෙන් ක්ෂුද්‍ර පෝෂක තත්ත්ව ඇගයීම සඳහා අවශ්‍ය පාංශු නියැදි තේ වගා කරන ප්‍රදේශවල බෝරෝන් තත්ත්වය ඇගයීම සඳහා යොදාගන්නා ලදී. එහිදී උපයෝජ්‍ය බෝරෝන් ප්‍රමාණයන් විශ්ලේෂණය කරන ලදී. තේ වගා කරන ප්‍රදේශවල ඇති විවිධ පාංශු ශ්‍රේණිවල බෝරෝන් තත්ත්වයන්හි විචල්‍යතාවයක් දක්නට ලැබෙන බව ප්‍රතිඵලවලින් අනාවරණය විය.

**තේ වගාව සඳහා සුදුසු ජෛව - කාබනික සහ ඛනිජමය හෝ සංයුක්ත පොහොර වර්ග සෑදීමේ ක්‍රම ප්‍රවර්ධනය කිරීම**

තේ පැල වැඩිමට අනුබල දෙන 'රයිසො බැක්ටීරියා' යනු ශාක මුල් මතුපිටින් වෙන්කර ගන්නා ලද ඵලදායි, නිදහසේ ජීවත්වන හෝ සංගමික හෝ සහජීවී පාංශු බැක්ටීරියා වන අතර ශාක වර්ධනය හා අස්වැන්න වැඩි කරන බවට පසක් කර ඇත. මැදරට සෑම කෘෂි දේශගුණික කලාපයක්ම නියෝජනය වන පරිදි තේ ගස්වල මුල් ආසන්නයෙන් පස් නියැදි ලබාගැනීම සම්පූර්ණ කර ඇත. රැස්කරගත් තේ මුල්වලින් නයිට්‍රජන් තිර කරන්නා වූ බැක්ටීරියාවන් වෙන්කර ගන්නා ලදී.

පොස්ෆේට් දියකරන්නා වූ බැක්ටීරියාවන්ද පාංශු මූල සාම්පල් වලින් වෙන්කර ගන්නා ලදී. මෙසේ වෙන්කර ගන්නා ලද බැක්ටීරියාවන් තවත් තත්ත්ව යටතේ ඔවුන්ගේ ඵලදායි ලක්ෂණ භාවිතයෙන් කාණ්ඩ කිරීම ආරම්භ කර ඇත.

**ශ්‍රී ලංකාවේ තේ වගා කරන පසෙහි $P^H$ ස්වාරක්ෂක ලක්ෂණයන් තක්සේරු කිරීම**

ප්‍රධාන පාංශු ශ්‍රේණි හඳුනාගනිමින් තේ වවන විවිධ ප්‍රදේශ අනාවරනය කරමින් පස් නියැදි රැස්කර ඒවායේ $P^H$ ස්වාරක්ෂක ධාරිතාවයන් තක්සේරු කරන ලදී. ඒ අනුව තේ වගා කරන ප්‍රදේශවල පාංශු ශ්‍රේණි ප්‍රධාන කාණ්ඩ 03 ක් යටතේ විදහා දක්වන ලදී. මෙම වර්ගීකරණය තේ වගා කරන ප්‍රදේශවලට අවශ්‍ය ඩොලමයිට් අවශ්‍යතාවය තීරණය කිරීමට උපකාර වේ. මේ සඳහා වඩා පහසු සූත්‍රයක් ගොඩනැගීමට අදාල පර්යේෂණ කටයුතුද ආරම්භ කර ඇති අතර, එහිදී ඩොලමයිට්වල කාර්යක්ෂමතාවය හා පවිත්‍රතාවය, එහි උදාසීන කරන කාලසීමාව, දේශගුණික සාධක, භාෂ්මික කැටායන ශාක මගින් අවශෝෂණය කිරීම හා පසෙන් ඉවත්වීම මගින් මෙන්ම නයිට්‍රජන් පොහොර යෙදීමෙන් වර්ධනය වන ආම්ලිකතාවය යනාදි කරුණු සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

**විවිධ ප්‍රමාණවලින් ඩොලමයිට් යෙදීම**

විවිධ ප්‍රමාණවලින් ඩොලමයිට් යෙදීමෙන් (0,1000,2000,3000 සහ 4000 කි.ග්‍රෑ/හෙක්/කප්පාදු චක්‍රයට) අස්වැන්නට සහ පාංශු/ශාක පෝෂක තත්ත්ව වලට ඇති බලපෑම සොයාබැලීම සඳහා මෙම පර්යේෂණ සිදුකරන ලදී. යොදන ලද ඩොලමයිට් ප්‍රමාණයන් වැඩි කිරීම මගින් අස්වැන්නෙහි සැලකිය යුතු වෙනසක් පෙන්නුම් කෙරුණි. කෙසේ වුවද ඩොලමයිට් ප්‍රමාණය වැඩි වීමත් සමග පාංශු $P^H$ අගයට හා ලබාගත හැකි කැල්සියම් හා මැග්නීසියම් ප්‍රමාණයන්ට සැලකිය යුතු ලෙස බලපෑම් කරනු ලැබිණි.

**තේ වගා අංශයට භූගෝලීය තොරතුරු පද්ධති (GIS) යොදාගැනීම**

විවිධාකාර වූ භූ දර්ශන සහිත තේ වගා කරන ප්‍රදේශවල පාංශු සාරවත් බවෙහි අවකාශමය හා කාලීනමය විචල්‍යතාවයක් හඳුනාගැනීම ප්‍රධාන අරමුණ කොටගෙන මෙම අධ්‍යයනය සිදු කරන ලදී. කොට්ටව ව්‍යාප්ති මධ්‍යස්ථාන පසෙහි රසායනික ලක්ෂණවලට අවකාශමය විචල්‍යතාවයන් ඇගයීමට ලක් කොට GIS තාක්ෂණික ක්‍රමවේදය භාවිතා කොට සිතියම්ගත කරන ලදී. පාංශු $P^H$ අගය, ඓන්ද්‍රිය කාබන් ප්‍රමාණය හා උපයෝජ්‍ය පාංශු පෝෂක අවකාශමය වශයෙන් විචල්‍යතාවයන් පෙන්වන බව නිරීක්ෂණය කරන ලදී.

**තවාන් සඳහා ජෛව පටල ජෛව පොහොර භාවිතය**

තවාන් සඳහා ජෛව පටල ජෛව පොහොර භාවිතය අධ්‍යයනය කිරීම සඳහා වැටහිර, මල් රටකජු, තේ පැලයේ මූලාශ්‍රිත ප්‍රදේශවලින් වෙන් කරගත් බැක්ටීරියා සහ දිලීර යොදාගන්නා ලදී. පරීක්ෂණ ගණනාවක ප්‍රතිඵලයක් ලෙස තවාන් සඳහා යොදන T65 නිර්දේශිත පොහොර භාවිතය භාගයකින් අඩු කිරීමට මෙම ඉහත කී ජෛව පටල ජෛව පොහොර යොදාගත හැකි බව සොයාගෙන ඇත. එම පරීක්ෂණ දත්ත වඩාත් තහවුරු කරගැනීම සඳහා තේ පැල 5000 ක් යොදාගෙන තේ පර්යේෂණ ආයතනයේ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල කරන ලද පරීක්ෂණවලදී ද ඉහත ප්‍රතිඵල සනාථ වී තිබේ. එමෙන්ම මෙම පරීක්ෂණ සඳහා රෝපණ මාධ්‍ය ලෙස යටිපස සුදුසු බව තහවුරු වී ඇත. ඌව තේ තවාන් සඳහා එම ප්‍රදේශයේ පසෙන් (ගෝනකැලේ වතුයායේ) වෙන්කරගත් බැක්ටීරියා යොදා කරන ලද පරීක්ෂණ වඩාත් සාර්ථක ප්‍රතිඵල ලබා දී ඇත.

**ක්ෂුද්‍රජීවී ජෛව පටල ජෛව පොහොර මගින් පසේ සරුබව සහ තේ අස්වැන්න වැඩිකර ගැනීම**

ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා ජෛව පටල ජෛව පොහොර සමඟ නිර්දේශිත පොහොරවලින් අඩක් ද, මුළු නිර්දේශිත පොහොර ප්‍රමාණය යන ප්‍රතිකර්ම යොදාගන්නා ලදී. මෙම පරීක්ෂණ කොට්ටව, රත්නපුර තේ පර්යේෂණ ආයතන මධ්‍යස්ථානවලද, ඇල්කඩුවත්ත, මාතලේ යන ස්ථානයේද සිදු කරන ලදී.

ඉහත ප්‍රතිකර්මවල තේ අස්වැන්නෙහි වෙනසක් නොවීන. පරීක්ෂණයට භාජනය කරන ලද ජෛව පටල ජෛව පොහොර පිළිවෙලින් F3B ( මල් රටකජු, තේ පැලවල මුල් ආශ්‍රිතයෙන් වෙන් කරගත් බැක්ටීරියා, බැසිලස් මෙගාතීරියම් (Basillus Megathirium) බැක්ටීරියා සහ

තේ මූලාශ්‍රයෙන් වෙන් කරගත් දිලීරවල එකතුවකි), F3A (වැටහිර සහ කසල තේ වලින් වෙන් කරගත් බැක්ටීරියා, බැසිලස් මෙගාතීරියම් සහ තේ මූලාශ්‍රයෙන් වෙන් කරගත් දිලීරවල එකතුවකි).

කොට්ටව, රත්නපුර පරීක්ෂණවලදී T200 නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණය සහ නිර්දේශිත රසායනික පොහොරවලින් අඩක් සමග ජෛව පටල ජෛව පොහොර යන ප්‍රතිකර්මවලින් ලැබුනු අස්වැන්න, සැලකිය යුතු ලෙස වෙනස් නොවුනි.

ඇල්කඩුව වත්තේ පරීක්ෂණවල අස්වනු ප්‍රතිඵලවල විශේෂිත වූ වැඩිවීමක් ජෛව පටල ජෛව පොහොර සමග නිර්දේශිත රසායනික පොහොර වලින් අඩක් යන ප්‍රතිකර්මයේ දක්නට ලැබිනි. එමෙන්ම මෙම ප්‍රතිකර්මයේ, පසෙහි කාබනික සංයුතිය, පොස්පරස්, පොටෑසියම් සහ ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය රසායනික නිර්දේශිත පොහොර ප්‍රතිකර්මයට සාපේක්ෂව වැඩිබව දක්නට ලැබිනි.

මේරූ තේ සමග කල පරීක්ෂණවල අඩු උත්ස්වේදන තත්ත්වයක් සහ අඩු කඳගුල්ලාගේ හානිය (Shot wole borer) තත්ත්වයක් F3A ප්‍රතිකර්මයේ දක්නට ලැබුනි. මෙය ස්ථිර කරගැනීමට තවත් පරීක්ෂණ ඉදිරියේදී කලයුතුව ඇත.

**කාබනික තේ වල ජෛව පටල ජෛව පොහොර භාවිතය, හල්දුම්මුල්ල වතුයාය**

ජෛව පටල ජෛව පොහොර සහ කොම්පොස්ට් ප්‍රතිකර්ම කාබනික ලෙස වගාකරන තේ වල පරීක්ෂා කරන ලදී. මෙහිදී පසෙහි ක්ෂුද්‍රජීවී කාබන් 115 - 227 මයික්‍රොග්‍රෑම්/ග්‍රෑම් දක්වා වැඩි වන බවද, අස්වැන්න 95-1120 කි.ග්‍රෑ./හෙක්ටයාර වැඩිවන බවද ජෛව පටල ජෛව පොහොර ප්‍රතිකර්මයේ දක්නට ලැබින.

**කාබනික වසුන් සමග නිර්දේශිත පොහොර අඩු ප්‍රමාණයක් භාවිතා කිරීම**

නිර්දේශිත පොහොරවලින් ¾ ක් සමග කාබනික වසුන් ලෙසට මානා තෘණ, වල් සූරියකාන්ත, එරබදු ශාක පත්‍ර සහ කසල තේ (මතුපිට සහ මිශ්‍ර කිරීම ලෙසට), කප්පාදු අතු වැළලීම භාවිතා කිරීමෙන් ලැබෙන තේ අස්වැන්න නිර්දේශිත රසායනික පොහොරවලින් ලැබෙන අස්වැන්න හා සසඳනු ලැබින. මෙහිදි මානා තෘණ සහ කසල තේ පස සමග මිශ්‍ර කිරීමෙන් යොදන ප්‍රතිකර්ම හැර, අනිත් ප්‍රතිකර්ම නිර්දේශිත රසායනික පොහොර ප්‍රතිකර්මයේ ලැබෙන අස්වැන්න සමග වඩාත් සැසඳෙන බව සොයාගන්නා ලදී.

**කප්පාදු චක්‍රයක කාලය අනුව තේ ප්‍රභේද වල ස්වීකරණ ශක්තිය බෙදී යාම - රසායනික පාරමිතකයන් ගුණාත්මක භාවය සහ අස්වැන්නහි ප්‍රමාණය තක්සේරු කිරීම**

කප්පාදු චක්‍රයේ වෙනස් කාලපරිච්ඡේදයන්හි ඇති පරිණත තේ ප්‍රභේද 2 ක (TRI.2025 සහ DT1) අස්වැන්නෙහි ප්‍රමාණය, ගුණාත්මකභාවය, රසායනික පාරමිතීන්ගේ වෙනස් වීම කෙසේ සිදුවනවාද යන්න වියළි සහ තෙත් කාල තත්ත්ව යටතේ ශාන්ත කූම්බස් වතුයායේ, කරන ලද කෙෂ්ත්‍ර පරීක්ෂාවකදී ඇගයීමකට ලක් කරන ලදී.

මෙහිදී කප්පාදුවෙන් පසු පළමු වසරේදීම තේ දළු වල ඇති රසායනික පාරමිතීන් ලෙස ඇති ඇමයිනෝ අම්ල එකතුවෙහි අඩුවීමක් සහ තතු ප්‍රමාණය සහ ක්ලෝරෆිල ප්‍රමාණය හි වැඩිවීමක් නිරීක්ෂණය කරන ලදී.

තවද තේ දළු වල අඩංගු පොලිෆිනෝල් එකතු වෙහි සහ පොලිෆිනෝල් ඔක්සිඩේස් ක්‍රියාවලියන්හි වැඩිවීමක් කප්පාදුවෙන් පසු 3 වසර දක්වා සිදුවී ඉන්පසු අඩු වීමක් සිදුවන බවක් නිරීක්ෂණය කරන ලදී.

එක් එක් කප්පාදු වසරයන්දී වියළි සහ තෙත් කාල තත්ත්ව යටතේ ඒ ඒ තේ ප්‍රභේදයෙහි ගුණාත්මකභාවයෙහි (වර්ණය,දීප්තිමත්භාවය, තියරුබිජින්ට තියොෆ්ලේවින් අනුපාතය) වෙනසක් පෙන්වන ලදී.

කප්පාදු චක්‍රයේ 1-5 වසර දක්වා ඉහළට යෑමේදී තියරුබිජීන්ට තියොෆ්ලේවින් අනුපාතය සහ වර්ණයෙහි වැඩිවීමක් ද දීප්තිමත්භාවය අඩු වීමක් ද සිදුවුනි.

තෙත් කාල තත්ත්ව යටතේ ඇති විට තියරුබිජීන්ට තියොෆ්ලේවින් දරණ අනුපාතයහි අගය වියළි කාල තත්ත්ව යටතේ ඇති එම අනුපාතයෙහි අගයට වඩා පැහැදිලි අඩුවීමක් තේ ක්ලෝන 2 හිම දක්නට ලැබුණු අතර TRI.2025 හි එම අනුපාතයෙහි අගය DT1 හි අනුපාතයහි අගයට වඩා ඉහළ අගයක් විය.

තෙත් කාල තත්ත්ව යටතේ වර්ණය සහ දීප්තිමත්භාවය වියළි කාල තත්ත්ව යටතේදීට වඩා වැඩි අගයක් තේ ක්ලෝන 2 හිම පෙන්වූ අතර DT1 හී එම අගය TRI 2025 ට වඩා ඉහළ අගයක් විය.

කප්පාදු චක්‍රයේ කාලයත් සමග තියරුබිජීන් ප්‍රමාණය වැඩි වු අතර තෙත් කාල සහ වියළි කාල තත්ත්ව සැසඳීමේදි තෙත් කාල තත්ත්ව යටතේ TRI 2025 හි ඇති තියරුබිජීන් ප්‍රමාණයට වඩා DT1 හී ඇති ප්‍රමාණය වැඩි අගයක් පෙන්විය.

සමස්තයක් ලෙස 1 - 3 වැනි අවුරුද්ද දක්වා මේරූ තේ වල ගුණාත්මකභාවය වැඩිවන අතර ඉන්පසු අඩුවේ.

**කප්පාදු චක්‍රයේ අවසාන භාගයේ සිදුවන උඩරට තේ ප්‍රභේද වල අස්වැන්න අඩුවීමේ ක්‍රියාවලිය කායික විද්‍යාත්මක මුලධර්ම වලට අනුව හඳුනාගැනීම**

කප්පාදු චක්‍රයේ අවසාන භාගය වන විට තේ අස්වැන්නෙහි අඩුවීමක් සිදු වේ. කප්පාදු චක්‍රයේ 4 වැනි වසරේදි සිදුවන අස්වැන්න අඩුවීම මුල් වලට හෝ අතුවලට බෙදා හැරෙන ඒකක ජෛව ස්කන්ධ වල විශේෂිත වෙනස් වීමකින් සිදුවන හේතුවක් නිසා සිදු නොවේ අස්වැන්න අඩුවීමට සෘජුවම බලපාන කරුණ වනුයේ ගසේ සම්පූර්ණ ස්කන්ධය එම ගස එම කාලය තුල ලබා දුන් සම්පූර්ණ අස්වැන්නට දරන අනුපාතයයි. ස්වීකරණ ශක්තියේ හැකියාව අඩුවීම කප්පාදු චක්‍රයේ 2 වැනි අර්ධ කාලපරිච්ඡේදය තුලදි පරික්ෂා කරන ලදී. සම්පූර්ණයෙන්ම කායික විද්‍යාත්මක ක්‍රියාවලියන් අවරෝහණය දිශාවකට පත්වන බවට 4 වන වසරේ මුල්වල පිෂ්ඨය වැඩිවීම සාක්ෂි දරයි.

**තේ රිකිලි බද්ධ තාක්ෂණයේ අනුකූලතාවය සොයාබැලීම**

මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ වැඩි අස්වැන්න, උසස් ගුණාත්මක බව, නියඟයට සහ රෝග පළිබෝධවලට ඔරොත්තු දීම යන ලක්ෂණ සහිත වඩාත් සාර්ථක අනුප/ග්‍රහක සංයෝජනයන් පිළිබඳ සොයා බැලීමයි
.

**වැඩි අස්වැන්න සහ උසස් ගුණාත්මය සඳහා රිකිළි බද්ධ තාක්ෂණය යොදාගැනීම.**

අනුජය සඳහා උසස් ගුණාත්මයෙන් යුතු ප්‍රභේද සහ ග්‍රාහකය සඳහා නියඟයට ඔරොත්තු දෙන ප්‍රභේද තෝරාගත් අතර පාලකය ලෙස බද්ධ නොකළ අනුජය යොදාගන්නා ලදී. පරීක්ෂණය ශාන්ත කූම්බස් වත්තේ දෙවන කප්පාදු චක්‍රයේ පළමු වසරේ පවතී.

TRI 777 සහ TRI 4079 අනුජය ලෙස යොදාගත් බද්ධ සංයෝජනයන් වැඩි අස්වැන්නක් පෙන්වූ අතර TRI 4079 සහ TRI 2025 යොදාගනිමින් සාදාගත් බද්ධ සංයෝජනය සැලකිය යුතු ලෙස වැඩි අස්වැන්නක් ලබාදුනි.

බද්ධ සංයෝජනයන්හි ගුණාත්මය පාලකයන්හි ගුණාත්මයට සමාන බව ගුණාත්ම විශ්ලේෂණයන්හිදී පෙන්වා ඇත.

**වැඩි අස්වැන්න සහ රෝග පළිබෝධවලට ඔරොත්තු දීම සඳහා රිකිළි බද්ධ තාක්ෂණය යොදාගැනීම.**

අනුජය ලෙස බුබුළු අංගමාරයට සහ කඳ ගුල්ලාට ඔරොත්තු දෙන වැඩි අස්වැන්නක් සහිත ප්‍රභේද තෝරාගත් අතර ග්‍රාහකය සඳහා පැතිරුණු මූල පද්ධතිය, නියඟයට ඔරොත්තු දෙන සහ වට පණුවන්ට (*Pratylenchus loosi*) ඔරොත්තු දීම යන ලක්ෂණ සහිත ප්‍රභේද යොදාගන්නා ලදී. පරීක්ෂණය ශාන්ත කූම්බස් වත්තේ පළමු කප්පාදු චක්‍රයේ පස්වන වසරේ පවතී.

අනුජය ලෙස TRI 4046 සහ ග්‍රාහකය ලෙස TRI 4006 යොදාගනිමින් සාදාගත් බද්ධ සංයෝජනය සැලකිය යුතු වැඩි අස්වැන්නක් පෙන්නුම් කල අතර අනෙකුත් සංයෝජනයන් වන TRI 3072 සමඟ TRI 4006 , TRI 3072 සමඟ TRI 4053, TRI 4046 සමඟ TRI 3072 සහ TRI 4006 සමඟ TRI 3072 ද පාලකයන්ට සාපේක්ෂව වැඩි අස්වැන්නක් පෙන්නුම් කරන ලදී.

**නියඟයට ඔරොත්තු දීම සඳහා රිකිළි බද්ධ තාක්ෂණය යොදාගැනීම.(ඌව පළාත)**

වැඩි අස්වැන්නක් ලබාදෙන ප්‍රභේද, නියඟයට ඔරොත්තු දෙන ප්‍රභේද සමඟ බද්ධ කිරීමෙන් නියඟය නිසා අස්වැන්න අඩු වීමේ ගැටළුවට පිළිතුරු සෙවීම මෙම පර්යේෂණයේ අරමුණයි.
බද්ධ සංයෝජනයන් වන TRI 3018 සමඟ DN , TRI 3019 සමඟ DN , TRI 4042 සමඟ DN , TRI 4046 සමඟ DN සහ TRI 4052 සමඟ N පර්යේෂණය සඳහා යොදාගන්නා ලදී. බද්ධ කළ පැළ වල වර්ධනය හා කායික විද්‍යාත්මක පරාමිතීන් ඇගයීමට ලක් කෙරුණු අතර, වසරකට මසු මට්ටම් කැපීම කරන ලදී.

**තවාන් අවස්ථාවේ බද්ධ කිරීම තුලින් පැරණි බීජ පැළ නැවත භාවිතයට ගැනීම.**

පැරණි බීජ පැල (විවිධ බීජ උයන් වලින් ලබාගත්) ග්‍රාහකය ලෙස යොදාගත් අතර අනුජයන් ලෙස TRI 2043 , TRI 4006 , TRI 4055 සහ TRI 3015 යොදාගනිමින් සාදාගත් බද්ධ සංයෝජනයන් ක්ෂේත්‍රයේ සිටුවා ඇති අතර ආදර්ශනයක් ලෙස තේ පර්යේෂණ ආයතනයේ පහතරට මධ්‍යස්ථානයේ ස්ථාපිත කර ඇත.

## භෝග කළමණාකරණය

**තේ වගාවේ වල්පැළෑටි පාලනය**

**ග්ලයිෆෝසේට් මගින් තන්ඩම් පිල්ලු (සුදන) හා අලවංගු පිල්ලු මර්ධනය කිරීම අපහසු වීමට බලපාන සාධක පරීක්ෂා කිරීම**

මෙම වල් පැළෑටි විශේෂ දෙක දුර්වල ලෙස මර්ධනය වීමට බලපෑ හැකි සාධක වන වල් පැළෑටිවල පරිනතභාවය, යොදනු ලබන ග්ලයිෆෝසේට් මාත්‍රාවේ ප්‍රමාණය හා ග්ලයිෆෝසේට් සඳහා වල් පැළෑටි විශේෂ දෙක ප්‍රතිරෝධීවීම යනාදි කරුණු පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කොට සනාථ කිරීම සඳහා ක්ෂේත්‍ර හා හරිතාගාර තත්ත්ව යටතේ පරීක්ෂණ ශාන්ත කුම්බස් වතුයායේදී සිදු කරන ලදී. තන්ඩම් පිල්ලු, ග්ලයිෆෝසේට් 5 මි.මි/ලී (හෙක්ටයාර් 1 ට සක්‍රීය ද්‍රව්‍ය කි.ග්‍රෑ. 0.99) මගින් ඉතා ලපටි පැල අවධියේදී ඉතා හොඳින් ද, තරුණ අවධියේදී (6 - 12 සෙ.මී. උසකින්) යම් තරමකින්ද පාලනය විය. එහෙත් පරිනත අවධියේදී (12 - 14 සෙ.මී. උසකින් ) කිසිම අයුරකින් මර්ධනය නොවුනි. අලවංගු පිල්ලු පත්‍ර 8 - 10 අවධියේදී ඉතා හොඳින් හා පත්‍ර 2 - 4 අවධියේදී අර්ධ වශයෙන් ද මර්ධනය විය. ඉහළ මාත්‍රාවක් මගින් හැම විටම පහළ මාත්‍රාවට වඩා ඉතා හොඳ මර්ධනයක් සිදුවිය.

වසර 15 වඩා ග්ලයිෆෝසේට් භාවිතා නොකරන ලද හල්දුම්මුල්ල කාබනික තේ වගාවකින් රැස්කල තන්ඩම් පිල්ලු බීජ මගින් ලබාගත් පැල, වසර 25 කට වැඩි කාලයක් ග්ලයිෆෝසේට් භාවිතා කරන ශාන්ත කුම්බස් වතුයායෙන් රැස්කල බීජ මගින් ලබාගත් පැල වලට වඩා සැලකිය යුතු මට්ටමකින් ග්ලයිෆෝසේට් මිලී. 5/ලී මගින් මර්ධනය විය. නමුත් ස්ථාන දෙකින්ම ලබාගත් අලවංගු පිල්ලු පැල ඉතා හොඳින් මර්ධනය විය. ඒ අනුව තන්ඩම් පිල්ලුවල ග්ලයිෆෝසේට් සඳහා යම් ප්‍රතිරෝධයක් වර්ධනය වෙමින් පවතින බව පෙනීයයි. කෙසේ වෙතත් ඉතා ලපටි අවධියේදී (සෙ.මී. 1 - 5 ) ග්ලයිෆෝසේට් 5 මී.ලී. මගින් වල් පැළෑටි දෙක තවදුරටත් මර්ධනය කල හැක.

**කාබනික තේ වගාවේ වගාවේ වර්ධනය, අස්වැන්න, රෝග හා පළිබෝධ කළමණාකරණය පිළිබඳ අධ්‍යයනය**

තේ වගාවේ වර්ධනය, අස්වැන්න, රෝග හා පළිබෝධ කළමණාකරණය පිළිබඳ දත්ත තලවකැලේ ස්ථාපනය කරන ලද දිගු කාලීන පර්යේෂණ

භූමින් වන 'TRIORCON' හා 'BIDORCON' හා ගිරාගම පර්යේෂණ භූමියේ Rainforest Alliance සහතිකකරණය ලත් තේ වගා පද්ධතින් සමග සසඳන ලදි.

මූලික පර්යේෂණ ප්‍රතිඵල වලට අනුව කාබනික හා ජෛවගතික වගා පද්ධතින්හි රෝග, පළිබෝධ හා වල් පැළෑටි ඇතිවීම රසායනික යෙදවුම් භාවිතා කළ වගා පද්ධතියට සාපේක්ෂව අඩුය. කාබනික, ජෛවගතික හා Rainforest Alliance සහතිකකරණය ලත් වගා පද්ධතින් පිළිබඳ විද්‍යාත්මක පසුබිම අධ්‍යයනය කිරීම සේවාලාභීන්ගේ අභිවෘද්ධිය උදෙසා වැදගත්වේ.

# බෝග ආරක්ෂාව

## පළිබෝධ පාලනය සඳහා පූර්ව ප්‍රතිකාරක ක්‍රම භාවිතය

### තේ ශාකයේ කඳ විදින ගුල්ලාට පාත්‍රී ශාක වර්ධන අවස්ථාවන් හානියෙන් ආරක්ෂා කර ගැනීම

තේ ශාකයේ පළිබෝධකයන්ට පාත්‍රී වර්ධන අවස්ථාවන් හානියෙන් ආරක්ෂා කර ගැනීම සඳහා පූර්ව ප්‍රතිකාරක යෙදීම ඒකාබද්ධ පළිබෝධ කළමණාකරණයේ වැදගත් අංගයක් ලෙස සැළකේ.

තේ පඳුරු කප්පාදුවෙන් පසු පැන්සලක ඝනකම සහිත අතු කොටස් කඳ විදින ගුල්ලාගේ හානියෙන්ද, දිරාපත් වූ කප්පාදු මුහුණත් සජීවී දැව වේයා ඇතුළු වීමෙන්ද ආරක්ෂා කර ගැනීමේදී එම පළිබෝධකයන්ගේ හානිය වැළැක්වීම හා හානියේ ස්වභාවය ආර්ථිකමය වශයෙන් හානිකර තත්ත්වයක් දක්වා වර්ධනය වළක්වාලීම ඉතා වැදගත්වේ.

මේ පිළිබඳව සිදු කළ පර්යේෂණ හා සමීක්ෂණ වල ප්‍රතිඵල වලට අනුව පහත කරුණු අනාවරණය විය.

1. කඳ විදින ගුල්ලාගේ හානිය පාලනය සඳහා තවාන් අවධියේදී පූර්ව ප්‍රතිකාරක යෙදීම නව හා පරිණත තේ වගාවේදී මෙන්ම ඉතා වැදගත් බව පැහැදිලි විය.

2. රසායනික හා ස්වභාවික ප්‍රතිකාරක ආලේපන කිහිපයක ක්‍රියාකාරී බව හා ඒවායේ ක්ෂේත්‍රයේ කල් පැවැත්ම ඇගයීම සඳහා තහවුරු කිරීමේ පර්යේෂණ කිහිපයක් කඳ විදින ගුල්ලාගේ හානියට පාත්‍රී විවිධ කෘෂි දේශගුණික කලාපයන්හිදී සිදු කරන ලදි. නාකියාදෙණිය කටුපොල් කර්මාන්තශාලාවේ අතුරුඵල ලෙස ඉවත් කරන ඔයිල් පාම් අපද්‍රව්‍ය, රබර් පර්යේෂණ ආයතනය හා එක්ව ස්වභාවික රබර් අනුසාරයෙන් නිපදවූ “ෂොට්ගාර්ඩ්” හා ලයිම් සල්ෆර් යනාදී ස්වභාවික ප්‍රතිකාරක ආලේපන ෆිප්රොනිල් රසායනිකය සමග පළිබෝධ ඝහණය මෙන්ම ප්‍රතිකාරක වලට තේ ශාකය දක්වන ප්‍රතිචාරයන්ද ඇගයීමට ලක් කෙරිණ.



**තේ වගාවේ පිළිකා සඳහා හේතුවන දිලීරයන්හි අණුක විද්‍යාත්මකව හඳුනා ගැනීම.**

*Macrophoma Theicola* නම් දිලීරය හේතු කොට ගෙන හට ගන්නා කඳ හා අතු පිළිකා රෝගය පහතරට තේ වවන කලාපයන්හි බරපතල ගැටළුවක් බවට පත්ව ඇත. මේ අතර මෑත කාලීන අධ්‍යයනයන් මගින්, *Fusarium* විශේෂ ද මෙම රෝගය සඳහා සහ සම්බන්ධ වන බව හෙලිදරව් විය. නියුක්ලියෝටයිඩ අනුපිළිවෙල සඳහා *Fusarium* ශුද්ධ රෝපණ භාවිතයෙන් ලබාගත් BLAST ගවේෂණ මෘදුකාංග නිපැයුම *Fusarium Solani* දිලීරයට 98% ක සර්ව සාමාන්‍ය බවක් සහිත ඉතා ඉහළ සමානාත්මයක් පෙන්වන ලදී. ඇතැම් දිලීර ශුද්ධ රෝපණයන්හි අන්තර් පිටපත් කරන ලද කලාපයේ ( ITS region) BLAST මෘදුකාංග ගවේෂණය අනාවරණය කරන පරිදි මීට පෙර *Macrophoma Theicola* ලෙස හඳුනා ගන්නා ලද (රූප විද්‍යාත්මක ලක්ෂණ මත පදනම්ව) දිලීරය, *Lassiodiplodia Theobroma* දිලීරයට ඉතා ඉහළ සමානත්වයක් දක්වයි.

**කඳ විදින ගුල්ලාගේ හානිය පාලනයට පාංශු ප්‍රතිකාරක භාවිතා කිරීමේ හැකියාව ඇගයීම සඳහා ක්ෂේත්‍ර පර්යේෂණ**

තවානේ හා නව වගාවේ වරින් වර ඇතිවන කඳ විදින ගුල්ලාගේ හානියට එරෙහිව මර්දන ක්‍රම යෙදීම ඉතා වැදගත්වේ. ප්‍රතිකාරක ලෙස තේ කප්පාදුවෙන් පසු පසට යොදන ලද කැටිතිමය ෆිප්රොනිල්, කාබොෆියුරාන් හා ඉමිඩක්ලෝප්‍රිඩ් රසායනිකයන් හා කොහොඹ පුන්නක්කු පිළිබඳ මෙම පර්යේෂණය තවදුරටත් සිදු කෙරේ.

**කම්බිලි පණුවා පාලනය සඳහා පූර්ව ප්‍රතිකාරක ක්‍රම භාවිතය**

කම්බිලි පණුවාගේ හානිය වසරේ වියළි දේශගුණික කාල වලට සීමා වන බව සැළකුවද, මෑත කාලීනව පටන් ප්‍රදේශ කිහිපයකම වසර පුරාවටම ව්‍යාප්තිය දක්නට ලැබිණ. තවද, මෙම පළිබෝධ හානිය නව වගාවට අමතරව තේ තවානේද සැළකිය යුතු තරම් වැඩි තත්වයකින් දක්නට ලැබිණ. ප්‍රතිකාරක ලෙස දැනට නිර්දේශිත කාබොෆියුරාන් වෙනුවට ආදේශකයන් සෙවීමේ අවශ්‍යතාවයද ඉස්මතු වීමෙන් විකල්ප පළිබෝධනාශකයක් හඳුනා ගැනීම සඳහා පර්යේෂණ දියත් කෙරිණ. මේ සඳහා කැටිතිමය ෆිප්රොනිල්, ඉමිඩක්ලෝප්‍රිඩ් හා කාබොසල්ෆාන් රසායනිකයන් විද්‍යාගාර තත්ව යටතේ මූලික පර්යේෂණද, පෝච්චිවල සිටවූ පැළ භාවිතයෙන් පාලිත තත්ත්ව යටතේ පර්යේෂණද හා ක්ෂේත්‍ර පර්යේෂණද තවදුරටත් සිදු කෙරේ.

**ප්‍රැටිලෙන්චස් ලූසයි හා රැඩොෆොලස් සිමිලිස් වටපණු විශේෂයන්ගේ අසාමාන්‍ය ව්‍යාප්තිය**

තේ වගාවට හානිකරන වටපණුවන්ගෙන් ප්‍රැටිලෙන්චස් ලූසයි අඩු පාංශු උෂ්ණත්වයේද රැඩොෆොලස් සිමිලිස් වැඩි පාංශු උෂ්ණත්වයේද හමුවේ. එහෙත් මෑත කාලීනව පටන් ප්‍රදේශ කිහිපයකම ප්‍රැටිලෙන්චස් ලූසයි හා රැඩොෆොලස් සිමිලිස් වටපණු විශේෂයන්ගේ අසාමාන්‍ය ලෙස ව්‍යාප්තියක් දක්නට ලැබිණ. මෙම වටපණුවන් ගාල්ල, දෙණියාය හා කන්නෙලිය වැනි කලින් වාර්තා නොවූ ප්‍රදේශවල තේ තවාන්, නව හා පරිණත වගාවන්හි ආර්ථිකමය හානිදායක මට්ටටමින් හමු විය. එම නිසා මෙම වටපණු හානි පිළිබඳව හා මැඩ පවත්වා ගැනීම සඳහා ඒකාබද්ධ වටපණු පාලන ක්‍රමවේදයන් පිළිබඳ වගාකරුවන් දැනුවත් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් දක්වන ලදි. ඒ සඳහා ආදර්ශන භූමින්ද ස්ථාපනය කරන ලදි.

තවද, මෙම විවිධ උන්නතාංශයන්ගෙන් පිහිටි ස්ථාන වල හමුවූ වටපණු විශේෂ පිළිබඳ තවදුරටත් අධ්‍යයනය සඳහා එම වටපණුවන් විද්‍යාගාර තත්ත්ව යටතේ ඇතිකිරීම අරඹන ලදි.

**ඒකාබද්ධ පළිබෝධ කළමණාකරණ ක්‍රමවේදයන් නිර්ණය සඳහා ආරක්ෂාකාරී පළිබෝධනාශක හඳුනා ගැනීම**

රසායනික සංයෝග මගින් ඉලක්කගත පළිබෝධකයන්ට අමතරව හිතකර ජීවීන් කෙරෙහිද බලපෑම් ඇති කෙරේ. එම නිසා තේ සඳහා පළිබෝධනාශකයක් නිර්දේශ කිරීමට පෙර එහි ඉලක්කගත නොවන ජීවීන් කෙරෙහි බලපෑම පිළිබඳ දත්ත අවශ්‍ය වේ. මෙසේ පළිබෝධනාශකයකගේ අනිසි බලපෑම් අධ්‍යයනය සඳහා සම්මත ක්‍රමවේදයන්ට අනුකූලව මී මැස්සන් හා ගැඩවිලි පණුවන් යොදා ගෙන පර්යේෂණ සිදු කෙරිණ. මෙහිදී හානිකර ස්වභාවය මත එම රසායනිකයන් කාණ්ඩගත කරන ලදි.

මෙහිදී ලද ප්‍රතිඵල වලට අනුව ෆිප්රොනිල් වල බලපෑම හේතුවෙන් මී මැස්සන් මිය යාමේ ප්‍රතිශතය 87.5% ක් තරම් ඉහළ වූ අතර කාබොසල්ෆාන් හේතුවෙන් එය 57.5% ක් විය. ඉමිඩක්ලෝප්‍රිඩ් හා ෆෙන්තියෝන් සඳහා එය සාපේක්ෂව පහළ ප්‍රතිශතයක් විය. ඉමිඩක්ලෝප්‍රිඩ්, කාබොසල්ෆාන් හා ෆිප්රොනිල් මී මැස්සන් කෙරෙහි අහිතකර බව කාණ්ඩගත කළ විට පිළිවෙලින් 2 (ඔරොත්තු දෙන), 3 (හානිකර) හා 4 (ඉතා හානිකර) වශයෙන් වේ.

ගැඩවිලි පණුවන් යොදා ගෙන කරන ලද පර්යේෂණයට අනුව ඉමිඩක්ලෝප්‍රිඩ්, කාබොෆියුරාන්, කාබොසල්ෆාන් හා ෆිප්රොනිල් දියර (රීජන්ට්) හා ෆිප්රොනිල් කැට (3GR) හේතුවෙන් පසේ සිටින ගැඩවිලි පණුවන් මිය යාමේ ප්‍රතිශතයන් පිළිවෙලින් 100, 98, 82 හා 0 වේ. ෆිප්රොනිල් දියර හා කැට යන ආකාර දෙකම කාණ්ඩ අංක 1 ( හානිකර නොවන) ලෙස හා ඉමිඩක්ලෝප්‍රිඩ්, කාබොෆියුරාන් හා කාබොසල්ෆාන් කාණ්ඩ අංක 4 ( ඉතා හානිකර ) ලෙස කාණ්ඩගත කරන ලදි.

**පහතරට සජීවී දැව වේයාගේ හානිය හා සම්බන්ධ දේහ රසායනය පිළිබඳ අධ්‍යයන**

හ රසායනය හඳුනා ගැනීම ඒකාබද්ධ පළිබෝධ කළමණාකරණයේ අන්තර්ගත කළ හැකි නවමෑත කාලයේ කරන ලද අධ්‍යයනයන්ට අනුව පහතරට තේ වගාවේ අස්වනු අඩු වීමටද, භූමි පළදායීතාවය හා තිරසාරත්වය අඩු වීමටද සජීවී දැව වේයාගේ හානිය හේතු සාදක වී ඇති බව පැහැදිලි විය. තවද, සජීවී දැව වේයා පාලනය සඳහා දැනට නිර්දේශිත සනීපාරක්ෂක කප්පාදුව හා කප්පාදු මුහුණත් මත ආලේපන තැවරීම වැනි පිළිවෙත් කෙරෙහි විශේෂ අවධානයක් යොමු විය  යුතු බවද පැහැදිලි විය. එසේම, තේ ගසේ නිරෝගීබව පවත්වා ගැනීම ඇතුළු සුදුසු යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම හා පහතරට සජීවී දැව වේයාගේ හානිය හා සම්බන්ධ දේ ක්‍රමවේද වේ.

පහතරට සජීවී දැව වේයාට ප්‍රතිරෝධී හා පාත්‍රී ප්‍රභේදවල දිරාපත් වූ කප්පාදු මුහුණත් වලින් මෙන්ම වේයන්ගෙන්ද සොයා ගත් විවිධ දිලීර විශේෂ භාවිතයෙන් විද්‍යාගාර තත්ව යටතේ මූලික පර්යේෂණ ආරම්භ කෙරිණ. මෙම වෙන් කර ගත් දිලීර විශේෂ 9ක් යොදා ගෙන ඒවා දිරාපත් වූ කප්පාදු මුහුණත්වල සෙලියුලෝස්, පෙක්ටින් හා ලිග්නින් යනාදි උපස්ථරයන් පරිභෝජනය කරන ආකාරය සම්බන්ධව කෙරෙන මූලික පර්යේෂණ තුළින් ප්‍රභේද කාණ්ඩ ගත කිරීමේ හැකියාව පිළිබඳවද අධ්‍යයනය කෙරේ.

**බුබුළු අංගමාරයේ රෝග තීව්‍රතාවය සඳහා සුචිය**

*Exobasidium Vexans* දිලීරය නිසා හටගන්නා බුබුළු අංගමාර රෝගයේ තීව්‍රතාවය කාර්යක්ෂමතාවය ඇගයීම සඳහා ප්‍රමාණාත්මක ප්‍රතිශත මිනුමක් වැඩි දියුණු කිරීම සහ එය වලංගු කිරීම සිදුකරන ලදි. ඇගයීම සිදුකිරීම පිණිස, අගයන්නන්ගේ දෘෂ්ටි නිපුණත්වය සහ ඇගයීමෙහි නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම මඟින් රෝගය තක්සේරු කිරීම සඳහා පුහුණු මෘදුකාංගයක් වැඩි දියුණු කරන ලදී. උග්‍රබව ඇගයීම පිණිස වැඩි දියුණු කරන ලද සුචිය, රෝග වසංගත අධ්‍යයනය, අභිජනන වැඩසටහන් වලදී ප්‍රතිරෝධී ප්‍රභේද හඳුනා ගැනීම සහ රෝගයක ආර්ථික බලපෑම හා සුවිශේෂි පාලන උපායන්හි ප්‍රතිලාභ සඳහා ප්‍රයෝජනවත් වේ.

**බුබුළු අංගමාර රෝගය කළමණාකරනය සඳහා ශාකතුළ ඇති වන ප්‍රතිරෝධී ආරක්ෂක උපක්‍රම අනාවරණය කිරීම**

ශාක තුල ප්‍රේරණය කරන ලද ප්‍රතිරෝධීතාව භාවිතය ශාක අභ්‍යන්තර ආරක්ෂාව සඳහා නොනැසි පවත්නා ප්‍රවේශයකි. වර්තමානයේ ශාක අභ්‍යන්තර ආරක්ෂක අනාවරක ජනප්‍රියත්වය වෙත පැමිණෙමින් පවති. බුබුළු අංගමාර රෝග කාරක *Exobasidium Vexans* ට එරෙහි තේ ශාකයේ ආරක්ෂක ප්‍රතිචාරය අවබෝධ කර ගැනීම සඳහා සහ සමෝධානික රෝග පාලන උපායන් තුල දිලීරනාශක භාවිතය අවම කිරීම සඳහා

අභ්‍යන්තර ආරක්ෂක අනාවරක භාවිතා කිරීමේ හැකියාව හා එමගින් රෝග පාලනය සඳහා ජෛව පාලක උපයෝගිතාව පිණිස වූ අධ්‍යයන කටයුතු ආරම්භ කොට ඇත.

**තේ වගාවේ බුබුළු අංගමාර පත්‍ර රෝගය සඳහා අවධානම් තක්සේරු ආකෘතිය**

සති 01 - 02 කට පෙරාතුව ක්ෂේත්‍රයේ බුබුළු අංගමාර රෝගයේ සෘජු අවධානම අනුමාන කිරීම පිණිස ප්‍රාථමික ආකෘතිය වැඩි දියුණු කරන ලදී.ආකෘතිය සනාථ කිරීමේ කටයුතු උදෙසා ස්වයංක්‍රිය කාලගුණික මධ්‍යස්ථානය සඳහා මිලියන 01 ක් වූ මූල්‍ය ප්‍රධානය ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම විසින් සිදු කරන ලද අතර එම කාර්යය සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

## දේශගුණික විපර්යාසවල බලපෑම ඇගයීම

**තේ ශාකයෙහි කායික විද්‍යාත්මක ප්‍රතිචාර සහ කාබන් තිරකිරීම කෙරෙහි ගෝලීය දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම අධ්‍යයනය කිරීම.**

ශ්‍රී ලංකාවේ විවිධ උස් මට්ටම්වල වගාකර ඇති තේ ශාකවල ඵලදායිතාවය කෙරෙහි දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම අධ්‍යයනය කිරීම සඳහා ෂෙෆීල්ඩ් ඩයිනමික් ග්ලෝබල් වෙජිටේෂන් මොඩල්" (SDGVM) නම් වූ ශාක කායික විද්‍යාත්මක ක්‍රියාවලීන් පදනම් කරගත් ආකෘතිය ශ්‍රී ලංකාවේ දේශගුණික තත්ත්වයන් සහ තේ ශාකයේ කායික විද්‍යාත්මක ලක්ෂණවලට අනුරූපිව වෙනස් කරන ලදී.

මෙම වෙනස් කරන ලද ආකෘතිය මඟින් ලබාදෙන ප්‍රතිඵල සාධනය කිරීම සඳහා උඩරට, මැදරට හා පහතරට ප්‍රදේශවලින් වාර්තාගත තේ අස්වනු අගයන් වසර 20 ක් වැනි දිගු කාලයක් තුලදී යොදාගන්නා ලදී.

මෙම ආකෘතිය මගින් අනාගතයේදී සිදුවිය හැකි දේශගුණික විපර්යාසයන්ගේ ප්‍රතිඵලයක් ලෙස උඩරට, මැදරට හා පහතරට යන කලාප 03 හිම තේ අස්වැන්නේ සැලකිය යුතු වර්ධනයක් ඇති වන බව පෙන්වා දෙනු ලැබීය. තවද මේ සඳහා වායුගෝලීය කාබන් ඩයොක්සයිඩ් වායුවේ සාන්ද්‍රනය වැඩිවීම සෘජුවම හේතුවන බවද, යම් හෙයකින් එම වැඩිවීම නොතිබුනහොත් දේශගුණ විපර්යාස ලෙස සිදුවන උෂ්ණත්ව වැඩිවීම මඟින් උඩරට තේ අස්වැන්න පමණක් වැඩිවන බවත්, මැදරට හා පහතරට තේ අස්වැන්නේ සිදුවිය හැකි වෙනස නොසැලකිය හැකි තරම් හෝ ආන්තික බවක් තවදුරටත් විස්තර කරන ලදී.

මෙම ආකෘතියෙන් ලබාදෙන ප්‍රතිඵලවල නිරවද්‍යතාවය වැඩි කිරීම සඳහා මෙම ආකෘතිය තවදුරටත් වෙනස් කිරීමේ කටයුතු කෙරෙමින් පවතී.

**දේශගුණික විපර්යාසයන් හා පළිබෝධකයන් කෙරෙහි එහි බලපෑම**

විවිධ කෘෂි දේශගුණික කලාපයන්හි විවිධ කෘමි, මයිටා හා වටපණු හානි ඇතිවීම පිළිබඳ සළකා බැලීමේදී පෙනී ගිය කරුණු නම්, ඇතැම් පළිබෝධකයන් නව පළිබෝධකයන් ලෙස ඉස්මතු වන අතර තවත් පළිබෝධකයන් විශේෂ ඇතැම් ස්ථානවල කලින් වාර්තාගත වූ තරම් ඝහණයන්ගෙන් නොමැති බවයි. මෙහිදී දේශගුණික පරාමිතීන්ගේ හා බෝග කළමණාකරණයේ සැළකියයුතු තරමේ වෙනස්කම් පිළිබඳ විද්‍යාත්මක පසුබිම අධ්‍යයනය කළ යුතු අතර සුදුසු පළිබෝධ මර්දන ක්‍රමද සැළසුම් කළ යුතුය.

මෙහිදී මූලික අධ්‍යයනයක් ලෙස විවිධ ස්ථානයන්ගෙන් හමුවූ කඳ විදින ගුල්ලා, පහතරට සජීවී දැව වේයා, මයිටාවන්, ප්‍රැටිලෙන්චස් ලූසයි, රැඩොෆොලස් සිමිලිස් හා මෙලොයිඩොගයිනි බ්‍රෙවිකෝඩා යන පළිබෝධකයන්ගේ ජීව විද්‍යාත්මක හා ජීවන චක්‍ර හා සම්බන්ධ අධ්‍යයනයන් දියත් කෙරිණ. මෙකී අධ්‍යයන ප්‍රතිඵල දීර්ඝ කාලීන දේශගුණික දත්ත හා සංසන්දනය කරමින් නව පළිබෝධකයන් ලෙස ඉස්මතු වීම හා ඇතැම් විට කලින් වාර්තාගත වූ ස්ථාන වල ඝනත්වය අඩුවීම මෙන්ම ඔවුන්ගේ ස්වභාවික සතුරන් හා සහසම්බන්ධතා පිළිබඳ අධ්‍යයනය සිදු කෙරේ.

### තේ වගාවේ වටපණුවන් කෙරෙහි දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම

තේ වගාවට හානිකරන වටපණු විශේෂයන්ගේ ව්‍යාධිජනක හැකියාව හා හානිය නිසා ඇතිවන රෝග ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයේ මූලික අදියරක් ලෙස ප්‍රැටිලෙන්චස් ලූසයි, රැඩොෆොලස් සිමිලිස් හා මෙලොයිඩොගයිනි බ්‍රෙවිකෝඩා වටපණු විශේෂයන්ගේ චර්යා රටා වැඩි උෂ්ණත්ව තත්ව යටතේ හා ප්‍රශස්ත තත්ව යටතේ සංසන්දනය කරන ලදි. මෙහිදී ප්‍රැටිලෙන්චස් ලූසයි හා රැඩොෆොලස් සිමිලිස් පිළිවෙළින් 20-24$^{0}$C හා 24-28$^{0}$C උෂ්ණත්ව පරාසයන් තුළ උපරිම ක්‍රියාකාරිත්වයක් දැක්වූ අතර මෙලොයිඩොගයිනි බ්‍රෙවිකෝඩා වැඩි උෂ්ණත්ව තත්ව යටතේ අක්‍රිය බවක් දැක්වීය. ප්‍රැටිලෙන්චස් ලූසයි විශේෂය සියළු තේ වගා ප්‍රදේශවල ආක්‍රමණකාරී ලෙස ව්‍යාප්ත වීමත් රැඩොෆොලස් සිමිලිස් හා මෙලොයිඩොගයිනි බ්‍රෙවිකෝඩාගේ ව්‍යාප්තිය සීමාකාරී වීමත් මෙම අධ්‍යයන ප්‍රතිඵල තුළින් පැහැදිලි විය.

## තේ වගාවේ ක්ෂේත්‍ර කටයුතු යාන්ත්‍රීකරණය

**කම්කරු නියගයට පිළියමක් ලෙස යෝග්‍ය තාක්ෂණික උපක්‍රම හා ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රියාවන් දියුණු කිරීම**

දළු නෙලන යන්ත්‍ර දෙකක් භාවිතා කරමින් තේ දළු තලයෙන් අඩක් හා සම්පූර්ණ දළු තලයෙන් දළු නෙලීමේ වාසි අවාසි අධ්‍යයනය කිරීම.

i. හොරණ මිල්ලකන්ද වතුයාය (2008)

චීනයෙන් හා ඉන්දුනීසියාවෙන් ආනයනය කරන ලද යන්ත්‍ර දෙකක් මේ සඳහා භාවිතා කරන ලදී. චීන යන්තය ඉන්දුනීසියානු යන්ත්‍රයට වඩා බරෙන් සැහැල්ලුය. දෙකම ද්විපහර, පෙට්‍රල් හා 2T මඟින් ක්‍රියාකරන එන්ජින් සහිත මැෂින්ය. ලපටි දළු මුවහත් තලයකින් කැපෙන අතර ඒවා මල්ලක් තුලට සුළං පහරක් මඟින් රැගෙන යයි.

අර්ධ දළු නෙලීම යටතේ තේ පත්‍ර තලයේ හරි අඩකින් එක් සතියකද ඉතිරි භාගයෙන් ඊලඟ සතියේද යන්ත්‍ර දෙක මඟින් දළු නෙලනු ලැබේ. සම්පූර්ණ පත්‍ර තලයෙන් දළු නෙලන්නේ සති දෙකට වරක් පමණි.

ක්‍රම දෙකම යටතේ යන්ත්‍ර මඟින් දළු නෙලිමේදී අතින් නෙලීමට වඩා 60% ක ප්‍රමාණයක් දළු අස්වනු හානි විය. කප්පාදු චක්‍රය අවසානයේ යන්ත්‍ර දෙක මඟින් දළු නෙලිමේදී අතින් නෙලීමට වඩා රළු මේරූ දළු ප්‍රමාණය 50% ක ගුණයකින් වැඩිවිය. කෙසේ වෙතත් කප්පාදු කල අතුවල බර, ගසක ඇති මුළු පත්‍ර ගණන යනාදිය දළු නෙලීමේ ක්‍රම දෙක නිසා වෙනස් නොවුනි. පත්‍රයක් සමඟ අංකුරය හා පත්‍රය දෙකක් සමඟ අංකුරය සහිත දළු සංඛ්‍යාව යන්ත්‍ර මඟින් දළු නෙලීමේදී අතින් නෙලීමට වඩා වැඩිවිය. නමුත් පත්‍ර තුන සමඟ අංකුරය සහිත දළු ප්‍රමාණය වැඩි නොවුනී. නමුත් පත්‍ර හතර සමඟ අංකුරය හා වංගි දළු සංඛ්‍යාව අතින් නෙලීමේදී යන්ත්‍ර මඟින් නෙලීමේදී වඩා වැඩිවිය. චීන හා ඉන්දුනීසියා යන්ත්‍ර දෙකෙන් පිළිවෙලින් දිනකට කි.ග්‍රෑ. 173 ක් හා කි.ග්‍රෑ. 189 ක සාමාන්‍ය අස්වැන්නක් ලබාගත හැකි වුනි. යන්ත්‍ර දෙකටම දිනකට පෙට්‍රල් ලීටර 5 ක් හා 2T ලීටර එකක් අවශ්‍ය වේ.

ii. බලංගොඩ වතුයාය

එම පරීක්ෂණයම බලංගොඩ වතුයායේ ද සිදුකරන ලදී. එහිදී ද අතින් දළු නෙලීමට සාපේක්ෂව ක්‍රම දෙක යටතේම යන්ත්‍ර මගින් දළු නෙලීමේදී 30 - 40% ක අස්වනු හානියක් සිදුවිය. තවද අතින් නෙලීමට සාපේක්ෂව 30 - 40% ක රළු මේරූ දළු ප්‍රතිශතයක් වැඩිවීමක් යන්ත්‍ර මගින් නෙලීමේදී වාර්තා විය. තේ ප්‍රභේද TRI 2026, DG 39 ට වඩා ඉහළ අස්වැන්නක් වාර්තා කලේය.

**තේ ශාක විවේකීව තබා හා නොතබා යන්ත්‍ර මගින් කප්පාදු කිරීමෙන් වන බලපෑම පරීක්ෂා කිරීම**

යන්ත්‍ර යොදා හා මිනිසුන් යොදා ශේෂ හා ශුද්ධ කප්පාදුවට පෙර තේ පඳුරු විවේකීව තබා හා විවේකීව නොතැබීමෙන් විය හැකි බලපෑම පරීක්ෂා කරන ලදී. මුළු පාත්ති ප්‍රමාණයෙන් අඩක් කප්පාදු කිරීමට පෙර සති 08 ක කාලයක් විවේකීව තබා හා ඉතිරි භාගය විවේකීව නොතබා පසුව ශේෂ කප්පාදුවට හා ශුද්ධ කප්පාදුවට බඳුන් කරන ලදී. අතින් කප්පාදුවට හා යන්ත්‍ර මගින් කප්පාදුවට පිළිවෙලින් ශ්‍රමිකයන් 50 ක් හා 10 ක් බැගින් අවශ්‍ය විය. කප්පාදු කර දෙවන වසර අවසානයේදී තේ අස්වැන්නෙහි වෙනසක් නොවුනී. විවේකීව තැබූ හා නොතැබූ තේ වල අස්වැන්න පිළිවෙලින් නිමි තේ කි.ග්‍රෑ.2453 ක් හා 2411 ක් ලෙස වාර්තා වුනී. යන්ත්‍ර මගින් හා මිනිසුන් මගින් කප්පාදු කිරීම තුලින් තේ අස්වැන්න පිළිවෙලින් හෙ. 1 ට නිමි තේ කි.ග්‍රෑ. 2442 ක් හා 2411 ක් ලෙස වාර්තා වුනී. ඉහළම අස්වැන්න වාර්තා වූයේ විවේකීව තබා ශේෂ අතු ද ඉතිරි කර කප්පාදු කල විටය. එය හෙක්ටයාර 1 ට නිමි තේ කි.ග්‍රෑ.2590 ක් විය.

**දළු නෙලීමේ යන්ත්‍රවල කාර්යක්ෂමතාව දියුණු කිරීමට සුදුසු වන සේ තේ පඳුරු සැකසීම**

විවිධ කප්පාදු ක්‍රම අනුගමනය කිරීමෙන් පසු යන්ත්‍ර මඟින් හා අතින් දළු නෙලීමේදී විය හැකි අස්වනු විචලතාවය පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයනයක් ගලබොඩ වත්තේදී ආරම්භ කරන ලදී. ඒ අනුව පහත දැක්වෙන ප්‍රතිකාරක අත්හදා බලන ලදී.

1. 20" ක උසින් ශේෂ කප්පාදුව කර මට්ටම් කපා යන්ත්‍ර මඟින් දළු නෙලීම
2. 20" ක උසින් ශේෂ කප්පාදුව කර මට්ටම් කපා පසුව අතින් දළු නෙලීම
3. 26" ක උසින් ශේෂ කප්පාදුව කර මට්ටම් කපා පසුව යන්ත්‍ර මඟින් දළු නෙලීම

අතින් දළු නෙලීමට වඩා යන්ත්‍ර මඟින් දළු නෙලන විට අස්වැන්න 20 - 30% ක් පහත වැටුනි. කප්පාදු චක්‍රය අවසානයේදී මේස කප්පාදුව කර යන්ත්‍ර මඟින් දළු නෙලීමේදී, 20" ක උසින් ශේෂ කප්පාදුව කර යන්ත්‍ර මඟින් දළු නෙලීමට වඩා අස්වනු පහත වැටීම අඩුවිනි. රළු හා මේරූ දළු ප්‍රමාණය යන්ත්‍ර මඟින් හා අතින් දළු නෙලීමේදී පිළිවෙලින් 23% ක් හා 2% ක් විය.

## තේ වියළීම සඳහා විකල්ප ශක්ති ප්‍රභවයන් යොදා ගැනීම

**හොරණ රයිගම් වතුයාය, රත්නපුර ශාන්ත ජෝකිම් වතුයාය, හන්තාන හා පස්සර තේ පර්යේෂණ ආයතන ප්‍රාදේශීය මධ්‍යස්ථානවලදී ශක්ති ප්‍රභවයන් ලෙස යොදාගත හැකි දැව ඉන්ධන ශාක පිළිබඳ අධ්‍යයනය කිරීම**

**රයිගම් වත්ත**

වයස අවුරුදු 4 දී ග්ලිරිසිඩියා මේරූ අතු අප්‍රේල් හා දෙසැම්බර් මාසවල දෙවරක් කප්පාදු කරන ලදී. ග්ලිරිසිඩියා මී.1 x මී.1, මී.1 x මී.2 හා මී.2 x මී.2 පරතරයෙන් සිටු වූ විට (හෙක්ටයාරයකට ගස් 10,000, 5000 හා 2500) 20% ක තෙතමනය සහිත දඬු අස්වනු ලෙස පිළිවෙලින් හෙක්ටයාරයකින් ටොන් 17.0, 9.5 හා 4.2 ක් පළමු කප්පාදුවෙන්ද ටොන් 17.2, 7.9 හා 4.0 ක් දෙවන කප්පාදුවෙන්ද ලැබුණි. ලපටි අතු හා පත්‍රවල වියළි බර ලෙස පිළිවෙලින් හෙක්ටයාරයකට ටොන් 3.77, 1.87 හා 0.93 ක් පළමු කප්පාදුවෙන්ද හෙක්ටයාරයකට ටොන් 4.17, 2.79 ක් හා 1.25 ක් දෙවන කප්පාදුවෙන්ද ඉහත පරතරවලදී වාර්තා විය. ලපටි දළු හා පත්‍ර යෙදීමෙන් පසේ කාබනික ද්‍රව්‍ය (2.21%) අවට පසේ කාබනික ද්‍රව්‍ය ප්‍රතිශතයට (2.04%) වඩා ඉහළ ගියේය.

**ශාන්ත ජෝකිම් වත්ත**

ග්ලිරිසිඩියා වයස අවුරුදු 04 දී මාස 08 ක් වයසැති දඬු වරක් කප්පාදු කරන ලදී. ඒවායේ බර (20% ක තෙතමනය සහිතව) මී.1 x මී.1, මී.1 x මී.2, හා මී.2 x මී.2, පරතරවලදී හෙක්ටයාර 1 ට ටොන් 23.3, 9.8 හා 2.2 ලෙස වාර්තා විය. පත්‍ර හා ලපටි අතුවල වියළි බර පිළිවෙලින් හෙක්ටයාර 1 ට ටොන් 4.51, 1.26 හා 0.3 ක් විය.

**තේ පර්යේෂණ ආයතනය, හන්තාන**

ග්ලිරිසිඩියා වයස අවුරුදු 02 දී මාස 08 ක් වයසැති දඬු දෙවන වරට කප්පාදු කරන ලදී. 20% ක තෙතමනය යටතේ දඬු බර ලෙස හෙක්ටයාර 1 ට ටොන් 2.94, 1.57 ක් හා 0. 49 ක් ලෙස පිළිවෙලින් ඉහත පරතරවලදී වාර්තා විය. ලපටි අතු හා පත්‍රවල වියළි බර ලෙස හෙක්ටයාර 1 ට ටොන් 1.86, 1.59 ක් හා 2. 97 ක් වාර්තා වුනි.

**ග්ලෙන් ඇල්පින් වත්ත, පස්සර**

අවුරුදු 02 ක් වයසැති ග්ලිරිසිඩියා තෙවන වරට කප්පාදු කරන ලදී. ඉහත දැක්වු පරතරවලදි පිළිවෙලින් 20% ක තෙතමන තත්ත්ව යටතේ ග්ලිරිසිඩියා දඬු අස්වනු ලෙස හෙක්ටයාර 1 ට ටොන් 17.05, 17.6 ක් හා 10.8 ක් වාර්තා විය. පත්‍ර හා ලපටි අතුවල වියළි බර ලෙස  පිළිවෙලින් හෙක්ටයාර 1 ට ටොන් 10.9, 7.9 ක් හා 6.6 ක් වාර්තා විය.



**ශාන්ත කුම්බිස් වතුයායේදී කැලියැන්ඩ්‍රා කැලෝත්‍රිසස් වගාකිරීම (2010)**

කැලියැන්ඩ්‍රා වසර 2 දී තුන්වන කප්පාදුව සිදුකරන ලදී. එහිදී 20% තෙතමන තත්ත්ව යටතේ පිළිවෙලින් හෙක්ටයාර 1 ට ටොන් 7.0, 6.0 ක් හා 5.0 ක් ලෙස දඬු අස්වැන්නක් ඉහත කී පරතරවලින් සිටුවීමේදී වාර්තා වුනි. පත්‍ර හා ලපටි දඬු වියළි බර ලෙස පිළිවෙලින් හෙක්ටයාර 1 ට ටොන් 10.6, 9.7 ක් හා 6.3 ක් වාර්තා වුනි.

මේ අනුව ශාක ගහනයේ හෙක්ටයාර 1 ට පැල 10,000 එනම් මී.1 x මී.1 පරතරයෙන් සිටුවන විට ශාක විශේෂ දෙකෙන්ම ඉහළම දඬු හා පත්‍ර අස්වැන්නක් ලබාගැනීමට හැකි විය.

## තේ පිරි සැකසුම් තාක්ෂණය

**පහතරට තේ නිෂ්පාදනයේ දී භාවිතා කරන රෝල් බ්‍රේකරයේ දැලෙහි සිදුරුවල විශාලත්වය වෙනස් කරමින් එය පහතරට නිමි තේ වල මිල වැඩිකර ගැනීමට සහ උසස් වර්ගයේ නිමි තේ වල ප්‍රතිශතය වැඩිකර ගැනීමට පරීක්ෂාකර බැලීම.**

පහතරට තේ (පත්‍රික නිමි තේ) නිෂ්පාදනය සිදුකරන කර්මාන්තශාලා 80% ක්ම අමු දළු මිල දී ගෙන තේ නිෂ්පාදනය සිදු කරන අතර, එම මිල දී ගන්නා දළු වල හොඳ ප්‍රතිශතය 50% පමණ වේ.

මේ නිසා සමහර කර්මාන්තශාලා හොඳ නිමි තේ වල ප්‍රතිශතය වැඩිකර ගැනීමේ අරමුණින් ඇඹරීමෙන් පසු ඇඹරුණු තේ කොටස් වෙන්කර ගැනීමට රෝල් බ්‍රේකරයට භාවිතා කරන දැල්වල සිදුරුවල විශාලත්වය නො. 04 වෙනුවට නො. 03 භාවිතා කිරීමට යොමු වී ඇත.
මෙහිදී තේ වල ශුද්ධ අලෙවි සාමාන්‍ය (N.S.A) මිල වැඩිකර, උසස් තේ වල ප්‍රතිශතය වැඩිකර ගැනීමේ අරමුණින් රෝල් බ්‍රේකරය සඳහා නො. 03 සහ නො. 04 යන දැල් දෙකෙහි සංයෝජනයක් ලෙස භාවිතා කර එය ඇඹරීමේ ක්‍රියාවලියෙන් කුමන අවස්ථාවකට යොදාගත හැකි වේ දැයි සොයාබැලීම සඳහා පර්යේෂණ සිදුකරන ලදී.

තේ ඇඹරීමේ ක්‍රියාවලියේදී භාවිතා කරන පළමුවැනි රෝල් බ්‍රේකරයට නො. 04 දැල යොදාගැනීමෙන් සහ ඊලඟට සිදුකරන සෑම ඇඹරුම් අවස්ථාවකටම නො. 03 සහ නො. 04 සංයෝජනයෙන් යුත් දැල් ඇතුලත් කර රෝල් බ්‍රේකර් යන්ත්‍ර යොදාගැනීමෙන් අමු දළු වල ප්‍රමිතිය 50% වුවද, උසස් නිමි තේ වල ප්‍රතිශතය වැඩිකර ගැනීමටත් ඒ සඳහා හොඳ මිලක් ලබාගත හැකි බවත් පරීක්ෂණ වලින් අනාවරනය විය.

**ඌව ප්‍රදේශයේ වගා කරන ලද නව තේ ප්‍රභේද වලින් නිපදවන නිමි තේ වල ගුණාත්මබව විශ්ලේෂණය කිරීම**

ඌව ප්‍රදේශයේ වගා කරන ලද, අළුතින් මුහුම් කල නව තේ ප්‍රභේද වලින් සාදන ලද නිමි තේ වල ගුණාත්මක බවින් වැඩි සහ අඩු තේ ප්‍රභේද(DN,2025) සමඟ සංසන්දනය කරන ලදී.
මේ අනුව DN වලින් නිපද වූ නිමි තේ වල ගුණාත්මකබව සමඟ නව තේ ප්‍රභේද 06 ක් සැසඳීමට ලක් කරන ලදී. එම තේ ප්‍රභේද අතරින් 02 ක් පමණක් ඒ හා අනුකූල විය. එම නිසා ඌව ප්‍රදේශයට සුදුසු තේ ප්‍රභේද නිර්දේශ කිරීමේදී මෙම නව තේ ප්‍රභේද (U5,U208) දෙකෙහි ගුණාත්මකබව පිළිබඳ විශේෂ අවධානයක් යාමු කල හැකිය.

**ඕතෝඩොක්ස්/රොටවේන් නිෂ්පාදන ක්‍රියාවලියේ දී යොදාගන්නා තේ වියළීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම**

පසුගිය කාලවල තිබුණු ඕතෝඩොක්ස්/රොටවේන් නිෂ්පාදන ක්‍රියාවලිය මේ වන විට වෙනස් වීමෙන් ඉතා කුඩා ප්‍රමාණයේ නිමි තේ වල නිෂ්පාදන ප්‍රතිශතය වැඩි වී ඇත.

තරල පත්ල වියළනය (FBD) යොදා ගනිමින් තේ වියළීමේදී මෙම තේ කුඩුවල කුඩා බව හේතුවෙන් ඒවා තරල පත්ල වියළනය තුල ක්‍රමානුකූල වියළීමක් සිදු නොවන බව පෙනී ගොස් ඇත. මෙම කුඩා ප්‍රමාණයේ තේ කුඩු ක්‍රමවත්ව වියළීමේ ක්‍රියාවලිය දියුණු කර ගැනීම සහ එමගින් ගුණාත්මක තේ නිෂ්පාදනය සඳහා බලපාන කරුණු අධ්‍යයනය කරන ලදී.

තරල පත්ල වියළනයේ ඇති සිදුරු සහිත තහඩුවේ ඇති සිදුරුවල ප්‍රමාණය ප්‍රශස්ත කිරීමෙන් හා අඟලකට ඇති සිදුරු සංඛ්‍යාව ප්‍රශස්ත කිරීමෙන් මෙම වියළනයෙන් කුඩා ප්‍රමාණයේ තේ කුඩු වල ක්‍රමානුකූල වියළීමක් සිදුකරගත හැකි බව පරීක්ෂණවලින් අනාවරණය විය.

## නිම් තේ වල ගුණාත්මය වැඩි දියුණු කිරීම

### ශ්‍රී ලංකා තේ වල ෆැලවොනෝල් (කැම්ෆොරෝල්, ක්වාසිටින් සහ මයිරසෙටින්) ප්‍රමාණ නිර්ණය කිරීම

මෑතකදි කරන ලද පර්යේෂණවලින් කළු තේ වල කහට රසයට ෆැලවොනෝල් ග්ලයිකෝසයිඩ බලපාන බව සොයාගන්නා ලදී. නමුත් කළු තේ වල අඩංගු මෙම රසායන ද්‍රව්‍යවල ප්‍රමාණය පිළිබඳ දත්තයන් නොමැත. එම නිසා මෙම පර්යේෂණ මඟින් කළු තේ වල කැම්ෆොරෝල්, ක්වාසිටින් සහ මයිරසෙටින් ප්‍රමාණ සොයාගන්නා ලදී.

### අන්තර් විද්‍යාගාර පර්යේෂණය

විශ්ලේෂණ දත්තවල තත්ත්ව පාලනය කිරීම සඳහා තේ පර්යේෂණ ආයතන ජෛව රසායන විද්‍යා අංශය අන්තර්ජාතික ආයතන මඟින් පවත්වන ලද අන්තර් විද්‍යාගාර පර්යේෂණ සඳහා සහභාගි වේ. මෙහි දී කළු තේ වල L- තියනින් නිර්ණය සඳහා අන්තර්ජාතික තත්ත්ව පාලන ආයතනය (ISO) මඟින් පවත්වන ලද පර්යේෂණ සඳහා සහභාගි විය. මීට අමතරව ශ්‍රී ලංකා තේ පර්යේෂණ විද්‍යාගාරය මඟින් පවත්වන ලද කළු තේ වල ISO 3720, නිර්ණය කිරීමේ පර්යේෂණ සඳහා සහභාගි වී ඉතා සතුටුදායක ප්‍රතිඵල ලබාගන්නා ලදී.

### පළිබෝධනාශක අවශේෂ නිර්ණය කිරීමේ වැඩසටහන

ශ්‍රී ලංකා තේ ලෝක වෙළෙඳපොළේ විකිණීම සඳහා පළිබෝධනාශක අවශේෂ උපරිම අවශේෂ සීමාවටල (MRL) අඩුවෙන් පවත්වාගෙන යාම ඉතාමත් වැදගත් වේ. එම නිසා පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණය කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම ඉතාමත් වැදගත් වේ. ඒ අනුව බහු අවශේෂ නිර්ණය කිරීමේ ක්‍රමයන් ස්ථාපිත කරන ලදී. මෙමගින් ඩයිසිනෝන්,බිටැටනෝල් හෙක්සකොනසෝල්/ ප්‍රොපිකොනසෝල්/ ටෙබියුකොනසෝල් යන දිලීරනාශක වල අවශේෂ නිර්ණය කල හැක. (ඔක්සිfපලුfපෙන්,ෆිප්‍රොනිල්, සහ පයිරක්ලොස්ට්‍රොබීන්) සඳහාද මෙවැනිම ක්‍රමයක් ස්ථාපිත කිරීමට පර්යේෂණ පැවැත්වේ.

**තේ වල අඩංගු ගැමාඇමයිනෝ බියුට්රික් අම්ල ප්‍රමාණය ප්‍රමාණික කිරීම**

ගාබා අම්ලයද L- තියනින් මෙන් මානසිය හා ආතතිය ඉහිල් කිරීමේ හැකියාවක් ඇති බව සොයාගෙන ඇත. එම නිසා තේ වල අඩංගු ගැමා ඇමයිනෝ බියුටරික් අම්ල ප්‍රමාණය LC-MS නැමැති උපකරණය භාවිතයෙන් නිර්ණය කරන ලදී. මෙහිදි ඉතාලියේ විද්‍යාඥයින් සමඟ සහයෝගීතාවයකින් ඉහත MS උපකරණය භාවිතා කරන ලදී.
කළු තේ, හරිත තේ , සිල්වටිප්ස් සහ ශ්වේත තේ වල අඩංගු ගාබා අම්ල ප්‍රමාණය පිළිවෙලින් 81-129, 13-48, 63-442 හා 83-803 mg/kg වේ.

# අගය එකතු කළ තේ නිෂ්පාදන

**ක්ෂණික කළු තේ නිෂ්පාදන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම**

සාමාන්‍ය ක්ෂණික කළු තේ නිෂ්පාදන ක්‍රියාවලියේදී තේ සාරය සාන්ද්‍ර කරනු ලබන්නේ වාෂ්පීකරණය මගිනි. මෙමගින් ක්ෂණික කළු තේ වල ගුණාත්මයට හානි සිදු වේ. පටල පෙරණ තාක්ෂණය යොදාගනිමින් තේ සාරය සාන්ද්‍ර කිරීම තාපය යොදාගනිමින් සාන්ද්‍ර කිරීම වෙනුවට හොඳ විකල්පයකි. එම නිසා ක්ෂණික කළු තේ නිෂ්පාදනයේදී තේ සාරය පටල පෙරණ තාක්ෂණය මගින් සාන්ද්‍ර කිරීමේ හැකියාව අධ්‍යයනය කරන ලදී. මෙම ක්‍රමය යොදාගනිමින් නිෂ්පාදිත ක්ෂණික කළු තේ වල රසායනික සංයුතිය සාමාන්‍ය ක්‍රමයට නිෂ්පාදිත කළු තේ වලට වඩා උසස් බව තහවුරු කරණ ලදි.

**තේ පානය සුවරැකුමට උපකාරි වන අයුරු ගැන පර්යේෂණ**

මස් යොදාගෙන කරනු ලබන නිෂ්පාදන ක්‍රියාවලියන්හිදී සුලභව භාවිතා කෙරෙන කෘතීම ප්‍රතිඔක්සිකාරක වෙනුවට භාවිතා කළහැකි ස්වාභාවික ප්‍රතිඔක්සිකාරක වෙතට වැඩි අවධානයක් යොමු වනුයේ එය ශරීරයට ඉතා හිතකර වන බැවිනි. එම නිසා මෙම පර්යේෂණ සිදු කරනු ලැබුවේ, එවැනි කෘතීම ප්‍රතිඔක්සිකාරක වෙනුවට කළු තේ හා කොළ තේ නිස්සාරණයන් යොදාගෙන පදම් නොකළ ඌරුමස් වලින් සොසේජස් සෑදීමේ හැකියාව පිළිබඳව සොයාබැලීමටය. එම අධ්‍යයනයෙන් සනාථ වූයේ කළු තේ හා කොළ තේ යන දෙවර්ගයම (නිස්සාරණයන්) සැලකිය යුතු මට්ටමේ ප්‍රතිඔක්සිකාරක හැකියාවක් සොසේජස් වෙත ලබාදෙන බවයි. (පහළ මට්ටමේ මේදය ඔක්සිකරණය වීමේ අගයන් දක්වමින්) පාලිත පරීක්ෂණයට සාපේක්ෂව කළු තේ හා කොළ තේ නිස්සාරණයන් යොදා සකස්කරන ලද පදම් නොකළ ඌරුමස් සොසේජස් වර්ග දින 05ක ගබඩා කිරීමේ කාලය තුලදී ඉතා අඩු මේදය ඔක්සිකරණය වීමේ අගයක් (TBARS Value) පෙන්නුම් කරන ලදී. කළු තේ නිස්සාරණය ප්‍රතිඔක්සිකාරකයක් ලෙස 0.05% සාන්ද්‍රණයකින් පදම් නොකළ ඌරුමස් සොසේජස් නිෂ්පාදනයේදී යොදා ගැනීම මගින් රස, වයනය හා සමස්ථ පිළිගැනුම (Oveall Acceptance) ඉහළම අගයක් පෙන්නුම් කරන ලදී.


Refuse tea
Instant tea
Spent tea
(by product)

## ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ කුඩා තේ වතු හිමියන්ගේ නිෂ්පාදන පිරිවැය කෙරෙහි බලපාන සාධක

නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තු කිරීම, නිෂ්පාදන පිරිවැය කෙරෙහි බලපාන සාධක හදුනාගැනීම සහ කුඩා තේ වතු හිමියන් මුහුණ දෙන ගැටළු පිළිබඳව අධ්‍යයනය කිරීම අරමුණු කරගෙන රත්නපුර දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන් 150 දෙනෙකු සම්බන්ධ කරගෙන සමීක්ෂණයක් සිදුකරන ලදී. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල වලින් පැහැදිලි වූයේ තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය ඉඩමේ ප්‍රමාණය මත සැලකිය යුතු ලෙස වෙනස් වන බවය. නිෂ්පාදන පිරිවැයට වැඩියෙන්ම දායක වූයේ කම්කරු ශ්‍රමය වූ අතර, එය මුළු නිෂ්පාදන පිරිවැයෙන් 72% ක් විය. විවිධ ඉඩම් ප්‍රමාණ වල ඵලදායිතාවය ගණනය කිරීමේදී අක්කර 2.25 - 5 කාණ්ඩයේ ඵලදායිතාව සාපේක්ෂව ඉහළ අගයක් පෙන්වන අතර අනෙකුත් ඉඩම් කාණ්ඩවල සමාන ඵලදායිතාවක් ද දක්නට ලැබුණි. තේ වගාව සඳහා ආයෝජනය කිරීමට ඇති හැකියාව, උසස් කළමනාකාරිත්වය සහ තොග වශයෙන් අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී ඇති වාසි මෙයට හේතු වේ. කළමනාකාරිත්වය හා නිෂ්පාදනය අතර සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති බවද සොයා ගැණිනි. මෙම ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන් මුහුණ පා ඇති ගැටළු ලෙස, තේ වගාව පිළිබඳ තාක්ෂණික දැනුම අඩුකම, මූල්‍යමය හා පුහුණුවීම් ලබාදෙන ආයතන පිළිබඳ අවබෝධය අඩුකම, මිලෙහි විචල්‍යයතාවයන් සහ අමු දළු මිල පහත වැටීම පෙන්වා දිය හැක.

**තේ ක්ෂේත්‍රයේ කළමනාකාරිත්වයට පහසුකම් සැලසීමේ ක්‍රමවේදයක් ලෙස භූගෝල විද්‍යා, තොරතුරු තාක්ෂණ පද්ධති (GIS) හඳුන්වා දීම.**

භූගෝල විද්‍යා, තොරතුරු පද්ධති (GIS) හා දුරස්ථ ගෝචර ග්‍රහන ශිල්පයෙහි (Remote Sensing) තාක්ෂණය භාවිතයෙන් ශාන්ත කුම්බස් තේ වත්ත ආදර්ශනයක් ලෙස යොදාගෙන සිදු කළ අධ්‍යයනයන් සාර්ථකව නිම කරන ලදී.

Arc Map 9.3 මෘදුකාංග භාවිතා කරමින් සකසන ලද චන්ද්‍රිකා ඡායාරූප දත්ත අංකන ක්‍රියාවලියට ලක් කරන ලදී. මෙලෙස ක්ෂේත්‍ර සිතියම, භූ පරිභෝජන සිතියම, තේ ප්‍රභේද සිතියම, මාර්ග සිතියම හා ගොඩනැගිලි සිතියම සකස් කරන ලදී.

ත්‍රිමාණ විශ්ලේෂණ තාක්ෂණයන් යොදාගනිමින් අංකික උන්නතාංශ ආකෘතිය (Digital Elevation Model) නිර්මාණය කරන ලදී. මෙය පදනම් කර ගනිමින් භූ ආනතිය සිතියම්ගත කරන ලදී. මෙම සියළුම සිතියම් Arc Reader මෘදුකාංගය භාවිතා කරමින් විශ්ලේෂණයට හැකි වන පරිදි සකස් කිරීමට Arc Putlisher භාවිතා කෙරිණ. මෙම සම්පූර්ණ පද්ධතිය වතු කළමනාකාරිත්වයට අදාල සැලසුම් සහ තීරණ ගැනීම සඳහා උපයෝගී කරගත හැකි මෙවලමක් ලෙස ඉදිරිපත් කළ හැක.



**කම්කරු වැටුප් ඉහළ යාම සහ පොහොර සහනාධාරය නිෂ්පාදන පිරිවැය කෙරෙහි බලපෑම**

කම්කරු වැටුප් ඉහළ යාම සහ පොහොර සහනාධාරය, කුඩා හා මහා තේ වතු අංශයේ නිෂ්පාදන පිරිවැය කෙරෙහි බලපෑම විශ්ලේෂණය කරන ලදී. උඩරට, මැදරට, පහතරට සහ ඌව ප්‍රදේශවල තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශිත මත ඇස්තමේන්තු කළ නිමි තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය, වැටුප් ඉහළ යාමට පෙර පිළිවෙලින් රුපියල් 334.66, 342.85, 355.06 සහ 399.80 ක් විය. පොහොර සහනාධාරය නිසා නිමි තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය රුපියල් 10.37 - 16.59 අතර ප්‍රමාණයකින් පහළ ගියේය. (මෙය මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයට 3 - 4 ක අඩු වීමකි. සමස්ථයක් ලෙස ගත් කල නිමි තේ කිලෝවක මුළු නිෂ්පාදන පිරිවැය රුපියල් 42 - 4 ක ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. (මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයට 12 - 13 ක වැඩි වීමකි).

කම්කරු වැටුප් වැඩි වීම, දැනට කුඩා තේ වතු අංශයේ නිෂ්පාදන පිරිවැය කෙරෙහි ඍජු බලපෑමක් ඇති නොකලද, මෙම ක්ෂේත්‍රයේද පුහුණු හා නුපුහුණු කම්කරුවන්ගේ දිනක වැටුප රුපියල් 650 සහ 450 කින් වැඩි විය හැකි බව බලාපොරොත්තු විය හැක. වසරක අමු දළු ඵලදායිතාව අත්තයට කි.ග්‍රෑ. 3954 ක් වන (කුඩා වතු ක්ෂේත්‍රයේ ජාතික ඵලදායිතාවයේ සාමාන්‍යය) සහිත තේ ඉඩමක අමු දළු කිලෝවක වර්තමාන නිෂ්පාදන පිරිවැය රුපියල් 37.80 ක් වේ. කෙසේ වෙතත්, වැටුප් වැඩිවීම සමඟ මෙවැනි ඉඩමක නිෂ්පාදන පිරිවැය රුපියල් 43.17 ක් දක්වා වැඩි විය හැක. මෙම වැඩි වීම මුළු අමු දළු කිලෝවක නිෂ්පාදන වියදමින් 14% ක වැඩි වීමකි (කිලෝවකට රුපියල් 5.40 ක වැඩිවීමක්). වැටුප් සංශෝධනයේ අහිතකර බලපෑම අවම කරගැනීම සඳහා භූමි හා කම්කරු ඵලදායිතාව ඉහළ නැංවීම මඟින් නිෂ්පාදන පිරිවැය පාලනය කරගත යුතු වේ. ක්‍රමවත් භෝග කළමනාකරණ හා නිෂ්පාදන ක්‍රියාකාරකම් අනුගමනය කිරීම, නිෂ්පාදිත විවිධාංගීකරණය, සහ අගය එකතු කළ තේ නිෂ්පාදනය, ඉහළ ඵලදායිතාවයක් හා මිලක් සහතික කරයි. එමෙන්ම නිෂ්පාදන පිරිවැයට කම්කරු වියදම විශාල ලෙස දායක වන හෙයින් අවශ්‍ය පරිදි කම්කරුවන් යෙදවීම සහ කොන්ත්‍රාත් පදනම මත කම්කරුවන් වැඩෙහි යෙදවීම, නිෂ්පාදන වියදම පාලනය කිරීමට වැදගත් වේ.

**තේ වගාව සඳහා බාහිර වගාකරුවන් යොදවා ගැනීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනය**

බාහිර වගාකරුවන් යොදවා ගැනීමේ සංකල්පය, ඇල්කඩුව වැවිලි සංගමයට අයත්, සෙලගම වතුයායේ කම්කරුවන් 29 දෙනෙකු යොදාගෙන ක්‍රියාත්මක කරන ලදී. තේ වතුවල ශ්‍රම හිඟතාවයට පිළියමක් ලෙස හා ඵලදායිතාවෙන් අඩු තේ ඉඩම් කම්කරුවන්ගේ සහභාගිත්වයෙන් වැඩි දියුණු කර තේ කර්මාන්තය දිගුකාලීනව පවත්වාගෙන යාමට ඉවහල් වන ක්‍රමවේදයක් ලෙස, බාහිර වගාකරුවන් යොදවා ගැනීම පිළිබඳ ආකෘතියක් ගොඩනැගීම සහ තේ වතු වලට යොදවා ගැනීම පිළිබඳව අධ්‍යයනය මෙමඟින් කෙරේ.

මෙම ව්‍යාපෘතියෙහි අරමුණු වන්නේ, මූල්‍යමය වාසිදායක තත්ත්වයන්ට අමතරව කම්කරුවන්ගේ කළමනාකරණ හැකියාව දියුණු කිරීම, ආත්ම විශ්වාසය ගොඩනැගීම සහ තමාගේ සහජ දක්ෂතා සහ කුසලතා පිළිබඳව විශ්වාසය තබා කටයුතු කිරීමට පෙළඹවීමය. 2011 වසරේ (835kg), බාහිර වගාකරුවන්ගේ තේ ඉඩම්වල ඵලදායිතාවයේ සාමාන්‍යය හිතකර කාළගුණික තත්ත්වයන් පැවැති 2010 වසර (835kg) හා සසඳන විට, ඉහළ මට්ටමක පැවැති බව මෙම ව්‍යාපෘතිය ආරම්භ කර මාස 08 කින් පසුව කළ මූලික විශ්ලේෂණයේ ප්‍රතිඵලවලින් තහවුරු විය. තවද, 2011 සහ 2008 වසර අතර ඵලදායිතාවයේ වෙනස සැලකිය යුතු ලෙස වැඩි විය. (වසර දෙකෙහි කාළගුණික තත්ත්ව බොහෝ දුරට සමාන ලෙස පැවැතිණි. 2011 වසරෙහි ඵලදායිතාව 2008 වසරට සාපේක්ෂව වැඩි අතර එය නිමි තේ කි. ග්‍රෑ. 165 ක් වැනි ඉහළ අගයක් ගනී. තවද තේ නිෂ්පාදනයද 2011 වසරෙහි, 2010 වසරට සාපේක්ෂව වැඩිය. (5% ක වැඩිවීමක්). මෙම ඉඩම්වල ඵලදායිතාවය වැඩිවීම, 2008 වර්ෂයට සාපේක්ෂව 25% ක් පමණ විය. බාහිර වගාකරුවන්, ඔවුන්ගේ තේ ඉඩම්වලින් රුපියල් 2600 ක පමණ මාසික ආදායමක් උපයාගෙන ඇත. මොවුන්ට තේ වත්තෙහි වැඩ කිරීම නිසා ලැබුණු මාසික ආදායම වූයේ රුපියල් 5300 කි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතියෙහි සැලසුම්ගත කටයුතුවල ප්‍රගතිය කෙරෙහි නියඟය අහිතකර ලෙස බලපෑවේය.

**පසුගිය දශක තුල තේ කර්මාන්තයේ ප්‍රගතිය**

තේ කර්මාන්තයේ ප්‍රගතිය විශ්ලේෂණයේ ප්‍රතිඵලවලින් පසුගිය දශක වලදී කුඩා තේ ඉඩම් ප්‍රමාණය වැඩි වී ඇති බවද, නිෂ්පාදන වර්ධන වේගය ධන අගයක් ගෙන ඇති බවද තහවුරු විය. එමෙන්ම පසුගිය දශකයේදී සියළුම තේ ක්ෂේත්‍රයේ අංශවල (ජනතා වතු සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය වැවිලි සංස්ථාව, ප්‍රාදේශීය වැවිලි සමාගම සහ කුඩා තේ වතු අංශය) සමස්ථ ඵලදායිතා වර්ධන වේගය සෘණ අගයක් ගෙන ඇති බවද පැහැදිලි විය. ඒ කෙසේ වෙතත්, ප්‍රාදේශීය වැවිලි සමාගම්වල ඵලදායිතා වර්ධන වේගය පසුගිය දශක තුන තුලදී ධන අගයක් ගෙන ඇත. කුඩා තේ වතු අංශයේ මූල්‍යමය කාර්යක්ෂමතාව මහා වතු අංශයට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින බවද මෙම විශ්ලේෂණයේදී තහවුරු විය.

## තේ කර්මාන්තයේ නියැලෙන්තන් සඳහා සේවාවන්

### (1) උපදෙස් හා ව්‍යාප්ති වැඩසටහන්

සේවාලාභීන්ගේ ඉල්ලීම මත ඔවුන්ගේ තේ ඉඩම් හි තේ වගාවන් සම්බන්ධ ගැටළු හඳුනා ගැනීමට සහ ඒවාට විසඳුම් ලබා දීම සඳහා සමාගම් අංශයේ සහ කුඩා තේ වතුවල නිරීක්ෂණ සහ උපදේශක චාරිකා රැසක් සිදු කරන ලදි.

උපදේශක චාරිකාවන්ගෙන් බහුතරයක් සමාගම් අංශයේ වතු සඳහා වෙන් කරන ලද අතර විශේෂිත ඉල්ලීම් මත කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමග කුඩා තේ වතු නිරීක්ෂණ චාරිකාවන් ද සිදු කරනු ලැබීය. උපදෙස් හා ව්‍යාප්ති අංශයේ නිලධාරීන් විසින් සිදු කරනු ලැබූ මුළු උපදේශක චාරිකා සංඛ්‍යාව 792 කි. මුළු චාරිකාවන්ගෙන් 27% පමණ ප්‍රමාණයක් සිදු කරනු ලැබුවේ නිරිත දිග මෝසම් කලාපයේ පිහිටා ඇති තේ ඉඩම් හි නැවත වගාව සඳහා යෝග්‍යතා වාර්තා සැපයීමට ය. චාරිකාවන්ගෙන් 10% පමණ අනුවර්ති චාරිකාවන් නිරීක්ෂණය සඳහා සිදු කල ව්‍යාප්ති චාරිකාවන් ය.

මුළු උපදෙස් හා ව්‍යාප්ති චාරිකාවන් ගෙන් 31% එනම් චාරිකා 248 ක් සිදු කරනු ලැබ ඇත්තේ දෙනියාය මධ්‍යස්ථානයෙනි. උඩරට කලාපයේ වතු සඳහා චාරිකා 232 ක් සිදු කර ඇති අතර මැදරට, ගාල්ල, පස්සර හා කළුතර ප්‍රදේශයන් හි උපදෙස් හා ව්‍යාප්ති නිලධාරීන් විසින් පිළිවෙලින් චාරිකා 130, 58, 54, 48 සහ 22 සිදු කර ඇත. මෙම චාරිකාවන්ගෙන් බහුතරයක් සිදු කර ඇත්තේ නැවත වගාවන් සඳහා යෝග්‍යතාවයන් නිර්දේශ කරනු පිණිස ය. අස්වැන්න පහළ බැසීම, තේ පඳුරු දිරාපත් වීම, තේ තවාන් අසාර්ථක වීම සහ රෝග පලිබෝධ හානි හඳුනා ගැනීම ආදී කරුණු මත අනෙකුත් චාරිකා සිදු කර ඇත.

### (2) අධ්‍යයන හා පුහුණු වැඩසටහන්

**කණ්ඩායම් පුහුණු වැඩසටහන්:** ආයතනයේ පර්යේෂණ නිලධාරීන්ගේ සහයෝගය ඇතිව පුහුණු වැඩසටහන් සම්මන්ත්‍රණ ක්ෂේත්‍ර දින සහ දේශණ වැඩසටහන් 516 ක් සිදු කර ඇත. පුහුණු වැඩසටහන් අතරින් 39.7% ක් දෙනියාය මධ්‍යස්ථානයෙහි නිලධාරීන් විසින් කුඩා තේ වතු හිමියන් හට සිදු කර ඇති අතර ඒවායේදී කාර්යක්ෂම ලෙස පොහොර භාවිතය ආරක්ෂාකාරී ලෙස පළිබෝධනාශක භාවිතය, රෝග හා පළිබෝධ සම්බන්ධ ගැටළු හඳුනා ගැනීම ආදී විෂයන් සාකච්ඡාවට භාජනය කර ඇත.

**නේවාසික පුහුණු වැඩසටහන්:** ජාතික වැවිලි කළමණාකරණ ආයතනයේ සම්බන්ධීකරණය මත සමාගම් ක්ෂේත්‍රයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා සහ වැවිලි ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාප්ති නිලධාරීන් සඳහාද නේවාසික පුහුණු වැඩසටහන් පවත්වනු ලැබීය. සමාගම් ක්ෂේත්‍රයේ  ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පැවැත්වූ  දින තුනක වැඩමුළුවේදී අස්වැන්න ඉහළ නැංවීමේ සහ පසු-අස්වනු හානි අවම කර ගැනීමේ ප්‍රායෝගික ක්‍රම පිළිබඳ වැඩි අවධානය යොමු කරනු ලැබීය. තේ, රබර් හා පොල් සහ අනෙකුත් කෘෂිකර්ම ක්ෂේත්‍රයන්හි ව්‍යාප්ති කටයුතු හි නියැලෙන නිලධාරීන් රැසක් දින 10 ක් පුරා පැවැත්වූ වැවිලි කළමණාකරණ ඩිප්ලෝමා වැඩසටහනට සහභාගි වූ අතර ඔවුන් තේ වගාව පිළිබඳ සිද්ධාන්ත දැනුමෙන් මෙන්ම ප්‍රායෝගික පුහුණුවෙන්ද ශක්තිමත් කරනු ලැබීය. වැවිලි කළමණාකරණ ආයතනය විසින් පාසැල් අධ්‍යාපනය අවසන් කල වැවිලි ක්ෂේත්‍රයට සම්බන්ධ වීමට කැමැත්තක් දක්වන තරුණයන් සඳහා සංවිධානය කල දින 12 ක් වූ නේවාසික පුහුණු වැඩසටහන තුලදී ඔවුන් තේ වගාවේ මූලික දැනුම සහ ප්‍රායෝගික පුහුණුවෙන් සන්නද්ධ විය. මේවාට අමතරව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අලුතින් බඳවා ගනු ලැබූ තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරීන්ට, තේ පර්යේෂණ ආයතනයේ නිලධාරීන් විසින් දින 6 ක පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබීය.

**කම්හල් පාදක ව්‍යාප්ති වැඩසටහන:** තේ මණ්ඩලය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමඟ එක්ව මාතර, ගාල්ල, සහ රත්නපුර දිස්ත්‍රික්කයන් හි සංවිධානය කල කම්හල් පාදක ව්‍යාප්ති වැඩ සටහන් මාලාව තුලදී තේ ඉඩම් හි වාර්තා තබා ගැනීම සහ පළිබෝධ නාශක අවශේෂ සීමාවන් පවත්වා ගැනීම පිළිබඳ කම්හල් හා සම්බන්ධව කටයුතු කරන ව්‍යාප්ති නිලධාරීන් දැනුවත් කරනු ලැබූ අතර නිවැරදි ආකාරයට වාර්තා තබා ගැනීමේ වැදගත්කම පිළිබඳ ඔවුන් ඉතාමත් ඉහලින් එකඟත්වය පලකලෝය.

**තාක්ෂණ හුවමාරු සහයෝගිත්ව වැඩ සටහන්**

**ප්‍රාදේශීය තාක්‍ෂණික සහ ව්‍යාප්ති සංසදය (RTEF):** කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සියළුම ප්‍රාදේශීය කළමණාකරණ කලාප නියෝජනය වන පරිදි, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහභාගිත්වය ඇතිව ඉහත සංසද රැස්වීම් දොලහක් පැවැත්වීය. පසේ සරුබව ඉහළ නංවමින් පොහොර උපයෝගිතා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, සෙවන පාලනය, TRI 3000 සහ TRI 4000 කාණ්ඩ සඳහා නව තේ ප්‍රභේදයන්හි ප්‍රගතිය ආදී කරුණු පිළිබඳ ප්‍රධාන වශයෙන් සාකච්ඡාවට ගැණිනි. මීට අමතරව තේ පඳුරු දුර්වල වීම පිළිබඳව සොයා බැලීම සඳහා සිදුකල සමීක්ෂණයේ ප්‍රථිඵල සමාලෝචනය කිරීම සහ බීජ පනතට අදාල නීති උපයෝගි කර ගනිමින් වාණිජ තේ තවාන් පරික්ෂාකිරීමේ සහ විධිමත් කිරීමේ වැඩ පිළිවෙල ශක්තිමත් කිරීම යන කරුණු පිළිබඳවද සාකච්ඡා කරනු ලැබීය.
ඌව ප්‍රදේශයේ පැවති සංසදයේදී කප්පාදු කිරීම සහ දළු නෙලීම යන වගා කටයුතු වල විද්‍යාත්මක පසුබිම ද රෝග හා පළිබෝධ පාලනය සඳහා පළිබෝධනාශක භාවිතය පිළිබඳව ද සාකච්ඡාවට භාජනය විය.

**කුඩා තේ වතු අංශය සඳහා පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය:** වසරකට දෙවරක් කුඩා තේ වතු ක්ෂේත්‍රය වෙනුවෙන් පවත්වනු ලබන පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය තේ පර්යේෂණ ආයතනය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තේ සංවර්ධන සමිති සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් ජූලි සහ දෙසැම්බර් මාස වලදී පැවැත්විණි. කුඩා තේ ඉඩම් හි වියදම් ගණනය කිරීම සහ ලාභය උපරිම කර ගැනීම සඳහා ගන්නා ක්‍රියා මාර්ග “තේ වගා කටයුතු යාන්ත්‍රිකරණය කිරීම” දෙනියාය ප්‍රදේශයේ තේ වගාව දුර්වල වීම පිළිබඳ සමීක්ෂණයේ ප්‍රථිඵල, “කඳ ගුල්ලා පාලනය කිරීම” “පසේ පී එච් ස්වාරක්ෂක ක්‍රියාවලිය සහ එය භාවිතයට ගැනීම” “තේ ඉඩම් සඳහා මිශ්‍ර වගාව/ අතුරු භෝග වගාව සහ “සෙවන කළමණාකරනය” මෙම වැඩමුළු වලදී සාකච්ඡාවට භාජනය කල විෂයයන් අතර විය. මෙහිදී කුඩා තේ වතු හිමියකු විසින් ඔවුන් මුහුණපාන ගැටළු පිළිබඳව ද ඉදිරිපත් කරනු ලැබීය.

**සමාගම් වතු ක්ෂේත්‍රය සඳහා පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය:** වැවිලි සමාගම් හි ප්‍රධාන විධායක නිලධාරීන් සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් ඉහත සංසද දෙකක් තලවාකැලේ තේ පර්යේෂණ ආයතනයේදී පැවැත්විණි. ඒවා පිළිබඳ තොරතුරු පහත සඳහන්වේ.

**222 වන පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය: 2011 ජනවාරි 28**

තේමාව: නිවැරදි ඉඩම් කළමණාකරණය මගින් නිෂ්පාදනය පහළ වැටීම මග හරවා ගැනීම
පලමුවන ඉදිරිපත් කිරීම: වැවිලි සමාගම් ක්ෂේත්‍රයේ වතු වල නිෂ්පාදකතාවය පහල වැටීමට බලපාන කරුණු (ආචාර්ය වී එස් සිදාකරන් )

දෙවන ඉදිරිපත් කිරීම: තේ ඉඩම්වල නිෂ්පාදකතාවයට සමහර ප්‍රධාන කප්පාදු ක්‍රියාකාරකම්හි බලපෑම (ආචාර්ය එම් ඒ විජේරත්න)

තෙවන ඉදිරිපත් කිරීම: තේ වල තෝරාගත් අනුජයන් හා ග්‍රාහකයන්ගේ ගැලපීම (එල් ඒ එස් පී ජයසිංහ මහත්මිය)

**223 වන පර්යේෂණ හා ව්‍යාප්ති සංසඳය: 2011 ජූලි 29**

තේමාව: වර්තමානයේ ලෝක තේ ඉල්ලුමට සරිලන පරිදි ශ්‍රී ලංකා තේ නිෂ්පාදන වෙනස් කිරීම

පලමුවන ඉදිරිපත් කිරීම: දළු මැලවීමේ ප්‍රමාණය ප්‍රශස්ථ තත්වයට පත් කිරීම තුලින් ඔතෝ රොටවේන් තේ නිෂ්පාදන ක්‍රියාවලියේදී තේ වල ගුණාත්මය ඉහල නැංවීම (ආචාර්ය ඩබ් එස් බොතේජු )

දෙවන ඉදිරිපත් කිරීම: වෙළඳපොල ඉල්ලුමට ගැලපෙන නිෂ්පාදනයන්ගේ ප්‍රමිති තත්වයන්: (ආචාර්ය නිමල් පුන්‍යසිරි)

තෙවන ඉදිරිපත් කිරීම: ඔතෝ-රොටවේන් නිෂ්පාදන ක්‍රියාවලියේදී තේ නිෂ්පාදන ගුණාත්මය ඉහල නැංවීම සඳහා කැබලි වෙන් කිරීමේ යන්ත්‍රයේ විවිධ ප්‍රමාණයන්ගේ පාලන සංයෝජනයන් යොදා ගැනීම (පී එල් සී ගලහිටියාව මහතා)

**ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු සම්මන්ත්‍රණ (RSC):** කලාප හතම ආවරණය වන පරිදි ප්‍රදේශිය විද්‍යාත්මක කමිටු මගින් සම්මන්ත්‍රණ අටක් සංවිධානය කරනු ලැබීය. "කෘෂිකාර්මික කටයුතු කළමණාකරණය කිරීම තුලින් යොදන පොහොර වල කාර්යක්ෂමතාවය ඉහල නැංවීම" "තේ ඉඩම්වල කෘෂි රසායන භාවිතය සහ රෝග පළිබෝධ හා වල්පැල පාලනය සඳහා විකල්ප ක්‍රම යොදා ගැනීම" "තේ කර්මාන්තයේ මානව සම්පත් කළමණාකරණය" "නියමිත කාලයට කප්පාදු කිරීමේ වැදගත්කම සහ උඩරට ප්‍රදේශයේ තේ ඉඩම්වල නිෂ්පාදකතාවය" හා "තේ වල ගුණාත්මය ඉහල නැංවීම සඳහා හොඳ වගා කටයුතු (GAP) සහ හොඳ තේ සැකසුම් කටයුතු අනුගමනය කිරීම" වැනි මාතෘකා සාකච්ඡාවට භාජනය කෙරුනි. 2011 අප්‍රේල් මස 1 වන දින ඌව ප්‍රදේශයේ පැවති සම්මන්ත්‍රණයේදී "සෙවන කළමණාකරණයේ වැදගත්කම" "නැවත වගාව සඳහා ඉහළ ගුණාත්මයෙන් යුත් රෝපන ද්‍රව්‍ය භාවිතා කිරීම" සහ "තේ සැකසුම් ක්‍රියාවලියේදී බලශක්තිය සංරක්ෂණය" යන මාතෘකා සාකච්ඡාවට බඳුන් විය.

**තේ කර්මාන්තයේ නිරතවන්නන්ගේ සංසඳ සම්මන්ත්‍රණ:** තේ කර්මාන්තයේ නිරතවන්නන් තේ පර්යේෂණ ආයතනය සමඟ වඩා සක්‍රිය සම්බන්ධතාවයක් ගොඩ නංවනු පිණිස වඩාත් ඉහල සහභාගිත්වයක් ඇතිව මෙම සංසඳය නව වැඩ පිළිවෙලක් ලෙස ආරම්භ විය. මෙම වසරේ අප්‍රේල් සහ ඔක්තෝබර් මාසයන් හිදී මේ වැඩසටහන යටතේ සම්මන්ත්‍රණ දෙකක් පැවැත් විය. සියළුම වතු සමාගම්හි ප්‍රධාන විධායක නිලධාරීන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ අනෙකුත් තේ සම්බන්ධ ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගිවූ මෙම සම්මන්ත්‍රණයන්හි දී "වැවිලි සමාගම් වලට අයත් තේ වතුවල කෘෂිකාර්මික පැතිකඩ" නමින්වූ සංජානනීය සමීක්ෂණයේ වාර්ථාව එලි දැක්වූ අතර අනෙකුත් වැදගත් මතෘකා රැසක් සාකච්ඡාවට භාජනය කෙරුනි. තේ පර්යේෂණායතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ හා

ව්‍යාපෘති නිලධාරීන් සහ වැවිලි සමාගම් නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ වැවිලි කළමණාකරුවන් හතර දෙනෙකු වැදගත් මාතෘකා යටතේ ඉදිරිපත් කිරීම් සිදු කලහ. වැවිලි ක්ෂේත්‍රයේ ඉදිරිපත් කිරීම් අතර පස කලමණාකරනයේ පිරිවැය, කප්පාදු අතු වැලලීමේ සාර්ථක අත්දැකීම්, තේ මුල්වල හැසිරීමට රසායනාවර්තයේ බලපෑම සහ තේ ඉඩම් සඳහා රොක් පොස්පේට් භාවිතා කිරීමේ විකල්ප ක්‍රම යන මාතෘකා යටතේ ඉදිරිපත් කිරීම් සිදු කරනු ලැබීය.

**තේ තොරතුරු ප්‍රචාරනය**

**උපදේශක ලිපි සහ වාර්ථා:** වැවිලි සමාගම් වතු සහ කුඩා තේ ඉඩම් නිරීක්ෂණ චාරිකාවන් සම්බන්ධ උපදෙස් වාර්තා සහ අනෙකුත් තොරතුරු ලිපි සහ වාර්තා ඇතුළු උපදේශක ලිපි 2,961 ක ප්‍රමාණයක් මේ වසර තුලදී නිකුත් කර ඇති අතර මේවා අතරින් බහුතරයක් නිකුත් කර ඇත්තේ වසරේ දෙවන සහ හතරවන කාර්තු වලදී ය. වසරේ මෙම කාල වකවානු සමඟ මෝසම් වැසි කාල සමපාත වීමත් එම නිසා තේ ඉඩම්හි වල් පාලනය, තේ සිටුවීම, කප්පාදු කිරීම, රෝග වැනි ප්‍රධාන වගා කටයුතු හා අදාල ගැටළු සහ අවශ්‍යතා බහුල වීමත් මේ කාලය තුල එම වාර්තා ඉහල යෑමට හේතු වී ඇත.

**ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ අනෙකුත් තොරතුරු මාධ්‍යයන්:**_තොරතුරු බෙදා හැරීම සහ ව්‍යාප්ති කටයුතු වලදී භාවිතා කිරීම සඳහා විවිධ ව්‍යාප්ති සහ අධ්‍යාපන ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරක රැසක් උපදෙස් හා ව්‍යාප්ති අංශයේ නිලධාරීන් විසින් සකස් කරනු ලැබීය.
ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරක ඇතුලත ඩිජිටල් පෝස්ටර්, විවිධ විෂයයන් සම්බන්ධයෙන් ප්‍රදර්ශණ ඵලක දොලහක්, තොරතුරු පත්‍රිකා සහ පොත් පිංච අටක්, තවාන් කළමණාකරණය සම්බන්ධ මුද්‍රිත පෝස්ටරයක් විය. ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශයෙන් නිකුත් කරන DVD තැටි ආරක්ෂිතව බෙදාහැරීම සඳහා DVD රඳවනයක් ද නිර්මාණය කර මුද්‍රණය කරනු ලැබීය.
මෙම වසර තුලදී ආයතනයෙන් විෂයානුබද්ධ විශේෂඥයන්ගේ සහභාගිත්වය ඇති උපදේශක චක්‍රලේඛ පහලොවක් පරිශෝධනය කර නිකුත් කරනු ලැබීය.

**නිකුත් කරනු ලැබූ ප්‍රකාශන**

- උපදෙස් චක්‍රලේඛ අංක PA 2 :තේ ඉඩම්හි නියං හානීන්ට මුහුණ දීම
- මාර්ගෝපදේශ අත් වැල අංක 01/11: නියඟයට පසු තේ ඉඩම්හි අනුගමනය කල යුතු කෘෂි වගා කටයුතු (සිංහල, ඉංග්‍රීසි)
- මාර්ගෝපදේශ අත්වැල අංක 01/11 : තේ ඉඩම්හි නිෂ්පාදකතාවය ඉහළ නැංවීම සඳහා කප්පාදු අතු වැළලීම පිළිබඳ අත්වැල
- TRI Update : 13 වන කලාපය, අංක 2
- තේ තතු : 07 වන කලාපය 01 වන කොටස
- තේ තතු : 08 වන කලාපය 01 වන කොටස

**ප්‍රකාශන අලෙවිය**

ප්‍රකාශන අලෙවිය තුලින් මෙම වසර තුලදී ඉපැයූ මුළු ආදායම රුපියල් 454,520.50 කි.

**ආයතනය තුල සිදුකල මුද්‍රණ සහ ඩුප්ලෝ කටයුතු**

ආයතනයේ විවිධ අංශ සහ ඒකකයන්ගේ ඉල්ලීම මත ප්‍රකාශන අංශය විවිධ මුද්‍රණ සේවාවන් සපයා ඇත. මේවා අතර උපදෙස් චක්‍රලේඛ මුද්‍රණය පර්යේෂණ හා ව්‍යාප්ති සංසඳ සඳහා සහ තේ වගා සායනයන්හි නොමිලේ බෙදා හැරීම සඳහා පත්‍රිකා ආදිය මුද්‍රණය කිරීම ඇතුලත් ය.

**වෙබ් අඩවිය**

යාවත් කාලීන කරන ලද තේ පර්යේෂණ ආයතන වෙබ් අඩවිය 2011 ජූලි මස 11 වන දින ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය මහින්ද සමරසිංහ මහතා අතින් දියත් කෙරුණි.

නව වෙබ් ලිපිනය www.tri.lk

**ඡායාරූප අංශය**

ආයතනයේ සෑම වැදගත් ක්‍රියාකාරකම් සහ උත්සවයන් හි දී ඡායාරූප ගත කිරීම් සිදු කල අතර 6,254 ක අවස්ථා ප්‍රමාණයක් ඡායාරූපගත කර ඇති අතර 568 ක ඡායාරූප ප්‍රමාණයක් මුද්‍රණය කර ඇති අතර 705 ක් පුද්ගලික ඡායාරූප නිකුත් කර ඇත. එම පුද්ගලික ඡායාරූප අලෙවිය මගින් රුපියල් 17,625 ක ආදායමක් උපයා ඇත.

**තේ කර්මාන්තයේ නියැලෙන්නන් සමඟ සහ මහජන සම්බන්ධතා කටයුතු**

**තේ ප ආ ට පැමිණි අමුත්තන්:** මෙම වසර තුලදී අධ්‍යාපන සහ දැනුවත්වීම් කටයුතු සඳහා 8,490 ක සංඛ්‍යාවක් තේ කර්මාන්තයේ නියැලෙන්නන්, විදේශිකයන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් ආයතනයට පැමිණ ඇත.

කළුතර ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන්, වාණිජ තේ තවාන් කරුවන්, වැවිලි සමාගම් නිලධාරීන් සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ව්‍යාප්ති නිලධාරී මණ්ඩලයේ සහභාගිත්වයෙන් තේ තවාන් පිළිබඳ වගා කඳවුරක් කළුතර ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානයේදී පැවැත්වූ අතර මෙහිදී තේ තවාන් කළමණාකරණයට සම්බන්ධ තේ ප්‍රභේද හදුනාගැනීම, සුදුසු රෝපන මාධ්‍යයන් තෝරා ගැනීම, තේ බද්ධ කිරීමේ තාක්ෂණයන් පිළිබඳ, දැනුවත් කිරීම් සඳහා උපදෙස් හා ව්‍යාප්ති අංශයේ, ශෂ්‍ය විද්‍යා අංශයේ, ශාක අභිජනන අංශයේ සහ කීට / වටපනු විද්‍යා අංශයන්ගේ නිලධාරීන් සහභාගි විය.

උපදෙස් හා ව්‍යාප්ති නිලධාරීන් බුත්තල පැවැත්වූ දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සහ තවත් අධ්‍යාපන සහ මහජන ප්‍රදර්ශන හතකට ක්‍රියාකාරී ලෙස සහභාගි විය. මෙවර දැයට කිරුළ ප්‍රදර්ශනයේ ආයතනයේ ප්‍රදර්ශන කුටියේ නිර්මාණය සහ සංවිධාන කටයුතු ඌව ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ස්ථාන භාර නිලධාරී වරයගේ ප්‍රධානත්වයෙන් සිදු.විය.

**ප්‍රතිලාභීන් සඳහා සේවාවන්**

**පස් විශ්ලේෂණ කටයුතු:** පී එච් අගය නිර්ණය කිරීම සඳහා විශ්ලේෂණ කටයුතු ගාල්ල, පස්සර, රත්නපුර, මහනුවර සහ දෙනියාය මධ්‍යස්ථානයන්හි ව්‍යාප්ති කාර්ය මණ්ඩලය අතින් සිදුවූ අතර එයට අමතරව පස්සර මධ්‍යස්ථානයේ පාංශු කාබනික ද්‍රව්‍ය විශ්ලේෂණ කටයුතු ද සිදු කෙරුණි. මෙම වසරේදී පී එච් අගයන් නිර්ණය කිරීම සඳහා පස් නියැදීන් 2,621 ක් ද පාංශු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයන් නිර්ණය කිරීම සඳහා නියැදීන් 386 ක්ද විශ්ලේෂණය කර ඇත. වාර්ථාවන්ට අනුව බහුතරයක් පස් නියැදීන් (48.3%) විශ්ලේෂණය සඳහා ආයතනය වෙත ලැබී ඇත්තේ දෙවන සහ තුන්වන කාර්තුවලදී වන අතර මෙම කාල වකවානු තුලදී තේ ඉඩම් කප්පාදු කිරීම මෙයට හේතු වී ඇත.

**නව තේ රිකිලි සැපයීම:** තේ පර්යේෂණ ආයතනයට අයත් මව් වගා බිම් 6 කින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අයත් මව් වගා බිම් දොලහකින් පුද්ගලික තේ බිම් දෙකකින් සහ දකුණු පළාතේ කුඩා තේ වතු ඉඩම් දොලහකින් මෙම වසරේදී TRI 3000 සහ TRI 4000 ශ්‍රේණිවල තේ ප්‍රභේදයන්ගෙන් මිලියන 7.8 ක තේ රිකිලි ප්‍රමාණයක් වැවිලි සමාගම් වතු සහ කුඩා තේ වතු හිමියන් වෙත සපයා ඇත.

බහුතර රිකිලි ප්‍රමාණයක් සපයා ඇත්තේ පලවෙනි කාර්තුවේදී (37%) සහ හතරවන කාර්තුවේදී ය( 38.3%) ඌව ප්‍රදේශයේ වගාකරුවන් TRI 4053, TRI 4052, TRI 4042 සහ TRI 3019 යන ප්‍රභේද සඳහා වැඩි කැමැත්තක් දක්වන අතර පහතරට ප්‍රදේශයේ වගාකරුවන් TRI 4049 ප්‍රභේදය සඳහා වැඩි කැමැත්තක් දැක්වී ය. මැදරට ප්‍රදේශයේදී TRI 4006 සහ 4046 සඳහා වැඩි ඉල්ලුමක් දැකිය හැකි වූ අතර උඩරට ප්‍රදේශයේදී වැඩි ඉල්ලුමක් දැකිය හැකි වුයේ TRI 4071, TRI 4052 සහ TRI 3019 යන තේ ප්‍රභේද සඳහා ය.
2011 වසරේදී සැපයීම සඳහා ඇස්තමේන්තුගත රිකිලි ප්‍රමාණය මිලියන 15 ක් වුවත් අයහපත් කාලගුණ තත්ත්වය හා කුඩා තේ වතු හිමියන්ගෙන් TRI 3000 හා TRI 4000 කාණ්ඩවල (ප්‍රභේද කිහිපයක් හැරුණු විට) තේ ප්‍රභේද සඳහා අඩු ඉල්ලුමක් පෙන්වූ නිසා ඇස්තමේන්තුගත රිකිලි ප්‍රමාණය සැපයීමට නොහැකි විය.

**වාණිජ තේ තවාන් පරීක්ෂාව**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ඉල්ලීම මත මෙම වසරේදී වාණිජ තේ තවාන් 137 පරීක්ෂාකර වාර්තා සැපයූ අතර පරීක්ෂා කල වාණිජ තේ තවාන් හි මුළු තේ පැල අතරින් නිර්දේශිත තත්වයන් අනුව සිටුවීම සඳහා යෝග්‍ය පැල දක්නට ලැබුනේ 55-60% පමණ ප්‍රතිශතයකි.

**ව්‍යාප්ති යටිතල පහසුකම් සංවර්ධන වැඩ කටයුතු**

ප්‍රාදේශීය මධ්‍යස්ථානයකින් පහසුකම් වැඩි දියුණු කිරීම කළුතර දිස්ත්‍රික්කයේ තේ වගා

කරුවන් වෙත තේ වගා තාක්ෂණයන් බෙදා හැරීම සඳහා රබර් පර්යේෂණ ආයතනයේ නිවිතිගලකැලේ ව්‍යාප්ති මධ්‍යස්ථාන පරිශ්‍රයේ නව උපදෙස් ව්‍යාප්ති මධ්‍යස්ථානයක් ස්ථාපනය කලේ ය.

වගාකරුවන් වෙත රෝපන ද්‍රව්‍ය සැපයීම අරමුණු කර ගනිමින් ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි දියුණු කිරීමට කටයුතු කලේය.

පේරාදෙණිය විශ්ව විද්‍යාලය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානයේ සහයෝගය ඇතුව තේ තාක්ෂණ දැනුම හා තොරතුරු වඩා හොඳින් වගාකරුවන් වෙත ප්‍රචාරණය සඳහා සහ ව්‍යාප්ති සහ ප්‍රචාරක කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරක නිපදවීම සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් මැදරට මධ්‍යස්ථානයේ ස්ථාපනය කරනු ලැබීය. මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් වැඩි දියුණු කල අතර පරිගනක සහ අන්තර්ජාල පහසුකම් සහිත මෙම මධ්‍යස්ථානය අංකිත සහ මුද්‍රිත ප්‍රකාශන සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරක නිපදවීම සඳහා අවශ්‍ය පහසුකම් වලින් සමන්විතය.

**ව්‍යාප්ති පර්යේෂණ**

තේ වතුයායන් හි කෘෂිකාර්මික කාර්ය සාධනය අධීක්ෂණය කිරීම වැවිලි සමාගම් ක්ෂේත්‍රයේ තේ වතුයායන්හි සිදු කල කෘෂිකාර්මික තත්ත්ව නිර්ණය කිරීමේ සමීක්ෂණයේ ප්‍රතිපල "වැවිලි සමාගම් ක්ෂේත්‍රයේ තේ වතුයායන්හි කෘෂිකාර්මික පැතිකඩ" ලෙස වාර්තාවක්ද "වැවිලි සමාගම් වතුයායන්හි කෘෂිකාර්මික පැතිකඩ" වෙන් වෙන්ව ප්‍රකාශනයට පත් කල වාර්තා 20 ක්ද මුද්‍රණය කර 2011 අප්‍රේල් මස 11 වන දින වැවිලි සමාගම් ප්‍රධාන විධායක නිලධාරීන්ට සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තුමිය වෙත ප්‍රදානය කරනු ලැබීය.මීට අමතරව මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල වැවිලි සමාගම් ප්‍රධාන විධායක නිලධාරීන්ට සහ ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යා වරයා වෙත ඉදිරිපත් කරනු ලැබීය. තේ පර්යේෂණායතනයේ නිර්දේශ තේ වතුයායන්හි අනුගමනය කිරීමේදී මතුවන ගැටළු පිළිබඳ නිරන්තර අධීක්ෂණයක් උපදේශක නිලධාරීන් විසින් සිදු කල අතර එම නිරීක්ෂණයන් ගේ ප්‍රතිඵල එවැනි නිර්දේශයන් තවදුරටත් නිවැරදි කර ගැනීමට උපයෝගි කරගැනේ.

**තේ වගාකරුවන් විසින් බහුලව අනුගමනය කරන කෘෂිකාර්මික කටයුතු සොයා බැලීම සහ ඒවා විද්‍යාත්මකව විමසා බැලීම:** කුඩා තේ වතු හිමියන් සහ වැවිලි ක්ෂේත්‍රයේ වගා කරුවන් විසින් අනුගමනය කරන සමහර වගා ක්‍රම පිළිබඳ ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකා වලදී මෙන්ම අනෙකුත් දේශණ වැඩමුළු ආදියේදී උපදෙස් අංශයේ නිලධාරීන් විසින් සහභාගිත්ව තොරතුරු රැස්කිරීමේ තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් එක් රැස් කරනු ලැබීය. මෙලෙස එක් රැස්කල සමහර තේ වගා කටයුතු අතර බිම් පැල සිටුවීම, විවිධ ප්‍රමාණයන්ගෙන් යුත් තවාන් මළු භාවිතය, විවිධ පස් වර්ග තවාන් සඳහා භාවිතා කිරීම විවිධ සෙවන සපයන ද්‍රව්‍ය තවාන් සඳහා යොදා ගැනීම, බීජ තේ පැල සහ රිකිලි තේ පැල එකට මල්ලක සිටුවා සමීප කර බද්ධ කිරීම හා වල් පාලනය සඳහා සාන්ද්‍ර පොහොර මිශ්‍රණ භාවිතා කිරීම ආදිය වේ. මෙලෙස හඳුනාගත් තේ වගා කටයුතු පිළිබඳ සාකච්ඡාවන්ට භාජනය කල අතර තව දුරටත් ඒවා පිළිබඳ වගාකරුවන්ගේ අදහස් රැස් කිරීමට මූලික වාර්තා කිරීමක් "තේ තතු" සඟරාව තුලින් සිදු කල අතර ඒ මගින් ලැබෙන ප්‍රතිපෝෂණයන් සටහන් කරගනු ලැබීය.

විවිධ ප්‍රමාණයන්ගෙන් තවාන් මළු භාවිතය, තවාන් සාත්තු පැල භාවිතය, සමීප බද්ධ තාක්ෂණය ආදිය පරීක්ෂාකර බැලීම සඳහා තවාන් පරීක්ෂණයක් 2012 දී තලවාකැලේ තේ පර්යේෂණ ආයතන තවානේ ස්ථාපනය කිරීමට සියල්ල සූදානම් කර ඇත.

සාන්ද්‍ර පොහොර මිශ්‍රණයක් වල් නාශක ලෙස භාවිතා කිරීමේ අධ්‍යයනයේ පූර්ව අවශ්‍යතවයක් සපුරා ගැනීම සඳහා ශාන්ත කූම්බ්ස් වතුයායේ විවිධ වයස් කාණ්ඩයන්ගේ නව තේ වගාවන් දෙකක වල්පැල ගණත්වය සහ ඒ හා අදාල අනෙකුත් තොරතුරු රැස් කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරනු ලැබීය.

**රාජ්‍ය පුද්ගලික හවුල් ව්‍යාප්ති ප්‍රවේශයෘ** තේ කර්මාන්තය තුල ක්‍රියාත්මක වන රාජ්‍ය සහ පුද්ගලික් ව්‍යාප්ති සේවාවන් අතර පවතින පරතරය අඩුකිරීම සහ පුද්ගලික අංශය සමග එක්ව ව්‍යාප්ති වැඩ සටහන් සිදු කිරීමේ සහ අවශ්‍ය ව්‍යාප්ති ආධාරක නිපදවීම සඳහා යොග්‍ය යාන්ත්‍රණයක් ගොඩ නගා ගැනීම අරමුණු කර ගනිමින් රාජ්‍ය පුද්ගලික හවුල්කාර ප්‍රවේශයන්හි සක්‍යතාවයන් සහ යහපත් ලක්ෂණ අධ්‍යයනය කිරීම සඳහා  අධ්‍යයනයන් රැසක්  සිදු කරනු ලැබීය. පුද්ගලික අංශයේ ව්‍යාප්ති සේවාවන්හි නිරත ආයතන, කෘෂි රසායන හා අනෙකුත් යෙදවුම් අලෙවි ආයතන  විශ්ව විද්‍යාල සහ තේ කර්මාන්තයේ තාක්ෂණික හුවමාරු කටයුතු හා අදාල අනෙකුත් ආයතන අතර සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීම පිළිබඳ කරුණු අධ්‍යයනය සඳහා සහ යෝග්‍ය සංසඳයක් ගොඩ නගා ගැනීම සඳහා කමිටුවක් පත් කරනු ලැබීය.

තේ වැවිලි සමාගම් ක්ෂේත්‍රය සඳහා පරිපූරක ව්‍යාප්ති ප්‍රවේශය (PEA)ෘ වැවිලි සමාගම් ක්ෂේත්‍රයේ නිරීක්ෂණ මට්ටමේ නිලධාරීන් හා කම්කරු මට්ටම අතර පවතින කෘෂිකාර්මික දැනුම හා ඒවා භාවිතයට ගැනීම අතර ඇති පුළුල් පරතරය අවම කිරීම සඳහා පරිපූරක ව්‍යාප්ති ප්‍රවේශයේ නියමු ව්‍යපෘතියක් වටවල සමාගමේ තෝරාගත් වතු හයක් තුල දියත් කරනු ලැබීය. මේ යටතේ සුදුසුකම් සහිත ක්ෂේත්‍ර නිලධාරීන් සහකාර ක්ෂේත්‍ර නිලධාරීන්, සුභසාධන නිලධාරීන් වතු වෛද්‍ය සහකරුවන් ආදීන් තේ වගා තාක්ෂණ දැනුම, සංනිවේදන තාක්ෂණය ඇතුළු අනෙකුත් දැනුමින් පරිපූර්ණ කරනු වස් නිරන්තර පුහුණු වැඩසටහන් පවත්වනු ලැබූ අතර අවසානයේ ඔවුන් කාර්යක්ෂම පරිපූරක ව්‍යාප්ති පුහුණු කරුවන් බවට පත් කිරීම අරමුණ වේ. මෙම වසර තුලදී වැඩ සටහන් හයක් පැවැත්වූ අතර ඒවායේදී පරිපූරක පුහුණු කරුවන් 30 ක් පුහුණු කරනු ලැබීය.

ඉන් අනතුරුව පරිපූරක පුහුණුකරුවන් විසින් ඔවුන් යටතේ සිටින කණිෂ්ඨ නිලධාරීන්, දළු නෙලන්නියන් වැනි කම්කරු කණ්ඩායම් තේ පර්යේෂණ ආයතනයේ සහයෝගය ඇතිව පුහුණු කරනු ලැබේ. වතු කළමණාකාරිත්වය විසින් පහත සදහන් නිරීක්ෂණ සිදු කල බව වාර්තා විය.

1. වතුවල ක‍ෙෂ්ත්‍ර නිලධාරීන්ගේ සහ කම්කරුවන් තුල කෘෂිකාර්මික දැනුම වඩවන තොරතුරු සහ නිවැරදි කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තාක්ෂණික දැනුම ලබා ගැනීමට ඇති මාවත් දියුණු වී ඇති බව.

2. වතු කම්කරුවන් පුහුණු කිරීමේ කාර්යක්ෂමතාවය ඉහල ගොස් ඇති බව.

3. ක‍ෙෂ්ත්‍ර නිලධාරීන් සහ කම්කරුවන් තුල තම රැකියාව පිළිබඳ ඇති ආකල්ප සහ නිවැරදි

කෘෂිකාර්මික කටයුතු භාවිතා කිරීම පිළිබඳ ඇති ආකල්ප යහපත් වී ඇති බව.

4. දිනකට නෙලන සාමාන්‍ය දළු ප්‍රමාණය ඉහළ යාම, විශේෂයෙන් දිනකට නෙලීමට නියමිත දළු ප්‍රමාණයට වඩා අඩුවෙන් දළු නෙලන කම්කරුවන් සංඛ්‍යාව අඩුවීම, නෙලන දළුවල තත්වය ඉහල යාම සහ වැඩට වාර්තා කිරීම ඉහල යාම වැනි රැකියාවේ තත්ත්වයන් ඉහල යාම සහ රැකියාවෙන් ලැබෙන ප්‍රතිඵල ඉහල යාම දක්නට ලැබිණ.

**සයිබර් ව්‍යාප්ති කටයුතු:** තේ තාක්ෂණ තොරතුරු බෙදා හැරීම සඳහා ගතවන කාලය අවම කිරීම සඳහා කුඩා තේ වතු හිමියන් සහ වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන්නන් යන කණ්ඩායම් දෙකටම භාවිතා කිරීමට පහසු, යෝග්‍ය තොරතුරු සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගනිමින් සයිබර් ව්‍යාප්ති වැඩ පිළිවෙල දියත් කරනු ලැබීය. තාක්ෂණය නිපදවන ක්ෂේත්‍රයන් හා තාක්ෂණය භාවිතා කරන කණ්ඩායම් අතර තාක්ෂණය ගෙන යාමට ගතවන කාලය අවම කිරීම තුලින් තේ වගා කරුවන් විසින් නිවැරදි තාක්ෂණය භාවිතා කිරීම ඉහල නැංවීම මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ වේ.

සයිබර් ව්‍යාප්ති කටයුතු සඳහා අත්‍යවශ්‍ය තොරතුරු සන්නිවේදන තාක්ෂණ මෙවලම් සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරක මෙන්ම ඩිජිටල් තොරතුරු නිපදවීම සඳහා අවශ්‍ය උපකරණයන්ගේ පරිපූර්ණ ප්‍රධාන තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය තේ පර්යේෂණායතනයේ මහනුවර මධ්‍යස්ථානය තුල ගොඩ නගමින් තිබේ.

වැවිලි කර්මාන්තයේ නියැලෙන සියළුම කණ්ඩායම් තුල ඇති සයිබර් ව්‍යාප්ති කටයුතු පිලිගැනීමට ඇති සූදානම සහ එය තුලින් ඔවුන්ගේ ලාභය ඉහළ නැංවීම සඳහා ඇති අපේක්ෂාවන් හදුනාගැනීම සඳහා නියැදි සමීක්ෂණයක් සිදු කරනු ලැබීය.

**දෙනියාය ප්‍රදේශයේ තේ පඳුරු දුර්වල වීම පිළිබඳ සමීක්ෂණය:** දෙනියාය ප්‍රදේශයේ අස්වැන්න පහල වැටීම සහ පඳුරු දුර්වල වීම සඳහා හේතු කාරක වන සාධක හඳුනා ගැනීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව විධිමත් නියැදි සමීක්ෂණයක් සිදු කරනු ලැබීය.

කොටපොල, පස්ගොඩ, සහ අකුරැස්ස ජ්‍යෙෂ්ඨ තේ පරීක්ෂක වරුන් විසින් තෝරා දෙනු ලැබූ තේ ගොවීන් අතරින් ස්ථීර නියැදි තාක්ෂණය භාවිතයෙන් තෝරා ගත් කුඩා තේ වතු හිමියන් 60 ක නියැදියක් ව්‍යුහගත සමීක්ෂණ ප්‍රශ්ණ මාලාවක් යොදාගනිමින් සමීක්ෂණය කරනු ලැබීය. සමීක්ෂණයේ අවසන් ප්‍රතිඵල පෙන්වා දී ඇත්තේ ඉහත තත්වයන්ට හේතුන් දැනට හඳුනාගෙන ඇති කඳ ගුල්ලාගේ හානිය, පහතරට සජීවී තේ කඳන් වේයාගේ හානිය, කඳ පිලිකා රෝගය, තේ පඳුරු වියපත් වීම සහ නිවැරදි කෘෂි කාර්මික වගා කටයුතු අනුගමනය නොකිරීම බව ය. මෙම ප්‍රතිඵල පිළිබඳව ප්‍රදේශීය තාක්ෂණ හා ව්‍යාප්ති සංසදය, පර්යේෂණ හා ව්‍යාප්ති (සිංහල) සංසදය හා ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු සම්මන්ත්‍රණ වැනි අවස්ථාවලදී කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන් මෙන්ම අනෙකුත් වගා කරුවන් දැනුවත් කිරීමට කටයුතු කලේය.

**වගා නොකල ඉඩම් පිළිබඳ සමීක්ෂණය:** වැවිලි සමාගම් ක්ෂෙත්‍රයේ වතුයායන් හි වගා

නොකර ඇති ඉඩම් ප්‍රමාණය හඳුනා ගැනීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් සංවිධානය කල සමීක්ෂණයේ තොරතුරු එක් රැස් කිරීම සඳහා තේ පර්යේෂණායතනයේ ව්‍යාප්ති අංශයේ මෙන්ම පර්යේෂණ අංශයන්හි නිලධාරීන් රැසක් ක්‍රියාකාරී දායකත්වය සැපයීය.

**අනුවර්ති පර්යේෂණ**

**පොහොර අනුවර්තී පර්යේෂණ:** තේ පර්යේෂණායතනය මගින් නිර්දේශිත පොහොර මිශ්‍රණ සහ තේ වගා කරුවන් භාවිතා කරන අනෙකුත් පොහොර මිශ්‍රණයන් පිළිබඳ ඔවුන් දක්වන කැමැත්ත පිළිබඳ තොරතුරු නිරාවරණය කරගැනීම සඳහා විවිධ තේ පරීක්ෂක කලාප නියෝජනය වන පරිදි තෝරාගත් කුඩා තේ ඉඩම් 26 ක් තුල පාංශු හා ශාක පෝෂක අංශයේ සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහභාගිත්වය ඇතුව අනුවර්තී පර්යේෂණ ක්ෂේත්‍ර ස්ථාපනය කරනු ලැබීය.

උපදෙස් අංශයේ නිලධාරීන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමඟ එක්ව නිරන්තර අධීක්ෂණය සහ තොරතුරු එක් රැස් කිරීම සිදු කරනු ලැබීය. මෙම වසර තුලදී මෙම අනුවර්ති පර්යේෂණ හා සම්බන්ධ ප්‍රගති රැස්වීම් දහයක් පැවැත්වූ අතර ඒවා තුලදී යම් යම් ගැටළු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමටද කටයුතු කලේය.

**කුඩා තේ ඉඩම්හි TRI 3000/4000 කාණ්ඩයන්ගේ තේ ප්‍රභේදයන්ගේ කාර්ය සාධනය හඳුනාගැනීමේ සමීක්ෂණය: තේ පර්යේෂණ ආයතනය විසින් නිකුත් කල TRI 3000/4000 කාණ්ඩයන්ගේ තේ ප්‍රභේදයන් පිළිබඳ වගාකරුවන්ගේ ආකල්ප හඳුනා ගැනීම සඳහා දීපව්‍යාප්ත සමීක්ෂණයක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ ශාක අභිජනන අංශයේ සහභාගිත්වය ඇති ව දියත් කරනු ලැබීය.**

පස්සර, දෙනියාය ප්‍රදේශයන්හි තොරතුරු රැස් කිරීම අවසන් කල අතර මහනුවර සහ රත්නපුර යන ප්‍රදේශයන්හි තොරතුරු රැස් කිරීම මෙම වසර තුල කරගෙන යනු ලැබේ.

දෙනියාය ප්‍රදේශයේ දැනට රැස්කල තොරතුරු විශ්ලේෂණයේදී පෙනී ගියේ සමීක්ෂණයට ලක්කල නියැදියේ 50 දෙනා අතරින් 90% වගා කරුවන් වගා කර ඇත්තේ TRI 4042 වන අතර ඔවුන්ගේ අදහස වූයේ TRI 4042 තුල ඉතාමත් සාධනීය ලක්ෂණ පවතින බවයි. කෙසේ නමුත් සමහර වගාකරුවන්ගේ අදහස වූයේ TRI 2026 හා TRI 2025 ප්‍රභේද TRI 4042 හා සැසඳීමේදී TRI 2000 ප්‍රභේද වඩා හොඳ බවය. සමීක්ෂණයට ලක්කල නියැදියේ 5% පමණ වගාකරුවන් පිරිසක් පමණක් තමන්ට නව තේ ප්‍රභේද වගා කිරීමේදී ගැටළුන්ට මුහුණ දීමට සිදුවූ බව වාර්තා කලේය. එවැනි තේ ඉඩම් තවදුරටත් අධ්‍යයන කිරීම සඳහා හඳුනාගනු ලැබීය. TRI 3035, TRI 4053 සහ TRI 4052 තේ ප්‍රභේදයන්ගේ ප්‍රගතිය පිළිබඳ බොහෝ වගා කරුවන් අසතුටුදායක ප්‍රතිචාරයක් දැක්වූ අතර එම ප්‍රතිචාරයන් එම ප්‍රභේදයන්ගේ ප්‍රවේනිගත ලක්ෂණ වන නිරතුරුව මල්හට ගැනීම සහ සාපේක්ෂව අඩු අස්වැන්න වැනි කරුණු හා බැඳී පවතින බව පෙනිනි.

**තේ තවාන්හි ජෛව පටල ජෛව පොහොර තාක්ෂණය (BFBF) භාවිතා කිරීම පිළිබඳ අනුවර්ති පර්යේෂණ :** වගාකරුවන්ගේ තේ තවාන්හි අඩු වියදම් නිරෝගී සහ ශක්තිමත්

තේ පැලයක් නිපදවීම සඳහා(BFBF) තාක්ෂණය යොදාගැනීමේ තාක්ෂණික හැකියාව සහ ආර්ථික තත්වය පිළිබඳ ඇගැයීම සඳහා අනුවර්ති පර්යේෂණ හතක් රත්නපුර,ගාල්ල, දෙනියාය, පස්සර හා ගම්පොල ප්‍රදේශයන්හි තෝරාගත් තේ තවාන් හතක ස්ථාපනය කරනු ලැබීය. පස්සර ප්‍රදේශයේ පරීක්ෂණයේ ඇගයීම අවසන් කල අතර අනෙකුත් ප්‍රදේශයන්හි තවාන් නිරීක්ෂණ කටයුතු තවදුරටත් සිදු කරමින් පවතී.

**චැම්ප් DP දිලීර නාශකය පිළිබඳ අනුවර්ති පරීක්ෂණය:**_චැම්ප් DP යනු මින් පෙර ශාක ව්‍යාධිවේද අංශය මගින් පරික්ෂා කරන ලද තේ බුබුළු අංගමාර රෝගය වැලැක්වීම සඳහා සාර්ථකව යොදාගත හැකි කොපර්හයිඩ්‍රොක්සයිඩ් නැමැති ස්පර්ශ දිලීර නාශකයේ දියුණු කල භෞතික ආකාරයකි. මින් පෙර මෙහි බුබුළු අංගමාරය මර්ධනය කිරීමේ හැකියාව හඳුනාගෙන ඇති නිසා මෙය ප්‍රායෝගිකව වාණිජ පරිමාණයෙන් භාවිතා කිරීමේ හැකියාව සොයා බැලීම පිණිස අනුවර්ති පර්යේෂණයන් ආරම්භ කරන ලදි.

දින 10 කට වරක් යොදන 0.1% චැම්ප් ද්‍රාවණයක් සහ දින 7 කට වරක් යොදන 0.08% චැම්ප් ද්‍රාවණයක් නුවරඑළිය වතුයායේ තෝරාගත් ක්ෂේත්‍රයක වාණිජ පරිමාණයෙන් භාවිතා කර එහි ප්‍රතිඵල සහ ප්‍රගතිය පරික්ෂා කිරීම මෙම අනුවර්ති පර්යේෂණයේ අරමුණ විය. මෙයට අමතරව දැනට වතුයායේ බුබුළු අංගමාරය මර්ධනය සඳහා භාවිතා කරන රසායන ද්‍රව්‍ය සමඟ ද (උදා ලෙස හෙල්මොක්සි (ස්පර්ශ දිලීර නාශකයක්) සහ (හෙල්මොක්සි සමඟ හෙක්සකොනසෝල් ) සංසන්දනය කරනු ලැබීය. මෙම පරික්ෂණය බුබුළු අංගමාරය බහුල කාලයක් තුලදී විවිධ වර්ධන අවධීන් හි පවතින බුබුළු අංගමාරයට පාත්‍ර තේ ප්‍රභේද යොදාගනිමින් සිදු කරනු ලැබීය. තේ පර්යේෂණායතනයේ උපදෙස් මත නුවරඑළිය වතුයාය මගින් මෙම පරික්ෂණය කළමණාකරණය කරනු ලැබීය. පරික්ෂණයේ ප්‍රතිඵල පෙන්නුම් කලේ දින 10 කට වරක් යොදන 0.1% චැම්ප් ද්‍රාවණය අනෙකුත් දිලීර නාශකයන්ට සහ 0.08% චැම්ප් ද්‍රාවණයට වඩා හොඳින් බුබුළු අංගමාරය පාලනය කරන අතර එය ආර්ථිකව ද ලාභදායී බවය. දින 7 කට වරක් යොදන චැම්ප් 0.08% ද්‍රාවණයට සාමාන්‍ය කොපර් දිලීර නාශකයන්ට වඩා තරමක් හොඳින් බුබුළු අංගමාරය පාලනය කරන බව පෙනුනු අතර දැනට නිර්දේශයේ පවතින කොපර් දිලීර නාශක සමඟ හෙක්සකොනසෝල් භාවිතා කරන මිශ්‍රණය දින 7 සිට 12 කාලපරතරයන්ගෙන් යොදන විට චැම්ප් DP යෙදීමට වඩා හොඳින් බුබුළු අංගමාරය පාලනය වන බව පෙනිනි.

**විශේෂ අවස්ථා**

කියුබානු රජයේ තානාපති තුමිය වන අතිගරු නිර්සියා කස්ට්‍රෝ ඩි ගුවේරා මැතිනිය ඌව ප්‍රදේශයේ ව්‍යාප්ති මධ්‍යස්ථානයට පැමිණියාය.

**විශේෂ ගැටළු**

මෙම වසරේ දෙවන භාගය තුලදී අයහපත් කාලගුණ තත්වය නිසා නිෂ්පාදනය පහල වැටීම, සාමාන්‍ය ශුද්ධ මිළ ගණන් පහල වැටීම හා නිෂ්පාදන වියදම ඉහළ යෑම යන කරුණු මත ඌව ප්‍රදේශයේ වැවිලි සමාගම් වලට අයත් බොහෝ වතු ආර්ථික පාඩු ලැබීය. මෙම තත්වය නිසා බොහෝ වතු ඔවුන්ගේ වතුවල කෘෂිකාර්මික සංවර්ධන කටයුතු

අත්හිටවීය.

<u>තොරතුරු තාක්ෂණ ඒකකය</u>

තොරතුරු තාක්ෂණ ඒකකය තමන්ගේ සේවාවන් තේ පර්යේෂණායතනය තුල පර්යේෂණ අංශ ඒකක, ප්‍රාදේශීය මධ්‍යස්ථාන සහ ආයතනයට අයත් වතුයායකට සැපයීය.

මෙම සේවාවන් අතර,

- අන්තර්ජාල, විද්‍යුත් තැපෑල සහ ලිපි ගොනු ගබඩා පහසුකම් පවත්වාගෙන යාම සහ නිසි කළමණාකරණය

- පරිගනකයන්ගේ ගැටළු හඳුනාගැනීම සහ සේවාවන් සැපයීම පරිගනක අමතර කොටස් සහ අභ්‍යයන්තර පරිගනක ජාලය පවත්වාගෙන යාම

- පරිගනක ජාලයේ ප්‍රති-වෛරස් මෘදුකාංග ස්ථාපනය කිරීම, පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම
- ආයතනයේ ඇඟිලි සටහන් යන්ත්‍රය කළමණාකරණය සහ පවත්වාගෙන යාම

- පරිගනක සහ අමතර කොටස් මිලදී ගැනීම සඳහා තාක්ෂණික පිරිවිතර පිළියෙල කිරීම

- ප්‍රධාන පරිගනක ජාලය වැඩි දියුණු කිරීම්

විද්‍යුත් තැපෑල් සර්වර්ය ලෙස යොදාගැනීම සඳහා නව පරිගනක සර්වරයක් මිලදී ගැනීම සහ ස්ථාපනය කිරීම.

- ඩෙක්ස්ටොප් පරිගනක 15 ක් සහ නෝට්බුක් පරිගනක 8 ක් මිලදී ගෙන ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන වෙත ලබා දීම.

- ප්‍රති-වෛරස් මෘදුකාංගයන් මිලදී ගෙන පරිගනක 111 ක ස්ථාපනය කිරීම

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජනායතනයේ මාර්ගොපදේශ අත්වැලට අනුව යමින් ආයතනයේ පරිගනක අමතර කොටස් සහ මෘදුකාංගයන්ගේ ස්ථාවර වත්කම ලේඛනයක් පිළියෙල කර පවත්වාගෙන යාම

**සාමාන්‍ය කරුණු**

- ශාක ව්‍යාධිවේද අංශයේ උපදේශකත්වය මත තේ බුබුළු අංගමාර රෝගය ඇගයීමේ පරිගනක මෘදුකාංගයේ ඇල්ෆා නිකුතුව පිළියෙල කිරීමේ කටයුතු අවසන් කිරීම.
- ආයතනයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම
- ආයතනයේ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සඳහා ප්‍රකාශන/ප්‍රචාරක නිලධාරීවරයාට සහයෝගය දීම පරිගනක රූප සහ මුද්‍රිත ද්‍රව්‍ය නර්මාණය කිරීම
- පරිගනක සහ අමතර කොටස් මිලදී ගැනීම සඳහා පත් කල තාක්ෂණික ඇගැයීම් කමිටු රැසක සාමාජිකයෙකු වීම.
- ආයතනයේ දේශණ සහ සම්මන්ත්‍රණ ආදියේදී බහු මාධ්‍ය ප්‍රක්ශේපන සහ පරිගනක යන්ත්‍ර සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ නිලධාරීන්ට

සහයෝගය ලබා දීම

**පුස්තකාලය**

ආයතනයේ විද්‍යාඥයින්ගේ පර්යේෂණ කටයුතු සහ ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු රැස්කිරීම සහ ඔවුන්ගේ ඉල්ලීම පරිදි ලබාදීම පුස්තකාලය පවත්වාගෙන යාමේ ප්‍රධාන අරමුණයි. ආයතනයේ නිලධාරීන්ට සහ උපාධි අපේක්ෂක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඔවුන්ගේ ව්‍යාපෘති කටයුතු සඳහා තොරතුරු ලබා දීමට අමතරව අනෙකුත් ආයතනයන්ගෙන් රාජකාරී මට්ටමෙන් ඉල්ලුම් කරන තොරතුරු ආදිය ලබා දීම ද පුස්තකාලයේ සේවාවන් අතරට ඇතුලත් වෙයි.

මෙම වසර තුලදී පුස්තකාල සේවාවන් අතරට පහත සඳහන් කටයුතු ද ඇතුලත් විය.

- පුස්තකාල පොත් සඟරා ආදිය ලබාගැනීම එක් රැස් කිරීම සහ නිසි පරිදි කළමණාකරණය.
- පුස්තකාල පොත් සඟරා ආදිය බැහැර ගෙන යාමට නිකුත් කිරීම
- පුවත්පත් හි පලවූ තේ හා අදාල ලිපි ලේඛන එකතුකර පිළිවෙලට සකස් කිරීම
- ඡායා පිටපත් සේවාව
- පුස්තකාල අතර පොත් පත් තාවකාලිකව හුවමාරු කර ගැනීමේ පොත් පත් ලබා ගැනීම

දැනට පුස්තකාලය සතු පොත් 4677 අතරට මෙම වසරේදී නව පොත් හතරක් එකතු වූ අතර සාමාජිකත්ව තත්ත්ව මත ප්‍රදානයන් ලෙස සහ හුවමාරු ක්‍රම යටතේ නව සඟරා සහ වාර ප්‍රකාශන 52 ලබා ගැනීමට හැකි විය. පුස්තකාලයේ උපාධි නිබන්ධන අතරට මෙම වසරේදී ආයතනයේ නිලධාරීන් ගේ උපාධි නිබන්ධන තුනක් එක් විය.

**සේවාවන්**

මෙම වසර තුලදී පුවත්පත් ලිපි ලේඛන 512 ක් අධ්‍යක්ෂවරයා වෙත ලබා දුන් අතර ආයතනයේ නිලධාරීන් වෙත ඡායා පිටපත් 3506 ක් ලබා දුනි. විශ්ව විද්‍යාල සහ තාක්ෂණික විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්40 පුස්තකාල සේවාවන් ලැබීය.

# ප්‍රාදේශීය මධ්‍යස්ථාන

පහතරට මධ්‍ය ස්ථානය
එම් ඒ විජේරත්න
ස්ථාන භාර නිලධාරි

## පරීක්ෂණ උපදෙස් හා ව්‍යාප්ති කටයුතු

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ පහතරට ස්ථානය ශෂ්‍ය විද්‍යා අංශය කීට විද්‍යා හා වටපනු අංශය ශාක අභිජනන අංශය හා තේ සැකසුම් තාක්ෂණ අංශය යන පර්යේෂණ අංශවලට අදාල පර්යේෂණාගාරවලින් සමන්විත වන අතර එයට අනුයුක්තව උපදෙස් හා ව්‍යාප්ති අංශයක්ද පවත්වා ගෙන යනු ලැබේ තලවාකැලේ ප්‍රධාන කාර්යාලයට අනුයුක්තව පවතින මෙම විවිධ පර්යේෂණ අංශවල නිලධාරීන් ඒ ඒ විෂයන්ට අදාලව රත්නපුර හා කෑගල්ල  දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර පර්යේෂණ හා රසායනාගාර පර්යේෂණ ගණනාවක් සිදු කර ගෙන යනු ලබන අතර පහතරට තේ කර්මාන්තශාලාවල ගැටලු නිරාකරණය කිරීම පිණිසද පර්යේෂණ හා අත්හදා බැලීම් සිදුකර ගෙන යනු ලැබේ.

ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකා සහ ක්ෂේත්‍ර දින වැඩමුලු හා සම්මන්තණ ආදි පුහුණු වැඩ සටහන් තුලින් උපදෙස් හා ව්‍යාප්ති ඒකකය කුඩා තේ ඉඩම් හිමියන්ට සහ මහ වතු අංශය වෙනුවෙන් උපදෙස් හා ව්‍යාප්ති කටයුතු පවත්වා ගෙන යනු ලැබේ තේ කර්මාන්ත ශාලාවලට අදාල ගැටලු නිරාකරනය කර දීම සහ ඒවායේ යන්ත්‍ර සූත්‍ර පරීක්ෂා කර අවශ්‍ය උපදෙස් ලබා දිම සිදු කරනු ලබන්නේ තේ සැකසුම් හා තාක්ෂන අංශයේ නිලධාරීන් මඟිනි.

අදාල වර්ෂයට පවත්වන්නට නියමිත කුඩා තේ ඉඩම් හිමියන් වෙනුවෙන් සැකසුන පර්යේෂණ හා ව්‍යාප්ති සම්මන්ත්‍රන හා ප්‍රාදේශීය තාක්ෂණ හා ව්‍යාප්ති සම්මන්ත්‍රන ආදිය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය තේ මණ්ඩලය හා තේ සංවර්ධන සමිති නිලධාරීන්ගේ සහභාගිත්වයෙන්

සාර්ථකව පැවැත්වින රත්නපුර කෑගල්ල හා කලුතර දිස්ත්‍රික්කවල මහ වතු අංශය සඳහා යෝජිත ප්‍රාදේශීය විද්‍යාත්මක කම්ටු රැස්වීම්ද පවත්වනු ලැබීය මෙම වැඩ සටහන්වලදී වැඩි අවධානයක් යොමුකල විෂය පතයන් වන්නේ ඉඩම්වල හා කම්කරුවන්ගේ පලදායීතාව ඉහල නැංවීම නිශ්පාදන වියදම පහත හෙලීම හොඳ තේ සැකසුම් පිලිවෙත් භාවිතය බල ශක්ති හානි අවම කර ගැනීම පාංශු භායනය සහ දේශගුණික විපර්යාස තුලින් තේ වගාවට ඇති විය හැකි බලපෑම් අවම කිරීම සම්බන්ධවයි මීට අමතරව ශෂ්‍ය විද්‍යා අංශය මඟින් නව නිපැයුම්කරුවන් ඉංජිනේරුවරුන් විශ්ව විද්‍යාල ආචාර්යවරුන් හා යන්ත්‍ර සූත්‍ර නිපදවා හෝ ආනයනය කර වෙළඳපොලට සපයන පුද්ගලික ආයතන වෙනුවෙන් දළු නෙලන යන්ත්‍ර පිලිබඳව ක්ෂේත්‍ර ආදර්ශනද ඇතුලත්ව වැඩමුලු දෙකක් පවත්වන ලදී මෙම වැඩ සටහන්වල අරමුණ වූයේ දළු නෙලීමට සුදුසු යන්ත්‍ර සූත්‍ර නිර්මාණය කර නිපදවීම පිලිබඳව තේ පර්යේෂණායතනය වෙත නිර්දේශ හා ව්‍යාපෘති වාර්ථා ලබා ගැනීමයි

කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුව කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව මිනින්දෝරු දෙපාර්තුමේන්තුව හා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති දෙපාර්තුමේන්තුව යන ආයතනවල සහයෝගිත්වයෙන් සහ ශෂ්‍ය විද්‍යා අංශයේ මුලිකත්වයෙන් ජාතික වටිනාකමින් යුතු ව්‍යාපෘති වාර්ථා දෙකක් එනම් දේශගුණික වෙනස් වීම් පිලිබඳව හා තේ ඉඩම් සිතියම් ගත කිරීම පිලිබඳව සකස් කරන ලදී

**කාර්ය මණ්ඩලය**

උපදෙස් නිලධාරී කේ ජී ජේ පී මහින්දපාල මයා 2011 ජනවාරි මස 03 වන දින මැද රට ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ සිට පහත රට ප්‍රාදේශිය මධ්‍යස්ථානයට සේවා මාරුවක් ලැබ පැමිණි අතර ඔහු නැවතත් සැප්තැම්බර් මස 26 වෙනි දින සිට ක්‍රියාත්මකවන පරිදි ගාල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ස්ථාන භාර නිලධාරී ලෙස පත්ව යන ලදී උපදෙස් නිලධාරී ටී ජී එන් මහින්ද මයා සැප්තැම්බර් මස 05 වන දින මතුගම ව්‍යාප්ති මධස්ථානයේ සිට පහත රට ප්‍රාදේශීය මධස්ථානයට ස්ථාන මාරු වීමක් ලැබී පැමිණියේය තේ සැකසුම් තාක්ෂණ අංශයේ සේවයකල අත්හදා බැලිමේ නිලධාරිනී කේ බී එම් ශ්‍රීපාලිකා මහත්මිය නොවැම්බර් මස 01 වන දින සේවයෙන් ඉල්ලා අස්විය පර්යේෂණ සහකාර එන් පී එස් එන් බණ්ඩාර මයා ඕස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් විශ්වවිද්‍යාලයට තම පශ්චාත් උපාධි වාර්ථාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව නැවත වරක් ශෂ්‍ය විද්‍යා අංශයේ පර්යේෂණ කටයුතුවල නිරත විය

**මානව සම්පත් සංවර්ධනය හා හැකියාවන් ඔප් නැංවීම**

පර්යේෂණ සහකාර එස් ආර් ඩබ් පතිරණගේ සහ අත්හදා බැලීමේ නිලධාරී එම් එම් ඒ යු බී මාරපන යන මහත්වරුන් චීනයේ පුහුණු පාඨමාලාවකට සහභාගී වූ අතර ස්ථාන භාර නිලධාරී ආචාර්ය එම් ඒ විජේරත්න මහතා ටොක්ලායි තේ සම්මන්ත්‍රනයට සහභාගී වී අධ්‍යයන චාරිකාවක නියැලීම පිණිස ශ්‍රී ලාංකික නියෝජිත පිරිස සමඟ ඉන්දියාව බලා පිටත් විය

**පුහුණු කටයුතු**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයට අනුයුක්තව බංගලාදේශ තේ පර්යේෂණායතයේ විද්‍යාත්මක නිලධාරි ටොෆික් අහමඩ් මහතා සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ශාක විද්‍යා අංශයේ කතිකාචාර්ය එච් අයි යු කල්දේරා මහත්මිය ඔවුන්ගේ පශ්චාත් උපාධි පාඨමාලාවලට අදාල පර්යේෂණ කටයුතු පහත රට තේ පර්යේෂණ මධ්‍යස්ථානයේදී සිදු කරනු ලැබීය. මීට අමතරව උපාධි අපේක්ෂකයින් තිදෙනෙකු හා රාජ්‍ය ආයතනවලට සම්බන්ධව පුහුණු කටයුතුවල නියැලී සිටින ආධුනික පුහුණු වන්නන් අට දෙනෙක සඳහා තේ වගාවට අදාල විෂය දැනුම හා ලිපිකරු පුහුණුව ලබා දෙනු ලැබීය

**යටිතල පහසුකම් වැඩි දියුණු කිරිම හා නඩත්තු කටයුතු**

ජල හා විදුලි සැපයුම නිලධාරී නිල නිවාස කාර්යයාලය, රසායනාගාර වෙනත් ගොඩනැගිලි හා අනෙකුත් පරිශ්‍රයන් සහ ආයතනයේ වාහනවලට අදාල අලුත්වැඩියාවන් සහ නඩත්තු හා සේවා කටයුතු සතුටුදායක මට්ටමින් පවත්වා ගෙන යනු ලැබීය ශාක අභිජනන අංශයේ ක්ෂේත්‍ර කාර්යාලය හා නිලධාරී නිල නිවාස දෙකක තීන්ත ආලේප කිරීමේ කටයුතු නිම කරන ලදී ආයතනයේ ඉඩම් වටා ඇති වැට නැවත අලුත්වැඩියා කරන ලදී

# මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය

ජේ. සී. කේ. රාජසිංහ
BSC Agric (Peradeniya, Sri Lanka) MSC (Peradeniya, Sri Lanka)
ස්ථාන භාර නිලධාරී

**පොදු කරුණු**

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ හන්තානයේ පිහිටි මැදරට මධ්‍යස්ථානය, ශෂ්‍ය විද්‍යා, කීට විද්‍යා, ශාක අභිජනන, පාංශු හා පෝෂක සහ උපදෙස් ව්‍යාප්ති අංශය යන අංශ 5කින් සමන්විතය.

භූමිය හා ඉඩම් භාවිත ආකාරය

| ඉඩම් භාවිත ආකාරය | භූමි ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|
| බීජ තේ | 2.00 |
| රිකිලි තේ (පරිණත) | 5.50 |
| රිකිලි තේ (ළපටි) | 3.50 |
| මව් වගාව | 2.75 |
| තේ තවාන | 0.20 |
| මානා වගාව | 0.50 |
| පළතුරු වගාව | 0.40 |
| පොල් වගාව | 0.81 |
| වන වගාව | 1.20 |
| මඩ වගුරු සහිත බිම් | 0.62 |
| ගොඩනැගිලි ගෙවතු හා මාර්ග | 5.77 |
| **tl;=j** | **23.25** |

ප්‍රධාන මධ්‍යස්ථානයේ පර්යේෂණ අංශ ප්‍රධානීන්ගේ උපදෙස් හා මග

පෙන්වීම මත මහනුවර හා මාතලේ දිස්ත්‍රික්ක ආවරණය වන සේ තේ වගාවට අදාළ ක්ෂේත්‍ර හා විද්‍යාගාර පර්යේෂණයන් හන්තාන තේ පර්යේෂණ මධ්‍යස්ථානයේ සිදු කරනු ලැබීය. උපදෙස් හා ව්‍යාප්ති අංශය උපදෙස් චාරිකා, පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර දින, වැඩමුලු හා සම්මන්ත්‍රණ ඔස්සේ විශාල වැවිලි ක්ෂේත්‍රයටත් කුඩා තේ වතු හිමියන්ටත් සිය සේවාව ලබා දුණි. මැද රට ප්‍රදේශයේ කුඩා තේ වතු අංශය සඳහා වූ ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසදය (RTEF), තේ පර්යේෂණායතනයේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ හා තේ මණ්ඩලයේ නිලධාරීන්ගේ සහ කුඩා තේ වතු සමිති නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් මැද රට මධ්‍යස්ථානයේ දී පැවැත් වූ අතර මැද රට පළාතේ සමාගම් වතු වල වැවිලි කරුවන් සඳහා ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු රැස්වීම (RSC) ද සාර්ථකව පවත්වන ලදී. මෙම වැඩසටහන් වලදී නිවැරදි සෙවණ භාවිතය, තේ කප්පාදුව, කෘෂි රසායන භාවිතාව අවම කිරීමේ වැදගත්කම, කඳ ගුල්ලා පාලනයේ නව ප්‍රවණතාවන් හා නියඟය, රෝග පළිබෝධ ආදියට ප්‍රතිරෝධී ලක්ෂණ සහිත උසස් වගා ප්‍රභේද (Cultivars) ඇති කිරීම සඳහා බද්ධ තේ පැළ නිෂ්පාදනය ආදී විෂය ක්ෂේත්‍ර පිළිබඳ කරුණු සාකච්ඡා විය. ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු රැසිවීමේ දී මැද රට ප්‍රදේශයේ තේ කප්පාදුව පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන ලද අතර ඉන් අනතුරුව ප්‍රාදේශීය තේ වගාව ආශ්‍රිත ප්‍රධාන ගැටලු සාකච්ඡා කිරීම සඳහා අවස්ථාව ලබා දුණි. මෙහිදී වැවිලි කරුවන් විසින් මතු කරන ලද ගැටලු ප්‍රධාන වශයෙන්ම කප්පාදු කාල සීමාව, කප්පාදු ක්‍රමය හා එහි උස, දළු නෙළීම, පොහොර භාවිතය, ඵලදායිතාවය ඉහළ නැංවීම, වල් පැළ පාලනය හා රෝග පළිබෝධ පාලනය යන අංශ මත පදනම් වූ අතර නිලධාරීන් විසින් ඒ සඳහා සාර්ථකව පිළිතුරු සපයන ලදී. මෙම සැලසුම් ගත වැඩසටහන් වලට අමතරව තේ කර්මාන්තය ආශ්‍රිතව පවතින කම්කරු හිඟයට පිළියමක් වශයෙන් දළු නෙළීම සඳහා “ දළු නෙළන කතුර ” භාවිතය පිළිබඳ මහනුවර හා මාතලේ දිස්ත්‍රික්ක වල තේ පරීක්ෂක මහතුන් දැනුවත් කිරීම සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් (TOT Programs) ක්‍රියාත්මක කරන ලදී. තවද පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ හා කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ පළමු වසර සිසුන් සඳහා පිළිවෙළින් තේ තවාන් පාලනය හා තේ වගා තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් දෙකක් එම ආයතන වල ඉල්ලීම පරිදි මැද රට මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලදී.

බුත්තල පැවති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය සහ තේ

පර්යේෂණ ආයතනයේ මතුගම ව්‍යාප්ති මධ්‍යස්ථානයේ පැවති තේ තවාන් පාලනය සම්බන්ධ වගා සායනය සඳහා මැද රට මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය ක්‍රියාකාරීව සහභාගි වූ අතර වැවිලි කළමණාකරණ අමාත්‍යංශය මගින් සංවිධානය කළ රත්නපුර දිස්ත්‍රික්කයේ සමාගම් වතු වල ඇති වගා නොකළ ඉඩම් පරීක්ෂා කර ඇස්තමේන්තු ගත කිරීමේ සමීක්ෂණය සඳහා ද දායකත්වය නොමදව ලබා දෙන ලදී. එමෙන්ම කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් අළුතින් බඳවා ගත් තේ පරීක්ෂක මහතුන් සඳහා නිලාරම්භක පුහුණු වැඩසටහන් (Induction Training Program) සංවිධානය කිරීමද සිදු කරන ලදී.

**ආසියානු සංවර්ධන බැංකුව අනුග්‍රහයෙන් ආරම්භ කළ මව් වගා ව්‍යාපෘතිය**

මව් වගා ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක ලෙස උපදෙස් හා ව්‍යාප්ති අංශයේ ජේෂ්ඨ උපදෙස් නිලධාරී ජේ. සී. කේ. රාජසිංහ මහතා ගාල්ල, මාතර, රත්නපුර, මහනුවර, නුවරඑළිය හා බදුල්ල යන දිස්ත්‍රික්ක වල ස්ථාපනය කර ඇති මව් වගාවන් නිරීක්ෂණය කරන ලද අතර එහි දී රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතාවය සපුරාලීම සඳහා එක් එක් මව් වගාවන් විසින් ළගා විය යුතු ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාකාරකම් පෙළගැස්වීම සිදු කරන ලදී.

**අනුවර්තී පර්යේෂණ**

පාංශු හා ශාක පෝෂණ අංශයේ හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහභාගීත්වයෙන් මැද රට ප්‍රදේශය සඳහා වඩාත් යෝග්‍ය පොහොර වර්ගය වරණය කිරීම සඳහා අනුවර්තී පර්යේෂණ ඒකක 4 ක් කුඩා තේ වතු ඉඩම් 4 ක ස්ථාපනය කරන ලදී. තවද ජෛව පටල ජෛව පොහොර (BFBF) සඳහා අනුවර්තී පර්යේෂණ 2 ක් මැද රට මධ්‍යස්ථානය තුළ හා නිව් පීකොක් (New Peacock) වතුයායේ ආරම්භ කරන ලදී. තවද රසායනික වල් මර්ධනය සඳහා හඳුන්වාදීමට නියමිත වන වල් නාශක සම්බන්ධ එක් අනුවර්තී පර්යේෂණක් ශෂ්‍ය විද්‍යා අංශයේ ද සහයෝගය ඇතිව මැද රට මධ්‍යස්ථානය තුළ ස්ථාපනය කරන ලදී.

**වගා ආදර්ශන භූමි**

ශෂ්‍ය විද්‍යා අංශයේ සහයෝගය ඇතිව තේ වගා ප්‍රභේද බද්ධ කිරීම ආදර්ශනය කිරීම සඳහා මැද රට මධ්‍යස්ථානය සතු තේ තවානේ කොටසක් වෙන් කරන ලදී. තවද තේ වගා කරුවන් හා මහජනතාව දැනුවත් කිරීම සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් නිරූපණය කරන වගා ආදර්ශන භූමි නඩත්තුව හා පවත්වාගෙන යාම ද මැද රට මධ්‍යස්ථානය මගින් සිදුවේ.

**යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුව**

විදුලි සැපයුමට අදාල නඩත්තු කටයුතු, නිළ නිවාස, කාර්යාලය, විද්‍යාගාර හා අනෙකුත් ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තුවත් ආයතනයේ රථ වාහන වල අලුත්වැඩියා හා සේවා කටයුතුත් සතුටුදායක මට්ටමින් සිදුකරන ලදී. රථ වාහන සේදීමේ කටයුතු පහසු කිරීම සඳහා වූ ස්ථානයක් (Vehicle Ramp) මැද රට මධ්‍යස්ථානය තුළ ස්ථාපනය කිරීම සිදු වූ අතර ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශිය කාර්යාලය හා වැවිලි කරුවන් අතර සිදු කරන සන්නිවේදන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ෆැක්ස් යන්ත්‍රයක් හා නව දුරකථන හුවමාරු ඒකකයක් ස්ථාපනය කිරීම සිදු විය. ප්‍රධාන මාර්ගයේ සිට ආයතනය දක්වා සම්පූර්ණ මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරණය කරන ලදී.

**මධ්‍යස්ථානයට පැමිණි ආගන්තුකයින් ප්‍රමාණය**

| | | |
|---|---|---|
| වැවිලිකරුවන් | - | 350 |
| ශිෂ්‍යයින් පාසල් ළමුන් | - | 40 |
| සාමාන්‍ය ආගන්තුකයින් | - | 176 |
| විදේශීය ආගන්තුකයින් | - | 10 |
| **එකතුව** | - | **576** |

**ආදායම**

| | | |
|---|---|---|
| අලෙවි කළ රිකිලි අතු ප්‍රමාණය | - | 436,440 |
| රිකිලි අතු අලෙවියෙන් ලද ආදායම | - | රු.320,715.00 |
| අලෙවි කළ රිකිලි තේ පැළ ප්‍රමාණය | - | 35,222 |
| රිකිලි තේ පැළ අලෙවියෙන් ලද ආදායම | - | රු. 633,996.00 |
| නෙළන ලද මුලු දළු අස්වනු ප්‍රමාණය | - | 16,517 |
| දළු අස්වනු ප්‍රමාණය අලෙවියෙන් ලද ආදායම | - | රු. 794,588.71 |
| ආගන්තුක නිවාසයෙන් ලද ආදායම | - | රු.62,950.00 |
| පාංශු පී. එච්. පර.ක්ෂාවෙන් ලද ආදායම | - | රු.36,995.00 |
| තේ. ප. ආ. ප්‍රකාශන අලෙවියෙන් ලද ආදායම | - | රු.83,125.00 |
| විවිධ ආදායම් | - | රු.28,200.00 |
| **එකතුව** | - | **රු .1,960,569.71** |

**අමු දළු අස්වැන්න**

2011 වසර තුළ නෙළා ගන්නා ලද අමු දළු අස්වැන්න පහත පරිදි වේ.

| මාසය | නෙළා ගන්නා ලද විකුණූ දළු ප්‍රමාණය (කි. ග්‍රෑ.) | ගෙවූ මිල රු. | ආදායම රු. |
|---|---|---|---|
| ජනවාරි | 752 | 51.20 | 38477.40 |
| පෙබරවාරි | 910 | 55.13 | 50143.30 |
| මාර්තු | 2879 | 55.34 | 159309.89 |
| අප්‍රේල් | 1991 | 49.17 | 97872.47 |
| මැයි | 2307 | 46.31 | 106812.17 |
| ජූනි | 1792 | 45.83 | 82112.33 |
| ජූලි | 1139 | 46.85 | 53337.15 |
| අගෝස්තු | 913 | 43.76 | 39927.88 |
| සැප්තැම්බර් | 628 | 42.20 | 26476.60 |
| ඔක්තෝබර් | 1087 | 43.92 | 47741.04 |
| නොවැම්බර් | 1229 | 42.04 | 50413.16 |
| දෙසැම්බර් | 890 | 48.48 | 41965.32 |
| **එකතුව** | **16517** | | **794,588.71** |

794588.71

**ඌව උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය**
**කේ .ආර්. ඩබ්.බී .කහඳව**
**(කෘෂි විද්‍යාවේදී, (පේරාදෙණිය,ශ්‍රී ලංකාව ) විද්‍යාපති (පේරාදෙණිය,ශ්‍රී ලංකාව )**
**ස්ථානභාර නිලධාරී)**

පස්සර ,පැල්ගහතැන්න පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානය ප්‍රධාන වශයෙන්ම ව්‍යාප්ති කටයුතු සිදුකරන අංශයක් වන අතර එය පාංශු ආම්ලිකතාවය, කාබන් ප්‍රතිශතය මැනීම සඳහා වු කුඩා විද්‍යාගාරයකින් ද සමන්විත වේ. මධ්‍යස්ථානයේ මුළු වපසරිය හෙක්ටයාර් 14.3 ක් වන අතර එහි භූමි උපයෝගීතා රටාව පහත පරිදි වේ.

භූමි උපයෝගිතාවය(හෙක්ටයාර්)

| | |
|---|---|
| දළු නෙලන මේරූ තේ වගාව | 4. 00 |
| නොමේරූ තේ වගාව ( පරීක්ෂණ වගාවන්) | 0 .30 |
| මව් මගාව | 2 .06 |
| ගොඩනැගිලි හා මාර්ග | 0 .79 |
| පුනරුත්ථාපන මාණා මගාව | 0 .40 |
| වන වගා / තෘණ භූමි | 6 .75 |
| **එකතුව** | **14.30** |

ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධානීන් ගේ විශේෂඥතාවය ඇතිව මෙම ව්‍යාප්ති මධ්‍යස්ථානය බදුල්ල සහ මොනරාගල දිස්ත්‍රික්ක වල පිහිටි වතු වල ක්ෂේත්‍ර පරීක්ෂණ විශාල සංඛ්‍යාවක් සිදුකරන ලදී. වතු අංශයේ සහ කුඩා තේ වතු අංශයේ තේ වගාකරුවන් හට නිරීක්ෂණ මගින් උපදෙස් ලබාදෙමින් ක්ෂේත්‍ර දින, වැඩ මුළු හා සම්මන්ත්‍රන පවත්වමින් අවශ්‍ය සේවාවන් ලබාදෙන ලදී .කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහභාගීත්වය ඇතිව ප්‍රදේශයේ කුඩා තේ වතු සංවර්ධන සමිති නිලධාරීන් සහ තේ පරීක්ෂක වරුන් හට ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසදයක් පවත්වන ලදී . බදුල්ල දිස්ත්‍රික්කයේ වතු අංශයේ කළමනාකරුවන් සහ සහකාර කළමනාකරුවන් සඳහා ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු සම්මන්ත්‍රනයක් ද සාර්ථකව පවත්වන ලදී. ඌව තේ වගාවේ කප්පාදුව,තේ නිෂ්පාදනයේදී බලශක්ති සංරක්ෂණ අවස්ථා ,තේ වගාවේ සෙවන නිසි ලෙස කළමණාකරණය කිරීම, තේ නැවත වගාව සඳහා ගුණාත්මයෙන් උසස් රෝපණ ද්‍රව්‍ය යොදා ගැනීම , නිර්දේශිත කෘෂි රසායනික සහ ඒවායේ නිවැරදි භාවිතය, ආදී මාතෘකා මෙම වැඩ සටහනන් වලදී තේමා කරගැණුනි .

මෙයට අමතරව ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය බුත්තල පැවැත්වූ දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයේ දී තේ පර්යේෂණ ආයතනයේ ප්‍රර්ශන කුටිය පවත්වාගෙන යාමේ කටයුතු සම්බන්ධීකරණය කලේය. බදුල්ල සහ මොනරාගල දිස්ත්‍රික්ක වල වතු අංශයේ වගා නොකල ඉඩම් හඳුනා ගැනීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් සිදුකල සමීක්ෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම ද මෙම

මධ්‍යස්ථානයෙන් ඉටුවිය. ශාක අභිජනන අංශය හා එක්ව සිදුකල 3000 සහ 4000 කාණ්ඩ වල ප්‍රභේද පිලිබඳ කුඩා තේ වතු හිමියන්ගේ ආකල්ප හදුනාගැනීමේ සමීක්ෂණයේ බදුල්ල දිස්ත්‍රික්කයට අදාල කටයුතු නිම කිරීමද මෙම මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය මගින් සිදු විය.

කියුබානු තානාපතිනි අතිගරු නිර්ශියා කස්ත්‍රෝ ද ගුවේරා මැතිනිය පස්සර ප්‍රදේශයේ සිදුකළ සංචාරයේ දී මෙම ආයතනයට පැමිණීමද විශේෂ කරුණක් ලෙස සටහන් කළ යුතුවේ .

කාර්ය මණ්ඩලයේ වෙනස්වීම්

කාර්මික නිලධාරි කේ.ඩි .දිසානායක මයා 2011 නොවැම්බර් 1 දින සිට මෙම ආයතනය වෙත මාරුවීම් ලබා පැමිණියේය.

යටිතල පහසුකම් සංවර්ධනය සහ නඩත්තුව

නිල නිවාස, කාර්යාල සහ අනෙකුත් ගොඩනැගිලි නඩත්තු කිරීම සහ ආයතනයේ වාහනය අළුත් වැඩියා කිරීම, රියදුරු විවේකාගාරය ඉදිකිරීම ආරම්භ කිරීම මෙම වසරේදී සිදුවිය. හෙක්ටයාර් 0 .1 ක නව වගාවේ පැල සිටුවීම සිදු විය.

අනුවර්ති පර්යේෂණ

කුඩා තේ වතු ක්ෂේත්‍ර තුනක කුඩා තේ වතු අංශය වු පොහොර අනුවර්ති පර්යේෂණ තුනක් පාංශු සහ ශාක පෝෂක අංශය සමග කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා ඒකාබද්ධව ආරම්භ කරන ලදී..

ශෂ්‍ය විද්‍යා අංශය හා ඒකාබද්ධව තවාන් සදහා ජෛව පටල ජෛව පොහොර අනුවර්ති පර්යේෂණයක් හාලිඇල පිහිටි වානිජ තේ තවානක ආරම්භ කරන ලදී ශාක අභිජනන අංශය සමඟ 5000 කාණ්ඩයේ ප්‍රභේද වල යෝග්‍යතාව සොයා බැලීම සදහා අනුවර්ති පරයේෂණ 2 ක් හපුතලේ සහ වැ'ල්ලපතන යන වතුවල ආරම්භ කරන ලදී .

ක්ෂේත්‍ර පර්යේෂණ අත්හදා බැලීම්

අදාල පරයේෂණ අංශ සමග ඒකාබද්ධව පහත අත්හදා බැලීම් මෙම මධ්‍යස්ථාන භූමියේ ක්‍රියාත්මක කෙරේ.

ක්ෂේත්‍ර අංක 04 හි UVP 9 සහ UVP 10 යන ක්ෂේත්‍ර අත්හදා බැලීම් ශාක අභිජනන අංශය විසින් 5000 කාණ්ඩයේ රෝපණ ද්‍රව්‍ය ලබාගැනීම සදහා පවත්වා ගෙනයයි.

නිරීක්ෂණ මට්ටමින් 5000 කාණ්ඩයේ ප්‍රභේද ඇගයීමේ ක්ෂේත්‍ර පර්යේෂණය ක්ෂේත්‍ර

අංක 2 හි පවත්වාගෙන යයි .

ඉදිරි අභිජනන කටයුතු සඳහා වටිනා ප්‍රවේශාංගයන් ලබා ගැනීම පිණිස ක්ෂේත්‍ර අංක 3 හි ජනක ප්ලාස්මය නඩත්තු කෙරේ.

UST 01 සහ UST 02 වැඩි දියුණු කල පැල වල ක්ෂේත්‍ර අත්හදා බැලීම් ක්ෂේත්‍ර අංක 3 හි සහ 4 හි ක්‍රියාත්මක කෙරේ.

රිකිලි බද්ධ කළ බීජ පැල ඇගයීමේ කටයුතු ශෂ්‍ය විද්‍යා අංශය මගින් ක්ෂේත්‍ර අංක 2 හි ක්‍රියාත්මක කෙරේ.

වටපණු හානිය පිලිබද TRI 5000 කාණ්ඩයේ ඇගයීමේ කටයුතු ක්ෂේත්‍ර අංක 01 හි ඇති ආමුකූලිත ටැංකි තුල සිදු කෙරේ.

වැසි දිය එකතු කිරීමේ තාක්ෂණ උපක්‍රම අත්හදා බැලීම විවිධ පරතරයන් වල පැල කළ බල ශක්ති ජනනය සදහා යොදාගන්නා කැසියා සහ ග්ලිරිසීඩියා පිලිබද අත්හදා බැලීම් ,ජෛව පටල ජෛව පොහොර මේරූ තේ සදහා යොදා ගැනීම (ක්ෂේත්‍ර අංක 2) යන අත්හදා බැලීම් ආයතනයේ ක්ෂේත්‍ර තුල දිගටම ක්‍රියාත්මක වේ.
සේවා ලාභීන් 787 දෙනෙකු ආයතනය වෙත විවිධ කටයුතු සදහා පැමිණි අතර එය පහත පරිද වේ.

<u>පැමිණි සේවා ලාභීන්</u>

| | |
|---|---|
| විදේශීය | 02 |
| වැවිලිකරුවන් | 89 |
| කුඩා තේ වතු හිමියන් | 187 |
| සිසු සිසුවියන් | 38 |
| උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් | 92 |
| වෙනත් | 186 |
| තේ.ප.ආ. නිලධාරීන් | 193 |
| එකතුව | 787 |

අස්වැන්න

ආයතනයේ තේ ක්ෂේත්‍ර වලින් මාසිකව ලැබුණු අමු දළු අස්වැන්න කම්හලෙන් ලැබුණු මිල හා
මාසික ආදායම පහත පරිදි වේ.

| මාසය | අමු දළු ( කි. ග්‍රෑ) | මිල (රු ) | මුදල(රු) |
|---|---|---|---|
| ජනවාරි | 1308 | 47.48 | 62103.84 |

| | | | |
|---|---|---|---|
| පෙබරවාරි | 1335 | 44.38 | 59,247.30 |
| මාර්තු | 5133 | 50.21 | 257,727.93 |
| අප්‍රේල් | 3220 | 46.39 | 149,375.80 |
| මැයි | 4876 | 39.61 | 193,138.36 |
| ජූනි | 4483 | 40.39 | 181,068.37 |
| ජූලි | 3070 | 41.46 | 127,282.20 |
| අගෝස්තු | 2138 | 41.83 | 89,432.54 |
| සැප්තැම්බර් | 5022 | 38.53 | 193,497.66 |
| ඔක්තෝබර් | 3065 | 43.02 | 131,856.30 |
| නොවැබර් | 4407 | 44.62 | 196,640.34 |
| දෙසැම්බර් | 2294 | 42.01 | 96,370.94 |
| එකතුව | 40351 | - | 1,737,741.58 |

අදායම (රු )

ආයතනය විවිධ කාර්යයන් මගින් උත්පාදනය කළ ආදායම විස්තරාත්මකව පහත පරිදි දැක්වේ.

| | (රු) |
|---|---|
| අමු දළු අලෙවිය | 1,737,741.58 |
| තේ රිකිළි අලෙවිය | 295,790.00 |
| තේ පැල අලෙවිය | 49,680.00 |
| පාංශු විශ්ලේෂණ ගාස්තු | 186,845.00 |
| ප්‍රකාශන අලෙවිය | 55,945.00 |
| සංචාරක නිවාසයේ නැවතීමේ ගාස්තු | 22,250.00 |
| වෙනත් | 26,894.00 |
| මුළු ආදායම | 2,375,145.58 |

**ව්‍යාප්ති මධ්‍යස්ථානය - ගාල්ල**

කේ.ඩී.දහනායක

කෘෂිකාර්මික ඉංජිනේරු ඩිප්ලෝමා

ස්ථාන භාර නිලධාරි (2011 සැප්තැම්බර් 23 දක්වා)

කේ.පී.ජේ.පී.මහින්දපාල

(විද්‍යාවේදී කෘෂි (පේරාදෙනිය ශ්‍රී ලංකාව) විද්‍යාපති (පේරාදෙනිය ශ්‍රී ලංකාව)

පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ව්‍යවහාරික සංඛ්‍යානය)

**පොදු**

ගාල්ල, තල්ගම්පල පිහිටා ඇති තේ පර්යේෂණ ආයතන ව්‍යාප්ති මධ්‍යස්ථානය මූලික වශයෙන් උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයක් වන අතර පාංශු පරීක්ෂාව සඳහා කුඩා පරිමානයේ විද්‍යාගාරයකින් සමන්විතයි. හෙක්ටයාර 35.6 කින් යුත් භූමියේ යොදවා ගැනීම් රටාව පහත පරිදි වේ.

| | |
|---|---|
| පරිනත දලු නෙලන වගාව | 5.0 |
| නව වගාව | 2.4 |
| මව්ශාඛ වගාව(ආසියානු සංවර්ධන බැංකු ආධාර) | 2.5 |
| තවාන (තේ ) | 1.0 |
| නැවත වගාව/ වගාව සඳහා වෙන් කෙරුණු | 3.5 |
| අත්හදා බැලීමේ කටයුතු | 1.0 |
| පුනරුත්ථාපනය සඳහා (මාණා සහ ගෞතමාලා) | 1.6 |
| පොල් හා පලතුරු ගස් ආදිය (හෙක්) | 1.5 |
| වන වගාව (හෙක්) | 7.3 |
| ගොඩනැගිලි, ගෙඋයන්, මාර්ග | 9.8 |

අනෙකුත් ප්‍රාදේශිය මධ්‍යස්ථාන මෙන්ම කොට්ටව මධ්‍යස්ථානයද තාක්ෂණ සංනිවේදනය, රෝපන ද්‍රව්‍ය බෙදා හැරීම සහ අනුවර්තී පර්යේෂණ අධීක්ෂණය ආදි කටයුතු සඳහා කැපවීමෙන් ක්‍රියා කරයි.මෙම මධ්‍යස්ථානය මගින් ගාල්ල දිස්ත්‍රික්කය සහ අකුරැස්ස ප්‍රදේශය තුල ඇති සමූහ වතු මෙන්ම කුඩා තේ වතු සඳහා ක්ෂේත්‍ර විමර්ශන විශාල සංඛ්‍යාවක් සිදුකර සමවබෝධික වාර්තා හා නිර්දේශ සපයන ලදි. බොහොමයක් ක්ෂේත්‍ර ගැටලු වලට හේතුව මූලික කෘෂිකාර්මික පිලිවෙත් වලින් බැහැර වීමේ ප්‍රතිඵලයක් ලෙස සිදුවූ තේ පඳුරු දුර්වල වීම බව මෙහිදී සටහන් කිරීම වටී. මෙම මධ්‍යස්ථානය මගින් කුඩා තේ වතුහිමියන් සඳහා ප්‍රාදේශිය තාක්ෂණික සංසදය වැනි නියමිත වැඩසටහන් කුඩා තේවතු සංවර්ධන අධිකාරිය හා තේ සංවර්ධන සමිති වල විධායක කමිටු සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් පැවැත්වූ අතර ප්‍රාදේශිය විද්‍යාත්මක සම්මන්ත්‍රණය දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානයේ සහයෝගිත්වයෙන් සමූහ වතු අංශය වෙනුවෙන් පවත්වන ලදි.වැවිලි ක්ෂේත්‍රයට ආවේණික කාලීනව වැදගත් වන ගැටලු මෙම වැඩසටහන් වලදී සාකච්ඡාවට බඳුන් විය. මෙබඳු නියමිත වැඩසටහන් වලට අමතරව තවාන් පැල වල තත්වය ඉහල නංවනු පිණිස තවාන් පැල සහතික කිරීමේ ක්‍රියාවලිය සඳහා වාණිජ තේ තවාන් පරීක්ෂා කිරීම ගාල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානයේ සේවක මණ්ඩලය විසින් සිදුකරන ලදි.

කර්මාන්තයේ නිරතවන්නන් පුහුණු කිරීම තාක්ෂණ සංනිවේදන ක්‍රියාවලියේ අනිවාර්ය අවශ්‍යතාවයකි. වැවිලිකරුවන්, පුහුණුවන්නන් සහ ශ්‍රමිකයන්ගේ හැකියාවන් සහ නව්‍ය හා පවත්නා තාක්ෂණය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම අරමුණු කොටගත් ක්ෂේත්‍ර දින, වැඩමුලු, ආදර්ශණ සහ සම්මන්ත්‍රණ විශාල සංඛ්‍යාවක් පවත්වන ලදි. අලුතින් වැඩි දියුණු

කරන ලද රෝපන ද්‍රව්‍ය මෙම ප්‍රදේශයේ වැවිලිකරුවන් හට බෙදා හැරීම අප සපයන සේවාවන් අතරින් ප්‍රධාන තැනක් ගනී. හෙක්ටයාර 2.5 පමණ වන අපගේ මව් වගාව තුලින් ටී.ආර්.අයි. 3025, ටී.ආර්.අයි. 3055, ටී.ආර්.අයි. 4042, ටී.ආර්.අයි. 4049, යන ප්‍රභේද වල රිකිලි 366750 ක් පමණ නිකුත් කරන ලදි.

ව්‍යාප්ති තොරතුරු / ප්‍රකාශණ 247 ක් පමණ බෙදාහරින ලදි. වැවිලිකරුවන් විසින් ගෙන එන ලද පස් නියැදි වල පී.එච් අගය පරික්ෂා කර ඔවුන්ගේ පසේ තත්වය ඉහල නැංවීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන ලදි.

සේවක මණ්ඩල වෙනස් වීම්

ස්ථාන භාර නිලධාරී කේ.ඩී.දහනායක මහතා 2011 සැප්තැම්බර් මස 23 වන දින සිට තේ පර්යේෂණ ආයතනයේ සේවයෙන් විශ්‍රාම ලැබූ අතර කේ.පී.ජේ.පී.මහින්දපාල මහතා එම ධූරයේ රාජකාරී භාර ගන්නා ලදි. එස්.පී.රත්නායක මහතා දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ස්ථාන භාර නිලධාරී ධූරයේ රාජකාරී භාරගන්නා ලදි.

යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුව

සංචාරක නිවාසය අලුත්වැඩියා කිරීම ආරම්භ කරන ලදි. ටී.ආර්.අයි. 4006 ප්‍රභේදය යොදා ගනිමින් ක්ෂේත්‍ර අංක 6 හි හෙක්. 0.15 නැවත වගා කරන ලදි.

අනුවර්ති පර්යේෂණ

තහවුරු කරන ලද තාක්ෂණවල කාර්ය ඵලය වැවිලිකරුවන්ගේද අදහස් අනුව තක්සේරු කරනු පිණිස ඔවුන්ගේ ක්ෂේත්‍ර වල ස්ථාපනය කරන ලද අනුවර්තී පර්යේෂණ අධීක්ෂණය මෙම මධ්‍යස්ථානය මගින් සිදුකරන ලදි. ප්‍රදේශයට වඩාත් උචිත පොහොර මිශ්‍රණය තෝරා ගැනීම පිණිස පාංශු සහ ශාබ පෝෂණ අංශයේ සහයෝගිත්වයෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ මාගෙදර, වදුරඹ, අම්පෙගම සහ හිනිදුම ප්‍රදේශ වල කුඩාවතු හිමියන් සතු ඉඩම් වල අනුවර්තී පොහොර පර්යේෂණ 4 ක් ආරම්භ කරන ලදි.

ජෛව පටල - ජෛව පොහොර අනුවර්තී පර්යේෂණයක් වදුරඹ පිහිටි වාණිජ තේ තවානක ආරම්භ කරන ලදි.

පර්යේෂණ කටයුතු

පහත දැක්වෙන අත්හදාබැලීම් අදාල පර්යේෂණ අංශ විසින් ගාල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානයේ සහයෝගිත්වය යටතේ සිදු කරනු ලබයි.
ශාබ අභිජනන අංශය

1. ටී.ආර්.අයි. 5000 කාණ්ඩයේ : පහතරට වර්ධක ප්‍රචාරණය : තෙවන අදියර පර්යේෂණය ක්ෂේත්‍ර අංක 3

2. පහතරට සජීව දැව වේයාට ප්‍රතිරෝධීත්වය පරීක්ෂා කිරීම.
පහතරට වර්ධක ප්‍රචාරණය : දෙවන අදියර ක්ෂේත්‍ර අංක 3

පාංශු සහ ශාඛ පෝෂණ අංශය : කාබනික පොහොර පර්යේෂණය : ක්ෂේත්‍ර අංක 7

කීට විද්‍යා හා වටපණු ව්‍යාධි අංශය : වටපණු ගහනය වෙනස් වන අයුරු අධ්‍යයනය කිරීමේ පර්යේෂණය : කේෂ්ත්‍ර අංක 4

ශෂ්‍ය විද්‍යා අංශය : ජෛව පටල ජෛව පොහොර පර්යේෂණය : කේෂ්ත්‍ර අංක 2

අමුත්තන්

ව්‍යාප්ති මධ්‍යස්ථානයට විවිධ අවශ්‍යතා සඳහා පැමිණි 680 ක් වන මුලු අමුත්තන්ගේ විස්තරය පහත පරිදි වේ.

| වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| විදේශිය අමුත්තන් | 04 |
| තේ වැවිලිකරුවන් | 431 |
| කුඩා වතුහිමියන් | 187 |
| උපාධි අපේක්ෂකයන් | 07 |
| ශිෂ්‍යයින් | 51 |
| එකතුව | 680 |

අස්වැන්න

මාසික අමුදලු අස්වැන්න සැපයු අමුදලු වෙනුවෙන් කර්මාන්තශාලාවෙන් ලැබුණු මිල සහ මාසික ආදායම පහත දැක්වේ.

| මාසය | අමුදලු (කි.ග්‍රෑ) | මිල (රු) | ආදායම(රු) |
|---|---|---|---|
| ජනවාරි | 2192 | 62.875 | 137,822.00 |
| පෙබරවාරි | 2099 | 62.315 | 130,799.19 |
| මාර්තු | 2179 | 60.003 | 130,746.54 |
| අප්‍රේල් | 2300 | 59.519 | 136,893.70 |
| මැයි | 2850 | 55.008 | 156,772.80 |
| ජුනි | 2573 | 57.006 | 146,676.44 |
| ජුලි | 1716 | 57.768 | 99,129.89 |
| අගෝස්තු | 2449 | 57.649 | 141,182.40 |
| සැප්තැම්බර් | 2176 | 56.758 | 123,505.41 |
| ඔක්තෝම්බර් | 1694 | 56.296 | 95,365.42 |
| නොවැම්බර් | 2221 | 55.219 | 122,641.40 |
| දෙසැම්බර් | 2254 | 59.009 | 133,006.29 |
| එකතුව | 26703 | | 1,554,541.48 |

ආදායම

| ක්‍රියාකාරකම් | ආදායම(රු) |
|---|---|
| අමුදලු විකිණීම | 1,554,541.48 |
| තේ රිකිලි විකිණීම | 258,540.00 |
| තේ පැල විකිණීම | 107,502.00 |
| පාංශු පී.එච්. අගය සහ කාබන් විශලේෂණ ගාස්තු | 13,585.00 |
| ආගන්තුක නිවාසයේ නවාතැන් සැපයිමේ ගාසිතු | 27,240.00 |
| වෙනත් | 13,250.00 |
| මුලු ආදායම | 1,974,976.58 |

තදනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානය
එස් පී රත්නායක
කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිය(රුහුණ, ශ්‍රී ලංකාව) පශ්චාත් උපාධිය(චූටි, චීනය)
ස්ථානභාර නිලධාරී

**පොදු කරුණු**

දෙනියාය රත්නපුර මාර්ගයේ පිහිටි තේ පර්යේෂණ ආයතන ව්‍යාප්ති මධ්‍යස්ථානය ප්‍රධාන වශයෙන් උපදෙස් සහ ව්‍යාප්ති කටයුතු සිදුකරන අතර එය සතුව කුඩා ප්‍රමාණයේ විද්‍යාගාරයක් ද ඇති අතර එහි පසෙහි ආම්ලිකතාවය සහ වටපණුවන් විශ්ලේෂණය සිදු කරයි. මෙහි භූමිය අක්කර 5.0 ක පමණ වපසරියකින් යුක්ත වේ. මෙහි ඉඩම් පරිහරණ විස්තර පහත දැක්වේ.

| | අක්කර |
|---|---|
| අළුතින් තේ පැල සිටුවන ලද ක්ෂේත්‍රය | 0.5 |
| පුනරුත්ථාපනය කරන ලද ක්ෂේත්‍රය (මානා තෘණ) | 2.2 |
| ගොඩනැගිලි, උද්‍යාන සහ පාරවල් | 2.3 |

තේ පර්යේෂණ ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ උපදේශන මත දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන අතර මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි පිහිටි විශාල තේ ඉඩම් ප්‍රමාණයක (හෙක්ටයාර 30,000 පමණ) ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු කරනු ලබයි. ව්‍යාප්ති මධ්‍යස්ථානය විසින් සමාගම් වතු සහ කුඩා තේ හිමියන්ගේ ඉඩම් පරීක්ෂා කර උපදෙස් ලබාදීම, පුහුණු වැඩමුළු සහ සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීමෙන් සේවා සපයනු ලබයි. මෙම වර්ෂයට අදාල ප්‍රධාන වැඩසටහන් 2 ක් වන ප්‍රාදේශීය තාක්ෂණ සහ ව්‍යාප්ති සංසදය සහ ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු රැස්වීම පවත්වන ලදී. ප්‍රාදේශීය තාක්ෂණ සහ ව්‍යාප්ති සංසදය සඳහා තේ පර්යේෂණ ආයතනයේ නිලධාරීන් සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ද සහභාගි වූ අතර කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධාන නියෝජනය වන පරිදි නිලධාරීන් පිරිසක්ද සහභාගි විය. ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු රැස්වීම පැවැත්වෙනුයේ මාතර දිස්ත්‍රික්කයේ සමාගම් වතු සහ පෞද්ගලික වතු ක්ෂේත්‍රය නියෝජනය වන පරිදිය. මෙම වැඩසටහන් වලදී සෙවන කළමනාකරණය, නිසි කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම තුලින් පොහොර භාවිතය කාර්යක්ෂම කිරීම සහ දෙනියාය ප්‍රදේශයේ තේ පඳුරු දුර්වල වීම සම්බන්ධව කරන ලද සමීක්ෂණයේ ප්‍රතිඵල දේශන මාර්ගයෙන් ඉදිරිපත් කරන ලදී. මීට අමතරව දෙනියාය ප්‍රදේශයේ තේ පඳුරු දුර්වල වීමට හේතු වූ කාරණා හඳුනාගැනීමේ සමීක්ෂණයක්, තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් හා ව්‍යාප්ති අංශයේ අංශ ප්‍රධානීගේ උපදේශකත්වය ඇතිව දෙනියාය උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ නිලධාරීන් සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ද සහභාගිත්වය ඇතිව සිදුකරන ලදී. මාතර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ තේ පරීක්ෂක වසම් 3 වන කොටපොල, අකුරැස්ස

සහ පස්ගොඩ වසම් ආවරණය වන පරිදි තෝරාගත් ඉඩම් 60 ක නියැදි ලබාගත් අතර එහි ප්‍රතිඵල ප්‍රාදේශීය තාක්ෂණ සහ ව්‍යාප්ති සංසදය, පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදය (කුඩා තේ ඉඩම් හිමියන් සඳහා) සහ විද්‍යාත්මක කමිටු රැස්වීමේදී ඉදිරිපත් කරන ලදී. මෙම පඳුරු දුර්වල වීමට හේතු වූ කරුණු කාරණා ලෙස රෝග හා පළිබෝධවල හානිය (පිළිකා, කඳ විදින ගුල්ලා සහ වටපණු) සහ නිවැරදි කෘෂිකාර්මික ක්‍රම අනුගමනය නොකිරීමෙහි සංකලනයක් ලෙස දැක්විය හැක.

රත්නපුර සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි පිහිටි සමාගම් වතුවල, වගා නොකරන ලද ඉඩම් පිළිබඳ සමීක්ෂණය සඳහා මෙම මධ්‍යස්ථානයේ උපදේශක හා ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ සහයෝගය ලබාදෙන ලදී. තවද කුඩා තේ වතු ක්ෂේත්‍රයේ TRI 3000 සහ 4000 කාණ්ඩවල තේ පැල වගාකර ඇති අය එම වර්ගයන් සම්බන්ධව දක්වන ප්‍රතිචාර සහ එම වර්ගවල යෝග්‍යතාවය පිළිබඳ තේ පර්යේෂණ ආයතනයේ ශාක අභිජනන අංශය සමඟ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියද එක්ව කරන ලද සමීක්ෂණයේ කටයුතුද අවසාන කර ඇත. මෙය අළුතින් ක්ෂේත්‍රයට හඳුන්වා දුන් තේ ප්‍රභේද සම්බන්ධව තේ වගාකරුවන්ගේ විශ්වාසය සහ පැහැදීම ඉහළ දැමීමටත් නව ප්‍රභේද වර්ග ඉඩම්වලට ගැලපෙන ආකාරය හඳුන්වා දීමටත් වගාව නිසි ලෙස කළමනාකරණයට සහ පවත්වාගෙන යාමටත් අවශ්‍ය උපදෙස් ලබාදීමේදී ප්‍රයෝජනවත් විය.

මාතර දිස්ත්‍රික්කයේ අහඹු ලෙස තෝරාගන්නා ලද තේ කම්හල් කිහිපයක් හා එක්ව කුඩා තේ ඉඩම් හිමියන්ගේ ක්ෂේත්‍රවල පොහොර සහ කෘෂි රසායන වර්ග භාවිතය පිළිබඳව විස්තර වාර්තා කරගැනීම සඳහා වාර්තා පොතක් තේ පර්යේෂණ ආයතනය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය එක්ව අළුතින්ම හඳුන්වා දෙන ලදී.
මෙහිදී ලබාගත් නිරීක්ෂණ අනුව වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවය විශාල ලෙස වර්ධනය කළයුතු බව වැටහී ඇත.

කාර්ය මණ්ඩල වෙනස්වීම්
ව්‍යාප්ති නිලධාරී පී කේ ආර් සී ඊ මුනසිංහ මහතා 2011 සැප්තැම්බර් මස 01 දින සිට තේ පර්යේෂණ ආයතනයේ මැදරට මධ්‍යස්ථානයට මාරුකර ඇත.

පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදය
ඉහත සංසදයේ සම්බන්ධීකාරක වශයෙන් උපදෙස් හා ව්‍යාප්ති අංශයට සම්බන්ධ උපදේශක නිලධාරී එස් පී රත්නායක මහතා විසින් මෙම සංසදය තේ පර්යේෂණ ආයතනය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, පෞද්ගලික තේ කම්හල්

හිමියන්ගේ සංවිධානය සහ දිස්ත්‍රික් කුඩා තේ වතු සංවර්ධන සමිති නිලධාරීන්ගේද සහභාගිත්වයෙන් අර්ධ වාර්ෂිකව පවත්වනු ලබයි. මෙම වර්ෂයේ පවත්වන ලද සංසදවලදී කුඩා තේ වතු හිමියන්ගේ වර්තමාන තේ දළු නිෂ්පාදන වියදම් ගණනය සහ ලාභය වැඩිකර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග, තේ වගාවට යාන්ත්‍රීකරණය හඳුන්වා දීමට ඇති විභවය, දෙනියාය ප්‍රදේශයේ තේ පඳුරු දුර්වල වීම සම්බන්ධව කරන ලද සමීක්ෂණයේදී ලද ප්‍රතිඵල, ගස්ගුල්ලාගේ හානිය පාලනය, පසේ පීඑච් අගය සහ පීඑච් ස්වාරක්ෂකතාව සහ එය යොදාගැනීම, කුඩා තේ ඉඩම්වල මිශ්‍ර/අන්තර් භෝග වගාව සහ සෙවන කළමණාකරනය සම්බන්ධ මාතෘකා යටතේ දේශන පැවැත් වූ අතර කුඩා තේ ඉඩම් හිමියෙක් විසින්ද ඔහුගේ අත්දැකීම්ද මෙම සංසදයට ඉදිරිපත් කරන ලදී. විවෘත සංවාදය අතරතුරදී තේ නිෂ්පාදනයේදී යන්ත්‍ර භාවිතය, ජනමාධ්‍ය මඟින් නිසි පරිදි සහ නිසි වේලාවට පණිවුඩ ප්‍රකාශ කිරීම සහ නිසි ප්‍රමිතියට සකසන ලද තේ පැල වගාකරුවන්ට ලබාගැනීමේ අවශ්‍යතාවයද ප්‍රධාන ලෙස ප්‍රකාශ කෙරුණි.

පුහුණු අවස්ථා

රුහුණු විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු විසින් පර්යේෂණ නිබන්ධනයක් සැකසීම හා ජාතික ආධුනිකත්ව මණ්ඩලය මඟින් යොමුකරන ලද ලබුදුව කෘෂිකර්ම විද්‍යාලයේ ඩිප්ලෝමා සිසුවෙකු අධ්‍යයන කටයුතු වලින් පසු කරනු ලබන පුහුණුව එස් පී රත්නායක මහතාගේ සුපරීක්ෂණය යටතේ සම්පූර්ණ කරන ලදී.

යටිතල සංවර්ධන සහ නිසි පරිදි පවත්වාගෙන යාම

ආයතනයේ ඉඩම මැන සිතියම්ගත කර එය වටා කම්බි වැට ගැසීමද සම්පූර්ණ කරන ලදී. ඩී" වර්ගයේ යුගල නිවාසයේ ඉදිකිරීම් කටයුතු සහ අභ්‍යන්තර මාර්ග කොන්ක්‍රීට් කිරීමද ආරම්භ කරන ලදී. මෙම මධ්‍යස්ථානය සතු වාහනයේ අළුත්වැඩියාවන්, නිල නිවාස සහ කාර්යාල නඩත්තුව සහ අළුත්වැඩියාවන් ද ගොඩනැගිලි අවට මෙන්ම පාරවල් දෙපස පිරිසිදු කිරීම සහ නඩත්තුවද නිසි පරිදි සිදුකෙරිණ.

උපයෝගිතා අත්හදාබැලීම

පහත සඳහන් අත්හදාබැලීම්, අදාල පර්යේෂණ අංශ හා සහයෝගිත්වයෙන් පවත්වාගෙන යන ලදී.

ශාක අභිජනන අංශය සමඟ

i. TRI 5000 වර්ගයේ තේ ප්‍රභේද - පහතරට වර්ධන ප්‍රචාරණ අදියර III ඉංදොල, කිරුවානාගඟ සහ දෙනියාය වතුවල ස්ථාපිත කර ඇත.

සසග වැඩි දියුණු කල ඇට තේ වගාවක් වරාපිටිය කුඩා තේ ඉඩම් හිමියෙකුගේ ඉඩමක ස්ථාපිත කර ඇත.

පාංශු සහ ශාක පෝෂක අංශය සමඟ

සහ පොහොර අත්හදාබැලීම - කොටපොල කුරුඳු වත්ත නැමැති පෞද්ගලික ඉඩමෙහි ස්ථාපිත කර ඇත.

වටපණු සහ ව්‍යාධිවේදී අංශය සමඟ

I. TRI 5000 වර්ගයේ තේ පැල වටපණුවන්ට දක්වන ප්‍රතිචාරය සොයාබැලීම දෙනියාය මධ්‍යස්ථානයේ ඇති තවානේ ස්ථාපිත කර ඇති

කඳ ගුල්ලාගේ හානිය පාලනය කිරීම - දෙනියාය වත්තට අයත් ක්ෂේත්‍රයක පවත්වාගෙන යයි.

ශෂ්‍ය විද්‍යා අංශය සමඟ ජෛව පටලජීව පොහොර යෝග්‍යතාවය සෙවීමේ අත්හදාබැලීම් දෙනියාය රිච්ලන්ඩ් සහ නිල්ගිරි පෞද්ගලික වතු දෙකෙහි පවත්වාගෙන යයි.

ආගන්තුකයින්

පහත දැක්වෙන පරිදි පුද්ගලයින් 1,038 දෙනෙක් සේවා ලබාගැනීම සඳහා දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානයට පැමිණ ඇත.

| | |
|---|---|
| විශාල වතු සහ කුඩා තේ ඉඩම් හිමියන් | 769 |
| විශ්වවිද්‍යාල/කෘෂිකර්ම විද්‍යාල/පාසල් සිසුන් සහ වෙනත් | 269 |

ආදායම

මධ්‍යස්ථානයේ කටයුතුවලින් ලද සම්පූර්ණ ආදායම

| ක්‍රියාකාරකම් | ආදායම (රු) |
|---|---|
| ප්‍රකාශන විකිණීම | 43,315.00 |
| නියැදි 357 ක ආම්ලිකතාවය (පීඑච්) පරීක්ෂාව | 33,915.00 |
| තේ පැල 1,300 ක් විකිණීම | 23,400.00 |
| විවිධ ආදායම් | 37,652.00 |
| එකතුව | 138,282.00 |

## කළුතර ව්‍යාප්ති මධ්‍යස්ථානය

හැරන් ජයවීර
වැඩ බලන ස්ථානභාර නිලධාරි

**හැඳින්වීම**

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ කළුතර ව්‍යාප්ති මධ්‍යස්ථානය, නිවිතිගල කැලේ, මතුගම පිහිටා ඇති අතර එය ප්‍රධාන වශයෙන් උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයකි. එයට අමතරව පාංශු පී.එච්. විශ්ලේෂණය සඳහා කුඩා විද්‍යාගාරයක්ද ඇත. මෙම මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයට අයත් ගොඩනැගිල්ලක ස්ථාපිත කර ඇත.

කළුතර ව්‍යාප්ති මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් හා ව්‍යාප්ති අංශ ප්‍රධානියාගේ, මඟ පෙන්වීම යටතේ කළුතර, ගම්පහ සහ කොළඹ යන දිස්ත්‍රික්ක තුල පිහිටා ඇති වැවිලි සමාගම්හි ක්ෂේත්‍ර හා කර්මාන්තශාලාවල සමීක්ෂණ රාශියක් සිදුකර ඇත. එසේම මෙම මධ්‍යස්ථානය මඟින් උපදේශක ක්ෂේත්‍ර චාරිකා, පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර දින, වැඩමුළු සහ සම්මන්ත්‍රණ යනාදිය වැවිලි සමාගම් වලට අයත් වතු හා කුඩා තේ වතු හිමියන් සඳහා පවත්වා ඇත. මෙම ව්‍යාප්ති මධ්‍යස්ථානය මඟින් 'ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසදය',තේ පර්යේෂණ ආයතනය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩල නිලධාරීන්ගේ හා තේ සංවර්ධන සභාවල සහභාගිත්වයෙන් පැවැත්වීය. තවද, රත්නපුර තේ පර්යේෂණ ආයතනය සමඟ ඒකාබද්ධ වී ප්‍රාදේශීය වැවිලි සමාගම්හි කළමනාකරුවන් සඳහා 'ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු සම්මන්ත්‍රණය' සංවිධානය කර පැවැත්වීය. මෙම සංසදයේ ප්‍රධාන මාතෘකාව වුයේ කළුතර දිස්ත්‍රික්ක තුල ප්‍රමිතියෙන් යුතු තේ තවාන් පැල නොමැති බව සම්බන්ධවයි. මෙයට අමතරව කළුතර ව්‍යාප්ති මධ්‍යස්ථානය, මතුගම ශාන්ත මේරි මහා විද්‍යාලයේ පැවති අධ්‍යාපන ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටියක් පැවැත්වීය. මෙහිදී ප්‍රදේශය තුල විසිරී ඇති තේ වගාකරුවන් හා මහජනතාව 15000 කට වඩා වැඩි පිරිසක් සහභාගි විය. තවද, කළුතර, ගම්පහ සහ කොළඹ යන දිස්ත්‍රික්ක තුල විසිරී ඇති තේ වගා කරුවන්ගේ ප්‍රයෝජනය සඳහා තේ වගා සායනයක් මෙම මධ්‍යස්ථානය මගින් සංවිධානය කරන ලදී. මෙයට කළුතර දිස්ත්‍රික් ලේකම්තුමා සහ ප්‍රාදේශිය ලේකම් වරුන් ඇතුළු 500ට වඩා වැඩි තේ වගා කරුවන් පිරිසක් සහභාගි විය. එමෙන්ම මතුගම සහකාර තේ කොමසාරිස්තුමාගේ හා කු.තේ.සං.අ. නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පැලවත්ත, කටුකැලේ, සහ හැඬිගල්ල යන ප්‍රදේශ වල තේ කර්මාන්තශාලා පාදක කර ගනිමින් ව්‍යාප්ති වැඩසටහන් සිදු කරන ලදී. මේ සඳහා එම කර්මාන්තශාලා වලට අනුබද්ධිත ව්‍යාප්ති නිලධාරීන් සහ කර්මාන්තශාලා

නිලධාරීන් සහභාගි විය. කළුතර දිස්ත්‍රික්ක කෘෂිකාර්මික කමිටු රැස්වීමට හා කළුතර දිස්ත්‍රික්ක සංවර්ධන රැස්වීමට තේ පර්යේෂණ ආයතනය නියෝජනය කරමින් කළුතර තේ පර්යේෂණ ආයතනයේ ස්ථානභාර නිලධාරී තුමා සහභාගි විය.

**කාර්ය මණ්ඩලයේ වෙනස්වීම්**

කළුතර ව්‍යාප්ති හා උපදෙස් මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරියා ලෙස කටයුතු කළ ටී.එන්. මහින්ද මහතා, රත්නපුර උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයට උපදෙස් නිලධාරියා ලෙස අනුයුක්ත කිරීමෙන් පසුව එම තනතුරට තලවකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ, ව්‍යාප්ති නිලධාරියකු ලෙස කටයුතු කළ හැරන් ජයවීර මහතා වැඩ බලන ස්ථානභාර නිලධාරි ලෙස 2011 සැප්තැම්බර් 01 වෙනි දින සිට බලපවත්වන පරිදි අනුයුක්ත කරන ලදී.

## යටිතල පහසුකම් සංවර්ධන හා නඩත්තුව

විද්‍යාගාරය, කාර්යාලය, හා දේශන ශාලා යනාදිය සහ නිල රථය නිසි ලෙස නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම් සිදු කර ඇති අතර ආයතන පරිශ්‍රයද, වඩා පිරිසිදුව හා ආකර්ශනීය වැඩ බිමක් ලෙස පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. එසේම රත්නපුර තේ පර්යේෂණ ආයතනයේ අභිජනන අංශයේ සහයෝගය ඇතිව නව තේ ප්‍රභේද සහිත වගා ආදර්ශන ක්ෂේත්‍රයක් ආයතන භූමිය තුල පිහිටුවන ලදී.

## අනුවර්තී පර්යේෂණ

කළුතර ප්‍රදේශයට වඩාත් යෝග්‍ය පොහොර මිශ්‍රණය තෝරා ගැනීමේ, අනුවර්තී පර්යේෂණ මීගහතැන්න හා ගිරන්චිකන්ද යන ප්‍රදේශයන්හි තෝරා ගත් කුඩා ඉඩම් හිමියන් දෙදෙනෙකුගේ වගා බිම් වලදී, පාංශු හා ශාක පෝෂණ අංශයේ සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව ආරම්භ කරන ලදී.

අමුත්තන්ගේ පැමිණීම

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ කළුතර ව්‍යාප්ති මධ්‍යස්ථානයට පැමිණි අමුත්තන් පහත සඳහන් පරිදි සාරාංශ ගත කර ඇත.

| කාණ්ඩය | ප්‍රමාණය |
|---|---|
| වැවිලිකරුවන් | 20 |
| කුඩා වතු හිමියන් | 100 |
| විශ්වවිද්‍යාල හා පාසල් සිසුන් | 30 |
| තේ පර්යේෂණ ආයතනයේ නිලධාරීන් | 20 |
| එකතුව | 170 |

## ආදායම

කළුතර තේ පර්යේෂණ ආයතනය ලැබූ ආදායම හා ඊට අදාල ක්‍රියාකාරකම් පහත පරිදි දැක්විය හැක

| ක්‍රියාකාරකම් | ආදායම(රු) |
|---|---|
| ප්‍රකාශන විකිණීම (100) | 3,000.00 |
| එකතුව | 3,000.00 |

## සම්මාන/ප්‍රදාන, ප්‍රකාශන, විශේෂ ඉදිරිපත් කිරීම් සහ අධ්‍යයන වැඩ සටහන්

උපදෙස් හා ව්‍යාප්ති අංශය

ප්‍රකාශන

අමරතුංග එම් කේ එස් එල් ඩී සහ වනිගසුන්දර ඩබ් ඒ ඩී පී (2010) රාජ්‍ය පුද්ගලික සහයෝගිතා ව්‍යාප්ති ප්‍රවේශයේ ප්‍රධාන සහභාගිවන්නන් අතර ඇති සම්බන්ධතාවය ශක්තිමත් කිරීම. ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු අංශය තුලින් උගත් පාඩම් : ශ්‍රී ලංකා තේ විද්‍යා සඟරාව ; (කලාපය 75(1) 1-16

සිදාකරන් වී එස් (2010) ශ්‍රී ලංකාවේ සමාගම් වැවිලි ක්ෂේත්‍රයේ කෘෂි තාක්ෂණය පිළිබඳ දැනුවත් වීම, දැනුම ලබා ගැනීම සහ භාවිතයට ගැනීම: ශ්‍රී ලංකා තේ විද්‍යා සඟරාව ; (කලාපය 75(1) 54-65

විශේෂ ඉදිරිපත් කිරීම්

බී ඒ ඩී සමන්සිරි මහතා විසින් අප්‍රේල් මස4 වැනි දින තේ කර්මාන්තයේ නිරතවෙන්නන් සඳහා කොළඹදී පැවැත්වූ සම්මන්ත්‍රණයක් සඳහා සමාගම් වැවිලි ක්ෂේත්‍රයේ සිදුකල නිර්ණායාත්මක අධ්‍යයනයේ ප්‍රතිඵල ඉදිරිපත් කරන ලදි.

ජේ සී කේ රාජසිංහ මහතා විසින් අප්‍රේල් මස4 වැනි දින තේ කර්මාන්තයේ නිරතවෙන්නන් සඳහා කොළඹදී පැවැත්වූ සම්මන්ත්‍රණයක් සඳහා සමාගම් වැවිලි ක්ෂේත්‍රය තුල තේ පර්යේෂණායතන නිර්දේශ භාවිතයට ගැනීමේ මට්ටම පිළිබඳ දේශනයක් සිදුකරන ලදි.

සී ජේ ලියනආරච්චි මහතා විසින් අගලවත්ත වැවිලි සමාගමේ උඩරට ප්‍රදේශයේ වතුවල විධායක නිලධාරීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා නැවත වගා කිරීම පිළිබඳ වැඩ මුළුවක් පවත්වනු ලැබීය.

අධ්‍යයන වැඩ සටහන්

බී ඒ ඩී සමන්සිරි මහතා විසින් වැව්ලි ක්ෂේත්‍රයේ නිරතවෙන්නන් අතර තොරතුරු සංනිවේදන තාක්ෂණ ය පිළිබඳ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කරනු ලබන පශ්චාත් උපාධි කටයුතු සඳහා ලබා දුන් මාස 18 ක අධ්‍යයන නිවාඩු කාලය අවසන් කර මාර්තු මස 15 වන දින නැවත ආයතනයට වාර්තා කරනු ලැබීය.

කේ පී ජේ පී මහින්දපාල මහතා කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාවහාරික සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව අවසන් කරනු ලැබීය.

හිරෝමි නිශාන්ති මහත්මිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ කෘෂි ව්‍යාප්තිය (සංවර්ධන සංනිවේදනය) පිළිබඳ විද්‍යාපති උපාධි කටයුතු සාර්ථකව සිදු කරමින් සිටින අතර ප්‍රායෝගික අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු එක් රැස් කිරීම අවසන් කරන ලදි.

රෝහිත කුමාර සහ සී මුණසිංහ යන මහත්වරු ඔක්තෝබර් මාසයේ 17-21 යන දින තුල කොළඹ තරුණ කටයුතු සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ නිපුණතා පියස හි නිපුණතා සංවර්ධන අරමුදල මගින් පැවැත්වූ පුහුණු කරන්නන් පුහුණු කිරීමේ වැඩමුළුවට සහභාගි විය.

**කෘෂි ආර්ථික විද්‍යා අංශය**

ප්‍රකාශන

බී එම් එම් එස් මංචනායක, එන් ආර් අබේනායක සහ එච් ඩබ් ශ්‍යාමලී (2011) නිශ්පාදන පිරිවැය ඇස්තමේන්තු කිරීම එහි නිර්ණායකයන්ගේ පංගුව සහ රත්නපුර දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු අංශයේ මුහුණ දෙන ගැටළු, වයඹ විශ්ව විද්‍යාලයේ 11 වන කෘෂිකර්ම පර්යේෂණ සමුළුවේ සමුළු වාර්තාව 188-192 පිටු

**විශේෂ ඉදිරිපත් කිරීම්**

එච් ඩබ් ශ්‍යාමලී මහත්මිය විසින් 2011 ජූලි මස 24 වන දින රත්නපුර පහතරට මධ්‍යස්ථානයේ ශ්‍රවණාගාරයේදී පැවැත්වූ පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදයේදී (සිංහල) කුඩා තේ ඉඩමක වර්තමාන තත්වය පිළිබඳව ආර්ථික විශ්ලේෂණයක් මැයින් දේශනයක් කරනු ලැබීය.

එච් ඩබ් ශ්‍යාමලී මහත්මිය විසින් 2011 අගොස්තු මස 25 වන දින පැවැත්වූ තේ පර්යේෂණ මණ්ඩල රැස්වීම සඳහා වැවිලි ක්ෂේත්‍රයේ කම්කරු කුලිය වැඩි කිරීම සහ පොහොර සහනාධාරය ලබාදීම නිසා නිෂ්පාදන වියදමට සිදුවූ බලපෑම පිළිබඳ පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරනු ලැබීය.

අධ්‍යයන වැඩ සටහන්

එච් ඩබ් ශ්‍යාමලී මහත්මිය සමාජ විද්‍යාත්මක පර්යේෂණ සහ පරිපූර්ණ පර්යේෂණ යෝජනාවලියක් සකස් කිරීම පිළිබඳ ජාතික විද්‍යා පදනම මගින් 2011 නොවැම්බර් 7 සහ 8 යන දෙදින තුල පැවැත්වූ වැඩමුළුවට සහභාගි විය.

එච් ඩබ් ශ්‍යාමලී මහත්මිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ තිරසාර කෘෂි කර්මාන්තය තුලින් දුප්පත් කම දුරලීම සඳහා වූ මධ්‍යස්ථානය මගින් පවත්වනු ලැබූ ආහාර සුරක්ෂිතභාවය සහ දුප්පත්කම පහත දැමීම සඳහා තිරසාර කෘෂි කර්මාන්තය මැයින් පැවැත්වූ වැඩමුළුවට සහභාගි විය.

කොළඹ මූල්‍ය අධ්‍යයනය පිළිබඳ අධ්‍යයන ආයතනය මගින් 2011 දෙසැම්බර් මස 1, 2 යන දෙදින තුල පැවැත්වූ සංයුක්ත සැලසුම් සහ අයවැයකරණය පිළිබඳ වැඩමුළුවට සහභාගි විය.

**ශෂ්‍ය විද්‍යා අංශය**

ජයසිංහ එස් සහ කේ පී ප්‍රේමතිලක (2011) අස්වැන්න ඉහල නැංවීම, නියගය, පළිබෝධ සහ රෝගයන්ට ඔරොත්තුදීම සඳහා තේ රිකිලි බද්ධය සිදුකිරීම, 222 වන පර්යේෂණ සහ ව්‍යාප්ති සංසඳ වාර්ථාව, තේ පර්යේෂණ ආයතනය, තලවාකැලේ

ප්‍රේමතිලක කේ පී (2010) ග්‍රැමොක්සෝන් සඳහා ආදේශකයක් " තේ තතු ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය 7 වන කලාපය අංක 1 ඔක්තොබර්

ප්‍රේමතිලක කේ පී (2010): කෘෂි වන වගා ක්‍රමය තුලින් තේ නිෂ්පාදනය ඉහල නැංවීම මාර්තු 15 වන දින ලුණුවිල පොල් පර්යේෂණ ආයතනයේ පැවැත්වූ කෘෂි වනවගා ක්‍රමය තුලින් පොල් නිෂ්පාදනය ඉහල නැංවීම සමුළුවේ වාර්ථාව (සංස්කරණය, පුෂ්පකුමාර ඩී කේ එන් පී, ගුණසේන එම් පී එම්, එම් ඒ ජේ සහ සිං) ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයේ, නව දිල්ලියේ පිහිටි ලෝක කෘෂි වනවගා මධ්‍යස්ථානයේ

දකුණු ආසියානු කාර්යාලයේ සහ ශ්‍රී ලංකාවේ ජාතික බහුකාර්ය ශාක ප්‍රභේද පිළිබඳ පර්යේෂණ ජාලයේ ප්‍රකාශනයකි.
සෙනෙවිරත්න පී, ජයසේකර ඒ පී ඩී ඒ ද සිල්වා එම් එස් ඩී එල් සහ අබේසේකර යූ පී (2011) දියුණු කල ක්ෂුද්‍ර ජීවී ජෛව පටල මගින් නිසරු වූ කෘෂිකාර්මික පස නැවත යථා තත්වයට පත් කල හැක". පාංශු ජෛව විද්‍යාව සහ ජෛව රසායනය 1.4

ප්‍රේමතිලක කේ පී, සහ එම් පී එස් ලියනගේ (2011) ගිණිසපු බීජ ස්වභාවික වල් නාශකයක් ලෙස භාවිතයට ඇති විභවය සොයා බැලීම 2011 දෙසැම්බර් 15-19 දින තුල චීනයේ ගුඅන්ග්ෂු හි පැවැති ශාක ඇලිලොපති සම්බන්ධ 6 වන ලෝක සමුළුවේ වාර්ථාව.

ජයසිංහ එල් ඒ එස් සහ කේ පී ප්‍රේමතිලක (2011) තේ අස්වැන්න ඉහල නැංවීම සහ නියඟයට ඔරොත්තු දීම සදහා තේ රිකිලි බද්ධය සිදු කිරීම 2011 දෙසැම්බර් 20-21 රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ පැවැත්වූ කාලගුණ වෙනස් වීම කෘෂි කර්මාන්තය කෙරෙහි බලපෑම සම්බන්ධ අන්තර්ජාතික සමුළුවේ වාර්ථාව.

විජේරත්න ටී එල්, ඩබ් ඒ ජේ එම් ඩී කොස්තා, එස් අයි වුඩ්වර්ඩ්, එම් ලොමාස් සහ එම් ඒ විජේරත්න (2011) ශ්‍රී ලංකාවේ විවිධ උච්චත්ව කලාපයන්හි වැවෙන තේ වගාවන්හි අස්වැන්න කෙරෙහි කාලගුණ විපර්යාසයන්හි බලපෑම පිළිබඳ පුරෝකථනය, 2011 දෙසැම්බර් 20-21 දිනයන්හි රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ පැවැත්වූ කාලගුණ වෙනස් වීම කෘෂි කර්මාන්තය කෙරෙහි බලපෑම සම්බන්ධ අන්තර්ජාතික සමුළුවේ වාර්ථාව.

**විශේෂ ඉදිරිපත් කිරීම්**
**ආචාර්ය** කේ පී ප්‍රේමතිලක මාර්තු 15 වන දින ලුණුවිල පොල් පර්යේෂණ ආයතනයේදී වන වගා ක්‍රමය තුලින් තේ ඉඩම්හි නිෂ්පාදකතාවය ඉහල නැංවීම යන මැයින් දේශනයක් ඉදිරිපත් කිරීම

ආචාර්ය එම් ඒ විජේරත්න පහත සදහන් ඉදිරිපත් කිරීම් සිදු කරන ලදි.

- අප්‍රේල් 5 දින කොළඹ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ සහ පුහුණු ආයතනයේදී කප්පාදු අතු වැලලීම, නිවැරදි කෘෂි කාර්මික වගා පිළිවෙත් මැයින්
- මැයි 4 වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේදී දේශගුණ වෙනස් වීමේ බලපෑම යන මැයින්
- ජූනි 30 කොළඹ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේදී රත්නපුර දිස්ත්‍රික්කයේ තේ වගා කරන ප්‍රදේශ සිතියම් ගත කිරීම යන මැයින්

සමන්ති ජයසිංහ මහත්මිය සහ ටී එල් විජේරත්න මහත්මිය 2011 දෙසැම්බර් 20-21 දිනයන්හි රුහුණු විශ්ව විද්‍යාලයේ පැවැති දේශගුණ වෙනස් වීම කෘෂි කර්මාන්තයට බලපෑම පිළිබඳ අන්තර්ජාතික සමුළුවේදී ඉදිරිපත් කිරීම් දෙකක් සිදු කරන ලැබීය.

**අධ්‍යයන වැඩසටහන්**

ටී එල් විජේරත්න මහත්මිය ඇයගේ දර්ශනපති උපාධියට අදාලව එක්සත් රාජධානියේ ෂෙෆීල්ඩ් විශ්ව විද්‍යාලයේදී දේශගුණික වෙනස්වීම්වලට අඳාලව තේ වගාවන් දක්වන කායික විද්‍යාත්මක සහ කාබන් බැඳ තබා ගැනීම පිළිබඳ මොඩලයක් සකස් කිරීම පිළිබඳ වසරක පුහුණුවෙන් පසු දිවයිනට පැමිණියාය.

එන් පී එස් එන් බංඩාර මහතා තම දර්ශනවේදී උපාධි නිබන්ධනය ඇඩිලේඩ් විශ්ව විද්‍යාලයට භාරදීමෙන් පසු දිවයිනට පැමිණියේය.

ආචාර්ය කේ පී ප්‍රේමතිලක චීනයේ ගුඅන්ග්ෂු හි පැවැත්වූ ශාක ඇලිලොපති සම්බන්ධ හයවන සමුළුවට සහභාගිවීමෙන් පසු දිවයිනට පැමිණියේය.

ආචාර්ය එම් ඒ විජේරත්න 2011 නොවැම්බර් 15-24 දිනයන්හි ඉංදියාවේ ටොක්ලායි සහ උපාසි පර්යේෂණ ආයතනයන්හි අධ්‍යයන සංචාරයකින් පසු දිවයිනට පැමිණියේය.

**ජෛව රසායන අංශය**
**සම්මාන/ප්‍රදාන**

2011 අගෝස්තු මස 25 වන දින බංඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති උත්සවයකදී ආචාර්ය අයි එස් බී අබේසිංහ සහ ආචාර්ය නිමල් පුණ්‍යසිරි යන මහත්වරුන් විශිෂ්ඨතම කෘෂිකර්ම පර්යේෂණය පිළිබඳ ජාතික සම්මානයේ පලමුවන ස්ථානය හිමි කර ගනු ලැබීය.

2011 පෙබරවාරි 21 වන දින කොළඹ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේදී ස්වභාවික විද්‍යාවන්ට අදාලව 2007-2009 අතර කාලය තුල සිදු කල විශිෂ්ඨතම පශ්චාත් උපාධි පර්යේෂණයන් සදහා පිරිනමන හිරාන් තිලකරත්න පර්යේෂණ සම්මානය" දිනා ගන්නා ලදි.

ආචාර්ය පී ඒ එන් පුණ්‍යසිරි ශ්‍රී ලංකාවේ තේ ජාන සංචිතයේ රසායනික සංයුතිය පිළිබඳ පර්යේෂණ කටයුතු සදහා ජාතික පර්යේෂණ සභාවෙන් රුපියල් මිලියන 9.3 ක ප්‍රදානයක් හිමි කර ගනු ලැබීය.

<u>ප්‍රකාශන</u>

ආචාර්ය පී ඒ එන් පුණ්‍යසිරි, සෝමසිරි එච් පී පී එස් , තොටවත්තගේ ජී, අබේසිංහ අයි එස් බී සහ අමරකෝන් ඒ එම් ටී (2011) ශ්‍රී ලංකාවේ තේ වල එල් තියැනීන් සංයුතිය නිර්ණය, 2011 පෙබරවාරි 21-25 දිනයන්හි ඕස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන්හි පැවැත්වූ 12 වන රජයේ ආහාර විශ්ලේෂණ සම්මේලනය.

ජේගනාදන් බී, ආචාර්ය පුන්‍යසිරි පී ඒ එන් , මංජිත් ටී, (2011) ශ්‍රී ලංකාවේ කළු තේ වල පොලිපීනෝල, ෆ්ලෙවනෝල් ග්ලයිකොසයිඩ් සහ ෆ්ලෙවනෝල ප්‍රමාණාත්මක විශ්ලේෂණය 2011 නොවැම්බර් මස පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ 16 වන පර්යේෂණ සැසිය (PURSE)

ධර්මසේන අයි , ජයවර්ධන බී සී, මහිපාල එම් බී පී, තොටවත්තගේ පී එච් (2011) ඌරු මස් සොසේජස් සමග එක්කල කළු සහ හරිත තේ නිස්සාරකයන්ගේ ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරිත්වය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සත්ව විද්‍යා දෙපාර්තමේන්තුවේ 21 වන වාර්ෂික පර්යේෂණ වැඩ මුළුවේ වාර්තාව 9-10 පිටු

නස්රියා එම්, මෙවන් කේ එම්, ආචාර්ය_කේ බී ඒ පී ප්‍රේමතිලක, ගිම්හානි ඩී ආර් (2011) SSRM මගින් හදුනාගත් ශ්‍රී ලංකාවේ පැරණි තේ බීජ වගාවන්හි ජාන විවිධත්වය 2011 සැප්තැම්බර් 20-21 දිනයන්හි මාකඳුර වයඹ විශ්ව විද්‍යාලයේ 11 වන කෘෂිකර්ම සමුළුවේ වාර්තාව.

**අධ්‍යයන වැඩ සටහන්**

කේ එම් මෙවන් 2011 ඔක්තෝබර් මාසයේදී කොළඹ විශ්ව විද්‍යාලයේ අණුක ජෛව විද්‍යාව සහ ජාන තාක්ෂණය පිළිබඳ ඔහුගේ පශ්චාත් උපාධි වැඩසටහන සම්පූර්ණ කරනු ලැබීය.

**විශේෂ ඉදිරිපත් කිරීම්**

ආචාර්ය පී ඒ එන් පුන්‍යසිරි සහ පී ඒ ඒ ආර් පෙරේරා 2011 දෙසැම්බර් 2 වන දින කොළඹ රසායනා විද්‍යා ආයතනයේදී පුහුණු සම්මන්ත්‍රණයකදී තේ හි ගුණාත්මය සුරක්ෂිතභාවය සහ සෞඛ්‍යමය කරුණු හා සම්බන්ධ තිරසාර සංවර්ධන කටයුතු පිළිබද දේශන සිදු කරනු ලැබීය.

**කීට විද්‍යා සහ වටපණු විද්‍යා අංශය**

**සම්මාන/ප්‍රදාන**

තේ ඉඩම්හි දේශගුණ වෙනස්වීම විශේෂ සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ වටපණු ගහණය රූපමිතිකව සහ අනුක සුලක්ෂිකරනයට භාජනය කිරීම සම්බන්ධ පර්යේෂණ යෝජනාවලිය පර්යේෂණ අරමුදල් සැපයීම සදහා ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ප්‍රතිපත්ති සභාව මගින් තෝරාගනු ලැබීය.

**විදේශ සම්මන්ත්‍රණ**

කීටවිද්‍යා සහ වටපණු විද්‍යා අංශයේ අංශ ප්‍රධානි ආචාර්ය කේ එම් මොහොට්ටි මහතා 2011 ජූලි මස කෙන්යාවේ මුම්බාසා හි පැවැත්වූ පලවෙනි අප්‍රිකානු තේ සම්මේලනය සහ FAO අන්තර් රාජ්‍ය ක්‍රියාකාරී කමිටුව සඳහා ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස සහභාගි විය. ඔහු කෙන්යාවේ තේ පර්යේෂණ පදනම සහ කෙන්යා තේ සංවර්ධන

නියෝජ්‍යායතනයට අයත් කුඩා තේ ඉඩම් සහ සමාගම් වතු අධ්‍යයනය සඳහා සංචාරය කරනු ලැබීය.

ආචාර්ය කේ එම් මොහොට්ටි මහතා 2011 නොවැම්බර් මස ඉන්දුනීසියාවේ බාලි හි පැවැත්වූ ඕසෝන වියනට හානි කරන ද්‍රව්‍ය පිළිබඳ මොන්ට්‍රියල් සම්මුතියට අයත් කණ්ඩායම් අතර රැස්වීමට සහ ඕසෝන වියන රැකගැනීම සම්බන්ධ වියානා සම්මුතියට අයත් කණ්ඩායම් අතර පැවැත්වුන නව වන රැස්වීමට සහභාගි විය. තේ කර්මාන්තයේ මීතයිල් බ්‍රෝමයිඩ් භාවිතය ඉවත්කර විකල්ප නව රසායන සහ රසායන නොවන ක්‍රම භාවිතයේ සාර්ථකත්වය පිළිබඳ තාක්ෂණික ඉදිරිපත් කිරීමක් ඔහු විසින් සිදු කරනු ලැබීය.

**ශාක අභිජනන අංශය**

**සම්මාන/ප්‍රදාන**

2011 වසරේදී කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ පැවැත්වූ 23 වන වාර්ෂික පර්යේෂණ සමුළුවේදී ශ්‍රී ලංකාවේ ජාන සංචිතය නිපදවන කළුතේ හි ගුණාත්මය පුරෝකථනය කිරීම සඳහා තෝරාගත් ජෛව රසායන සංඝටකයක් විශ්ලේෂණය යන මැයින් ඉදිරිපත් කල පර්යේෂණ පත්‍රිකාව සඳහා සමුළුවේ ජෛව රසායන හා ආහාර විද්‍යා අංශයේ හොඳම ඉදිරිපත් කිරීම සහ එම සමුළුවේ පශ්චාත් උපාධි ශිෂ්‍යයකු ඉදිරිපත් කල හොඳම පර්යේෂණ පත්‍රිකාව ලෙස සම්මානයට පාත්‍ර විය.

ශ්‍රී ලංකාවේ ජාන සංචිතයේ රසායන සංයුතිය සම්බන්ධව ජෛව රසායන අංශය හා එක්ව ජාතික පර්යේෂණ සභාවට ඉදිරිපත් කල පර්යේෂණ යෝජනාවලිය සඳහා රුපියල් මිලියන 9.3 ක මුල්‍ය ප්‍රදානයක් හිමිවූ අතර එම පර්යේෂණ කටයුතු සිදු කරගෙන යනු ලැබේ.

තේ පිරිසැකසුම් අංශය හා එක්ව ජෛව රසායන සහ අණුක සලකුණු භාවිතා කරමින් හොඳ ගුණාත්මයෙන් යුක්ත කළු තේ නිපදවීම සඳහා යෝග්‍ය ප්‍රභේදයන් තේ ජාන සංචිතය තුලින් තෝරා ගැනීමට නිර්ණායකයන් තෝරා සංවර්ධනය කරගැනීම සම්බන්ධ පර්යේෂණ යෝජනාවලියක් සහ රෝගයන්ට ප්‍රතිරෝධී තේ ප්‍රභේද නිපදවීම සඳහා විශේෂයන් අතර අභිජනනය හා කළල සුරක්ෂිත කරගැනීම සම්බන්ධව පර්යේෂණ යෝජනාවලියක් ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම යටතේ අවශ්‍ය අරමුදල් ලබා ගැනීම සඳහා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවට ඉදිරිපත් කල අතර එය අරමුදල් සැපයීම සඳහා තෝරා ගනු ලැබීය.

**ප්‍රකාශන**

ආරියරත්න එච් ඒ ඩී කේ, ගුණසේකර එම් ටී කේ , කොට්ටවආරච්චි ජේ ඩී, පාස්කරදේවන් ආර් ,රණවීර කේ කේ රත්නායක එම් සහ කුමාර ජේ බී ඩී ඒ ඩී 2011, ශ්‍රී ලංකාවේ තේ ශාක වල ප්‍රජනක ජෛව විද්‍යාත්මක තත්වයන්ට බලපාන රූපානු, කායික විද්‍යා සහ සෘතුමය ගුණාංග 181: 203-215

කොට්ටවආරච්චි ජේ ඩී,ගුණසේකර එම් ටී කේ. රණතුංග එම් ඒ බී. ජයසිංය එල් සහ

කරුණාගොඩ ආර් පී හොඳ ගුණාත්මයෙන් යුක්ත කළු තේ නිපදවීම සඳහා යෝග්‍ය ප්‍රභේදයන් ශ්‍රී ලංකාවේ ජාන සංයුතියක් තුලින් පුරෝකථනය කිරීම සඳහා තෝරා ගත් ජෛව රසායන සංඝටක විශ්ලේෂණය: Tropical Agriculture Research 23(1): 30-41

අබයපාල කේ එම් ආර් ඩී, ගුණසේකර එම් ටී කේ, රණවීර කේ කේ, රණතුංග එම් ඒ බී, සහ වීරසිංහ පී ඒ , 2011 කැමෙලියා සිනෙන්සිස් සහ කැමෙලියා සැසන්කුවා විශේෂ අතර අභිජනනයන් රැකගැනීමේ තාක්ෂණය: ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සභාවේ 67 වන වාර්ෂික සමුළුවේ වාර්තාව (SLAAS) පලමුවන කොටස 13 පිටු

පින්නගොඩ ඩී එම්, වික්‍රමසිංහ අයි වී, රණතුංග එම් ඒ බී, සහ ගුණසේකර එම් ටී කේ, 2011 තේ (කැමෙලියා සිනෙන්සිස්) අභිජනනයන් ඇගයීම සඳහා රූප විද්‍යාත්මක සහ අණුක සලකුණු භාවිතය කෘෂිකර්ම ජීව විද්‍යා දෙපාර්තමේන්තුවේ උපාධි අපේක්ෂක පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීම් වාර්තා : නො 2, 35-38

රණතුංග එම් ඒ බී,ගුණසේකර එම් ටී කේ, පින්නගොඩ ඩී එම්, වික්‍රමසිංහ අයි වී,2011 සාම්ප්‍රදායික තේ අභිජනන වැඩසටහන් සඳහා පරිපූරකයක් ලෙස ¾PD පදනම් කරගත් ජනිතයක් විශ්ලේෂණ ක්‍රම වේදයන් දියුණු කිරීම: කෘෂිකාර්මික ජෛව තාක්ෂණය පිළිබඳ ජාතික සමුළුවේ වාර්තාව (මුද්‍රණයේ පවතී)

**පොත් පරිච්ඡේදයන්**

ගුණසේකර එම් ටී කේ, ශ්‍රී ලංකාවේ තේ ශාකයේ (lefu,shd isfkkaisia එල්) අභිජනන කටයුතුහි ජයග්‍රහණයන්, අභියෝග සහ පර්යාලෝකයන්: ගෝලීය පුරා තේ අභිජනන කටයුතු: තේ ශාකය අභිජනනයේ ජයග්‍රහණයන්, අභියෝග සහ පර්යාලෝකයන් (සංස්කරණය: ලියැන්ග් චෙන් සහ ෂෙනෝ ඇපොස්ටොලිඩස්), GmbH

**අධ්‍යයන වැඩ සටහන්**

කේ කේ රණවීර පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ භෝග විද්‍යාව පිළිබඳ ඔහුගේ දර්ශනවේදී පශ්චාත් උපාධි කටයුතු සාර්ථකව අවසන් කරනු ලැබීය.

එම් ඒ බී රණතුංග පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් දර්ශනපති උපාධි කටයුතු ආරම්භ කරනු ලැබීය.

**තේ සැකසුම් තාක්‍ෂණ අංශය**

**ප්‍රකාශන**

දෙල්ගමුව ඩී පී කේ ආර් , බොතේජු ඩබ් එස්, අබේසිංහ ඩී ඩී, (2011) විවිධ ප්‍රමාණයන්ගේ තව් මැරීමට භාජනය කල තේ දෙකෙලවර ඇඳුම භාවිතා කර ඕතෝ රොටවේන් මගින් නිපදවූ විට ලැබෙන ප්‍රධාන තේ වර්ග ප්‍රතිශතය සහ ඇඹරූ තේ හි උෂ්නත්වය එහි ගුණාත්මයට ඇති කරන බලපෑම 2011

සැප්තැම්බර් 20-21, 11 වන කෘෂිකර්ම පර්යේෂණ සමුළුව.

**පාංශු සහ ශාක පෝෂණ අංශය**

ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම්

මහාචාර්ය ඒ එන් ජයකොඩි, ජ්‍යෙෂඨ පර්යේෂණ නිලධාරි, තේ වගා සඳහා පස උපයෝජනය පිළිබඳ ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය මගින් සිදුකල පර්යේෂණ අධ්‍යයනය පිළිබඳ විමර්ශණය මැයෙන් ඔහුගේ විමර්ශණ වාර්තාව පිළියෙල කර එය තේ පර්යේෂණායතනයට සහ තේ පර්යේෂණ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබීය.

මහාචාර්ය ඒ එන් ජයකොඩි, ජ්‍යෙෂධ පර්යේෂණ නිලධාරි පස සහ උපායමාර්ගික පර්යේෂණ සැලසුම් කෙරෙහි අවධානය යොමු කරමින් තේ කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා විවිධ දෘෂ්ඨිකෝණයන් මැයෙන් යුත් ඔහුගේ පර්යේෂණ වාර්තාව සකස් කර තේ පර්යේෂණායතනයට සහ තේ පර්යේෂණ මණ්ඩලය ඉදිරිපත් කරනු ලැබීය.

ලියනගේ එල් ආර් එම් සී, තානායම්වත්ත ඩී එම් පී එස්, ගුණරත්න පී පී, ජයකොඩි ඒ එන් 2011 ඔක්තෝබර් මාස 10-13 දිනයන්හි කොළඹ සිනමන් ලේක් හෝටලයේ පැවැත්වූ නැගෙනහිර සහ ගිණිකොණ දිග ආසියානු පාංශු විද්‍යා සන්ධියනයේ 10 වන අන්තර්ජාතික සම්මේලනය ප්‍රකාශයට පත්කල පසේ pH ස්වාරක්ෂක ධාරිතාව මත තේ වගා කරන පස් වර්ගීකරණය නැමැති පර්යේෂණ පත්‍රිකාව

පී පී ගුණරත්න, එල් ආර් එම් සී,ලියනගේ, මහාචාර්ය ඒ එන් ජයකොඩි, ඩබ් එම් එස් විජේතුංග එස් එම් දිසානායක, 2011 ඔක්තෝබර් මස 27-28 දිනයන්හි මහනුවර ටොපෑෂ් හෝටලයේ අන්තරජාතික පොටෑෂ් ආයතනය මගින් සංවිධානය කල තිරසාර අස්වැන්නක් සහ ගුණාත්මයෙන් පවත්නාගෙන යාම සඳහා පොටෑසියම් පෝෂකයේ ක්‍රියාකලාපය නැමැති අන්තර්ජාතික සමුළුවේ ප්‍රකාශනයට පත් කල ශ්‍රී ලංකාවේ තේ ඉඩම් වල පොටෑෂියම් සුලභතාවයට එම ඉඩම්වල තත්වයේ බලපෑම නැමැති පර්යේෂණ පත්‍රිකාව.

එම් ඒ සී ආර් පෙරේරා, පී පී ගුණරත්න, එම් එන් ප්‍රනාන්දුපුල්ලේ, එල් ආර් එම් සී,ලියනගේ (2011) මැග්නීසියම් ගතිකය මත ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රදේශයන්හි පස වර්ගීකරණය වයඹ විශ්ව විද්‍යාලයේ 11 වන කෘෂිකර්ම පර්යේෂණ සමුළුව.

## තේ ප ආ වතු

## ශාන්ත කුම්බ්ස් වත්ත - තලවාකැලේ

**වතු අධිකාරී**
යූ.සී.ඔලිවර් (අගෝස්තු 14 දක්වා)
ටී.එම්.එස්.කේ.තෙන්නකෝන් (අගෝස්තු 15 සිට)

**පොදු**

- වැවිලි කර්මාන්ත අමාත්‍ය , පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්ද සමරසිංහ මැතිතුමාගේ නියෝජිතයන් පිරිසක් අප්‍රේල් 22 දින ශාන්ත කුම්බස්හි නිරීක්ෂණ චාරිකාවක යෙදුන අතර ඔවුන්ගේ අරමුණ වූයේ උඩරට තේ නිෂ්පාදනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව හැදෑරීමයි.

- ශාන්ත කුම්බස් වත්තේ නිරීක්ෂණ නියෝජිත ලෙස කටයුතු කරන මහේන් මඩුගල්ල මහතා මාර්තු 15 වන දින වතුයාය නිරීක්ෂණය කළ අතර එහිදී වතුයායේ නිෂ්පාදන ඵලදායිතාවය හා ලාභ ඉපැයීම් වැඩි දියුණු කර ගැනීම සඳහා පසුබිම් වන ක්ෂේත්‍ර හා කෘෂිකාර්මික වත් පිළිවෙත් පිළිබඳව විශේෂඥඋපදේශන ලබා දෙන ලදී.

- මෙතෙක් ශාන්ත කුම්බස් වත්තේ තැරැව්කරුවන් ලෙස කටයුතු කළ ෆෝබ්ස් සහ වෝකර් පුද්. සමාගම , මෙම වසර පුරාවටද ශාන්ත කුම්බස් නිමි තේ කොළඹ වෙන්දේසියේ විකිණීමට කටයුතු කරන ලදී.

- යූ.සී.ඔලිවර් මහතා 2011 මැයි 18 දින ශාන්ත කුම්බස් වතු අධිකාරී තනතුරෙන් ඉල්ලා අස්වූ අතර, මැයි 18 සිට අගෝස්තු 14 දක්වා වැඩ බලන වතු අධිකාරිවරයා වශයෙන් සේවය කළේය.

- ශාන්ත කුම්බස් වත්තේ නව වතු අධිකාරිවරයා වශයෙන් ටී.එම්.එස්.කේ.තෙන්නකෝන් මහතා 2011 අගෝස්තු 15 දින වැඩ භාර ගන්නා ලදී.

- දෛනික වැටුප මත දිගුකලක් මෙම වත්තේ සේවය කළ පහත නම් සඳහන් මහත්ම මහත්මීන් තම දැරූ නිලතලවල 2011 ජනවාරි මස 1 වනදා සිට ස්ථිර කරන ලදී.

| | | |
|---|---|---|
| 1 | කේ රාජ්කුමාර් මහතා | කනිෂ්ඨ සහකාර ලිපිකරු |
| 2 | පී සෙල්වේන්ද්‍රන් මහතා | කනිෂ්ඨ සහකාර ක්ෂේත්‍ර නිළධාරී |
| 3 | එස් සිවන් මහතා | කර්මාන්ත ශාලා කාර්මික ශිල්පී |
| 4 | කේ ජෝති මහත්මිය | ළමා උයන් පාලිකා |
| 5 | ටී පොන්මනී මහත්මිය | ළමා උයන් පාලිකා |

2010 වර්ෂයට සමගාමීව 2011 වර්ෂයේ තේ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය හා වතුයායේ අස්වැන්න පහත දක්වා ඇත.

| | 2011 | | 2010 | |
|---|---|---|---|---|
| | නිමි තේ (කි.ග්) | අස්වැන්න(හෙක්.කි) | නිමි තේ (කි.ග්) | අස්වැන්න(හෙක්.කි) |
| ශාන්ත කුම්බස් | 205,155 | 2,573 | 165,668 | 2,052 |
| ලැමලියර් | 103,350 | 2,221 | 92,250 | 1,940 |
| එකතුව | 308,505 | 2,444 | 257,918 | 2,011 |
| මිලදී ගත් දළු | 35,626 | - | 7,007 | - |
| මුළු එකතුව | 344,131 | 2,444 | 264,925 | 2,011 |

ඉහත දක්වා ඇති වගුවට අනුව 2011 වර්ෂයේ හෙක්ටාරයකට නිමි තේ කිලෝ 2,444 ලෙස වාර්තා විය.

## සංවර්ධන ක්‍රියාකාරකම්

- ශාන්ත කුම්බස් හා ලැමලියර් කොටස්වල හෙක්ටයාර 2.00 ක භූමි ප්‍රමාණයක පැරණි බීජ තේ ගලවා නැවත තේ වගා කිරීම සඳහා බිම් සකස් කරන ලදී.
- සකස් කරන ලද හෙක්ටයාර 2.00 ක භූමි ප්‍රමාණයක, තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශිත ක්ලෝන වගා කරන ලදී.

## ආසියානු සංවර්ධන බැංකු මව්ශාක වගා ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ නිර්දේශිත 3000 සහ 4000 ශ්‍රේණිවල රිකිලි තේ අතු 798,278 ක් කුඩා තේ වතු හිමියන් වෙත හා වාණිජ වැවිලි සමාගම් වෙත නිකුත් කරන ලද අතර එම වර්ෂයේදී මෙම මව්ශාක වගා ව්‍යාපෘතිය මඟින් රු. 901,852.63 ක ශුද්ධ ලාභයක් පෙන්නුම් කරන ලදී.

## තේ කර්මාන්ත ශාලාව හා නිෂ්පාදනය

ලාභ ඉපයීම හා නිෂ්පාදනය කිරීමේ හැකියාව මත , කුඩා තේ වතු සමාගම්වලින් අමු තේ දළු මිලදී ගැනීමේ ක්‍රියාකාරිත්වයෙහි මනා දියුණුවක් පෙන්නුම් කරන ලද අතර එයින් නිමිතේ කිලෝ 35,626ක් නිෂ්පාදනය කරන ලදී. එම වර්ෂයේදී ඒ සඳහා රු. 2,924,538.34 ක ශුද්ධ ලාභයක් පෙන්නුම් කරන ලදී.
මෙය ශාන්ත කුම්බස් ඉතිහාසයේ වැඩිම මිලදී ගත් දළු නිෂ්පාදනය කළ අවස්ථාව විය.

නව තේ දළු වල තත්ත්වය වැඩි දියුණු වීම සහ තේ කර්මාන්ත ශාලාවේ සංවර්ධනයන් වල ප්‍රතිඵලයක් ලෙස ශාන්ත කුම්බස් වෙළඳ නාමය මුහුදු මට්ටමේ සිට පිහිටීම අනුව බටහිර උස්බිම් වැවිලි - නානුඔය / ලිඳුල / තලවාකැලේ දිස්ත්‍රික්ක අනුව වන කාණ්ඩය යටතේ ,2011 වර්ෂයේදිද 3 වන ස්ථානයට පත්විය

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතන විද්‍යාඥයන්ගේ සහය මත විශේෂිත ආකාරයේ තේ වර්ග 3 ක් 'ශාන්ත කුම්බස්' වෙළඳ නාමය යටතේ කොළඹ තේ වෙන්දේසියේ විකිණීමට කටයුතු කරන ලදී. ඒවා නම්,

| | |
|---|---|
| ගෝල්ඩන් ටිප්ස් | 18,000.00 |
| වයිට් ටී | 15,000.00 |
| සිල්වර් ටිප්ස් | 13,000.00 |

මෙම තේ වලට ලබාගත් ඉහළ මිල ගණන් නිසා ශාන්ත කුම්බස් වත්තේ දළ විකුණුම් සාමාන්‍යයය බොහෝ ලෙස වැඩිවිය.

2011 වසර සඳහා ශාන්ත කුම්බස් දළ විකුණුම් සාමාන්‍යයය රු.419.92 ක් වූ අතර එය බටහිර උස්බිම් වැවිලි කාණ්ඩය යටතේ පිහිටීම අනුව විකුණුම් සාමාන්‍යයයට වඩා රු. 79.65 ක වර්ධනයකි.

**කාරක ආදායම්**

අදාල වසර තුළ රු. 2,189,186.62 ශුද්ධ ලාභයක් ලබා ගන්නා ලදී.

## ශාන්ත ජෝකිම් වත්ත - රත්නපුර

පී.එස් හබරගොඩ

වෘ අධිකාරි

සාමාන්‍ය සටහන්

- ෆෝබ්ස් සහ වෝකර් වෙළඳ සමාගම හා බාට්ලීට් වෙළඳ සමාගම යන තැරැව්කාර සමාගම් විසින් ශාන්ත ජෝකිම් තේ වෙළඳ කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යනු ලබයි,

- 2010 වර්ෂය තුල තේ කර්මාන්ත ශාලාවේ පහත සඳහන් සංවර්ධන කටයුතු සිදු කරන ලදී.

I. තේ දළු ඇඹරුම් යන්ත්‍ර අංක 1 ක 5 සහ 3 හි මේසය නැවත සවිකිරීම සිදුකරන ලද අතර අලුත් කෝන 2ක් සවිකිරීමද සිදුකරන ලදී.

II. ' රෝල් බ්‍රේකර් යන්ත්‍ර සඳහා අලුත් දැල් සවිකිරීම සිදුකරන ලදී.

III' භාවිතයෙන් ඉවත් කරන ලද හියුමිඩිෆයර් යන්ත්‍රයෙහි මෝටරය අලුත් වැඩියා කර නැවත භාවිතයට ගන්නා ලදී.

IV. 2/3ටී ස්ට්‍රෝක් එක්ස්ට්‍රැක්ටර් නටු අහුලන යන්ත්‍රය වෙළඳ නියෝජිත ආයතනය මගින් අලුත් වැඩියා කරන ලදී.

V. ෆයිබර් මැට් යන්ත්‍රය සහ තේ වර්ග කිරීමේ අංශයේ මිඩිල්ටන් චෝටා ෂි.ෆ්ටර්, මිච් ෂි.ෆ්ටර්,යන්ත්‍ර අලුත් වැඩියා කරන ලදී.

VI. වර්ෂ කිහිපයකට පසුව ස්ප්‍රින්ක්ලර් යන්ත්‍රය අලුත් වැඩියා කරන ලද අතර දෝෂ සහිති විදුලි වයර් පද්ධතිය ආදිය අලුත් වැඩියා කරන ලදී.

VII. කලර්සෝටර් යන්ත්‍රය පරීක්ෂාකර අලුත් වැඩියා කරන ලදී.

VIII.ඇල්පෙක්ස් ආයතනය මඟින් ගිණි නිවන උපකරණ පරීක්ෂා කර අවශ්‍ය අලුත් වැඩියා කටයුතු සිදුකරන ලදී.

I×. අලුත් ලොරි රථයක් මිලදී ගන්නා ලදී.

×. බාහිර පරීක්ෂක නිමල් එම්. අමරසේකර මහතා 2011-09-31 වන

දින  ශාන්ත ජෝකිම් වත්තේ නිරීක්ෂණ චාරිකාවක යෙදීම සිදුකරන ලද අතර තේ ක්ෂේත්‍ර පරික්ෂා කරන ලදී. එසේම නිෂ්පාදන ධාරිතාවය හා ආයතනයේ ලාභය වැඩිකර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ඔහු විසින් ලබා දෙන ලදී.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් පිරිනමන ලබන තත්ව සහතික ලාභියෙකු වීමේ අවස්ථාව අප ආයතනය හිමි කරගත් අතර 2011 දෙසැම්බර් මස 27 වන සිට අවුරුදු 03 ක් සඳහා එම තත්ත්ව සහතිකය වලංගුව ඇත.

## 2011 දෙසැම්බර් 31 දිනට භූමි ප්‍රමාණය (හෙක්ටාර්)

| | භූමිප්‍රමාණය (හෙක්ටාර්) |
|---|---|
| රිකිලි තේ වගා භූමි ප්‍රමාණය | 46.34 |
| පාළු සිටුවන තේ බිම් (ක්ෂේත්‍ර අංක 2 එෆ්) | 1.18 |
| පාළු සිටවන තේ බිම් (ක්ෂේත්‍ර අංක 8 ඒ) | 0.50 |
| තේ පර්යේෂණායතනයේ පොල් වගා බිම් | 3.89 |
| වාණිජ්‍ය පැල තවාන් බිම | 1.58 |
| රබර් වගා බිම් | 7.12 |
| පරිණත රබර් වගා බිම් | 5.68 |
| කුඹුරු | 8.74 |
| මව් ශාඛා ව්‍යාප්ති ක්ෂේත්‍ර බිම්(ආසියා සංවර්ධන මව් ශාඛා ව්‍යාප්ති බිම්) | 30.00 |
| තේ පර්යේෂණායතනයේ ගොඩනැගිලි හා පරීක්ෂණාත්මක ක්ෂේත්‍ර සහිත බිම් | 11.02 |
| ගොඩනැගිලිල මං මාවත් ලඳු කැලෑ සහ පතන | 25.93 |
| එකතුව | 141.98 |

## ඵලදාව හා අස්වැන්න ( නිමි තේ කිලෝ ප්‍රමාණය)-

පසුගිය වසරට සාපේක්ෂව 2011 වර්ෂයේ නිමි තේ නිෂ්පාදනය ඵලදාව

| වර්ගය | 2011 | 2010 | වෙනස |
|---|---|---|---|
| තේ | | | |
| ශාන්ත ජෝකීම් තේ නිෂ්පාදනය | 46427 | 46991 | -564 |
| මිලදී ගන්නා ලද තේ නිෂ්පාදනය | 349861 | 449766 | -99905 |
| එකතුව | 396288 | 496757 | |

| | 2011 | | 2010 | | වෙනස | |
|---|---|---|---|---|---|---|
| | අස්වැන්න (කිලෝ) | හෙක්ටාර්1ක අස්වැන්න | අස්වැන්න (කිලෝ) | හෙක්ටාර් 1ක අස්වැන්න | | |
| රබර් | 12960 | 1138 | 9047 | 838 | +3913 | +300 |

## තේ වගා කෘෂිකාර්මික ක්‍රියාකාරකම්.

සාමන්‍ය තේ වගා කාෂිකාර්මික කටයුතු සිදුකරගෙන යන ලද අතර කප්පාදු කරන ලද ක්ෂේත්‍රයන්හි නෙර දෙකක් අතර පරතරයට කොම්පෝස්ට් කිරීම සඳහා කානුකැපීම හා කප්පාදුකොටස් වැලලීම සිදුකරන ලදී.

## පාළු සිටුවීම

ක්ෂේත්‍ර අංක 04 හි පාළු සිටුවීම සිදුකරන ලද අතර එහි පැල 15350 ක් සිටුවන ලදී. එසේම ක්ෂේත්‍ර අංක 03 හි නව වගා කටයුතු සිදුකරන ලද අතර එහි පැල 8000 ක් සිටුවන ලදී.

## ආසියා සංවර්ධන මව් ශබා ව්‍යාප්ති වැඩසටහන.

කුඩා තේ වතු හිමියන් හා වැවිලි සමාගම් සඳහා රිකිලි තේ අතු 287,445 ක ප්‍රමාණයක් නිකුත් කර ඇති අතර 2010 වර්ෂයේ නිකුත් කරන ලද අතු ප්‍රමාණය 370,050 ක් විය'

## කර්මාන්තශාලා නිෂ්පාදන ශුද්ධ මිල ගනන්.

2010 වර්ෂයේදී 378.14 ක් වූ තේ කිලෝවක ශුද්ධ අලෙවි මිළ 2011 වර්ෂයේදී 371.62 විය .

## දළු මිළට ගැනීම.

2010 වර්ෂයට සාපේක්ෂව දලු කිලෝ 99905 ක පහත වැටීමක් සිදුවී ඇති අතර ගැමිදිරිය ආයතනය විසින් දලු සැපයීම අත්හිටුවීම හේතුවෙන් මිලට ගනුලබන දලු ප්‍රමාණයන්හි පහත වැටීමක් 2011 වර්ෂය තුල සිදුවිය.

## කාළගුණය හා වර්ෂාපතනය.

2011 වර්ෂය තුළ වර්ෂාපතනය මි.මි 3583 ලෙස වර්තා වූ අතර දින 148 ක් ආර්ද්‍රතාවය සහිත දින ලෙස වාර්ථා විය. 2010 වර්ෂයේ වර්ෂාපතනය 4968 මි.මි ලෙස සටහන්ව ඇති අතර ආර්ද්‍රතා දින 184 ලෙස සටහන්ව ඇත.

## වෙළඳ ප්‍රතිඑල

පසුගිය වර්ෂයේ රු 1"133"766$- ක් වූ ලාභය 2011 වර්ෂයේ දෙසැම්බර් මස 31

## පරිපාලන හා මූල්‍ය

**සුවිශේෂ කඩයිම්**

- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වැඩිදියුණු කරන ලද වෙබ් අඩවිය වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මැතිතුමාගේත් එම අමාත්‍යාංශ ලේකම් ගරු මාලිනී පීරිස් මැතිනියගේ හා අනෙකුත් ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගේත් සහභාගිත්වයෙන් 2011 ජූලි මස 11 වැනි දින වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී උත්සවාකාරයෙන් එළි දක්වන ලදී.

- ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයේ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අංක 30 හා 30 (1) දරණ චක්‍රලේඛන උපදෙස් හා මගපෙන්වීම මත ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සඳහා විශේෂිත නව බඳවාගැනීමේ ක්‍රියාපටිපාටියක් හඳුන්වා දුන් අතර එමගින් කර්මාන්තයේ ඇති වන්නා වූ ගැටළු කාර්යක්ෂම හා සඵලදායි ලෙස විසඳාගැනීමටත් මානව සම්පත් සංවර්ධනය කිරීමටත් අවැසි අවධානය යොමු කරන ලදී. අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අවසරය 2011 සැප්තැම්බර් මස 16 වන දින සිට ලබාදෙන ලදී.

- ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ 65 වැනි ජන්ම දිනය සහ දෙවන පදවිප්‍රාප්තිය ආරම්භ වීම සමරා පරිසර අමාත්‍යාංශයේ දැයට සෙවන" රුක් රෝපණ වැඩසටහන යටතේ පැල මිලියන 1.1 ක් රෝපණය කිරීමේ ව්‍යාපෘතිය හා අනුබද්ධ වෙමින් 2011 නොවැම්බර් මස 15 වන දින ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ තලවාකැලේ පිහිටි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

**මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් හා විදේශීය පුහුණු/වැඩමුළු/සම්මන්ත්‍රණ**

- ශ්‍රී ලංකාවේ ෆාම්තෙල් නිෂ්පාදන කටයුතු වැඩිදියුණු කිරීමේ අදහසින් ඉන්දුනීසියානු රජය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මැතිතුමා ප්‍රමුඛ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් කණ්ඩායමක් 2011 ජනවාරි මස 02 - 04 වන දින දක්වා ඉන්දුනීසියාවේ නිල සංචාරයක යෙදුන අතර එම රාජ්‍යතාන්ත්‍රික නිලධාරී මඩුල්ලේ ප්‍රධාන සාමාජිකයෙකු ලෙස තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති ආචාර්ය එස් එස් බී ඩී ජී ජයවර්ධන මහතා සහභාගි වන ලදී.

    - වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මැතිතුමාගේ මූලිකත්වයෙන් 2011 ජනවාරි මස 11 - 21 වන දින දක්වා ජපන් රජය හා එරට වෙළඳ සංවිධාන සමග නව සංවර්ධන ව්‍යාපෘතීන් සහ තේ ප්‍රවර්ධන කටයුතු ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ජපානයේදී පැවැත් වූ රාජ්‍යතාන්ත්‍රික සාකච්ඡා සඳහා සහභාගි වූ නිලධාරී කණ්ඩායමේ ප්‍රධාන සාමාජිකයෙකු ලෙස තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති ආචාර්ය එස් එස් බී ඩී ජී ජයවර්ධන මහතා සහභාගි වන ලදී.

    - 2011 මාර්තු මස 09 - 15 දින දක්වා ඉන්දියාවේ සිල්ගුරි හිදී පැවැති තේ සඳහා වූ ජාතික සම්මන්ත්‍රණයේ ආරාධිත දේශකයානන් ලෙස ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය අයි එස් බී අබේසිංහ මහතා සහභාගි වන ලදී.

    - 2011 මැයි මස 11 - ජූලි මස 15 වන දින දක්වා චීනයේ පැවති සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පරිසර දූෂණයෙන් තොර තේ නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාවට ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ පිරිසැකසුම් තාක්ෂණ අංශයේ අත්හදා බැලීමේ නිලධාරී එම් එම් ඒ යූ බී මාරපන මහතා සහභාගි වන ලදී.

    - වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මැතිතුමාගේ මූලිකත්වයෙන් 2011 ජූනි මස 21 - 27 දින දක්වා ජර්මනියේ පැවති තේ ප්‍රවර්ධනය ශක්තිමත් කිරීමේ වැඩසටහන් හා සැකසූ තේ වල උපරිම අවශේෂ සීමා පිළිබඳ ජර්මානු තේ සංගමය සහ උපදේශන සභාව සමග පැවති රාජතාන්ත්‍රික සාකච්ඡා සඳහා සහභාගි වූ නිලධාරී කණ්ඩායමේ ප්‍රධාන සාමාජිකයෙකු ලෙස තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති ආචාර්ය එස් එස් බී ඩී ජී ජයවර්ධන මහතා සහභාගි විය.

- 2011 ජූලි මස 18 - 22 දින දක්වා කෙන්යාවේ පැවති 19 වන FAO/IGG රැස්වීම හා පළමු වන අප්‍රිකානු තේ නියෝජිතයින්ගේ රැස්වීම සඳහා තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති ආචාර්ය එස් එස් බී ඩී ජී ජයවර්ධන මහතා හා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ කීටවිද්‍යා අංශ ප්‍රධානී ආචාර්ය කේ එම් මොහොට්ටි මහතා සහභාගි වූහ.

- 2011 සැප්තැම්බර් මස 01 - ඔක්තෝම්බර් මස 31 වන දින දක්වා ඉන්දියාවේ කෝතාරි කෘෂිකාර්මික කළමනාකරණ මධ්‍යස්ථානයේ පැවති තේ වගා කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පුහුණු පාඨමාලාවට ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ශාක අභිජනන අංශයේ අත්හදා බැලීමේ නිලධාරී කේ කේ රණවීර මහතා සහභාගි වන ලදී.

- 2011 ඔක්තෝම්බර් මස 17 - නොවැම්බර් මස 07 වන දින දක්වා චීනයේ ජිනාන් හි පැවති කෘෂිකාර්මික යාන්ත්‍රෝපකරණ පිළිබඳ පරිපූර්ණ හා ප්‍රායෝගික ශිල්පීය ක්‍රම සඳහා වූ පුහුණු පාඨමාලාවට ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ශෂ්‍ය විද්‍යා අංශයේ පර්යේෂණ සහකාර එස් ආර් ඩබ් පතිරණගේ මහතා සහභාගි වන ලදී.

- 2011 ඔක්තෝම්බර් මස 25 - 29 වන දින දක්වා චීන තායිපේ හිදී පැවති කෘෂිකාර්මික ජෛව රසායන හා ජෛව සුරක්ෂිතභාවය පිළිබඳ විශේෂඥඋපදේශන හමුවට ආරාධිත විද්‍යාඥවරියක් ලෙස ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ශාක අභිජනන අංශ ප්‍රධානී ආචාර්ය එම් ටී කේ ගුණසේකර මිය සහභාගි වූවාය.

- 2011 නොවැම්බර් මස 16 - 25 වන දින දක්වා දකුණු ඉන්දියාවේ එක්සත් වැවිලිකරුවන්ගේ සංගමය හා තෝරාගත් දකුණු ඉන්දියානු තේ වතු නිරීක්ෂණය කිරීමේ සංචාරය සහ ජොහාට් හි ටෙකොලායි පර්යේෂණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද ලෝක තේ සම්මේලනය නියෝජනය කරමින් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ශාක අභිජනන අංශ ප්‍රධානී ආචාර්ය එම් ටී කේ ගුණසේකර මිය, පාංශු හා ශාක පෝෂණ විද්‍යා අංශ ප්‍රධානී ආචාර්ය ජී ජී ගුණරත්න මහතා, උපදෙස් හා ව්‍යාප්ති අංශ ප්‍රධානී බී ඒ ඩී සමන්සිරි මහතා හා ශෂ්‍ය විද්‍යා අංශයේ ප්‍රධාන පර්යේෂණ නිලධාරී ආචාර්ය එම් ඒ විජේරත්න මහතා ද ඊට සහභාගි වූහ.

- 2011 නොවැම්බර් මස 21 - 25 වන දින දක්වා ඉන්දියාවේ ජොහාට් හි ටෙකොලායි පර්යේෂණ මධ්‍යස්ථානයේදී පැවති ලෝක තේ සම්මේලනය සඳහා තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය අයි එස් බී අබේසිංහ මහතා සහභාගි වන ලදී.

- 2011 නොවැම්බර් මස 21 - 25 වන දින දක්වා ඉන්දුනීසියාවේ බාලි හි පැවති මොන්ට්‍රියෙල් මුල් කෙටුම්පතෙහි පාර්ශවකරුවන් සඳහා වූ සම්මන්ත්‍රණයට ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ කීටවිද්‍යා හා වටපණු විද්‍යාවේදී අංශ ප්‍රධානී ආචාර්ය කේ එම් මොහොට්ටි මහතා සහභාගි වන ලදී.

- 2011 දෙසැම්බර් මස 4 - 21 වන දින දක්වා චීනයේ ගුඇන්ශූ හි පැවති ශාක විෂ (Allelopathy) පිළිබඳ 06 වන ලෝක සම්මන්ත්‍රණය නියෝජනය කරමින් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ශෂ්‍ය විද්‍යා අංශ ප්‍රධානී අචාර්ය කේ ජී ප්‍රේමතිලක මහතා සහභාගි වන ලදී.

## සේවක බලගැන්වීම් සහ අභිප්‍රේරණය

### (අ) සේවක බඳවාගැනීම්

| නම | තනතුර | පත්වීම් ලද දිනය |
|---|---|---|
| 1. කේ ජේ සී ජේ රොද්‍රිගෝ | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) | 01.02.2011 |
| 2. ආර් එම් ආර් ආර් එල් රණරාජා | නේවාසික ඉංජිනේරු | 02.05.2011 |
| 3. ටී එස් කුමාර | ගිණුම් ලිපිකරු | 16.05.2011 |
| 4. වී ඊ කුමාර | ගිණුම් ලිපිකරු | 16.05.2011 |
| 5. ඒ ඒ එච් චින්තක | ලිපිකරු/යතුරු ලේඛක | 16.05.2011 |
| 6. ආර් ඒ සී ලසන්ත | ලිපිකරු/යතුරු ලේඛක | 16.05.2011 |
| 7. එස් ඒ සී සුරවීර | රියදුරු | 16.05.2011 |
| 8. එම් ඩී චන්දන | රියදුරු | 16.05.2011 |
| 9. ටී කේ ඒ කුමාරසිංහ | රියදුරු | 16.05.2011 |
| 10. එච් ඒ ඩී නිරංජන් | රියදුරු | 16.05.2011 |
| 11. කේ එම් ටී ටී බණ්ඩාර | රියදුරු | 16.05.2011 |
| 12. ජේ එස් එන් ජයමොහාන් | රියදුරු(ශාන්ත ජෝකිම්) | 16.05.2011 |
| 13. ඩබ් ඒ ඒ එච් ශාමක | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |
| 14. ඊ පී ඒ විජේවර්ධන | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |
| 15. කේ ඒ එස් ඒ රූපසිංහ | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |
| 16. සී ඩී ජයසිංහ | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |
| 17. බී එම් එන් ජේ බස්නායක | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |
| 18. ආර් ඒ අයි ඩබ් කේ රණතුංග | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |
| 19. ඩී වී ආර් අයි දෙනියපහල | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |
| 20. එම් ජී එන් ජේ කුමාර | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |
| 21. ආර් එම් ඊ එම් කේ රන්දෙනිය | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |
| 22. ඒ වී කේ එස් පෙරේරා | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |

| | | |
|---|---|---|
| 23. එස් එම් ඩී ඩී සමරකෝන් | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |
| 24. එම් ඩී කේ එස් තිලකසිරි | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |
| 25. ඩී කේ ඩී දිසානායක | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |
| 26. ජී ඩබ් එම් එස් එන් ගුණසේකර | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |
| 27. ඊ එන් යූ එදිරිසිංහ | තාක්ෂණ නිලධාරී | 01.08.2011 |
| 28. ඩී එල් ඒ එල් ඒ දසනායක | පර්යේෂණ නිලධාරී | 01.08.2011 |
| 29. එච් ආර් එම් පී අබේරත්න | පර්යේෂණ නිලධාරී | 01.08.2011 |
| 30. ආචාර්ය ඩබ් එස් බොතේජු | අංශ ප්‍රධානී, පිරිසැකසුම් තාක්ෂණ | 01.08.2011 |
| 31. ආචාර්ය ජී පී ගුණරත්න | අංශ ප්‍රධානී, පාංශු සහ ශාක පෝෂණ | 01.08.2011 |
| 32. ටී එම් එස් කේ තෙන්නකෝන් | වතු අධිකාරී (ශාන්ත කූම්බස් වත්ත) | 15.08.2011 |
| 33. එස් පරමේස්වරි | පොදු සේවක | 01.10.2011 |
| 34. කේ රාජරත්නම් | පොදු සේවක | 01.10.2011 |
| 35. ජී එස් රාජු | පොදු සේවක | 01.10.2011 |
| 36. වී සභාරත්නම් | පොදු සේවක | 01.10.2011 |
| 37. වී චන්ද්‍රසේකරන් | පොදු සේවක | 01.10.2011 |
| 38. වී රාධාක්‍රිෂ්ණන් | පොදු සේවක | 01.10.2011 |
| 39. ඒ ක්‍රිෂ්ණමෙනන් | පොදු සේවක | 01.10.2011 |
| 40. කේ එම් එස් කේ කොඩිතුවක්කු | පොදු සේවක | 01.10.2011 |
| 41. ජී පෙරියසාමි | පොදු සේවක | 01.10.2011 |
| 42. කේ ජයරත්නම් | පොදු සේවක | 01.10.2011 |
| 43. ඩී සිල්වෙස්ටර් | පොදු සේවක | 01.10.2011 |
| 44. ඒ ලෝගනාතන් | පොදු සේවක | 01.10.2011 |
| 45. එල් ආර් රාජලිංගම් | පොදු සේවක | 01.10.2011 |
| 46. එන් පුෂ්පරාජ් | පොදු සේවක | 01.10.2011 |
| 47. ඩබ් සී පෝල් | පොදු සේවක | 01.10.2011 |
| 48. ජේ අන්තෝනි | පොදු සේවක | 01.10.2011 |
| 49. පී සෙල්වරාජ් | පොදු සේවක | 01.10.2011 |
| 50. ඩබ් එම් එස් ජේ වීරසිංහ | පොදු සේවක | 01.10.2011 |
| 51. එච් එම් විජේසේකර | පොදු සේවක | 01.10.2011 |

| | | |
|---|---|---|
| 52. පී සෙල්ලදුරෙයි | පොදු සේවක | 01.10.2011 |
| 53. පී වෛතිලිංගම් පිල්ලෙයි | පොදු සේවක | 01.10.2011 |
| 54. එස් බාලක්‍රිෂ්ණන් | පොදු සේවක | 01.10.2011 |
| 55. ආර් ඉලංගෝවන් | පොදු සේවක | 01.10.2011 |
| 56. එන් සිවසුබ්‍රමනියම් | පොදු සේවක | 01.10.2011 |
| 57. එස් හෙට්ටිආරච්චි | පොදු සේවක | 01.10.2011 |
| 58. අයි පී එස් ඩී වික්‍රමසූරිය | තාක්ෂණ නිලධාරී | 01.11.2011 |

**(ආ) උසස් වීම්**

| | **නම** | **තනතුර** | **දිනය** |
|---|---|---|---|
| 1. | ඩබ් එම් එස් විජේතුංග | පර්යේෂණ නිලධාරී | 01.08.2011 |
| 2. | ආර් ඩී පී සේනානායක | පර්යේෂණ නිලධාරී | 01.08.2011 |

**(ඇ) සේවයෙන් ඉවත්වීම්**

| | **නම** | **තනතුර** | **දිනය** |
|---|---|---|---|
| 1. | ආර් පී ද සිල්වා විජේරත්න | ලිපිකරු/ලඝු ලේඛිකා | 01.01.2011 |
| 2. | ආර් එම් ඩී ටී පල්ලේමුල්ල | පර්යේෂණ නිලධාරී | 07.01.2011 |
| 3. | එච් ඒ සී කේ ආරියරත්න | පර්යේෂණ සහකාර | 07.03.2011 |
| 4. | යූ සී ඔලිවර් | වතු අධිකාරී (ශාන්ත කුම්බස් වත්ත) | 18.05.2011 |
| 5. | පී ජී සී ප්‍රියන්ත | අත්හදා බැලීමේ නිලධාරී | 01.07.2011 |
| 6. | පී එම් එම් ජයතිලක | අත්හදා බැලීමේ නිලධාරී | 30.06.2011 |
| 7. | පී කේ පී මුතුකුමාරන | අත්හදා බැලීමේ නිලධාරී | 14.09.2011 |
| 8. | කේ බී එම් ශ්‍රීපාලිකා | අත්හදා බැලීමේ නිලධාරී | 02.10.2011 |

(ඈ) විශ්‍රාම ගැනීම්

| | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 1. | කේ ජී පියසේන | මහජන සම්බන්ධතා හා සුබසාධක නිලධාරී | 16.01.2011 |
| 2. | එස් කරුපයියා | දුරකථන රැහැන්කරු | 18.02.2011 |
| 3. | ජේ එම් ජෝතිපාල | පෙදරේරු | 05.05.2011 |
| 4. | ජේ ජයසුන්දර | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | 05.06.2011 |
| 5. | ඩී එම් ආර් දිසානායක | ගණකාධිකාරී | 02.07.2011 |
| 6. | කේ ඩී දහනායක | ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී | 23.09.2011 |
| 8. | ආර් එම් කේ ඩයස් | නේවාසිකාගාර භාරකරු | 06.10.2011 |
| 9. | වී පහලගේ | ගිණුම් ලිපිකරු | 01.11.2011 |
| 10. | ජී ජී ඊ එච් ගමගේ | ප්‍රධාන යාන්ත්‍රික කාර්මික | 05.11.2011 |
| 11. | එම් ජී වීරතිලක | මුදල් අයකැමි | 23.12.2011 |

(ඉ) මාරුකිරීම්

| | නම සහ තනතුර | මාරුවීම් ලද ස්ථානය | දිනය |
|---|---|---|---|
| 1. | ටී ජී එන් මහින්ද<br>උපදේශක නිලධාරී | මතුගම ව්‍යාප්ති මධ්‍යස්ථානයේ සිට<br>පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය වෙත | 01.09.2011 |
| 2. | පී වී ඒ ආර් අබේසේකර<br>අත්හදා බැලීමේ නිලධාරී | මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ සිට<br>ප්‍රධාන කාර්යාලය වෙත | 01.09.2011 |
| 3. | පී කේ ආර් සී ඊ මුනසිංහ<br>ව්‍යාප්ති නිලධාරී | දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානයේ සිට<br>මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය වෙත | 01.09.2011 |
| 4. | කේ එම් ටී ටී බණ්ඩාර<br>රියදුරු | ප්‍රධාන කාර්යාලයේ සිට<br>මතුගම ව්‍යාප්ති මධ්‍යස්ථානය වෙත | 01.09.2011 |
| 5. | එච් අයි මෙත්තානන්ද<br>රියදුරු | ගාල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානයේ සිට<br>ප්‍රධාන කාර්යාලය වෙත | 01.09.2011 |

| | | | |
|---|---|---|---|
| 6. | ජී ජී එම් රණසිංහ<br>රියදුරු | මතුගම ව්‍යාප්ති මධ්‍යස්ථානයේ සිට<br>මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය වෙත | 01.09.2011 |
| 7. | එස් ඒ සී සුරවීර<br>රියදුරු | ප්‍රධාන කාර්යාලයේ සිට<br>ගාල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානය වෙත | 01.09.2011 |
| 8. | ටී කේ ඒ කුමාරසිංහ<br>රියදුරු | ප්‍රධාන කාර්යාලයේ සිට<br>ගාල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානය වෙත | 01.09.2011 |
| 9. | කේ පී ජේ පී මහින්දපාල<br>උපදේශක නිලධාරී | පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ සිට<br>ගාල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානය වෙත | 26.09.2011 |
| 10. | එච් ජයවීර<br>ව්‍යාප්ති නිලධාරී | ප්‍රධාන කාර්යාලයේ සිට<br>මතුගම ව්‍යාප්ති මධ්‍යස්ථානය වෙත | 26.09.2011 |
| 11. | එස් පී ඩී තරංග<br>රියදුරු | දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානයේ සිට<br>ප්‍රධාන කාර්යාලය වෙත(මාස 3ක් සඳහා) | 03.10.2011 |
| 12. | කේ දිසානායක<br>තාක්ෂණ නිලධාරී | ප්‍රධාන කාර්යාලයේ සිට<br>ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානය වෙත | 01.11.2011 |
| 13. | යූ කේ ඒ බී උඩුවැල්ල<br>රියදුරු | ප්‍රධාන කාර්යාලයේ සිට<br>දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානය වෙත<br>(මාස 3ක් සඳහා) | 08.11.2011 |

(ඊ) සේවය අතහැර යාම්

| නම | තනතුර | දිනය |
|---|---|---|
| 1. ජේ ඩබ් කේ කේ ජයසුන්දර | පර්යේෂණ නිලධාරි | 23.02.2011 |

| (උ) මියගිය | තනතුර | දිනය |
|---|---|---|
| 1. සී එන් කේ එදිරිසිංහ | ස්ථාන සහකාර | 22.02.2011 |

**යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තු කටයුතු සංවර්ධනය**
**යටිතල පහසුකම් සංවර්ධනය**

1. ගාල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානයේ පිහිටි සංචාරක නිවාසය රුපියල් මිලියන 1.8 ක වියදමින් නවීකරණය කරන ලදී.

2. අළුතින් ඉදිකරන ලද දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානයේ සීමා මායිම් වැට රුපියල් මිලියන 1 ක වියදමින් නිම කරන ලදී.

3. තලවාකැලේ පිහිටි ප්‍රධාන ජෛව රසායනාගාරයේ විෂ දුම් පෙරණය රුපියල් 554,400/- ක වියදමින් නවීකරණය කරන ලදී.

4. හන්තානේ පිහිටි මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය සඳහා නව තොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකරන ලදී.

5. දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානයේ කීටවිද්‍යා හා වටපණු විද්‍යාගාරය සඳහා වටපණුවන්ට ප්‍රතිරෝධී නව ප්‍රභේද හඳුනා දිය හැකි පර්යේෂණ බිම් කොටස් 03 ක් රුපියල් 62,000/- වියදමින් ඉදිකරන ලදී.

6. තලවාකැලේ පිහිටි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පැති කාණු ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර ඇස්තමේන්තුගත මුදල රුපියල් 300,000/- කි.

7. මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය සඳහා රථවාහන සේදීමේ ස්ථානයක් ඉදිකිරීමට 2011 නොවැම්බර් මස ආරම්භ කරන ලද අතර ඇස්තමේන්තුගත මුදල රුපියල් 200,000/- කි.

8. රත්නපුර ශාන්ත ජෝකිම් වතුයායේ පිරිසැකසුම් තාක්ෂණ අංශය සඳහා ඉන්ධන දැව ගබඩාවක් ඉදිකිරීමේ කටයුතු 2011 දෙසැම්බර් මස ආරම්භ කල අතර ඇස්තමේන්තුගත මුදල රුපියල් 100,000/- කි.

9. රත්නපුර පිහිටි පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය සඳහා නව පොහොර ගබඩාවක් ඉදිකිරීමේ කටයුතු 2011 දෙසැම්බර් මස ආරම්භ කරන ලද අතර ඇස්තමේන්තුගත මුදල රුපියල් 850,000/- කි.

10. තලවාකැලේ පිහිටි ප්‍රධාන කාර්යාල පරිශ්‍රය ඇතුලත මීටර 213 ක දිගකින් යුත් අභ්‍යන්තර මාර්ග පද්ධතියක් ඉදිකිරීමේ කටයුතු 2011 දෙසැම්බර් මස ආරම්භ කරන ලද අතර ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 1 කි.

11. දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානයේ කල D" මාදිලියේ ද්විත්ව නිල නිවාසයක් ඉදිකිරීමේ කටයුතු 2011 දෙසැම්බර් මස ආරම්භ කරන ලද අතර ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 2.7 කි.

12. ප්‍රධාන කාර්යාල පරිශ්‍රය අභ්‍යන්තරයේ පිහිටා ඇති ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ සමූපාකාර සමිති ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු සිදුකිරීම 2011 දෙසැම්බර් මස ආරම්භ කරන ලද අතර ඇස්තමේන්තුගත මුදල රුපියල් 200,000/- කි.

නඩත්තු කටයුතු

- නුවරඑළිය - හැටන් ප්‍රධාන මාර්ගයේ මට්ටකැලේ හන්දියේ සිට ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය වෙත වන පිවිසුම් මාර්ගය කාලානුරූපීව නඩත්තු කරන ලදී.

- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතන ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය හා මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය තුල සවිකර ඇති ගිනි නිවීමේ උපකරණවල මෙහෙයුම් ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම සහ අදාල ප්‍රතිස්ථාපන කටයුතු සිදුකරන ලදී.

- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතන ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටි සංචාරක බංගලාව සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය සඳහා නව තිර රෙදි සවිකරන ලදී.

- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතන ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටි ජල පෙරහන්ගාරය, ජල ටැංකි හා අවසාදිත ටැංකි කාලානුරූපීව පවිත්‍ර කල අතර සංචාරක බංගලාවේ ජලනල පද්ධතිය සහ A, B, C, යන කාණ්ඩවලට අයත් නිලනිවාස හා සම්බන්ධ ප්‍රධාන ජල සැපයුම් මාර්ගයද අළුත්වැඩියා කරන ලදී. නව ප්ලාස්ටික් ජල ටැංකි 10 ක් හා ඊට සම්බන්ධ ජලනල මාර්ග තෝරාගත් B, C හා D කාණ්ඩවලට අයත් නිලනිවාස වෙත සවි කරන ලද අතර නව ගීසර් 05 ක් B, C හා D කාණ්ඩවලට අයත් නිලනිවාස සඳහා සවිකරන ලදී.

- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතන ප්‍රධාන කාර්යාලයේ පිහිටි විදුලි කාර්මික අංශයේ සිට කැමිලියා නේවාසිකාගාරය වෙත නව තෙකලා විදුලිය පහසුකම් ලබාදෙන ලදී. නව වායු සමීකරණ පද්ධතියක් ප්‍රධාන කාර්යාලයේ පිහිටි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේ සවිකරන ලදී. මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ රථවාහන අංශයේ පිහිටි ප්‍රධාන විදුලි පරිනාමකයේ සිට නිලනිවාස හා සංචාරක බංගලාව වෙත සම්බන්ධ ප්‍රධාන විදුලිය පද්ධතිය අළුත්වැඩියා කරන ලද අතර එම මධ්‍යස්ථානයේ පිහිටි ප්‍රධාන ජල පොම්පාගාරයට නව මනු කියවීමේ ඒකකයක්ද සවිකරන ලදී.

- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සතු සියළුම අංශවල දෛනික විදුලි සැපයුම්, ජල සැපයුම්, නිලනිවාස නඩත්තු හා අළුත්වැඩියා කටයුතු, විද්‍යාගාර, කාර්යාල හා අනෙකුත් ගොඩනැගිලි නඩත්තු කටයුතු සහ දුරකථන හුවමාරු මධ්‍යස්ථානයේ දෛනික නඩත්තු හා අළුත්වැඩියා කටයුතු ඉතා සාර්ථක අන්දමින් සිදු කරන ලදී.

**සමීක්ෂණ මණ්ඩල (Board of Survey)**

- 2011 දෙසැමබර් මස 31 දිනෙන් අවසන් වසර සඳහා සමීක්ෂණ මණ්ඩල පත්කරන ලද අතර එමගින් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සතු තේ වතු, මධ්‍යස්ථාන, අංශ හා ඒකක වල පැවති නොසෙල්විය හැකි, අබිලි හා අළුත්වැඩියා කළ නොහැකි අයිතම ගණනය කරන ලදී. 2010 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වසරේ සමීක්ෂණ මණ්ඩල වාර්තාවෙන් පෙන්වා දුන් ශාන්ත ජෝකිම් වතුයායේ අබිලි හා නැවත අළුත්වැඩියා කළ නොහැකි අයිතම රැසක් වෙන්දේසි කල අතර විකුණුම් වටිනාකමක් නොමැති අයිතම විනාශ කරන ලදී.

**ප්‍රවාහන හා මෝටර් ගරාජය**

- පෙජරෝ වර්ගයේ පරණ ජීප් රථයක් රුපියල් මිලියන 1. 65 ක වියදමින් ප්‍රතිසංස්කරණය කරන ලද අතර ආසන 11 ක වෑන් රථයක්, ආසන 30 ක බස් රථයක් හා කැබ් රථ 03 ක් රුපියල් මිලියන 1. 82 ක වියදමින් අළුත්වැඩියා කරන ලදී. පර්යේෂණ හා සංවර්ධන කටයුතු සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය දෛනික, ලැයිස්තුගත හා සතිඅන්ත ප්‍රවාහන පහසුකම් සාර්ථකව සලසා දුන් අතර වාහන 09 ක එන්ජින් අළුත්වැඩියා, ජියර් පද්ධති 03 ක අළුත්වැඩියා හා නව සස්පෙන්ෂන් පද්ධති 19 ක් අළුතින් සවිකිරීම වැනි නඩත්තු කටයුතු සාර්ථකව සිදුකරන ලදී.

**ප්‍රසම්පාදන කටයුතු**

ජාත්‍යන්තර සහ දේශීය වශයෙන් මිලදීගන්නා රසායනික හා වීදුරු භාණ්ඩ, යන්ත්‍ර හා රසායනාගාර උපකරණ, කෘෂිකාර්මක යෙදවුම්, පොත්පත් හා සඟරා, යාන්ත්‍රික හා රසායනාගාර උපකරණ අමතර කොටස්, වාහන අමතර කොටස්, කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය, ඉන්ධන හා තෙල්, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ජල හා විදුලි උපකරණ ආදී මිලදීගැනීම් සඳහා සුළු ප්‍රසම්පාදන කමිටු රැස්වීම් 12 ක් සංවිධානය කරන ලදී. අධික්‍රියාකාරී ද්‍රව වර්ණාලේඛන පද්ධතියක් (HPLC), දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ' D' කාණ්ඩයේ ද්විත්ව නිවාස, එම මධ්‍යස්ථානයේ ' B' කාණ්ඩයේ නිල නිවසක් හා සංචාරක බංගලාවක් සහ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සඳහා නව ආරක්ෂක සේවාවක් තෝරාගැනීම යන ප්‍රසම්පාදන කටයුතු සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු රැස්වීම් 04 ක් ද සංවිධානය කරන ලදී. රාජ්‍ය ආයතන සඳහා වූ මිලදීගැනීමේ ක්‍රියාපටිපාටීන් යටතේ කල් බදු ක්‍රමයට ටොයෝටා කොරොල්ලා " (ZRE141) වර්ගයේ මෝටර් රථයක් තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපතිතුමාගේ පාවිච්චිය උදෙසා මිලදීගත් අතර එතෙක් පාවිච්චි කරන ලද අංක 301 - 2022 දරණ ටොයෝටා කොරොල්ලා (EE110) මෝටර් රථය රුපියල් මිලියන 1. 4 ක මුදලකට වෙන්දේසි කරන ලදී.

# මූල්‍ය කාර්යසාධනය

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | 2011 | 2010 |
|---|---|---|
| වත්කම් | රු .000 | රු .000 |
| ජංගම නොවන වත්කම් | | |
| දේපල හා යන්ත්‍රෝපකරණ | 999,922 | 963,274 |
| අඩු - එක්රැස්වූ ක්ෂය | (614,912) | (586,963) |
| | 385,010 | 376,311 |
| කෙරෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු | 11,706 | 8,996 |
| අනෙකුත් වත්කම් | 23 | 23 |
| | 396,739 | 385,330 |
| ජංගම වත්කම් | | |
| තොග | 21,354 | 19,261 |
| විකුණුම් සහ ලැබිය යුතු පූර්ව ගෙවීම් | 101,378 | 107,164 |
| අඩුකලා - අවිනිශ්චිත ලැබීම් සඳහා වෙන්කිරීම | (62) | (90) |
| පූර්ව ගෙවීම් | 596 | 986 |
| මුදල් සහ මූල්‍ය සමකයන් | 59,691 | 68,826 |
| | 182,958 | 196,147 |
| හඳුනාගත් ලාභ/අලාභ | | |
| අතිරික්ත හා හිඟය | 28 | - |
| | 579,725 | 581,478 |
| මුළු වත්කම් | | |
| වගකීම් | | |
| ජංගම වගකීම් | | |
| ගෙවිය යුතු | 19,904 | 19,867 |
| එක්රැස්වූ වියදම් | 29,362 | 26,002 |
| | 49,266 | 45,869 |
| ජංගම නොවන වගකීම් | | |
| පාරිතෝෂික ගෙවීම් වෙන්කිරීම් | 140,157 | 110,941 |
| ඉන්ධන සඳහා තැන්පතු | 24 | 21 |
| | 189,448 | 156,832 |
| මුළු වගකීම් | | |
| මුළු ශුද්ධ වගකීම් | **390,278** | **424,645** |
| ශුද්ධ වත්කම් | | |
| තේ පර්යේෂණ අරමුදල | 268,710 | 295,526 |
| ප්‍රදානයන් සහ සංචිත | 121,567 | 129,119 |
| | **390,278** | **424,645** |

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය

| | 2011 | 2010 |
|---|---|---|
| | රු .000 | රු .000 |
| මෙහෙයුම් ආදායම් | | |
| පුනරාවර්ථන ලැබීම් - සෙස් බදු | 316,066 | 282,974 |
| වෙනත් ආදායම් | 22,758 | 24,307 |
| වෙනත් ආදායම් - ප්‍රමාද වූ ආදායම් | 5,121 | 5,153 |
| | 343,945 | 312,434 |
| අඩුකලා - වතුවලින් ලැබූ ශුද්ධ පාඩුව | -30,475 | |
| | 313,470 | |
| මෙහෙයුම් වියදම් | | |
| වැටුප් | 163,354 | 153,844 |
| ගමන් වියදම් | 9,587 | 6,750 |
| සැපයුම් සහ පරිභෝජන | 23,124 | 21,149 |
| නඩත්තු කටයුතු | 27,270 | 24,272 |
| කෝන්ත්‍රාත් සේවා - ආරක්‍ෂණ/රක්‍ෂණ | 13,894 | 14,906 |
| විදුලි පරිභෝජන | 14,994 | 14,066 |
| සන්නිවේදන | 2,425 | 2,587 |
| පර්යේෂණ හා සංවර්ධන | 34,268 | 23,140 |
| ක්‍ෂයවීම් | 25,927 | 26,656 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 26,848 | 22,135 |
| මුළු මෙහෙයුම් පිරිවැය | **341,691** | **309,505** |
| මෙහෙයුම් කටයුතුවල අතිරික්තය/හිගය | **(28,222)** | **2,929** |
| මූල්‍ය පිරිවැය | | |
| දේපළ, උපකරණ විකුණුම් ආදායම් | 1,405 | |
| මෙහෙයුම් නොවන මුළු වියදම | | |
| අතිරේක අයිතමයන්ට පෙර මුළු අතිරික්තය/හිගය | **(26,817)** | **2,929** |
| අමතර අයිතමයන් | | |
| වාර්ෂික ගැලපුම් | | (505) |
| අදාල කාලය තුළ මුළු අතිරික්තය/හිගය | **(26,817)** | **2,424** |

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ඒකාබද්ධ මුල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය

| මෙහෙයුම් කාර්යයන්හී මුල්‍ය ප්‍රවාහය | 2011<br>රු..000 | 2010<br>රු..000 |
|---|---|---|
| සාමාන්‍ය කාර්යයන්හී අතිරික්තය/හිඟය | (22,830) | 897 |
| මුල්‍යමය නොවන සංචලනයන් | | |
| ක්‍ෂයවීම් | 31,576 | 32,113 |
| බොල්ණය වෙන්කිරීම් | (28) | (146) |
| ගෙවිය යුතු මුදල් වෙන්කිරීම් | 3,398 | (3,125) |
| සේවක පිරිවැය සඳහා වෙන්කිරීම් ඉහළ දැමීම | 29,217 | 7,737 |
| ස්ථාවර වත්කම් විකුණුම් | (1,405) | - |
| අනෙකුත් ජංගම වත්කම් ඉහළ දැමීම | (5,658) | 899 |
| වත්කම් කපා හැරීම | (2,930) | (1) |
| ආපසු බැරකල වත්කම් | (14) | (229) |
| ලැබිය යුතු ආදායම් අඩුකිරීම | 9,799 | (1,571) |
| පෙර වසර හා ගැළපුම් | | (505) |
| ප්‍රාග්ධන සංචිතයේ මුල්‍ය ගැළපුම් | (8,234) | (6,454) |
| මෙහෙයුම් කාර්යයන්හි ශුද්ධ මුල්‍ය ප්‍රවාහය | **32,891** | **29,615** |
| ආයෝජන කාර්යයන්හී මුල්‍ය ප්‍රවාහය | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | (44,302) | (30,097) |
| ආයෝජන පොලී | 2,581 | 2,032 |
| කෙරෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු (වැඩිකිරීම්/අඩුකිරීම්) | (2,710) | 3,963 |
| ස්ථාවර වත්කම් විකුණුම් | 1,405 | - |
| ආයෝජන කාර්යයන්හී මුල්‍ය ප්‍රවාහය | **(43,026)** | **(24,102)** |
| මුල්‍ය කටයුතුවල ශුද්ධ මුල්‍ය ප්‍රවාහය | | |
| ප්‍රාග්ධන ප්‍රදානයන් - ජාතික විද්‍යා පදනම | 1,000 | - |
| මුල්‍ය කටයුතු වල ශුද්ධ මුල්‍ය ප්‍රවාහය | **1,000** | |
| මුල්‍ය සහ මුල්‍ය සමකයන් වල ශුද්ධ වැඩිවීම්/අඩුවීම් | **(9,135)** | **5,513** |
| වසර ආරම්භක මුල්‍ය සහ මුල්‍ය සමකයන් | **68,826** | **63,313** |
| වසර අවසාන මුල්‍ය සහ මුල්‍ය සමකයන් | **59,691** | **68,826** |

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

2011 දෙසැම්බර් 31 දිනට ශාන්ත කූම්බ්ස් සහ ලැම්ලියර් වතු සඳහා කාරක ගිණුම

| 2010 | | ආදායම් | | 2011 | |
|---|---|---|---|---|---|
| රු | කිලෝ ග්‍රෑම් | තේ විකුණුම් දළ ආදායම | කිලෝ ග්‍රෑම් | රු | |
| 86,013,381.04 | 212,658.5 | | | | |
| 12,681,125.00 | 34,265.5 | බ්‍රෝකර් ආයතන හරහා විකුණුම් | 307,340.0 | 127,261,739.63 | |
| 98,694,506.04 | 246,924.00 | දේශීය විකුණුම් සහ නොමිලේ බෙදා දීම් | 36,791.0 | 14,228,109.50 | |
| | | | 344,131.0 | 141,489,849.13 | 141,489,849.13 |
| | | එකතු කළා | | | |
| 4,626,876.88 | | අමු තේ දළු විකුණම් | | - | |
| 805,699.66 | | රිකිලි තේ අතු විකුණුම් ලාභය | | 814,720.21 | |
| 177,173.49 | | විවිධ ආදායම් | | 382,274.49 | |
| 445,725.31 | | ප්‍රමාද වී ලද ආදායම් | | 445,725.31 | |
| 104,749,981.38 | | මුළු ආදායම | | 1,642,720.01 | 1,642,720.01 |
| | | | | | 143,132,569.14 |
| | | වියදම් | | | |
| | | අඩු කළා වතු වියදම් | | | |
| 37,121,848.46 | | පොදු ගාස්තු | | 50,062,345.46 | |
| 11,503,289.07 | | කෂේත්‍ර කටයුතු සහ වගා කිරීම් | | 13,069,118.76 | |
| 41,732,735.61 | | නිෂ්පාදන | | 57,756,901.84 | |
| 2,210,127.26 | | දළු මිලදී ගැනීම් (ප්‍රවාහන වියදම්ද සහිතව) | | 11,531,695.70 | 132,420,061.76 |
| 92,568,000.40 | | | | | |
| | | පරිපාලන සහ මූල්‍ය | | | |
| 4,012,229.29 | | ප්‍රසාද දීමනා සහ නිවාඩු දින ගෙවීම් | | 5,066,144.46 | |
| 1,733,717.51 | | ක්ෂය වීම් | | 1,608,653.21 | |
| | | | | | 6,674,797.67 |
| | | විකුණුම් බදු සහ බෙදා හැරීමේ පිරිවැය | | | |
| 1,195,423.21 | | බ්‍රෝකර් ගාස්තු පැටවීමේ සහ විකුණුම් වියදම් | | 1,848,523.09 | 1,848,523.09 |
| **99,509,370.41** | | මුළු වියදම් | | | **140,943,382.52** |
| 5,240,610.97 | | වසර සඳහා ලාභය (අලාභය) | | | 2,189,186.62 |
| 218,872.37 | | අඩු කළා : නොවිකිණු තේ සඳහා වැඩිපුර කළ වෙන් කිරීම් | | 148,860.50 | |
| 521,408.03 | | පෙර වසර හා ගැලපුම් | | 14,963,762.29 | 15,112,622.79 |
| 740,280.40 | | තේ ප ආ මෙහෙයුම් ගිණුමට මාරු කළ ලාභය (අලාභය) | | | |
| **4,500,330.57** | | | | | **(12,923,436.17)** |

## ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
## 2011 දෙසැම්බර් 31 දිනට ශා: පෝකිම් වත්ත සඳහා කාරක ගිණුම

| 2010 | | ආදායම් | | 2011 | |
|---|---|---|---|---|---|
| රු | කිලෝ ග්‍රෑම් | තේ විකුණුම් දළ ආදායම | කිලෝ ග්‍රෑම් | රු | |
| 186,700,139.10 | 491,679.0 | තේ බෝ්කර්වරුන් හරහා විකුණුම් | 391,715.0 | 143,699,321.20 | |
| 1,174,804.75 | 5,168.0 | දේශීය විකුණුම් සහ නොමිලේ බෙදා දීම් | 4,572.0 | 998,021.05 | |
| 187,874,943.85 | 496,847.0 | | 396,287.0 | 144,697,342.25 | 144,697,342.25 |
| | | එකතු කළා | | | |
| 146,268.25 | | රිකිලි තේ අතු විකුණුම් ලාභය | | 93,402.50 | |
| 543,052.92 | | විවිධ ආදායම් | | 1,093,058.42 | |
| 3,207,640.00 | | රබර් වලින් ලද ආදායම් | | 5,962,870.00 | |
| 855,719.52 | | ප්‍රමාද වී ලද ආදායම් | | 855,719.52 | 8,005,050.44 |
| 192,627,624.54 | | මුළු ආදායම | | | 152,702,392.69 |
| | | වියදම් | | | |
| | | අඩු කළා වතු වියදම් | | | |
| 4,190,072.14 | | පොදු ගාස්තු | | 3,291,031.14 | |
| 3,552,727.27 | | ක්ෂේත්‍ර කටයුතු සහ වගා කිරීම් | | 4,341,976.19 | |
| 6,118,518.28 | | නිෂ්පාදන | | 5,966,243.42 | |
| 1,129,431.57 | | රබර් සඳහා වියදම් | | 1,973,118.84 | |
| 167,450,897.43 | | දළු මිලදී ගැනීම් (ප්‍රවාහන වියදම්ද සහිතව) | | 143,864,045.66 | 159,436,415.25 |
| | | පරිපාලන සහ මූල්‍ය | | | |
| 1,600,245.41 | | ප්‍රසාද දීමනා සහ නිවාඩු දින ගෙවීම් | | 2,944,754.40 | |
| 3,677,024.89 | | ක්ෂය වීම් | | 4,040,594.60 | 6,985,349.00 |
| | | විකුණුම් බදු සහ බෙදා හැරීමේ පිරිවැය | | | |
| 3,774,941.15 | | බෝ්කර් ගාස්තු පැටවීමේ සහ විකුණුම් වියදම් | | 2,304,888.24 | 2,304,888.24 |
| 191,493,858.14 | | මුළු වියදම් | | | **168,726,652.49** |
| 1,133,766.40 | | වසර සඳහා ලාභය (අලාභය) | | | (16,024,259.80) |
| (552,833.51) | | අඩු කළා : නොවිකිණු තේ සඳහා වැඩිපුර කළ වෙන් කිරීම් | | | (1,525,920.37) |
| 580,932.89 | | තේ ප ආ මෙහෙයුම් ගිණුමට මාරු කළ ලාභය (අලාභය) | | | **(17,550,180.17)** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல / My No. පීඩබ්/ඒ/ටීආර්බී/එෆ්ඒ/2011

ඔබේ අංකය / உமது இல / No.

දිනය / திகதி / Date 2012සැප්තැම්බර් 30 දින

සභාපති ,

තේ පර්යේෂණ මණ්ඩලය

තේ පර්යේෂණ මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

තේ පර්යේෂණ මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 15 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2012 මැයි 10 දින මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට හා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887220
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887221
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.
මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට තේ පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

(අ) මණ්ඩලයට එරෙහිව උසාවියේ ගොනු කර තිබූ නඩු වලින් සිදුවිය හැකි අසම්භාව්‍ය බැරකම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) වර්තමානයේ භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 18 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

සභාපතිගේ අදහස් දැක්වීම් වලට අනුව, තක්සේරු දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර ඇත.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 වර්ෂයේදී "අයිඑස්ඕ" සහතිකය ලබාගැනීම සඳහා කරන ලද රු.2,381,613 ක ගෙවීම් ජංගම නොවන වත්කමක් ලෙස වෙනම දැක්වීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශන වල ඉඩම් ගොඩනැගිලි යටතේ දක්වා තිබුණි.

(ආ) 2009 වර්ෂයට අදාල රු.34,518 ක් වටිනාකම වූ මාර්ගස්ථ භාණ්ඩ අදාල ගිණුම් වලට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් ලැබුණු වාහනයක වටිනාකම තහවුරු කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඈ) ශාන්ත කුම්බිස් කර්මාන්ත ශාලාවේ ගොඩනැගිලි සඳහා කරන ලද එකතුව රු.111,039 ක් වූ සුළු අළුත් වැඩියාවන් ලාභයට එරෙහිව ලියා හරිනු වෙනුවට කෙරී ගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ඉ) ශාන්ත කුම්බිස් වතුයායට අදාළ රු.5,494,090 ක් වූ කර්මාන්ත ශාලා සංවර්ධන වියදම් ගිණුම් වල කෙරී ගෙන යන වැඩ යටතේ දක්වා තිබුණද , 2011 දෙසැම්බර් 31 දින වන විට එම කාර්යයන් සම්පූර්ණ කර තිබුණි.

(ඊ) පරිගණක , විදුලි උපකරණ හා ලී බඩු වැනි එකම වර්ගයේ ස්ථාවර වත්කම් සඳහා විවිධ ක්ෂය අනුපාත යොදා ගෙන තිබුණි.

2.2.3 නොසැසඳු ශේෂ

පහත දැක්වෙන නොසැසඳු ශේෂ විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) පහත දැක්වෙන ස්ථාවර වත්කම් ශේෂයන් ලෙජරයේ වර්ගීකරණය කර නොතිබු බැවින් , මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් උපලේඛනයන් සමඟ සැසඳිය නොහැකි විය.

| විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| තලවාකැලේ තේ පර්යේෂණායතනයේ ස්ථාවර වත්කම් | 89,702,632 |
| රත්නපුර තේ පර්යේෂණායතනයේ ස්ථාවර වත්කම් | 11,621,908 |
| හන්තාන තේ පර්යේෂණායතනයේ ස්ථාවර වත්කම් | 12,064,360 |
| කොට්ටාව තේ පර්යේෂණායතනයේ ස්ථාවර වත්කම් | 3,003,998 |
| පස්සර තේ පර්යේෂණායතනයේ ස්ථාවර වත්කම් | 2,084,061 |
| දෙණියාය තේ පර්යේෂණායතනයේ ස්ථාවර වත්කම් | 2,813,438 |
| දෙණියාය තේ පර්යේෂණායතනයේ ස්ථාවර වත්කම් | 1,224,761 |
| මතුගම තේ පර්යේෂණායතනයේ ස්ථාවර වත්කම් | 294,624 |
| ශාන්ත කුම්බිස් වතුයායේ ස්ථාවර වත්කම් | 17,321,421 |
| ශාන්ත ජෝකිම් වතුයායේ ස්ථාවර වත්කම් | 17,095,102 |
| | 157,226,305 |

(ආ) ශාන්ත කුම්බිස් කර්මාන්ත ශාලා ගිණුම්වල ණයගැති උපලේඛනය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මුල්‍ය ප්‍රකාශන වල ණය හිමියන් සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය අවසානයට තේ මිලදී ගැනීම්වලට අදාළව රු.1,993,319 ක් වූ වෙනස්කම් නිරීක්ෂණය විය.

## 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට ලැබිය යුතු විශ්ලේෂණ ගාස්තු රු.152,920 ක් වූ අතර, එයින් රු.121,070 ක් වූ ශේෂ වර්ෂ 5 කට වැඩි කාලයක් ගිහ හිට පැවතුණි.

(ආ) කාල විශ්ලේෂණයට අනුව , රු.307,751 ක් වූ වෙළඳ හා විවිධ ණයගැතියන් අයකර ගැනීමෙන් තොරව වර්ෂ 4 කට වැඩි කාලයක් ගිහ හිට පැවතුණි.

(ඇ) ශාන්ත ජෝකිම් වතුයායේ ණය , අත්තිකාරම් වැනි වෙක්රෝල් ණය රු.22,175 ක් වර්ෂ පහකට වැඩි කාලයක් අයකර ගෙන නොතිබුණි.

2.5 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති , රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත හා 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත | සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ සඳහා ස්ථාවර දීමනා මත සේවක අර්ථ සාධක අරමුදල් දායකය සේවකයන්ගෙන් අයකර ගෙන නොතිබුණු අතර එම දීමනා මත සේවායාගේ අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකය ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6.5.1 ඡේදය | 2011 වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසානවී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ 1978 දෙසැම්බර් 12 දිනැති අංක 842 | ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණු අතර මණ්ඩලයට අයත් ඉඩම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.මිලියන 26.8 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු.මිලියන 2.9 ක් වූ බැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 29.7 ක පිරිහීමක් දැක්වුණි. ශාන්ත කුම්බිස් වතුයායේ හා ශාන්ත ජෝකිම් වතුයායේ රු.මිලියන 30.5 ක් වූ අලාභය එයට හේතු වී තිබුණි.

3.2 වතු පිළිබඳ මෙහෙයුම් ප්‍රතිඵල

මණ්ඩලය විසින් වතුයායන් දෙකක් එනම් ශාන්ත කුම්බිස් වතුයාය හා ශාන්ත ජෝකිම් වතුයාය කළමනාකරණය කරනු ලබන අතර සමාලෝචිත වර්ෂයේ එම වතු වල මෙහෙයුම් ප්‍රතිඵල ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | ශාන්ත කුම්බිස් වතුයාය (ලැම්ලියර් කොටසද ඇතුළුව ) | | ශාන්ත ජෝකිම් වතුයාය | |
|---|---|---|---|---|
| | 2011 | 2010 | 2011 | 2010 |
| තේ විකුණුම් | | | | |
| ප්‍රමාණය ( කිලෝග්‍රෑම් ) | 344,131 | 246,924 | 396,287 | 496,847 |
| විකුණුම් වටිනාකම (රු.000) | 141,490 | 98,695 | 144,697 | 187,875 |
| වෙනත් ආදායම (රු.000) | 1,643 | 6,055 | 8,005 | 4,753 |
| මුළු ආදායම (රු.000) | 143,133 | 104,750 | 152,702 | 192,628 |
| අඩු කළා :- | | | | |
| මුළු වියදම (රු.000) | 140,942 | 99,509 | 168,726 | 191,494 |
| මෙහෙයුම් ලාභය/පාඩුව (රු.000) | 2,189 | 5,241 | (16,024) | 1,134 |
| පෙර වර්ෂ ගැලපීම් (රු.000) | (15,112) | (741) | (1,526) | (553) |
| ශුද්ධ ලාභය / (පාඩුව) (රු.000) | (12,923) | 4,500 | (17,550) | 581 |
| තේ කිලෝග්‍රෑමයකට නිෂ්පාදන පිරිවැය (රු.000) | 413.43 | 371.92 | 394.24 | 365.11 |
| හෙක්ටයාරයකට ඉපයීම් (කිලෝග්‍රෑම්) | 2,444 | 2,011 | 1,002 | 1,016 |
| ශුද්ධ විකුණුම් සාමාන්‍යය (කිලෝග්‍රෑමයකට රු.) | 405.78 | 394.85 | 359.31 | 372.72 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ශාන්ත කුම්බිස් වතුයායේ විකුණුම් ප්‍රමාණය කිලෝග්‍රෑම් 97,207 කින් වැඩිවී තිබුණු අතර මෙහෙයුම් ලාභය රු.3,051,424 කින් අඩුවී තිබුණි. මිලදී ගත් තේ දළු වියදම වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කෙසේ වුවද ඉකුත් වර්ෂ වල පාරිතෝෂික ඌන ප්‍රතිපාදනය පිළිබඳ ගැලපීම් හේතුවෙන් පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ශුද්ධ ලාභය රු.17,423,767 කින් අඩුවී තිබුණි.

(ආ) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ශාන්ත ජෝකිම් වතුයායේ විකුණුම් ප්‍රමාණය කිලෝග්‍රෑම් 100,560 කින් අඩුවී තිබුණු අතර පෙර වර්ෂයේ රු.580,933 ක් ව පැවති ශුද්ධ ලාභය රු.17,550,180 ක් වූ ශුද්ධ පාඩුවකට පරිවර්තනය වී තිබුණි. වැඩි නිෂ්පාදනයක් ලබාගැනීමට හා ලාභදායි කර්මාන්ත ශාලාවක් බවට පත්කර ගැනීම සඳහා "රුවන්පුර ගැම්දිරිය ඒකාබද්ධ සමාගම " ( ගැම්දිරිය ) සමඟ ශාන්ත ජෝකිම් වතුයාය අවබෝධතා ගිවිසුමකට එළඹ තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළදී රු.17,550,000 ක ශුද්ධ පාඩුවක් ලබා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4. කාර්ය සාධන සමාලෝචනය

---------------------------------

### 4.1 මණ්ඩලයේ කාර්යයන්

--------------------------

(අ) තේ පර්යේෂණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වන්නේ තේ වගා කිරීමට හා නිෂ්පාදනයට සම්බන්ධ ගැටළු හා කරුණු වලට අදාළ විද්‍යාත්මක හා තාක්ෂණික පර්යේෂණ සහ විමර්ශන පැවැත්වීමට සහායවීම හා දිරිමත් කිරීම , මණ්ඩලයේ මහ පෙන්වීම් වලට අනුව තේ වලින් කෙරෙන නිෂ්පාදන විවිධාංගිකරණය මෙන්ම තේ වගාවට හානි කරන කෘමි සතුන්ගෙන් ආරක්ෂා කිරීම හා පාලනය කිරීම ඇතුළත් පර්යේෂණ කටයුතු වල ප්‍රතිඵල පුළුල් කිරීම හා ප්‍රසිද්ධ කිරීම සහ තේවල ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීමයි. ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ මූල්‍ය කාර්ය සාධනය පහත දැක්වේ.

| වැඩ සටහන | වර්ෂය සඳහා ප්‍රතිපාදනය | | | උපයෝජනය | | | උපයෝජනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | මූලධන | එකතුව | පුනරාවර්තන | මූලධන | එකතුව | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| ඵලදාව වැඩිදියුණු කිරීම | 13.65 | 13.89 | 27.54 | 13.42 | 7.54 | 20.96 | 76.10 |
| ඉඩම් ඵලදායිතාව වැඩිදියුණු කිරීම | 13.82 | 16.07 | 29.89 | 14.50 | 10.15 | 24.65 | 82.46 |
| ඵලදාව කළමනාකරණය | 29.61 | 12.64 | 42.25 | 26.38 | 5.88 | 23.26 | 76.35 |
| පසු අස්වනු තාක්ෂණය | 14.17 | 14.11 | 28.28 | 15.03 | 11.07 | 26.10 | 92.29 |
| සම්පත් සැලසුම් කිරීම | 5.40 | 1.25 | 6.65 | 3.11 | 0.54 | 3.65 | 54.88 |
| උනන්දුවක් දක්වන්නන් සඳහා සේවා | 38.25 | 38.54 | 76.79 | 38.13 | 12.24 | 50.37 | 65.59 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| පර්යේෂණ කළමනාකරණය | 113.63 | 27.56 | 141.19 | 113.76 | 15.80 | 129.56 | 91.76 |
| අභ්‍යන්තර සේවා සහ නඩත්තුව | 5074 | 31.30 | 82.04 | 51.69 | 9.15 | 60.84 | 74.15 |
| එකතුව | 279.27 | 155.36 | 434.63 | 276.02 | 72.37 | 348.39 | 91.15 |

(ආ) කර්මාන්ත ශාලාවල කාර්යයන් ක්‍රියාකාර් සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි. එබැවින් මණ්ඩලයේ කර්මාන්ත ශාලාවල හා වතු වල කාර්යයන් පිළිබඳ ප්‍රගතිය විගණනයේදී නිශ්චය කර ගත නොහැකි විය.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබාගත හැකි වූ තොරතුරු අනුව, සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබාගෙන අනිවාර්ය සේවා කාල පරිච්ඡේදය සේවය කිරීමට නොහැකි වූ නිලධාරීන් 10 දෙනෙකුගෙන් රු.27,090,600 ක මුදලක් ලැබිය යුතු වූ නමුත් 2012 මාර්තු 31 දක්වාත් අදාළ පාර්ශ්වයන්ගෙන් එම මුදල් අයකර ගෙන නොතිබුණි.

(ආ) 1982 වර්ෂයේ සිට කෙරගෙන යන වැඩ යටතේ අඩු තේ සැකසුම් ව්‍යාපෘතිය (Lowery Tea Processing Project ) ලෙස රු.4,142,173 ක මුදලක් ගිණුම් වල දක්වා තිබුණි. ලබාගත හැකි වූ තොරතුරු අනුව , ශ්‍රී ලංකා තේ සැකසුම් යෝග්‍යතාවය පරීක්ෂා කිරීමට උඩරට තේ කර්මාන්ත ශාලා 6 ක යන්ත්‍ර 6 ක් ස්ථාපනය කරන ලද අතර, එම යන්ත්‍රෝපකරණ ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන ක්‍රියාවලියට යෝග්‍ය නොවූ බැවින් ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. කෙසේ වුවද එම යන්ත්‍ර ස්ථාපනය කරන ලද කර්මාන්ත ශාලාවල තවමත් නිෂ්කාර්යව තිබෙන බවත් කෙරී ගෙන යන වැඩ ලෙස ගිණුම්වල දීර්ඝ කාලයක සිට දැක්වෙන බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) ශාන්ත ජෝකම්ම් වතුයායේ හෙක්ටයාර් 143.810 ක් වූ මුළු ඉඩම් වපසරියෙන් හෙක්ටයාර් 17.675 ක් දීර්ඝ කාලයක සිට බාහිර පාර්ශ්වයන් විසින් බලයෙන් අල්ලා ගෙන ස්ථිර නිවාස ඉදිකර වී, තේ, රබර් , පොල් , සහ වෙනත් වැවිලි වගාකර තිබුණි. එබැවින් මෙම වගාවන්ගෙන් වතුයාය ලබන ආදායම අහිමි කර ගෙන තිබුණු අතර ඔවුන්ගෙන් එම ඉඩම් ආපසු ලබාගැනීම සඳහා ඔවුන්ට එරෙහිව කටයුතු කිරීමට 2012 මාර්තු 31 දක්වා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) මණ්ඩලයට හා ශාන්ත කුම්බිස් වතුයායට අදාළ නොවන ඇතැම් බාහිර පාර්ශ්වයන් විසින් මණ්ඩලයෙන් හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් විධිමත් අනුමැතින් ලබාගැනීමෙන් තොරව විශාල ඉඩම් වපසර්යක එළවළු වගාකර විශාල අදායමක් උපයමින් තිබුණි. බලය නොලත් ඉඩම් උපයෝජනය පිළිබඳ විස්තර විගණනයට ඉල්ලා සිටි නමුත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) මණ්ඩලයට හා මණ්ඩල පරිශ්‍රයෙහි ස්ථානගත ළදරු පාසැල් දෙමාපිය සංගමයට එරෙහිව ළදරු පාසැල් ගුරුවරියක විසින් ගොනු කරන ලද නඩුවක් සඳහා නීතිමය ගාස්තු ලෙස මණ්ඩලය විසින් රු.125,000 ක මුදලක් ගෙවා තිබුණි. ළදරු පාසැලේ කළමනාකරණය පැවරී තිබුණේ ළදරු පාසැලේ විධායක කමිටුවට බැවින් මෙය මණ්ඩලයට අදාළ නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) ශාන්ත ජෝකිම් වතුයායේ සේවය කරන ලද සේවකයන් දෙදෙනෙකුගේ උසස්වීම් සම්බන්ධයෙන් 2008 වර්ෂයේදී මණ්ඩලයට එරෙහිව රත්නපුර ජාතික වතු සේවා සංගමය විසින් උසාවි නඩුවක් ගොනුකර තිබුණි. විසඳුමකට එළඹීමෙන් තොරව මණ්ඩලය විසින් නඩුව ඉදිරියට ගෙනයන බවත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පෞද්ගලික නීතිඥවරුන්ට රු.901,500 ක මුදලක් ගෙවා තිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද 2012 මාර්තු 31 වන විටත් මෙම නඩුව අවසාන වී නොතිබුණි.

4.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩල තත්ත්වය

--------------------------

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 අගෝස්තු 24 දිනැති ලිපියට අනුව, මණ්ඩලයේ අනුමත කරන ලද නව කාර්ය මණ්ඩලය 443 ක් වන අතර මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද වාර්තා ප්‍රකාරව 2011 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තත්ත්වය පහත දැක්වේ. කෙසේ වුවද පුරප්පාඩු පිරවීම සඳහා මණ්ඩලය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

| ශ්‍රේණිය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| විධායක ශ්‍රේණි | 87 | 39 | 48 |
| විධායක නොවන ශ්‍රේණි | 206 | 121 | 85 |
| සුළු සේවක ශ්‍රේණි | 150 | 80 | 70 |
| එකතුව | 443 | 240 | 203 |

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සභාපතිගේ පිළිතුරට අනුව, 2011 සැප්තැම්බර් දක්වා බඳවා ගැනීම් යෝජනා ක්‍රමය අනුමත කරනතුරු වඩා අත්‍යවශ්‍ය තනතුරු පමණක් පිරවීමට අනුමැතිය දී තිබුණු අතර නව බඳවා ගැනීම් යෝජනා ක්‍රමය අනුගමනය කරමින් ආයතනය විසින් දැනට කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් කාර්යය සිදුකරනු ලැබේ.

(ආ) කාර්ය මණ්ඩල පිරිවැය

ලබාගත හැකි වූ තොරතුරු අනුව කර්මාන්ත ශාලා ශ්‍රමිකයන් හැර සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩල පිරිවැය පෙර වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| සේවක වර්ගය | සේවක සංඛ්‍යාව | | මුළු පඩිනඩි | | සේවකයකුට පිරිවැය | |
|---|---|---|---|---|---|---|
| විධායක | 51 | 48 | 25,622,590 | 24,989,897 | 516,598 | 527,662 |
| විධායක නොවන | 145 | 138 | 51,148,457 | 49,360,723 | 375,473 | 380,282 |
| සුළු සේවක | 75 | 47 | 17,368,699 | 15,216,663 | 232,250 | 327,002 |
| | 271 | 233 | 94,139,746 | 89,567,283 | 371,604 | 415,720 |

(ඇ) බඳවා ගැනීම්

2011 පෙබරවාරි 01 දින සිදුකරන ලද නියෝජ්‍ය අධ්‍යක්ෂ ( පරිපාලන ) පත්කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 නොවැම්බර් 14 දින පුවත්පත් දැන්වීම ප්‍රකාරව බඳවා ගන්නා ලද නිලධාරියා හට අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද නොතිබුණි.

(ii) සම්මුඛ පරීක්ෂණ ලකුණු වාර්තාවට අනුව , කිසිදු පිළිගත හැකි හේතුවක් නොමැතිව අනිකුත් ඉල්ලුම්කරුවන් හතරදෙනා අතරින් ඉහත ඉල්ලුම්කරුට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් වැඩි ලකුණු දී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iii) ලබාගත හැකිවූ තොරතුරු අනුව, මණ්ඩලය විසින් ඉහත කී නිලධාරියාට 2011 පෙබරවාරි සිට 2012 ජනවාරි දක්වා රු.699,562 ක් හා රු.308,097 ක් පිළිවෙලින් වැටුප් සහ අභ්‍යන්තර හා බාහිර ශ්‍රමික ගාස්තු ලෙස ගෙවා තිබුණි.

4.4 මෝටර් වාහන උපයෝජනය

------------------------------

මෝටර් වාහන 50 කින් , ලොරි 09 කින් , ට්‍රැක්ටර් 13 කින් හා යතුරු පැදි 42 කින් සමන්විත මණ්ඩලයේ වාහන ඇණිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දීර්ඝ කාලයක සිට අළුත්වැඩියා කිරීමෙන් තොරව මෝටර් වාහන 11 ක් නිෂ්කාර්යව තිබුණි.

(ආ) උපලේඛන සමඟ සැසඳීමේදී යතුරු පැදි දෙකක් සමීක්ෂණ වාර්තා වල ඇතුළත් කර තිබුණි.

(ඇ) මණ්ඩලයේ වාහනයකට නව බොඩි ගැසීමක් හා නව එන්ජිමක් නැවත සවිකිරීමට සමාලෝචිත වර්ෂය තුළ පෞද්ගලික ගරාජයකට රු.1,650,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද අළුත් වැඩියාව සඳහා මණ්ඩලයේ අනුමැතිය හා එන්ජිමක් නැවත සවිකිරීම සඳහා මෝටර් ප්‍රවාහන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. අළුත් වැඩියා කිරීම් සතුටුදායක තත්ත්වයකින් කර නොතිබීම හේතුවෙන් මාස 6 ක් ඉකුත් වීමට පෙර වාහනය නැවත අළුත් වැඩියා සඳහා යැවීමට සිදුවී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ වාහන 8 ක් අනතුරු වලට මුහුණ පා තිබුණි. වාහන 5 ක අළුත් වැඩියා සඳහා රු.142,715 ක මුදලක් ගෙවා තිබුණු අතර එයින් රු.99,028 ක් පමණක් රක්ෂණ වන්දි වශයෙන් ලැබී තිබුණි. ඉතිරි වාහන තුනෙහි අළුත් වැඩියා සඳහා එකතුව රු.162,075 ක් වූ රක්ෂණ හිමිකම් මණ්ඩලය විසින් 2012 මාර්තු 31 වන විටත් අයකර ගෙන නොතිබුණි.

4.5 පාර්තෝෂික ප්‍රතිපාදන ආයෝජනය

------------------------------------

1983 අංක 12 දරන පාර්තෝෂික ගෙවීම් පනතෙහි දක්වා ඇති පරිදි අනාගත බැරකම් වලට මුහුණදීම සඳහා මණ්ඩලය විසින් රු.140,157,472 ක් වූ පාර්තෝෂික ප්‍රතිපාදන වෙනම ආයෝජනය කර නොතිබුණි.

5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සමඟ තථ්‍ය ප්‍රගතිය 2008-2012 වර්ෂ සඳහා වූ සංයුක්ත සැලැස්ම හා සැසඳිය නොහැකි විය.

5.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකය මණ්ඩලයේ අධ්‍යක්ෂවරයාගෙන් ස්වාධීන විය යුතුය. එහෙත් මණ්ඩලයේ සංවිධාන සටහන අනුව , අභ්‍යන්තර විගණක, මණ්ඩලයේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ නොව මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා යටතේ කටයුතු කරමින් සිටී.

5.3 අයවැය ලේඛනමය පාලනය

අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු, මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම
(ඇ) අත්තිකාරම් නිරවුල් කිරීම
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
(ඊ) මූල්‍ය කළමනාකරණය
(උ) අයවැය
(ඌ) වතු කළමනාකරණය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති